ඇලෙක්සැන්ඩර් රස්කින්ගේ

When Daddy was a Little Boy කෘතිය ඇසුරින්

සොඳුරු බාලේ ගෙවුණු තාලේ





අනුවාදය

රන්දිකා රණවීර

සොඳුරු බාලේ ගෙවුණු කාලේ

සිංහල අනුවාදය

රන්දිකා රණවීර

WHEN DADDY WAS A LITTLE BOY

A. රස්කින්

තැචර් ප්‍රකාශන

සොඳුරු බාලේ ගෙවුණු තාලේ
සිංහල අනුවාදය රන්දිකා රණවීර

ISBN 978-955-7541-04-4

සියලුම හිමිකම් ඇවිරිණි

ප්‍රථම මුද්‍රණය 2014

පිටකවර නිර්මාණය
පුබුදු පණ්ඩිතරත්න

පිංතූර සැකසුම, පරිගණක අක්ෂර සංයෝජනය
හා පිටු සැකසුම, මුද්‍රණය, ප්‍රකාශනය සහ බෙදා හැරීම

තැචර් ප්‍රකාශන
518/8E, මුදිතා මාවත,
හීන්කෙන්ද, රාගම

දුරකථන 077-448 34 34
වෙබ් www.thatcher.lk
ඊ මේල් thatcher@thatcher.lk
thatcherpub@gmail.com

ප්‍රණාම පෙරදැරි පිදුම

සිය දියණියට පියෙකු විසින්
කියා දුන් මේ කතන්දර එකතුව,

සිය දියණියට මහා පොළොවේ
කතන්දරය කියා දුන්
අම්මේ, තාත්තේ. . .
ඔබ දෙපළට
ප්‍රණාම පෙරදැරි ව පුදදෙමි

-ලොකු දුව-

කතුවරයාගෙන් වදනක්

ආදරණීය දරුවනි,

මෙම පොත රචනයට මා යොමු වූයේ කෙසේදැයි ඔබට පැවසීමට කැමතියි. මට දියණියක් සිටී. ඇගේ නම සාෂාය. ඇය දැන් වැඩිහිටි ළමයෙක්. නිරතුරු ඈ තමා පිළිබඳ ව කතා කරද්දී, "මම කුඩා දැරියක ව සිටි කාලයේදී............" වශයෙන් කතා කිරීමට හුරු පුරුදු වී ඇත*.

ඉතිං, මගේ දූ සාෂා බොහොම කුඩා දැරියක ව සිටි අවධියේ, ඇය නිරතුරුව ම රෝගාතුර වූවාය. ඈ සෙම්ප්‍රතිශ්‍යාවෙන්, සෙම්ගෙඩි වලින් හා කනේ ආසාදනයකින් නිරතුරුව ම පෙළිණ. ඔබ කවදා හරි දවසක කනේ ආසාදනයකින් පීඩා විඳ තිබේ නම් එහි ඇති වේදනාත්මක ස්වභාවය මැනවින් වැටහෙනු ඇත. ඔබට කවදාවත් එවැනි රෝගයක් නොතිබුණේ නම් ඒ පිළිබඳ ව විස්තර කිරීමෙන් පලක් නැත. එය කෙසේ වන්නේදැයි ඔබට කිසිදා වටහාගත නොහැක.

වරක් සාෂාගේ කන් අමාරුව වැඩි වී ඇය නොනවත්වා ම හඬන්නට පටන් ගත්තාය. ඇයට කිසි ලෙසකින් නින්දක් ලැබීමට නොහැකි විය. ඈ පිළිබඳ ව තදබල දුකකින් පසු වූ මටත් හැඬෙන්නට ආසන්න විය. ඉතිං මම ඇයට ඇසෙන්නට පොත් කියැවීමි. විනෝද කතා කියා දුනිමි. කුඩා දරුවකු ව සිටි සන්ධියේ මගේ අලුත් ම බෝලය කාරයක් යටට යැවූ හැටි කියා දුනිමි. ඇය එයට බොහෝ සෙයින් කැමති වූවාය. ඇගේ පියා කලෙකදී කුඩා ළමයෙකු ව සිටි බවත්, දඟ වැඩ කිරීම නිසා ඔහුටත් විටෙක දඬුවම් විඳින්නට වූ බවත් ඇය අසා සිටියේ බලවත් විමතියෙනි. ඇයට සියලුම කතා මතක තිබිණ. යම් විටෙක ඇගේ කන රිදෙන්නට පටන් ගත් විට, ඈ වහා හඬ නගන්නීය. "තාත්තේ, තාත්තේ! මගේ කන රිදෙනවා! අනේ මට කියන්න ඔයා පුංචි කාලේ කතාවක්." ඒ හැම විටෙක ම මම ඇයට අලුත් කතාවක් කියා දුන්නෙමි. ඒ හැම කතාවක් ම මේ පොත් පෙලෙහි ද ඔබට හමුවනු ඇත. මට සිදු වූ සියලුම විනෝදජනක දේ සිහිකර ගන්නට මම උත්සාහ කළෙමි. ඒ රෝගී දැරියගේ මුහුණෙහි සිනාවක් දකින්නට උවමනා වූ බැවිනි. එයට අමතර ව ලෝභ කමෙහිද, පුරසාරම් කතා කීමෙහිද, උඩගු වීමෙහිද, නුසුදුසු භාවය ඇයට වටහා දීමටද මට අවැසි විය. එහි අරුත කුඩා කලදී හැමවිටම මා එසේ වූ බව නොවේ. සමහර අවස්ථාවලදී මට අලුත් කතාවක් සිහිකරගත නොහැකි වූ විට, දන්නා හඳුනන වෙනත් පියෙකුගේ කුඩා කල කතාවක් තාවකාලික ව ඉල්ලා ගතිමි. කෙසේ වුවද, හැම පියෙකු ම කලෙක කුඩා පිරිමි ළමයෙකු ව හිඳ ඇත. ඉඳින්, මෙහි දැක්වෙන එකදු කතාවක්වත් නිර්මාණය කළ

ඒවා නොවන බව ඔබට පෙනෙනු ඇත. මේවා එක් කලෙක සිටි කුඩා පිරිමි ළමුන්ට සත්‍ය වශයෙන් ම සිදු වූ ඒවාය. දැන් සාෂා වැඩුණු ගැහැණු ළමයෙකි. පෙර පරිදි නිතර නිතර රෝගී වන්නේ නැති අතර තනිව ම අගනා විශාල පොත් කියවා ගත හැකිය.

නමුත්, සමහරවිට එක්තරා පියෙකු පිළිබඳවත් කුඩා පිරිමි ළමයෙකු ව සිටි අවධියේ ඔහුට මුහුණ පෑමට සිදු වූ දේ පිළිබඳවත් දැනගැනීමට වෙනත් ළමයින් කැමති වන්නට ඉඩ ඇතැයි මට සිතිණ.

මට කීමට අවශ්‍ය වූයේ එපමණකි. නමුත් නවතින්න! තවත් යමක් ඉතිරි ව ඇත. මේ පොතට එහා ගිය තවත් දේ ඇත. ඒ හැමදේ ඔබ වෙනුවෙන් ඔබට ම සොයාගත හැකිවනු ඇත. ඔබේ ම පියාට, එක් කලෙක කුඩා පිරිමි ළමයෙකු ව සිටි ඔහුගේ ළමා කාලයෙන් කතා ගොන්නක් ඔබ වෙත ගෙනෙන්නට තිබෙනවා විය හැක. ඒ වගේම ඔබේ මවටත්! මම හරිම කැමතියි ඒ කතා අසන්නටත්.

මෙයට විශ්වාසී,

ඔබේ මිතුරු A. *රස්කින්*

* *When Daddy was a Little Boy – පියා කුඩා පිරිමි ළමයෙකු ව සිටියදී... යනුවෙන් පියා විසින් සිය කතාවන් සෑම විටම වාගේ අරඹන ලද නිසා ඇයට එසේ හුරු වන්නට ඇත. - අනුවාදක*

අනුවාදකගෙන් වදනක්

රුසියානු ගත්කතුවර ඇලැක්සැන්ඩර් රස්කින් විසින් රුසියන් බසින් රචිත කතාන්දර පොතක් අනුසාරයෙන්, ෆායින්නා ග්ලැගෝලෙවා (Fainna Glagoleva) විසින් **When Daddy was a Little Boy** නමින් ඉංග්‍රීසි බසට පරිවර්තනය කරන්නට යෙදුණු පොත මා අතට පත් වන්නේ 2011 වසරේ දීය. සරල හා විනෝදාත්මක ලෙසින් නමුත් උපදේශාත්මක කතා බොහොමයකින් යුතු වූ එම පොත, පසෙක නොතබා එක්වනම කියවා හමාර කළෙමි. එයින් අනතුරුව ගෙවුණු සමයේ හිතින් බොහෝ විට එහි කතා අතර සැරිසැරුවෙමි. කෙතරම් මසිත එහි රැඳුණෝ ද යත් විවේකී විටදී එයින් කතා එකින් එක සිංහලයට හරවන්නට වීමි. නමුදු ඒ හැරවීම පරිවර්තනයක් නමින් හැඳින්විය නොහැක. එයට හේතුව මුල් ඉංග්‍රීසි කෘතියෙහි පියා විසින් දියණියට පවසන කතාන්දර විස්තර වී තිබුණේ, 'When little daddy was older he discovered' - පුංචි තාත්තා වැඩුණු පසු ඔහු විසින් සොයා ගත්තේය' යනාදී ලෙසින් වන අතර මා විසින් එය සිංහලයට හරවන ලද්දේ 'මා වැඩුණු පසු මම සොයා ගතිමි' යනාකාරයෙනි. එයට හේතුව 'Little Daddy-පුංචි තාත්තා' යන්න සිංහලයට එතරම් හුරු නොවූ වදනක් සේ මට හැඟීමත්, තමන්ට සිදු වූ දෙයක් ලෙසින් විස්තර කෙරෙන විට පාඨකයෙකු වන පුංචි දරුවෙකුට වඩා හොඳින් ධාරණය වෙතැයි සිතුණු නිසාත්ය. එබැවින් මෙය පරිවර්තනයක් නොවේ, අනුවාදයකි.

එසේ සිංහලයට හරවන ලද කතා කිහිපයක් මගේ පරිගණකය තුළ කාලයක් නිසොල්මනේ රැඳී තිබුණි. කාලයක් තිස්සේ අන්තර්ජාලය තුළ බ්ලොග් පිටුවක් පවත්වාගෙන යන මවිසින් විවිධාකාර තේමාවන් යටතේ කවි, කෙටිකතා, කාලීන සිදුවීම් අළලා ලියැවුණු දෑ, යනාදී වශයෙන් විවිධ ලිපි පළ කර තිබේ. ඒ ලිපි මගින් හඳුනාගත් සෑහෙන පමණ පාඨක පිරිසක් ද සිටින අතර ඔවුන් වෙත මා අනුව කරන ලද කතා කිහිපයක් ඉදිරිපත් කරන්නට සිතුවේ ඔවුන්ගේ අදහස් හැමදාමත් විශාල දිරිමත් කිරීමක් වූ බැවිනි. සැබවින් ම බලාපොරොත්තු වූවාටත් වඩා යහපත් ප්‍රතිචාර සමගින් දිරිමත් කිරීම් ලැබිණි. බොහෝ දෙනෙකු පුද්ගලිකව ම අමතා පැවසුවේ බ්ලොග් අවකාශයේ සැරිසරන්නන්ට පමණක් පහසුවෙන් කියවිය හැකි ලෙස මේ කතා පළ නොකර පොතක් වශයෙන් පළ කිරීම සුදුසු බවය. දිගින් දිගට ම එවැනි ප්‍රතිචාර ලැබෙන්නට වූ බැවින් කතා හතරක් පමණක් පළ කිරීමෙන් නැවතීමට තීරණය කළෙමි. අනතුරුව නිසොල්මනේ සිටිනා අතරේ මා මිතුරිය නීතිඥ රදිකා ගුණරත්න මෙනවිය, පොතක් පළ කිරීම සඳහා මා දිරිමත් කළාය. ඇය නොවන්නට මේ කාර්යය මෙතරම් ඉක්මනින් සිදු නොවන්නට හෝ කිසිදු

ආකාරයකින් සිදු නොවන්නට ම ඉඩ තිබුණි. තවද මා මිතුරිය වෛද්‍ය බෝධිනී සමරතුංග මහත්මිය මෙම කටයුත්තේ දී මා හට සිය සහයෝගය ලබා දුන්නාය. ඉතාමත් කෙටි දැනුම්දීමක් මත අගනා, සිත්ඇදගන්නාසුලු කවරයක් නිර්මාණය කරදුන් මගේ පාසල් සමයේ පටන් මිතුරියක වන පුබුදු පණ්ඩිතරත්න මෙනවිය ස්තූතිපූර්වක ව සිහිපත් කරමි.

කරන කියන සෑම කටයුත්තකදී ම මා වෙත සිය සහයෝගය වචනයෙන්, ක්‍රියාවෙන් හා මූල්‍යමය අංශයෙන් යනාදී තෙයාකාරයෙන් ම සෙනෙහසින් යුතුව සිය උපරිමයෙන් ලබා දෙන මා දයාබර සැමියා වාසනා ප්‍රනාන්දු මෙහි ලියැවී ඇති සෑම අකුරක් පිටු පසම හිඳින මගේ ශක්තියයි. මෙම කාර්යය පිළිබඳ ව දැනගත් අවස්ථාවේ සිට දිරිමත් කරන අම්මා, තාත්තා සහ සොයුරියන්ද, මෙවැන්නක් පිළිබඳ ව සිතා නොසිටි සමයේ ඒ සඳහා අදහස් සහ අනුබල දුන් රවී වීරසිංහ මා හිතවතාද, තනෝජා රාජපක්ෂ, හර්ෂණී නාකන්දල, මිහිරි මොහොට්ටි යන හිතවතියන් හා අනෙකුත් බ්ලොග් පාඨක හිතවතුන්ද, මේ අවස්ථාවේ සිහිපත් කළ යුතුය.

මෙහි කතාන්දර 35කට වැඩි ප්‍රමාණයක් ඇති අතර ඒවායින් මෙහි කියැවෙන පුංචි පිරිමි ළමයාගේ පාසල් සමයට පෙර කාලයත්, පාසල් සමයත්, වැඩුණු ළමයෙකු වශයෙන් ගෙවුණු සමයත් පිළිබඳ ව විස්තර කෙරෙයි.

මුල් ඉංග්‍රීසි පොතෙහි ඇති ලෙව් තොක්මාකොව් (Lev Tokmakov) විසින් අඳින ලද චිත්‍ර ඒ අයුරින් ම කතාන්දර සඳහා භාවිතා කර ඇති අතර පිට කවරය සඳහා ද ඇතුළු පිටුවල තිබුණු පිංතූර සංස්කරණය කර යොදාගෙන ඇත.

වැඩිහිටියන්ට හා දරුවන්ට කියවා එකසේ පහසුවෙන් වටහා ගත හැකි ලෙසින් සරළ සිංහල ව්‍යාකරණ රීති අනුගමනය කරමින් අනුවාදය කළෙමි. වැඩිහිටියන් හට දරුවන්ගේ සිතුම් පැතුම් හා කටයුතු කිරීමේ දී සිතිය යුතු දෑ ගැනත් , දරුවන්ට තමන්ගේ ජීවිතය හැඩ ගස්වා ගතයුතු ආකාරය ගැනත් යහපත් අදහස් ලබාදෙන මෙම කතා පෙළ ඔබගේ සිත් තදින් ඇද ගනු ඇති බවට නොඅනුමානයි. ඔබ මෙය කියවා විනෝදය සේම යම්කිසි උපදේශයක් ඔබගේ ජීවිතයට එක් කරගනු ලබන්නේ නම් එය මගේ සතුට වේ.

රන්දිකා රණවීර
077-4483434
randil02@gmail.com
2014 මැයි මස 10 වන දින

පටුන

මට නැතිවුණු බෝලේ	1-6
බල්ලෙකු හීලෑ කළේ මෙලෙසේ	7-14
කවි ද ලිව්වයි මෙ මා රාළේ	15-21
මහා ඇදුරෙකු සැපූ වේලේ	22-27
රස්සාවක් තේරුවයි රාළේ	28-34
පියානෝවේ මා නොදත් තාලේ	35-40
පාන් වර්ජනය කළෙම් මෙලෙසේ	41-45
කෝපයට පත්වුණු තාලේ	46-51
අත්වැරැද්දක් සිදුවූවානේ රාළේ	52-55
ලිවීම උගත් කාලේ	56-59
සොයුරු තනිකර දිවූ වේලේ	60-63
මිතුරියයි මා ගලවා ගත්තේ	64-67
සවිය උරගා බැලූ තාලේ	68-72
ඉඳින් ඇරඹිණි පාසල් කාලේ	73-76
පමා වී පාසල් ගියෙමි ඒ කාලේ	77-82
සිනමා සිත්තම මග හැරුණු තාලේ	83-87
කිම් ද? මිතුරියනි කළේ සරදම්	88-91
ගියෙමු අපි කොටි දඩයමේ	92-96
මා ඇන්ද-මා දන්න-සිත්තරේ විස්තරේ	97-100
ගුරුතුමිය රැවටේද රාළේ?	101-105

ට්‍රොලි රථයේ ජංජාලේ 406-111
සර්පයකු කැබලි වූවයි කැලයේ 112-118
ජර්මන් බස උගත් තාලේ 119-123
රචනා දෙකක් තිබුණා දෙඅතේ 124-128
මහා කිච්චර හා දුරකථන සංවාදේ 129-133
ලියූ කවි ගැයුවයි වේදිකාවේ 134-139
ඇළී ගැලුනෙමි පිං පොං බෝලේ 140-148
පරහ හිටියයි බංකු කකුලේ 149-154

මා නොදැන පළමුවැනියා වූ වසරේ 155-160
යකඩ ගොඩක් හමු වූ දවසේ 161-166
උණත් නරක නැතැයි සිතෙන තාලේ 167-173
බියෙන් ගැහුණෙමි එල්ලී වහලේ 174-179
සම ව බෙදූ තාලේ 180-184
මා පෙළුඃ සරදම් නාමේ 185-189
ඇත්ත පැවසූ අල්ල පනල්ලේ 190-195
බිත්ති පුවත්පතේ කතන්දරේ 196-203
වැටත් ගැලවුණායි දෙවන මහලේ 204-210



රන්දිකා රණවීර

මට නැතිවුණු බෝලේ



ලූගේ ආදර දුවේ...

මා බොහො ම කුඩා දරුවකු ව සිටි අවධියේ අපි වාසය කළේ කුඩා නගරයක් වූ පව්ලොවෝ පොසාඩ් පෙදෙසෙහිය. එහිදී වරෙක මගේ දෙමව්පියන් විසින් මා හට ඉතාමත් අලංකාර බෝලයක් තෑගි කරන ලද අතර එහි අලංකාරය විස්තර කිරීමට තරම් මා සතු වදන් ප්‍රමාණවත් නොවූ බව කිව යුතුය. එය සූර්යයා සේ අලංකාරය. නැත. එය සූර්යයාටත් වඩා අලංකාරය. සූර්යයා මෙන් නොවේ, කෙනෙකුට එය අපහසුවකින් තොරව පියවි ඇසින් නැරඹිය හැකි අතර එය සූර්යයා මෙන් සිව් ගුණයක් අලංකාර වූ බව මට සිතිණි. එයට

හේතුව එය අලංකාර වර්ණ හතරකින් සමන්විත වීමයි. සූර්යයා සතුව ඇත්තේ එකම එක වර්ණයක් පමණක් වන අතර එයටද පිළිගත හැකි නමක් නැත. එනමුදු මගේ බෝලයට... එහි එක් කොටසක් පෙපර්මින්ට් පෙත්තක් සේ රෝස පැහැතිය. තවත් කොටසක් චොකලට් පෙත්තක් සේ දුඹුරු පැහැතිය. තුන්වැන්න ගගන සේ නීල වර්ණ වූ අතර අනෙක් කොටස තණබිමක් මෙන් හරිත වර්ණ විය. කුඩා නගරයක් වූ පව්ලොවෝ පොසාඩ් හි කිසිවකු ඉන් පෙර එවැනි අලංකාර බෝලයක් කිසි දිනෙක දැක නොතිබූ බව සහතිකය. මා පියා විසින් එය මිල දී ගෙන තිබුණේ මොස්කව් නගරයෙනි. මට හිතුණු පරිදි මොස්කව් නගරයේ පවා මෙවැනි අගනා බෝල හිඟ විය යුතුය. ඒ මන්ද යත් වැඩිහිටියන් පවා මගේ අලංකාර වස්තුව නැරඹීමට නිතර නිතර පැමිණි නිසාය.

"අනේ... මොන තරම් අගනා, අලංකාර බෝලයක්ද?" ඔවුහු හැමවිට මගේ බෝලය වර්ණනා කරන්නට වූහ.

එය සැබවින්ම ආදරණීය වස්තුවක් විය. එනිසාම මම ඒ පිළිබඳව ඉමහත් ආඩම්බරයකින් පසුවීමි. මගේ දරාගත නොහැකි ආඩම්බරය කොතරම් ද කිවහොත් මා පසුවූයේ එම බෝලය මා විසින් ම නිපදවා මා විසින්ම වර්ණ ගැන්වූ සේය. මා එය ද ගෙන සෙල්ලම් කරනු පිණිස නිවසින් පිටතට ගිය විට, සැමවිට ම හතර වටින් ම කොල්ලෝ කුරුට්ටෝ පැන ගෙන එන්නට විය.

"ශා.... මරු බෝලයක්නේ" ඔවුන් හැම දෙනෙකුගේ ම මුව රැව් පිළිරැව් දුන් වදන එය විය. "කෝ... කෝ...... මටත් ටිකක් දෙන්නකෝ සෙල්ලං කරන්න" ඉල්ලීම් නිමක් නැති විය.

නමුදු මා නොවේ කිසිවෙකුට එය ඇඟිල්ලකින් තරම්වත් ස්පර්ශ කරනට අවස්ථාව දුන්නේ. "බැහැ දෙන්නේ නැහැ. ඒක මගේ බෝලේ. මගේ විතරමයි. ලෝකේ කාටවත් නැහැ මේ වගේ ලස්සන බෝලයක්. මේක මගේ තාත්තා මට ගෙනාවේ මොස්කව් නගරයෙන්. දුවනවා

අහකට. අල්ලන්න කියලා හිතන්නවත් එපා!" මම මගේ ආඩම්බරය මොනවට කියා පෑමි.

එවිට ළමයි එකතුව මට බැන වදින්නට වූහ.

"අපොයි ආඩම්බරකාර ලෝබයා. ලෝකේ ඉන්න ලොකුම ලෝබයා නුඹයි!"

ඔවුන් පැවසූ කිසි වදනකට මගේ කන අසලටවත් එන්නට නොහැකිවිය. මගේ අලංකාර බෝලය කිසිවෙකු අල්ලනවා දකින්නටවත් කැමැත්තක් නොමැති වූ අතර මට අවැසි වූයේ එය සමඟින් තනිව සෙල්ලම් කිරීමටයි. කෙසේ වුවද, තනිව කරන සෙල්ලමේ ඇති කම්මැලිකම අපි හැමෝම දනිමු. එයට පිළිතුරක් ලෙස, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බෝලය කෙරෙහි ලෝබ බැඳගෙන සිටි මා කළේ එය රැගෙන ගොස් අනෙකුත් ළමයින්ගේ ඇස් ඉදිරිපිට සෙල්ලම් කිරීමයි. එයින් ඔවුන්ගේ සිත් තුළ ඉරිසියාවක් ඇති කර සතුටු වීම මගේ එකල අභිප්‍රාය විය.

"එයා නං ලෝබ තකතීරුවෙක්. එයා එක්ක අපේ සෙල්ලමක් නැහැ" ඔවුන් කතා වනු මට ඇසිණ. ඉන් අනතුරුව දෙදිනක් යනතුරු මා සමඟින් සෙල්ලම් කිරීමට කිසිම ළමයෙකු පැමිණියේ නැත. තුන්වැනි දවසේ ඔවුන්ගෙන් කෙනෙකු මා හා කතා කරන්නට විය.

"ඔයාගේ බෝලය අගනා බඩුවක් තමයි. ලස්සන පාට ඒකේ තියෙන්නේ. ඒත් ඒක කාර් එකක් යටට රෝල් වෙලා ගියොත් ඉතිං ආයේ වෙනසක් නැහැ, අනිත් බෝල වගේම තමයි. ඩොං... ගාලා පුපුරලා යනවා ෂුවර්. ඒක නිසා ඔච්චර උඩ යන්න එපා"

"යනවා මෝඩ ළමයෝ යන්න. මගේ බෝලේ කවදාවත් පුපුරන්නේ නැහැ!" මම කෑ ගසා පැවසීමි. එම බෝලය ගැන එතරම් විශ්වාසයකින් මා කතා කළේ, හරියටම මා විසින් මගේම දෑතින් එය වර්ණ ගැන්වූ සේය.

"හෙ... හෙ... මොකද නැත්තේ. කොයි බෝලෙත් එකයි. ඕකත් පුපුරනවා" ළමයි මට නොනවත්වා විසුළු කරන්නට වූහ.

"නැහැ එහෙම වෙන්නේ නැහැ." මම නැවතත් කෑ ගැසීමි.

"ආ ... එහෙමද? එහෙනං අන්න කාර් එකක් එනවා. දානවකෝ බලන්න එහෙනං ඔය මහ ලොකු බෝලේ ඒ කාර් එක යටට" එක් ළමයෙකු ඉදිරියට පැමිණ පැවසූයෙන් මම එදෙසට හැරුණෙමි.

දෙපාරක් සිතීමට මා හට අවැසි නොවීය. එතරම් මට බෝලය ගැන විශ්වාසයක් තිබිණ. බෝලය මා අතින් රෝල් වී කාරය යටට යැවිණ. හැම දෙනම දෙනෙත් නෙරවාගෙන, නිශ්ශබ්දව එදෙස බලා සිටින්නට වූහ. ඉදිරි රෝද දෙක මැදින් රෝල් වී ගිය බෝලය පිටු පස රෝදයක් අසලට ළඟා විය. රථය මදක් ගැස්සී ඉදිරියට පැන ගමන් කරන්නට වූයේ හරියටම එය රෝදය උඩින් ගිය බව පෙන්වමිනි. මගේ අනගි බෝලය අනතුරු රහිතව එතැන තිබිණ!.

"ඇද්ද? ඇද්ද? ඒක පිපිරුවෙ නෑ. ඒක පිපිරුවෙ නෑ"

එය ගැනීමට දිවගෙන යන අතරතුරේ මම සතුටින් කෑ ගැසීමි. අහෝ! එවිට ම මහා පිපිරුම් හඬක් ඇසිණ. ඒ මගේ බෝලයේ අවසානය විය. එතැන තවදුරටත් ඉතිරිව තිබුණේ කුඩා කුඩා රබර් කැබලි විශාල ප්‍රමාණයක් පමණි. තවදුරටත් වර්ණනා කරමින් සතුටු වන්නට දෙයක් එතැන ඉතිරිව තිබුණේ නැත. මම ඉමහත් දුකින් හඬන්නට වීමි. හඬමින්ම ගෙදරට දිවගෙන ගියෙමි. ළමයින් මහා හඬින් සිනාසෙනු මට ඇසිණ.

"ඒක පිපිරුවා. ඒක පිපිරුවා. ඔන්න ලෝබයා...... නුඹට නිසි දඬුවම් ලැබුණා" ඔවුන් කෑ ගසා කියනුද මට ඇසිණ.

නිවසට ගිය මම, මාගේ අම්මා හමුවේ, පුපුරනවාද නැද්ද යන්න දැන ගැනීම පිණිස කාරයක් යටට බෝලය රෝල් කර හැර, එය අහිමි කරගත් අයුරු ඉමහත් දුකින් විස්තර කළෙමි. එපමණක් නොව, ඒ සඳහා

ත්‍යාග වශයෙන් ඇයගෙන් පස්ස පැත්ත පුරවා ගුටි පූජාවක් ලදිමි. එපමණක් ද නොව, හවස් යාමයේ තාත්තා රාජකාරි නිමවා නිවසට පැමිණි පසු ඔහුගෙන්ද, එවැනි ම වූ තවත් ගුටි පූජාවක් ලදිමි.

"මම නුඹට තළන්නේ බෝලය කාර් එක යටට යැව්ව නිසා නෙමෙයි. මෝඩ තකතීරුවෙක් වගේ හැසිරිලා තිබුණු නිසායි" මා අල්ලා සොලවා දමමින් තාත්තා පැවසුවේය.

කාලයක් යනතුරු මාගේ දෙමව්පියන්ගේ මිතුරු මිතුරියන්, කෙනෙකු එවන් අගනා බෝලයක් එලෙසින් නැති කරගත්තේ කෙසේද යන්න ගැන ඉමහත් පුදුමයෙන් කතා කරන්නට වූ බව මට මතක තිබේ.

"මෝඩ ම මෝඩ ළමයෙකුට විතරයි ඒ වගේ මෝඩ ම මෝඩ වැඩක් කරන්න පුළුවන්" ඒ හැමවිට ම මාගේ දෙමව්පියන්ගේ පිළිතුර එය විය. අහෝ! මොන තරම් නම් ලජ්ජා සහගත තත්ත්වයකට මා පත් වීද?

ඒ විතරක් නම් හානියක් නොවන්නට ඉඩ තිබිණ. දුටු දුටු තැන මා හට උසුළු විසුළු කරන්නට පළාතේම ළමයින් පුල පුලා බලා සිටින්නට වීම දරාගත නොහැකි කාරණායක් විය.

"ආ කොහොමද? කෝ ඔයාගේ අර අලුත් ලස්සන බෝලේ?" ඔවුහු මා දුටු විට අසන්නට සැදී පැහැදී සිටියෝය. ළඟට ඇවිත් ඇසුවා නම් කම් නැත. දුර සිට කෑ ගසා අසන්නට වූවෝය. අහෝ! නැවතත් මොන තරම් නම් ලජ්ජා සහගත තත්ත්වයකට මා පත් වීද? වැඩිහිටියන්, කොල්ලෝ කුරුට්ටන් ආදී සියල්ලන් ම මා හට සිනා සෙන්නට බලා සිටිති'යි මට සිතිණ.

නමුදු, අප නිවසට යාබද නිවැසියා කිසි දිනෙක මේ සම්බන්ධයෙන් සිනහ පහළ කළේ නැත. දිනක් ඔහු සිදු වූ සියල්ල මුල පටන් පවසන ලෙස මා හට පැවසීය. ඉතා අසරණව කල්ගත කළ මා, ඒ හිතවතා හමුවේ සියල්ල පැවසීමි. ඔහු සාවධානව අසා සිටියේය. මගේ කතාව අවසානයේදී ඔහු මෙලෙස පැවසීය.

"නැහැ, ඔබ මෝඩ ළමයෙක් නොවෙයි" බෝලය පිපිරුණ දා සිට මා හට අසන්නට ලැබුණු එකම සැනසිලිදායක වදන එය විය.

"ඔබ ලෝබ ළමයෙක්. තමන්ගේ හයිකාරකම් අනුන්ට පෙන්වන්න උත්සාහ කරන ළමයෙක්" ඔහු තවදුරටත් පැවසුයේ, පිබිදීගෙන ආ මසිත මුකුලිත කරමිනි.

"එය ඇත්තටම ලැජ්ජාවට කාරණයක්. කෙනෙකුට තමන්ගේම බෝලය එක්ක හරි තනියෙම සෙල්ලම් කරන්න හිතෙනවා නං, ඔහු හරිම ආත්මාර්ථකාමී තැනැත්තෙක්. ඔය වැඩෙන් නුඹ සමාජයේදී තනි වෙනවා. වැඩිහිටි වෙනකොට ඔය තත්ත්වය තවත් දරුණු අතට හැරෙනවා. දැන්ම ම වෙනස් වුණේ නැත්නම් කවදා හරි ඔබට පසුතැවෙන්න වෙයි මගේ පුංචි යාළුවා!"

මම ඉමහත් ලෙස භීතියට පත් වී හඬන්නට වීමි. හැඬුම් අතරින්, ලෝබකම් නොකරන බවටත්, මින්පසු කිසි දිනෙක කටමැත නොදොඩන බවටත් මම ඔහුට පොරොන්දු වීමි. එයින් නොනැවති දිගටම හඬන්නට වීමි. ඉතාමත් තදින් බෑගිරි ගසා හඬන්නට වීමි. මෙයින් මා දුන් පොරොන්දුව සත්‍යය බව මාගේ හිතවතා වටහා ගන්නට ඇත. ඔහු මා අස්වැසුවේය. ඉන් අනතුරුව, පසු දිනෙක ඔහු මට අලුත් බෝලයක් ගෙනැවිත් දුන්නේය. එය මාගේ පිපිරුනු බෝලය තරම් අලංකාර නොවුණද, අපේ ගමේ සියලුම ළමයින් එයින් සෙල්ලම් කරන්නට මා හා එක්විය. හැමදෙන එක සිතින් සතුටුව සෙල්ලම් කළෝය. කිසිවෙකු ඉන්පසු කිසිම දිනෙක මා ලෝබ තකතීරුවෙක් යැයි පැවසුවේ නැත.

ඉතිං මගේ දුවේ, ඔයාගේ තාත්තා ලෝබ වීමේ ආදීනව මැනවින් වටහා ගත්තේ එම සිද්ධිය නිසා යැයි පැවසුවොත් එය බොරුවක් නොවේමය.

බල්ලෙකු හීලෑ කළේ මෙලෙසේ



ළදර දුවේ...

මා, බොහොම කුඩා දරුවකු ව සිටි අවධියේ දිනක් මාගේ දෙමව්පියන් විසින් සර්කස් සංදර්ශනයක් නැරඹීම සඳහා කැඳවාගෙන යන ලදී. එය ඇත්ත වශයෙන්ම අපූර්වතම අත්දැකීමක් විය. එහි සිටි සත්ත්ව පුහුණුකරුවන් අතුරින් සිංහයින් හීලෑ කොට පුහුණු කරන්නා මගේ සිත තදින් ඇද බැඳ ගත් තැනැත්තා විය. එයට හේතු වූයේ ඔහු ඉතාමත් අලංකාර ඇඳුමින් සැරසී සිටීමත්, "සිංහ පුහුණුකරු" යන්න ඉතාමත් ගරු ගාම්භීර හැඳින්වීමක් වීමත්ය. ඇරත්, සිංහයින් හා

කොටියන්, කීකරු බළල් පැංචන් බවට හීලෑ කළ ඔහු, මා වැනි කුඩා දරුවකුගේ සිත් ගැනීම පුදුමයට කරුණක්ද? ඔහු සතුව කසයක් සහ පිස්තෝල දෙකක් තිබුණද ඉතාමත් කලාතුරකින් මිස ඒවා භාවිතා නොකරමින් ඔහු කරන්නට යෙදුණු ප්‍රාතිහාර්යය මා හට නම් සර්කස් සංදර්ශනයක් නොව මැජික් සංදර්ශනයක් සේ විය.

"මේ භයානක කැලෑ සත්තු හීලෑ වෙන්නෙ මගේ ඇස් දෙකට!. උන් මගේ ඇස් දිහා එක එල්ලේ බලන්න බයයි" ඔහු ශබ්ද නගා පැවසීය. "මගේ ඇස් දෙක තමයි මා සතු අගනා ම ආයුධය! මිනිසෙකු තමන්ගේ ඇස් දෙක දිහා එක එල්ලේ බලා සිටින විට නොසැළී හිටින්න කිසිම සතෙකුට බැහැ!"

ඇත්ත වශයෙන්ම ඔහු සිංහයා දෙස නෙත් හෙළන පමාවෙන් ඒ භයානක සිංහයා, කීකරු බළල් පැටවකු සේ බංකුව මතට නැගී හිඳගන්නටත්, අනතුරුව බැරලයක් තුළින් පැනීමටත් පමණක් නොව මියගියා සේ බිම වැතිරී සිටීමටත් යොමු වූයේ මාගේ මුව මටත් නොදැනී මදින් මද විවර කරමිනි. දෙවියනි! ඒ භයානක සිංහයා එලෙසින් හීලෑ ව, කීකරු ව හැසිරුණේ, වෙන කිසිවක් නිසා නොව මිනිසෙකුගේ දෙනෙත දෙස එක එල්ලේ බලා සිටීමට ඇති නොහැකියාව නිසා බව අසීරුවෙන් වුවද මා හට පිළිගන්නට සිදු විය. එවැන්නක් ගැන සිතීමත් උද්‍යෝගය ඇති කරවන්නක් විය.

සංදර්ශනය එන්න එන්නම සතුට ගෙන එන්නක් බවට පත්විය. තූර්යභාණ්ඩ වාදනය නොනවත්වා ම කෙරීගෙන ගිය අතර ප්‍රේක්ෂකයෝ සිංහයන් පුහුණු කරන්නා හට ඔල්වරසන් දෙමින් සතුට ප්‍රකාශ කළෝය. ඔහු පපුව මත සිය අත තබා සෑම දිශාවට ම නැමී නැමී ඔවුන් ට ආචාර කළේය. ඇත්ත වශයෙන්ම එවැනි සංදර්ශනයක් නරඹන්නට ලැබීම කුඩා දරුවකු වූ මා හට අගනා ත්‍යාගයක් ම විය. සංදර්ශනය නිසා අමන්දානන්දයට පත් ව සිටි මා එක්වනම තීරණය කළේ කවදා හෝ මා 'සිංහ පුහුණුකරුවකු' විය යුතු බවයි.

අනතුරුව මම පසුදින සිට ඒ සඳහා සැලසුම් සකසන්නට වීමි. කවදා හෝ දිනෙක, අනභිභවනීය සිංහ පුහුණුකරුවකු වන්නට නම් කුඩා කල සිටම ටිකින් ටික පුරුදු පුහුණු විය යුතු බව මගේ පුංචි මොළයට වැටහිණ. එහෙත් පුහුණු කරන්නට තබා සිංහයකු අසලටවත් මා කෙසේ නම් ළංවන්නද? අනාගතයේදී ලොව පිළිගත් සිංහ පුහුණුකරුවකු වන්නට සිටියේ වුවද, ඒ වන විට මා තවත් එක් කුඩා කොලුවකු පමණි. ඉදින් වඩා ම සුදුසු දේ, පුහුණු වන අවධියේ මුල් භාගයේදී වඩා රෞද්‍ර නොවූ සතෙකු සොයා ගෙන හීලෑ කිරීම බව මා හට අවබෝධ විය. මගේ පුංචි හිතට මේ සඳහා සුදුසු ම සතෙකු සේ හැඟුණේ බල්ලෙකි. ඒ ද අතිවිශාල එකෙකු නොවේ. ඉතාමත් කුඩා එකෙකි. ප්‍රායෝගිකව සැලකූ කල අතිවිශාල බල්ලෙකු යනු, කුඩා ප්‍රමාණයේ සිංහයෙකු සේ භයානක නොවේ යැයි කාට නම් කිව හැකිද? සිංහ පුහුණුකරු සිහිනය මුල් වරට දුටු දා පටන්, හීලෑ කිරීමට සුදුසු ප්‍රමාණයේ බල්ලෙකු ගැන නිතර විමසිලිමත් ව කාලය ගත කිරීම මාගේ පුරුද්ද විය.

කෙසේ හෝ අවසානයේ මාගේ බලාපොරොත්තුව මල්ඵල ගැන්විණ.

අපගේ පච්ලොචෝ පොසාඩ් නම් වූ කුඩා නගරයේ කුඩා උද්‍යානයක් තිබිණ. මෙකල එය විශාල ප්‍රමාණයේ උද්‍යානයක් වුවද, මා මේ කියන අවධිය වන විට තිබුණේ කුඩා උද්‍යානයකි. මගේ අම්මා එකල නිරතුරු මා එහි රැගෙන යාම පුරුද්දක් ව තිබිණ. මේ කියන දිනයේදී, මා සෙල්ලමින් කාලය ගත කරන අතර මගේ අම්මා අසල වූ බංකුව මත අසුන්ගෙන පොතක් කියවමින් සිටියාය. අම්මා අසල, ඉතාමත් ලස්සන, සුදු, කුඩා බල්ලෙකු සමග පැමිණ සිටි තවත් කාන්තාවක් අසුන්ගෙන සිටියාය. ඇය ද පසු වූයේ පොතක් කියවමිනි. මේ කතාවේ ප්‍රධාන චරිතයක් වන ඒ බල්ලා, ඉතා කුඩා එකෙකු වූ අතර ඌ සතුව කළුපාට, විශාල දෙනෙතක් තිබිණ. ඒ මගේ කටයුත්තට කියාපු දෙනෙතක් බව දුටු පමණින් මට සිතුණු අතර ඒවා මා හට ආයාචනා කරනා සේ මට දැනිණ.

"අනේ මට හීලෑ වෙන්න ඕනේ. අනේ කරුණාකරලා, පුංචි ළමයෝ, ඔයාට බැරිද මාව හීලෑ කරන්න? ඔය විදිහට මගේ ඇස් දෙක දිහා බලන්න එපා. අනේ මට කෙළින් ඉන්නත් බැහැ වගේ අයියෝ!!!"

ඒ කතා කරන ඇස් මගේ කනට නොව හදවතට කතා කොට එලෙසින් ඉල්ලා සිටින්නා සේ මට දැනිණ.

තවත් මොනවා නම් කල්පනා කරන්නද? කුමට කාලය කා දමනවාද? ඒ මොහොතේ ම බලු පුහුණුව ආරම්භ කළ යුතු බව මගේ තීරණය විය. ඉදින් මම බල්ලා වෙත හිමින් හිමින් ළං වීමි. අම්මා ඇගේ පොත කියවමින් සිටියාය. බල්ලාගේ හිමිකාරිය ඇගේ පොත කියවමින් සිටියාය. ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙකුවත් තමන් අසල සිදුවන දේ වැටහීමකින් තොරව තම තමන්ගේ පොත්වල ඇළී සිටි අතර මම සෙමින් සෙමින් බල්ලා වෙත ළං වෙමින් සිටියෙමි.

බල්ලාට එනපොට හොඳ නැති බව හැඟීදෝ, ඌ බංකුව යටට රිංගා ගත්තේය. අනතුරුව එහි දිගාවී, 'මේ පැංචා ගාටන්නේ මොකටදැ?' යි කල්පනා කරන්නා සේ උගේ කළුපාට විශාල දෙනෙතෙහි සැක කටයුතු බැල්මක් රඳවාගෙන මා දෙස බලා සිටින්නට විය. මම හැකි තරම් සෙමින් සෙමින් ඌ අසළට ළඟා වෙමින් සිටියෙමි.

"අපොයි මට පේන්නේ මේකාට මගේ ඇස් දෙක ගැන වගේ වගක් නැහැ වගේ. අපරාදේ මට තිබුණේ කෙළින් ම සිංහයෙකුගෙන්ම පටන් ගන්න. මට හිතෙන්නේ මේකා හීලෑ වෙන අදහස අත්හැරලා දාලා වගෙයි" මට සිතෙන්නට විය.

එදින ඉතාමත් උෂ්ණාධික දිනයක් වූයෙන්, මා සැරසී සිටියේ කොට කලිසමකින් හා සෙරෙප්පු ජෝඩුවකින් පමණි. මා වැනි කුඩා දරුවකු එලෙස සැරසී සිටීම විනය නීති කැඩීමක් ලෙස නුවරුන් නොසලකන්නට ඇති බව විශ්වාසය.

දැන් මා බල්ලාට ඉතා ආසන්නය. ඌ ගැඹුරු බැල්මෙන් මා දෙස බලා සිටියි. මා ඌ අල්ලා ගන්නට ඔන්න මෙන්න වාගේ තිබියදී, ඒ මෝඩ සතා එක්වනම ඉදිරියට පැන මගේ බුරිය සපා කෑවේය.

අහෝ! මාගේ කුඩා බුරිය....

මම මර ළතෝනි දෙන්නට වීමි.

පොත තුළ ගිලී සිටි මගේ අම්මා උඩ විසි වී ගොස්, මටත් වඩා මහ හඬින් ළතෝනි දෙන්නට වූවාය. ඇය පමණක් නොවේ, ඇය අසල ම සිටි බල්ලාගේ හිමිකාරිය ද මගේ අම්මා සමග හවුලේ ළතෝනි දෙන්නට වූවාය.

බල්ලා පමණක් කුමට නිහඬව සිටින්නද? ඌ ද හැකි පමණ වෙර යොදා බුරමින් සිටියේය. එකම ගාලගෝට්ටියකි.

"අනේ මෙන්න මූ මාව කෑවෝ" මම කෑ ගසන්නට වීමි.

"අනේ මෙන්න මේ ජරා බල්ලා මගේ දරුවා ව කෑවා" ඒ මගේ අම්මාගේ කෑ ගැසිල්ලය.

"මේ ළමයා මගේ බල්ලාට හිංසා කළා! නැත්තං කවදාවත් මගේ බල්ලා කාවවත් හපන්නේ නැහැ!" බල්ලාගේ හිමිකාරිය ද දෙවැනි නොවූවාය.

බල්ලා කුමක් කියා කෑ ගැසුවාද කියා සිතා ගැනීම පාඨක ඔබට භාරය.

ගත වූයේ නිමේෂයකි. වටේ පිටේ සෙනඟ මේ ගාලගෝට්ටිය අසා එතැනට රැස් වෙන්නට විය.

"අම්මෝ.... බොහොම නරක දෙයක් වෙලා තියෙන්නේ" හැමදෙන ම පවසන්නට වූහ.

මේ අතරතුරේ උද්‍යාන පාලක තැන එතැනට සැපත් වූයේය.

"ඈ පොඩි ළමයෝ, නුඹ බල්ලාට හිංසා පීඩා කළාද?" ඔහු ඇසුවේය.

"නැහැ. මම ඌ ව හීලෑ කරන්න ගියේ" මම පැවසීමි.

අපොයි දෙවියනි...!!! රැස් ව සිටි හැමදෙන මහා හඬින් සිනාසෙන්නට වූහ.

"හ්ම්.... ඒකත් එහෙමද? හොඳයි... කියමු බලන්න නුඹ කොහොමද ඒ වැඩේ කරන්න ගියේ?"

"මම බල්ලාගේ ඇස් දෙක දිහා ම බලාගෙන හිමින් හිමින් ඌ ළඟට ගියා. වැඩක් වුණේ නැහැ. දැන් මං දන්නවා බල්ලෝ, සිංහයෝ වගේ නෙමෙයි, මිනිහෙක් බැලුවා කියලා ඌට කෙළින් හිටන් ඉන්න බැරි කමක් පහළ වෙන්නෙ නැහැ" මම මා කළ දේත්, එයින් ලද නිරීක්ෂණයත්, අවසන් නිගමනයත් සියල්ලන් ඉදිරියේ පවසමින් සිටියෙමි.

මගේ වැදගත් කතාව පසෙක තිබියදී රැස් ව සිටි මෝඩ මිනිසුන් නැවතත් කොක් හඬලා සිනාසෙන්නට විය.

"දැක්කනෙ....! මේ ළමයා තමයි සේරම කරලා තියෙන්නේ. කවුද මෙයාට කිව්වේ මගේ බල්ලා ව හීලෑ කරන්න කියලා...." බල්ලාගේ හිමිකාරිය ජයග්‍රාහී ලෙස තම අදහස් පළ කරන්නට වූවාය.

"දැන් මෙයාට දඩ ගහන්නයි තියෙන්නෙ, තමන්ගේ ළමයා හරියට බලා ගත්තේ නැති ව වටේ පිටේ මිනිස්සුන්ගේ කටයුතු වලට බාධා ඇති කළාට" ඇය තවදුරටත් මගේ අම්මා දෙසට අත දිගු කරමින් පවසන්නට වූවාය.

මගේ අම්මා තිගැස්සුණාය. කිසිම වදනක් නොඑන ලෙසින් ඇගේ මුව අගුළු වැටී ගියා සේ විය.

මෙහිදී උද්‍යාන පාලක තෙමේ ඉදිරිපත් විය. "අර බලන්න අර පුවරුව... 'බල්ලන් උද්‍යානය තුළට ගෙන ඒම තහනම්!'. ඒක, 'ළමයින් උද්‍යානය තුළට ගෙන ඒම තහනම්!' කියලා තිබුණා නං මේ ළමයාගේ අම්මාට දඩ නියම කරන්න මට පුළුවන්. ඒත් දැන් මට දඩ නියම කරන්න වෙලා තියෙන්නේ කාටද කියලා ඔබතුමියට වැටහෙනවා නේද? කරුණාකර දැන් මෙම උද්‍යානයෙන් පිටව යන ලෙස ඉල්ලා සිටිනවා. මේ දරුවා සෙල්ලම් කරමින් ඉන්න තැනට ඔබ හපා කන බල්ලෙකු ගෙනැවිත් තිබෙනවා. මෙහි සෙල්ලම් කරන්න පුළුවන්. ඒත් හපා කෑම් බැහැ." ඔහු බල්ලාගේ හිමිකාරියට කරුණු පැහැදිලි කර දුන්නේය.

"කොහොම වුණාත් පොඩි ළමයා.... නුඹ සෙල්ලම් කරද්දි කල්පනාවෙන් සෙල්ලම් කරන්න දැන ගන්න ඕනෑ. කාත් එක්කද සෙල්ලම් කරන්නේ කියලා කල්පනා නොකර සෙල්ලමට ගියහ ම ඔහොම දේවල් සිදු වීම සාමාන්‍යයි. බල්ලා දන්නේ නැහැනේ ඔයා මේ එන්නේ ඌව හීලෑ කරන්න කියලා. බාගවිට ඌ හිතන්න ඇති ඔයා නං එන්නේ ඌ ව හපන්න ම තමයි කියලා" ඔහු මාගේ මුහුණට එබී පවසන්නට වූ විට හොර පූසෙකු සේ බිම බලා ගෙන සිටියෙමි.

"තේරුණාද?"

"ඔව්... තේරුණා" අවසානයේ දී ඔහු කී දේ වැටහුණු බව පැවසීමි.

එයින් අනතුරුව මගේ, 'සිංහ පුහුණුකරු සිහිනය' තවදුරටත් ඉතිරි නොවී, ගිය අතක් සොයා ගත නොහැකි ලෙස සැඟ වී ගියේය.

පෙර ආරක්ෂාව පිණිස මා හට ලබා දුන් එන්නත් ප්‍රමාණය අනුව, මා තෝරාගෙන තිබුණේ කිසිසේත් ම ලේසි පාසු රැකියාවක් නොවන බව ප්‍රත්‍යක්ෂයෙන් ම වටහා ගතිමි. එන්නත් ලබා ගැනීම සඳහා දොස්තර මහතා හමුවන්නට ගිය අවස්ථාවෙදී, විශාල බල්ලෙකුගේ ඇහිබැම් හැඩ කරන්නට ගොස්, එම බලු රාජයා ලවා තම කම්මුල් දෙකෙහි ම හිල් විදගෙන පැමිණි ළමයෙකු හඳුනා ගන්නට මා

හට හැකි විය. ඉදින්, බල්ලන් සමඟ කටයුතු කිරීමේ රඟ අපි දෙදෙනා සාකච්ඡා කර මැනවින් වටහා ගතිමු. ඔහුටත් මට සේම එන්නත් පෝලිමක් ලබා දීමට තරම් දොස්තර මහතා කාරුණික විය.

ඉතිං මගේ හොඳ දුවේ... තිරිසන් සතුන් සමඟ කටයුතු කිරීමේ ආදීනව, නුඹේ පියා වන මම ඉහත කී සිද්ධියෙන් අනතුරුව හොඳ හැටියෙන් වටහා ගතිමි. ඇත්ත වශයෙන් ම සර්කස්කරුවන් සතුන් හීලෑ කරනුයේ ඔවුන්ගේ ඇස් දෙස බලා සිටීමෙන් ම පමණක් යන්න ගප් බින්නයක් බව පසු කලෙක මා හට අවබෝධ විය.

කවි ද ලිව්වයි මෙ මා රාළේ



නුඹ දන්නවාද මගේ දුවේ?...

මා බොහොම කුඩා දරුවකු ව සිටි අවධියේ මගේ ප්‍රියතම විනෝදාංශය වූයේ පොත් පත් කියැවීමයි. යන්තම් වයස අවුරුදු හතර වෙද්දී ම කියැවීම හුරුවීමෙන් පසුව, උදේ පටන් රෑ වනතුරු පොත් කියවනවා හැර වෙන යමක් ගැන මා හට සිතා ගැනීමටවත් නොහැකි වූ තරම්ය. අසල්වාසී අනෙකුත් ළමයින් නිරතුරු සෙල්ලමින් කාලය ගත කරන අතරතුරේ මම පොතක් බදාගෙන සිටියෙමි. කාලයක් ගතවන

විට මගේ අම්මාත් තාත්තාත් මේ ගැන කල්පනා කරන්නට වූහ. මගේ පොත් කියැවීම හුදෙක් පොතක් කියවීමක් නොව, එකක් ඉවරවන විට තවෙකක් වශයෙන් පොතක් බදා ගැනීමට ඇබ්බැහි වීමක් බව දුටු ඔවුහු ඉමහත් සේ කලබලයටත් කණගාටුවටත් පත් වූහ. මෙලෙස පොතට ම එබී සිටීම මගේ දෙනෙතට අහිතකර ලෙස බලපානු ඇති බව ඔවුන්ගේ අදහස විය.

ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි මා හට අලුතින් පොත් ලබා දීම අත්හිටුවන ලදී. එපමණක් නොව දිනකට පැය තුනකට වඩා පොත් කියැවීමට කාලය යෙදවීම තහනම් කරන ලදී. නමුදු පලක්වූයේ නැත. උදේ පටන් රෑ වනතුරු කෙරුණු මගේ පොත කියැවීම වැළැක්වීමට මේ කිසිදු තහනමකට නොහැකි විය. අවසර ලද පැය තුනෙහි සැමට පෙනෙන තැනක සිට නිදහසේ පොත් කියවන මා නිවස තුළ සුපුරුදු දසුනක් වුවද, නියමිත කාලය අවසන් වන තත්පරයේදී ම සැඟවී නොපෙනී ගියේ කිසිවෙකුට සොයා ගැනීමට නොහැකි වන පරිදිය.

දිනෙක ඇඳ යටට බඩ ගාමි.

තවත් දිනෙක වහලය මත වූ අට්ටාලය මතට නැග ගනිමි.

අනෙක් දිනෙක පිදුරු මඩුව තුළ සැඟවෙන්නෙමි.

මේ කොයි තැනටත් මා සමඟ ඉතාම රසවත් පොතක්ද ගිය බව නොකිවමනාය. සැඟවෙන ස්ථානවලින් වඩාම මගේ සිත් ගත් ස්ථානය වූයේ පිදුරු මඩුවයි. නැවුම් පිදුරු මතින් නැගෙන සුවඳේ ගැළෙමින් පොත් කියැවීම හරිම අපූරු දෙයක්!

නිවසේ ඇඳන් පෙරළෙමින් මා සොයන පිරිසේ ෂෝෂාව නෑසූ කන්ව පොතේ එල්ලී කාලය ගත කරන මම නැවත නිවස තුළ පෙනී සිටින්නේ හරියට ම රාත්‍රී ආහාර වේලාව ළං වූ විටය. දුටු මොහොතේ ම අම්මාගෙන් සහ තාත්තාගෙන් බැණුම් සමඟින් දඬුවම් ද ලබන මට කළ හැකිව තිබුණේ විගස ආහාර ගෙන ඇඳ වෙත දිව යෑම පමණි.

රෑ මැද අවදි වන මම විදුලි එළි දල්වාගෙන නැවත පොතක් පෙරළා ගනිමි. මා කියවූ පොත් අතරින් වඩාත් මගේ සිත් ගත් පොත් ලෙස, ගලිවර්ගේ චාරිකා, රුසියානු සුරංගන කතා, එක්දහස් එක් රැය සහ රොබින්සන් කෲසෝ මාගේ මතකයේ රැඳී තිබේ. මේ ලෝකය ඉතාමත් අලංකාර පොත්වලින් පිරී පවතින බව මම විශ්වාස කළෙමි. ඒ හැම පොතක් ම එකක් නෑර කියවා අවසන් කිරීම මගේ අභිප්‍රාය විය. ඉඳින්, දිවා රෑ නොබලා කියවා මිස ඒ කාර්යය සපුරා ගත නොහැකි බව වටහා ගත් මා එලෙස කටයුතු කිරීම වරදක්ද?

රෑ මැදියමේ පොත් කියවන විට කාලය ගතවනු නොදැනේ. මේ බව දැනගත් විගස අම්මා පැමිණ පොත උදුරාගෙන විදුලි එළිය නිවා දමා යන්නීය. මද වේලාවක් නිසොල්මනේ සිටින මම නැවත විදුලි එළිය දල්වා, අම්මා උදුරාගෙන ගිය පොත සේම රසවත් වෙනත් පොතක් අතට ගනිමි.

ඊට පසු එන්නේ තාත්තාය. ඔහු වේගයෙන් පැමිණ පොත උදුරාගෙන, විදුලි එළිය නිවා දමා, මගේ පස්ස පැත්තට පහරක් ද ගසා පිටව යන්නේ ය. එවන් පහර වලින් මට කිසිම දිනෙක රිදුණේ නැත. ඇත්තට ම එවන් සිදු වීම් වලින් මගේ සිත රිදුණු තරම් ගුටියකින් මට කිසිම දිනෙක රිදුණේ නැත.

මේ හැම සිදුවීමක ම අවසාන පලය කණගාටුදායක දෙයක් විය. මුලින්ම සිදු වූ දෙය නම් මගේ ඇස් පෙනීම දුර්වල වීමයි. අම්මාගේත් තාත්තාගේත් විරෝධතාව නිසා මා සැගවී පොත් කියවූ තැන් වූ ඇඳ යටත්, අට්ටාලයත්, පිදුරු මඩුවත් මද එළියෙන් ආලෝකමත් වූ තැන් විය. මේ සියලුම තැන්වලට අමතර ව, කළ හැකි දෙයක් නොමැති ම වූ අවස්ථා වලදී පෙරවනය තුළ රිංගා ගෙන පොත් කියැවීමි. එහිදී ඉතාමත් කුඩා සිදුරකින් පමණක් ලද ආලෝකය පොත් කියැවීමට තබා දෙයක් හඳුනා ගැනීමට තරම්වත් ප්‍රමාණවත් නොවීය. දුර්වල ආලෝක තත්ත්ව යටතේ පොත් පත් කියැවීම යනු, දෙනෙත් දුර්වල වීමට ප්‍රධාන වශයෙන් බලපාන්නක් බව එකල මම නොදැන සිටියෙමි. අවසානයේ

වුයේ මා හට උපැස් යුවලක් පැළඳීමට සිදුවීමයි. සමහරවිට මෙම සිදුවීමෙන් මගේ පොත් කියැවීමේ රුචිකත්වයට යම් පසුබෑමක් ඇතිවන්නට ඇත.

එයින් අනතුරුව කලක් ගතවන විට මම හිටිවන කවි නිමවන්නට පටන් ගතිමි.

පූසෙකු දුටු විට,

මං ආසා,
මේ පූසා !

බල්ලෙකු දුටු විට,

මමයි අල්ලා,
ගත්තේ මේ බල්ලා

කුකුළෙකු දුටු විට,

කුක්කු කූක් කූක්
කොහොමද ඔබේ සැපදුක්

ඒ විතරක් නොවේ තාත්තා දුටු විට,

අනේ තාත්තේ ප්ලීස්,
දෙනවද මට චීස් !

ඔවැනි ලෙස විවිධාකාර පදවැල් ගෙතීම මදින් මද මට හුරුවන්නට විය. ඒවා ඉතාමත් අනර්ඝ නිමැවුම් සේ සිතා මගේ දෙමව්පියෝ ඉමහත් සේ සතුටට පත් වූහ. කොතරම් අමන්දානන්දයට පත් වූවාද කියතොත් මා කියූ කවි පද පොතක ලියා තබන්නට ඔවුහු

කටයුතු කළෝය. මිතුරු සමාගම්හිදී එම කවිපද සිය මිතුරු මිතුරියන් හමුවේ ඉදිරිපත් කිරීම ඔවුන්ට මහත් සතුටක් ගෙන දුන් අතර පිරිසෙන් ඇතමෙකු ඒවා තමන්ගේ සටහන් පොතක සටහන් කරගත් අවස්ථා විරල නොවීය. එම අවධියේ යම් තැනක වැඩිහිටි මිතුරු සමාගමක් වීද, එතැන මාගේ දෙමව්පියන් වීද, ඔවුන් සමඟින් මා වීද, එසේ නම් සැමවිටම එයින් කෙනෙක්, "මොකද හිතන්නේ පුංචි හාදයා? හිතෙන්නේ නැද්ද අපි වෙනුවෙන් ඔයාගේ කවියක් ගායනා කරන්න?" යැයි අසන්නේය.

ඉදින් මමද නොපමාව මගේ හැකියාව දක්වමි. වාස්කා නම් වූ පූසා ගැන කියූ කව මේ ආකාර ගති.

වාස්කා නම් වූ පූසා - නැත කිසිම දෙයකට ආසා

වැඩිහිටි සැමදෙන සිනා සෙන්නට වූහ. ඔවුන් සිනා පෑවද එම කවිපද කිසිම කමකට නැති ඒවා බවත්, ඕනෑ ම කෙනෙකුට එවැනි වූ වැදගැම්මකට නැති පදවැල් කිව හැකි බවත් සිතූ බව පසු කලෙක මා හට වැටහුණි. නමුදු එකල මම, මා බොහොම බුද්ධිමත් කෙනෙකු යැයි සිතා සිටියෙමි. එලෙස ම වැඩිහිටි සැම මගේ කවි අසා සිනා නගන්නේ, ඔවුන්ද මගේ බුද්ධිමත් බව අගය කරන නිසා යැයි සිතා සිටියෙමි. ඇත්ත වශයෙන් ම කියතොත් අග්‍රගණ්‍ය කවියෙකු ලෙස මා ගැන සිතා ගෙන සිටියෙමි. සෑම උපන්දින සාදයකදී ම, කේක් කැපීමට පෙරත් පසුවත් මගේ කවි ගායනා ව සිදු වුණි. ඔය අතරේ මගේ ලීසා නැන්දනියගේ විවාහ මංගල උත්සවය යෙදුණු අතර එහිදී ද හිටිවන කවියක් ගායනා කරන ලෙස ඉල්ලීම් කෙරිණ. එදින නම් මටවත් මගේ කවියටවත් එතරම් සුබ වූයේ නැත. ඇත්ත වශයෙන් ම එය ඉතාමත් භයානක කවියක් වූ බව එය ගායනා කරන අවස්ථාවේදී මට නොවැටහිණ.

කාටවත් හිතාගන්නවත් පුළුවන්ද මන්දා
මනාලියක් වෙලානෙ අද ලීසා නැන්දා

ආරාධිතයන්ගෙන් ඇතැමෙකු සිනා නැගුවද, ඇතමෙකු අසීරුවෙන් සිනාව සිරකරගෙන සිටින්නට විය. ඒ අතරේ ලීසා නැන්දා ඇයගේ කාමරය වෙත අඬාගෙන දිව ගියාය. මනාලයා අන්දමන්දව, අඬන්න ඔන්න මෙන්න මෙන් බලා සිටියේය.

එම සිදුවීම නිසා මා හට දඬුවම් නියම නොවුණේ, එය මා මගේ නැන්දනියගේ සිත රිදවීම සඳහා හිතා මතා ම කරන ලද්දක් නොවීම නිසාය. කෙසේ වුවද, එයින් පසු ව සමහර වැඩිහිටියන් පෙර පරිදි මගේ කවි ඇසීමට රුචිකත්වයක් නොදක්වන බව මදින් මද හා හට වැටහෙන්නට විය. එයින් කෙනෙක් සිය නොරිස්සීම ප්‍රකාශ කරනු ද මට ඇසෙන්නට විය.

"මං හරි කැමතියි අර අමුතු ළමයා එයාගේ විකාර කවියක් මෙතැන නොකියනවා නං"

මම අම්මා වෙත දිව ගියෙමි. "අම්මේ, අසාමාන්‍ය ළමයා කියන්නේ මොකද්ද?" මම ඇසීමි.

"ඒකේ තේරුම අනිත් අයට වඩා වෙනස් ළමයෙක් කියන එක" අම්මා කීවාය.

"අනිත් අයට වඩා වෙනස් කියන්නේ, මොන විදිහට වෙනස් කියන එකද?" මම තවදුරටත් ඇසීමි.

"අපි මෙහෙම කියමු. එයාට පුළුවන් අනිත් ගොඩක් අයට බැරි දේවල්. වයලීනයක් වැයීම වගේ දෙයක්, එහෙමත් නැත්නම් එයා හොඳ මළල ක්‍රීඩකයෙක් වෙන්න පුළුවන්. එයා සමහරවිට නොයෙකුත් ප්‍රශ්න මහ ගොඩක් අහලා එයාගේ අම්මා ව වෙහෙසට පත් කරන කෙනෙක් නොවෙන්නත් පුළුවන්" මා ප්‍රශ්න ඇසුවා වැඩිදැයි සිතුණද, තවත් එක් ප්‍රශ්නයක් ඇසිය යුතුව තිබිණ.

"ඉතිං ඒ අමුතු ළමයා ලොකු වුණාහම එයා මොන වගේ වෙයිද අම්මේ?"

"කිසිම අමුතු දෙයක් වෙන එකක් නැහැ මට හිතෙන්නේ. එයා බොහොම සාමාන්‍ය පුද්ගලයෙක් වෙයි" අම්මා පැවසුවාය.

"ස්තුතියි අම්මේ. මට දැන් තේරුණා."යැයි පැවසූ මම අම්මා වෙතින් ඉවතට ගියෙමි.

ඉන්පසු එළඹුණු උපන්දින සාදයේදී මගේ කවි ගායනා ඉදිරිපත් නොකිරීමට තීරණය කළෙමි. කෙනෙකු ඒ සඳහා ඉල්ලීමක් කළද මා හට හිසරදයක් ඇති බව පවසා මග හැර සිටියෙමි. එයින් අනතුරුව බොහෝ කාලයක් ගතවනතුරු කිසිම කවියක් මා අතින් ලියැවුණේ නැති තරම්ය. දැන් පවා කෙනෙකු උපන්දින සාදයකදී කවියක් ගයන ලෙස ඉල්ලුවහොත් මා හට විගස හිසරදයක් වැළඳීම වැළැක්විය නොහැකිය.

මහා ඇදුරෙකු සැපූ වේලේ

ඔබට වාගේම මටත් පුංචි කාලේ ලෙඩ වලින් අඩුවක් තිබුණේ නැහැ දුවේ...

මම බොහොම කුඩා දරුවකු ව උන් අවධියේ නිරතුරුව ම වාගේ සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළෙන්නට වීමි. කිවිසුම් යෑම හා කැස්ස නිරතුරු මා හට වද දෙන්නට වූ අතර සමහර දිනෙක තදබල ලෙස සෙම්ගෙඩි වලින් පීඩා විඳිමි. සෙම්ප්‍රතිශ්‍යාව උග්‍ර අතට හැරී, තවත් දිනෙක උග්‍ර කන් කැක්කුමකින් වේදනා විඳින්නට ද මා හට සිදුවිය.

අවසානයේ දී මාගේ දෙමව්පියන් විසින් තීරණය කරන්නට යෙදුනේ උගුර, කන හා නාසය පිළිබඳ ව කටයුතු කරන වෛද්‍යවරයකු හට මා පෙන්වීමටයි. ඒ අනුව දිනෙක අපි තිදෙන ඒ සඳහා පිටත් ව ගියෙමු.

"උගුර, කන හා නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍ය" එම ස්ථානයේ පිටත බිත්තියේ සටහන් කොට තිබුණි.

"ඒ එයාගේ නමද අම්මේ?" මම ඇසීමි.

"නැහැ. ඒවාට තමයි මේ දොස්තර මහත්මයා බෙහෙත් කරන්නේ. කරුණාකරලා පුතේ, සද්ද නැතිව හිටියොත් හොඳයි!"

ඉදින් දොස්තර මහතා මා පරීක්ෂා කරන්නට වූයේය. මුලින් මගේ කන්, පසුව නාසය හා අනතුරුව උගුර පරීක්ෂා කළ එතුමාගේ තීරණය වූයේ නොපමාව මා ශල්‍යකර්මයකට භාජනය කළයුතු බවයි. මාගේ ඇඩිනොයිඩ් ග්‍රන්ථිය ඉවත් කළ යුතුව තිබිණ. අනතුරුව මාගේ දෙමව්පියන් විසින් මා, වඩා විශාල වූ සායනයක් කරා ගෙන යන ලදී.

සුදු හිස කෙසින් සම්පූර්ණයෙන් ම වාගේ හිස වැසී ගිය ඉතාමත් වයස්ගත නමුදු දැඩි පෙනුමක් තිබුණු මහාචාර්යවරයෙකු එම සායනයේ විය.

"කට අරින්න!" අණ ලැබිණ. ඉදින් මම කට ඇරීමි. මීට පෙර හමු වූ සියලුම වෛද්‍යවරුන් ඔවුන් පවසන දේ කළ පසු "ස්තූතියි" යැයි පැවසුවද, මහාචාර්යතුමාගේ මුවින් එවදන් පිට නොවිණ. මා කට ඇරි විගස ම ඔහු ඔහුගේ අති විශාල අත මගේ කටට ඔබා එහෙට මෙහෙට ඔබන්නට වූයේය. එය ඉතාමත් වේදනාකාරී හා අප්‍රසන්න ක්‍රියාවක් වූ බව නොකිවමනාය. මට ඉවසාගෙන සිටීමට නොහැකි වූ තරම්ය.

මද වේලාවක් මගේ කට තුළ සිය අත කරකවමින් සිටි මහාචාර්යතුමා, තමන් සෙවූ දෙය හමු වූ බව හඟවමින්, "ආ මෙන්න තියෙනවා" යි පවසමින් පෙරටත් වඩා තදින් මගේ කටට අත ඔබා තද කළේය. එවිගසම, "බුදු අම්මෝ....... මගේ අත"යි කෑ ගසමින් සිය අත ඉවතට ඇද ගත්තේය. මටත් නොදැනීම මගේ දත් දෙපෙළ ඔහු ගේ අත සපා තිබුණි. ඔහුගේ මහපට ඇඟිල්ල හිල් වී ලේ ගලමින් තිබුණු අතර මෙම සිදුවීමත් සමග ම හාත්පස සිසාරා පැතිර ගියේ දැඩි නිහඬතාවකි.

"අයඩීන්!" මහචාර්යයවරයා මොර දුන්නේය.

එසැණින්, කෙනෙකු ඔහු අත අයඩීන් තැබීය. එයින් බිඳක් පුළුන් කැබැල්ලක තැවරූ ඔහු, එය මොහොතකට පෙර බේදවාචකයකට හසු වූ මහපට ඇඟිල්ල මත තැවරුවේය.

"පැළැස්තරයක් ගේන්න!"

එයද, ඉල්ලූ සැණින් ලදින්, ඔහු අනිත් අතින් එය වහ වහා ඇඟිල්ල වටා ඔතා ගත්තේය.

අනතුරුව ඔහු අප දෙසට හැරුණේය. ඉතාමත් සිහින් හඬින් ඇමතූ ඔහු මෙලෙසින් පැවසුවේය.

"මගේ මේ රස්සාවට අවුරුදු හතළිහක් වෙනවා. ඒ මුළු කාලෙට ම අද තමයි මෙහෙම දෙයක් වුණේ. කරුණාකරලා වෙන කෙනෙක් හොයාගන්න මේ වැඩේට. මම අත පිහදාගෙන අයින් වෙනවා"

එසේ පැවසූ ඔහු අනතුරුව සබන් යොදා ජලයෙන් අත සෝදා, පිහදාගෙන ඉවතට ගියේය.

මගේ පියා තදබල ලෙස කෝපයට පත් වුණේය.

"අපි ඔයාව ගෙනාවේ ප්‍රසිද්ධ මහාචාර්යවරයෙකු ළඟට! එයාට ඕනෑ වුණේ ඔයාට හොඳක් කරන්න! ඔය මොකද්ද මේ කළේ? අර පැත්තේ තියෙනවා පරිවාස කඳවුරක්, දොස්තරලා ව හපන ළමයින් ව ගිහින් දමන. ආයෙ එහෙම මෙහෙම දෙයක් කළොත් ඔයාටත් යන්න වෙන්නෙ එහෙට තමයි" මා පියා මා හට තර්ජනය කළේය.

"ඔයා මේ සැත්කම හරියට කරන්න දුන්නොත්, ඊට පස්සේ මං ඔයාට අයිස් ක්‍රීම් එකක් අරං දෙන බවට පොරොන්දු වෙනවා" අනතුරුව ඔහු පැවසුවේය.

'අයිස්ක්‍රීම්!' එවදන ඇසුණු සැණින් මම කල්පනා කරන්නට වීමි. ඒ වන විට මට මතක ඇති දාක අයිස් ක්‍රීම් ලැබී තිබුණේ නැත. එයට හේතු වූයේ, මගේ රෝගී ස්වභාවයයි. අම්මාත් තාත්තාත් සැමවිට ම කල්පනා කෙරුවේ, අයිස් ක්‍රීම් අනුභවයෙන් මගේ රෝගී තත්ත්වය උත්සන්න විය හැකි බවකි. නමුදු මේ කියන දිනවල, මෙවන් සැත්කමකට පසු ව ළමයින් හට අයිස් ක්‍රීම් ලබා දෙන සිරිතක් ජනයා වෙත තිබිණි. එයට හේතුව අයිස් ක්‍රීම් නිසා රුධිර ගලනය වඩා ඉක්මනින් නවතින බැවිණි.

ඉදින් මේ අයිස් ක්‍රීම් ගැන කල්පනාව නිසා නැවත කිසිවෙකු නොහපන බවට මම මගේ තාත්තාට පොරොන්දු වීමි.

මේ අතර, වයස්ගත මහාචාර්යවරයා ආඩම්බර ලීලාවෙන් පිටව ගිය පසු පැමිණි තරුණ වෛද්‍යවරයා සැත්කම සඳහා සූදානම් විය.

"පුතා, මතක තියා ගන්න. ඔයා පොරොන්දු වුණා" ඔහු එය අරඹන්නට ප්‍රථම මට සිහි කර දුන්නේය.

"මම හපන්නේ නැහැ" මම නැවතත් ස්ථිර ලෙසින් පවසා සිටිමි.

සැත්කම සාර්ථක ලෙස නිමවිය.

"ඔයා හොඳ දරුවෙක්නේ. මට හොඳ සහයෝගයක් දුන්නානෙ වැඩේ කරන්න. දැන් ඔයාට අයිස් ක්‍රීම් එකක් ලැබෙයි නේද? ඔයා කැමති ම රස මොකද්ද?" වෛද්‍යවරයා අසා සිටියේය.

"වැනිලා"යි පැවසූ මම මගේ තාත්තා දෙස බැලිමි. නමුදු තාත්තා ඒ වන විටත් මා කෙරෙහි කෝපයෙන් පසු වූ බව වටහා ගන්නට මා හට අපහසු නොවිණි.

"මේ සැරේ නෙමෙයි. ඊළඟ සැරේ. ඔයා තැනක හැසිරෙන විදිහ ඉගෙන ගෙන මේ විදිහට නොහපා ඉන්න ඉගෙන ගත්ත දාට ඔයාට අයිස් ක්‍රීම් ලැබෙයි" මගේ තාත්තා විසින් ස්ථිර හඬින් පවසා සිටියේ මගේ හිත දුකින් පුරවමිනි.

ඉමහත් ආශාවෙන් බලාපොරොත්තුවෙන් සිටි අයිස් ක්‍රීම් එදින නොලැබෙන බව හොඳින්ම වැටහුණු විට මට මගේ කඳුළු නවතා ගන්නට නොහැකි විය. මම දුකින් කඳුළු සලා හැඬිමි. අවට සිටි හැමදෙන මා කෙරේ අනුකම්පාවෙන් දුකට පත් වුවද මගේ පියා පමණක් ඔහුගේ ස්ථාවරය වෙනස් නොකර දැඩි ලෙසින් සිටියේය.

පසු කාලීනවත් ඒ දිනය සිහිවන විට මගේ හිතට දුකක් දැනුණි. එදින සිදු වූයේ බලවත් අසාධාරණයක් බව අදටත් සිතේ. අද වන විට නොයෙකුත් වර්ගයේ, නොයෙකුත් රසැති -වැනිලා, චොකලට් සහ ස්ට්‍රෝබෙරි ආදී වූ- අයිස්ක්‍රීම් විශාල ප්‍රමාණයක් මා හට ලැබී තිබුණද, එදා, මා යමක් පොරොන්දු වීම නිසා මට ලබා දෙන බවට පොරොන්දු වූ, එනමුදු මා මගේ පොරොන්දුව ඉෂ්ට කළද, මට නොලැබී ගිය ඒ අයිස් ක්‍රීමය මට කිසිදා අමතක නොවේ.

කෙසේ නමුදු එදින කරන්නට යෙදුණු සැත්කමින් අනතුරුව පෙර පරිදි නිරතුරු ඇති වන රෝගී ස්වභාවය මා කෙරෙන් තුරන් විය.

කිවිසුම් යෑමත්, කැස්සත්, උගුර කැක්කුම හා කන් කැක්කුම ආදී වූ සියලුම රෝග ඉඳහිට මිස නිරතුරු ඇති නොවීය.

ඉදින් එම සැත්කම මා හට ඉමහත් සැනසීමක් ගෙන ආ බව පැවසිය යුතුය. එයින් මා වටහා ගත්තේ වඩා හොඳ දෙයක් ලබා ගැනීමට අපට යම් පමණකට අපහසුතාවන්ට මුහුණ දෙන්නට සිදුවණ බවය. එයින් අනතුරුවත් විවිධ අවස්ථාවන් වලදී, විවිධ වෛද්‍යවරුන් සිදුකළ සැත්කම් වලට මුහුණ දීමට මා හට සිදු වුණද, එයින් එක් අයෙකු හෝ මා විසින් නොහැප්පූ බව පැවසිය යුතුය. ඔවුන් ඒ සියල්ල කළේ මගේ යහපතට බව මම වටහාගෙන සිටියෙමි. එහෙත් මගේ දුවේ, අදත් මා වෛද්‍යවරයෙකු මුණ ගැසීමට ගියහොත් එන ගමනේ අයිස් ක්‍රීමයක් ගෙන රස බලන්නට අමතක නොකරන්නේ අදටත් මගේ අයිස් ක්‍රීම් ආශාව නොසන්සිඳී පවතින නිසාය.

රස්සාවක් තෝරුවයි රාළේ

දැන් ඔයාගෙන් වගේ ම මං පුංචි කාලෙත් නොයෙක් විට නොයෙක් දෙනා ඇසූ එකම ප්‍රශ්නයක් තිබිණි.

"ඔයා ලොකු වුණාහම කවුරු කෙනෙක් ද වෙන්නේ?" මා සතුව හැමවිටම ඒ සඳහා පිළිතුරක් දිව අග තිබිණ. නමුදු එය සැමවිට ම එකම පිළිතුර නම් නොවීය.

ප්‍රථමයෙන් මා හට අවැසි වූයේ රාත්‍රී මුරකරුවෙකු වීමටයි. එය අපූරු සිතුවිල්ලක් විය. මුළු නගරයම සුව නින්දේය. මා පමණක් අවදියෙන්! නගරය ගැන විමසිල්ලෙන් මා පමණක් අවදියෙන්! කෙතරම් අගනා රැකියාවක්ද? ඒ පිළිබඳ ව දින ගණන්, අවදියෙන් සිටිමින් සිහින දකින්නට මා හට හැකි විය.

මගේ රාත්‍රී මුරකරු සිහිනය පසෙකට විසි කර දමමින්, බැබලෙන හරිත වර්ණ කරත්තයක් තල්ලු කරගෙන, අයිස් ක්‍රීම් වෙළෙන්දෙක් පැමිණියේය. ඇයි මා අයිස් ක්‍රීම් වෙළෙන්දෙකු නොවන්නේ? වනවා නම් විය යුත්තේ අයිස් ක්‍රීම් වෙළෙන්දෙක්මය. කරත්තය තල්ලු කරගෙන, ගම් නගර සිසාරා යන ගමනේ මා හට අවැසි ඕනෑම වර්ගයක අයිස් ක්‍රීමයක රස බැලීමට කාගෙන් නම් තහනමක්ද? එකල මට සිතුණේ එලෙසිනි.

"අයිස් ක්‍රීම් එකක් විකිණූ සැම විට ම මමත් එකක් කනවා" මම එලෙසින් සිතිමි. " හැම පුංචි ළමයාට ම නොමිලේ අයිස් ක්‍රීම් දෙනවා. පව්නේ පුංචි ළමයි!"

තමන්ගේ පුතණුවන් අයිස් ක්‍රීම් වෙළෙන්දෙකු වන්නට යන වග ඇසූ මගේ දෙමව්පියෝ ඉමහත් පුදුමයට පත් වූහ. එය ඉතාමත් හාස්‍යජනක දෙයක් ලෙසින් ගත් ඔව්හු සිහි වන හැම විටම සිනහ පහළ කරන්නට වූහ. නමුදු මා සිතුවේ, රසවත් ලෙසින් වැඩෙන්නට හොඳ ම විදිහ අයිස් ක්‍රීම් වෙළෙන්දෙකු වීම බවයි.

දිනක් අම්මා සමගින් ගමනක් යන විට මට අමුතු ආකාරයේ මිනිසෙකු දුම්රිය ස්ථානයේදී දකින්නට ලැබිණ. ඔහු මුළු ඇඟම වැසෙන පරිදි අඳිනා, 'ඕවරෝල්' වර්ගයේ ඇඳුමක් ඇඳ සිටි අතර දුම්රිය ගැල් හා දුම්රිය මැදිරි හා සෙල්ලම් කරමින් සිටියේය. ඒවා එකල මා සතු ව තිබූ පරිදි සෙල්ලම් බඩු නොවීය. සැබෑම ගැල් සහ මැදිරි විය! විටෙක දුම්රිය වේදිකාවට පැන්න ඔහු, තවත් විටෙක ගැලක් හෝ මැදිරියක් යටින් බඩ ගා යන්නට විය. එය ඇත්ත වශයෙන් ම අමුතු හා අතිශයින් විනෝදජනක ක්‍රීඩාවක් විය.

"කවුද අම්මේ අර මනුස්සයා?" මම ඇසීමි.

"දුම්රිය පීලි මාරු කරන්නෙක්"

එවෙලෙහිම මා වටහා ගත්තේ මා යම් දිනෙක යම් කෙනෙක් වනවා නම් ඒ දුම්රිය පීලි මාරු කරන්නෙක් ම බවයි. නිකමට මෙන් සිතා බලන්න! ඔහු අච්චර අතිවිශාල දුම්රිය මැදිරි හා ගැල්වල පීලි මාරු කරනවා! එයිටත් වඩා විනෝදජනක දෙයක් ලෝකේ තියෙන්න පුළුවන්ද? නැත. කොහෙත් ම නැත.

දිනක් කෙනෙකු හා, මා යම් දවසක දුම්රිය පීලි මාරු කරන්නෙකු වන වග පැවසූ විට ඔහු එක්වනම මෙලෙස අසා සිටියේය.

"ඔහ්.... හොඳයි. බොහොම හොඳයි. ඒත් මොකද වුණේ අයිස් ක්‍රීම් වෙළඳාමට?"

එය නම් ඇත්ත වශයෙන් ම විශාල ගැටළුවක් විය. දුම්රිය පීලි මාරු කරන්නෙකු වන්නට ඒ වනවිටත් මා විසින් තීරණය කර තිබුණත්, හරිත වර්ණ බැබලෙන කරත්තයක් තල්ලු කරගෙන අයිස් ක්‍රීම් විකුණන්නට යෑම අත් හරින්නට ද කැමැත්තක් මසිතේ නොවිය. අවසානයේ එම ප්‍රශ්නයට කදිම විසඳුමක් සොයා ගන්නට මා හට හැකි විය. ඉඳින් පිළිතුර සරළ විය.

"මම දුම්රිය පීලි මාරු කරන්නෙකුයි, අයිස් ක්‍රීම් වෙළෙන්දෙකුයි වෙනවා!"

මගේ පිළිතුර ඇසූ ඇසූ හැමදෙන පුදුමයට පත් වූහ. නමුදු ඇත්ත වශයෙන් ම එහි එතරම් පුදුමයට කාරණයක් නොමැති බව වටහා දෙමින්, මගේ පිළිතුර පහදන්නට මම ඉදිරිපත් වීමි.

"ඇත්තට ම ඒක එච්චර අමාරු වැඩක් නෙමෙයිනේ. ඔන්න මෙහෙමයි හරිද? ඔන්න මුලින් ම උදෙන් ම මම අයිස් ක්‍රීම් විකුණන්න යනවා. ඒ වැඩේ ඉවර වුණාට පස්සේ ඉස්ටේෂන් එකට යනවා. ඔය තියෙන කෝච්චියක් දෙකක් පීලි මාරු කරලා ඉවර වෙලා, ආයේ යනවා අයිස් ක්‍රීම් පොඩ්ඩක් විකුණන්න. ආයේ ඒ වැඩේ ඉවර වුණාට පස්සේ ආපහු ඉස්ටේෂන් එකට ගිහින් කෝච්චියක දෙකක පීලි මාරු කරලා

ඉවර වෙලා යනවා හවස් වරුවේ අයිස් ක්‍රීම් විකුණන්න. ඇත්තට ම ඒක එච්චර අමාරු වැඩක් වෙන්නේ නැහැ, මොකද මං මගේ අයිස් ක්‍රීම් කරත්තේ නවත්තන්නේ ස්ටේෂන් එකට ළඟ පාතින්. ඉතිං මට එච්චර දුර නිකරුණේ ඇවිදින්න වෙන්නේ නැහැනේ"

අසා සිටි හැම දෙන සතුටට පත් වී දෝ ඉතාමත් අලංකාර ලෙසින් මහ සිනහවකින් මා හට සංග්‍රහ කළෝය.

එහෙත් එයින් මගේ සිතේ කේන්තියක් පහළ විය.

"ඔන්න ඔන්න ඉතිං. ඔයාලා ඔය විදිහට හිනා වෙන්න තියා ගත්තොත් එහෙම මං, රෑ කාලේ කරන්න වෙන වැඩකුත් නැති එකේ රාත්‍රී මුරකරුවෙකුත් වෙනවා ඔන්න!"

එයින් අනතුරුව සියල්ල සන්සුන් ව කාලය ගතවිය. එහෙත් නැවතත් වරින් වර මගේ සිහිනය වෙනස් වීම නිසා ඒ සන්සුන් භාවය නැවත නැවතත් අතුරුදන්වන්නට විය. වරෙක මගේ අනාගත රැකියාව ලෙස මා විසින් තෝරා ගන්නා ලද්දේ ගුවන්යානා නියමුවකු වීම වූ අතර එය රංගන ශිල්පියෙකු දක්වා වෙනස් වීමට දින පහක්වත් ගත නොවූ බව මා හට මතකය.

මා පියා, මා රැගෙන කම්හලක් වෙත ගිය දිනයේ මගේ සිහින රැකියාව ලෙස ලියවන පට්ටලයක් ආරම්භ කිරීම වඩාත් ම සුදුසු බව මා හට වැටහී ගියේය. මේ මොන රැකියාව අතරතුර වුවද සේලරුවකු වශයෙන් ද කටයුතු කිරීම මගේ අභිප්‍රාය විය. එය අපහසු විණි නම් අඩුම තරමින් එඬේරකු වශයෙන් ක්‍රියා කරමින් දිග කසයකින් පහර දෙමින් ගවයන් දක්කාගෙන දිනය පුරා ගම වටා ඇවිදීමවත් කළ යුතුව තිබිණ.

මේ ආකාරයෙන් වරින් වර මගේ සිහින රැකියාව වෙනස් වන්නට විය. මා කවරෙකු විය යුතුද යන්න විචල්‍යයක් ම විය.

අවසානයේ, වඩාම සිත් ගන්නාසුලු පිළිතුර මා හට ලැබිණ. සියලු කාරණා අවසානයේ මා වටහා ගත්තේ මට ඇත්ත වශයෙන් ම අවශ්‍ය සහ සුදුසු ම වන්නේ බල්ලෙකු වීම බවයි. මෙය වටහා ගත් දිනයේ, මුළු දවස පුරාම අත් පා හතරින් බිම දිගේ වේගයෙන් එහා මෙහා පනිමින් ආගන්තුකයින්ට බුරා පැනීම මගේ එකම කටයුත්ත බවට පත්විය. මගේ හිසට තට්ටු කිරීමට උත්සාහ කළ වැඩිහිටි කාන්තාවක දෙසට පැන හපා කන්නට යෑමට පවා මගේ බලු රස්සාව මා පෙළඹවීය. ඉතාමත් අගනා ලෙස බිරීමට ඉගෙන ගැනීමට වැඩි කලක් නොගියද, අවාසනාවකට මෙන් කොතරම් මහන්සි වී උත්සාහ දැරුවද, පස්ස ගාතයක් ඔසවා කන පිටුපස කසා ගන්නට නම් මා හට කිසි ලෙසකින්වත් නොහැකි විය. නිවස තුළ සිට මෙවැන්නක් පුරුදු වීම අපහසු යැයි සිතූ මම ඊගාව පියවර ලෙස නිවසින් පිටතට ගොස් ආලින්දයේ සිට පස්ස ගාතයෙන් කන පිටු පස කසා ගන්නට වට ගණනාවක් එක තැන ම කැරකෙන්නට වීමි.

මේ අතරතුරේ පාර දිගේ ඇවිදගෙන ගිය මිනිසෙකු මේ අරුම පුදුම කැරකිල්ල කුමක්දැයි කියා විපරම් කරන්නට වූවා විය යුතුය. මා ඔහු දුටුවද, බල්ලකු වී සිටි නිසා ලැජ්ජාවක් නොදැනිණි. මද වේලාවක් මා දෙස බලා සිටි ඔහු එතැනින් යතැයි කියා සිතුවද, එසේ නොවිණ.

"ඈ ළමයෝ... මොකද්ද ඇත්තට ඔය කරන්න හදන්නේ?" කුතුහලය නොවිසඳුණු නිසාදෝ විමසා සිටින්නට විය.

"මේ මං නියම බල්ලෙක් වෙන්න යනවා"

"හ්ම්... එහෙමද? ඇයි ඔයාට ඕනෑ නැද්ද නියම කොල්ලෙක් වෙන්න?"

"හපෝ... මං ඇති තරං කාලයක් නියම කොල්ලෙක් වෙලා ඉඳලා තියෙනවානේ"

"මක් කිව්වා? ඇති තරම් කාලයක් නියම කොල්ලෙක් වෙලා හිටියා? නියම කොල්ලෙක් නං මේ ලෝකේ කරන්න බැරි වැඩක් නැහැ. අනේ ළමයෝ...... අඩුම ගානේ බල්ලෙක්වත් වෙන්න බැරිව දඟලන ඔයා මොන කොල්ලෙක්ද?.... අනෙක් අතට මනුස්සයෙක් වුණාහම බල්ලෙක් වෙනවාට වඩා කරන්න තව කොච්චරක්වත් වැඩ රාජකාරි නැද්ද හැබෑටම"

"හ්ම්.... දැන් අංකල් මට කවුරු කෙනෙක් වෙන්න කියලද කියන්නේ"

"මුලින් සේරටම කලියෙන් තමන් ව තේරුම් අරං ඉන්න. මනුස්සයෙක් වෙලා ඉපදීමේ වටිනාකම වටහාගෙන ඉන්න. හොඳ මනුස්සයෙක් වෙන්න. එතකොට ඔයාට ඉබේ ම තමන් විය යුතු කෙනා වැටහේවි" යැයි පැවසූ ඔහු යන්නට ගියේය.

ඔහු මගේ ක්‍රියාව සමච්චලයට ලක් නොකළා පමණක් නොව සුළු ලෙසකින්වත් සිනහ පහළ කළේ ද නැත. නුමුදු සංවාදය අවසන් කර එම මනුස්සයා පිටත් ව ගිය මොහොතේ මා කෙරෙහි ම ඇති වූ අති මහත් වූ ලජ්ජාවකින් පීඩාවට පත්වීමි. මම සිතන්නට වීමි. දිගින් දිගට ම සිතන්නට වීමි. සිතන්නට සිතන්නට තව තවත් ලජ්ජාව විසින් මා පෙළන්නට විය. එම මිනිසා මා හට කිසිවක් පැහැදිලි කළේ නැත. මා විය යුත්තේ කවුරුන්දැයි මා හට පැවසුවේ නැත. එහෙත් දිනෙන් දින සිහින රැකියාව වෙනස් කරමින් විකාර දේ සිතමින් සිටි මගේ සිතේ විසුළු ස්වභාවය මා හට පසක් විය. අනෙක් අතට සිහින රැකියාවක් තෝරා ගැනීමට තරම් වැඩුණු වයසකින් හෝ මනසකින් මා පසු නොවන වගද ඒ හා සමගම මට වැටහිණ. එයින් පසු එළඹුණු සමයේ කෙනෙකු මාගෙන් 'ලොකු වුණාහම කවුරුද වෙන්නේ?'යි ඇසූ සැණින්, විදියේ නැවතී මා හා කතා කළ පුද්ගලයා මගේ සිතට පිවිසිණ. එයින් අනතුරු ව මගේ පිළිතුර කවදාවත් වෙනස් නොවීය.

"මම හොඳ මනුස්සයෙක් වෙනවා"

කිසිවකු සිනහ පහළ කළේ නැත. එම ප්‍රශ්නයට ලොව තිබෙන සුදුසු ම පිළිතුර එය බව මම වටහා ගතිමි. අදටත් මාගේ සිතුවිල්ලේ වෙනසක් නැත. එයට වඩා යහපත් පිළිතුරක් තිබෙන්නට නොහැකිය. සැමට ම පෙර සෑම කෙනෙකු ම යහපත් පුද්ගලයෙකු වී සිටිය යුතුය. එයයි, මෙලොව උපන් සෑම මනුෂ්‍යයකුගේ ම අභිප්‍රාය විය යුතු වන්නේ. ඔහු ගුවන් නියමුවෙකුද, එඬේරෙකුද එසේත් නැත්නම් අයිස්ක්‍රීම් වෙළෙන්දෙකුද යන්නෙහි වටිනාකම තීරණය වනුයේ ද මනුෂ්‍යයකු වශයෙන් සමාජයේ ඔහුගේ හැසිරීම මුල් කරගෙනය. එසේ වූ සඳ මගේ දුවේ, කිසි දිනෙක මිනිසෙකුට තමන්ගේ පාදයෙන් තමන්ගේ කන පිටුපස කසා ගන්නට සිදුවන්නේ නැත.

පියානෝවේ මා නොදත් තාලේ



ඉන්නවාද මගේ දුවේ...

කුඩා අවධියේදී මගේ දෙමව්පියන් විසින් මා හට සෙල්ලම් භාණ්ඩ බොහෝ ප්‍රමාණයක් ගෙනැවිත් දුන් අතර පෙර සඳහන් කරන්නට යෙදුණු බෝලය ඇතුළුව බොහෝ දේවල් ඒ අතර තිබිණ. ඒවායින් සෙල්ලම් කරමින් පසුවන අතරේ එක්තරා ලස්සන දිනකදී මට අරුම පුදුම භාණ්ඩයක් ලැබුණි. නමුදු එය මා මුලින් සිතූ පරිද්දෙන් සෙල්ලම් බඩුවක් නොවීය. එය දිස්නේ දෙන කළුපාට මතුපිටකින් යුත් අගනා පියානෝවකි. එහි විශාලත්වය කෙතරම් ද යත්, අපගේ විසිත්ත කාමරයෙන් හරි අඩක ප්‍රමාණයක් පියානෝව වෙනුවෙන් වෙන්විණ.

"තාත්තේ, ඔයාට මේක වාදනය කරන්න පුළුවන්ද?" මම ඇසීමි.

"බැහැ" යන්න පිළිතුර විය.

"එහෙනං අම්මේ, ඔයාට පුළුවන්ද මේක වාදනය කරන්න?" අම්මාගෙන් ඇසීමි.

"බැහැ" පිළිතුර පෙර පරිදි ම විය.

"හැත්........... එහෙනං කවුද අනේ මේක වාදනය කරන්න යන්නේ?" අම්මාත් තාත්තාත් හැර වෙන කිසිවකු අප නිවසේ නොවූ නිසා, මට එය පුදුමයක් විය.

"වෙන කවුද ඉතිං... ඔයා තමයි!" එවර අම්මාත් තාත්තාත් එකවර පැවසූහ.

"ඉතිං අනේ, ඒත් අනේ, මාත් දන්නේ නැහැනේ මේක වාදනය කරන්න"

"ඒකට මක් වෙනවද? ඔයාට සංගීතය ගැන බොහොම ඉක්මනට ඉගෙන ගන්න ලැබෙනවා" තාත්තා පැවසුවේය.

"දන්නවද පුතේ ඔයාගේ සංගීත ගුරුතුමිය කවුද කියලා? ඇගේ නම ඇනා ඉවානොවිනා" අම්මා ඒ පිළිතුර සම්පූර්ණ කළාය.

මොහොතකින් මා හට වැටහී ගියේ, එවර මා ලබා තිබුණේ අනභිභවනීය ත්‍යාගයක් බවයි. එයට පෙර කිසිමදාක ගුරුවරියක් පැමිණ සෙල්ලම් බඩුවකින් සෙල්ලම් කරන ආකාරය මා හට උගන්වා නොතිබිණා. එතෙක් කාලයකට ලැබුණු සියලුම නව සෙල්ලම් භාණ්ඩ සමග කටයුතු කිරීමට මම තනිව ම උගතිමි.

දින කිහිපයක ඇවෑමෙන් නව ගුරුතුමිය ප්‍රාදූර්භූත වූවාය. ඇය වැඩිහිටි කාන්තාවක් වූ අතර සිහින් ස්වරයෙන් කතා කරන්නියක වූවාය. ප්‍රථමයෙන් ඇය මට අසා සිටින්නට පියානෝව වාදනය කළ

අතර අනතුරුව ස්වර එකින් එක මා හට හඳුන්වා දෙන්නට වූවාය. සියලුම ස්වර හතක් පමණක් වූ අතර ඒවා නම් *ස*, *රි*, *ග*, *ම*, *ප*, *ධ* සහ *නි* විය.

ස්වර හත එක්වනම ධාරණය කර ගැනීම, හොඳින් සුද්ද කර දුන් කජු මද කන්නා සේ පහසුවිය. එයට හේතුව මම මගේ ම ක්‍රමයක් ඒ සඳහා යොදා ගැනීමයි. ඇත්තට ම එය මගේ ම ක්‍රමයක් යැයි කිව නොහැකිය. මන්ද එය අපට පාසලේ උගැන්වූ දෙයක් නිසාය. නමුදු සංගීතය සඳහා එම ක්‍රමය යොදා ගත් පළමුවැන්නා මා විය යුතුය.

මම අකරාදී හෝඩිය උගත් පරිද්දෙන් සියලු ම ස්වරයන් සඳහා එකකට එක චිත්‍රය බැගින් ඇඳ ගතිමි!

එම චිත්‍ර මෙසේ විය. 'ස' යන්නෙන් සමනළයෙකි. 'රි' යන්නෙන් රියකි. 'ග' යන්නෙන් ගසක් වූ අතර 'ම' යන්නෙන් මලක් විය. 'ප' යන්නෙන් පඹයෙක් ඇඳ ගත් මා 'ධ' යන්නෙන් ඇඳ ගත්තේ අප රටේ ධජයයි. අවසාන වශයෙන් 'න' යන්නෙන් නිල ඇඳුමකට වඩා නිල මැස්සෙකු ඇඳ ගැනීම පහසු යැයි සිතිමි. කාර්යය අවසාන වූ පසු ඉමහත් ප්‍රහර්ෂයට පත් වුවද, ස්වල්ප දිනකින් මා හට වැටහී ගියේ චිත්‍ර ඇඳ ගැනීම තරම් පහසුවෙන් පියානෝ වාදනය උගත නොහැකි බවයි. එක දිගටම එකම ස්වර වාදනය කිරීමත්, නැවතත් ඒවා ම වාදනය කිරීමත්, ආයෙම නැවත නැවතත් ඒවා ම වාදනය කිරීමත් නිසා වැඩි කල් නොගොස් එම කාර්යය එපා වන තැනට කටයුතු සැලසිණි. ඇත්තට ම පියානෝවක් වාදනය කරනවාට වඩා, එම කාලය තුළ පොතක් කියැවීම හෝ සෙල්ලම් බඩුවක් ගෙන සෙල්ලම් කිරීම හෝ ඒ කිසිවක් ම නොකර නිකම් ම සිටීම හෝ දාහෙන් සම්පතක් බව මා හට වැටහෙමින් තිබිණ. සති දෙකක් අවසන් වන විට මා පියානෝ වාදනයෙන් කෙතරම් පීඩාවට පත් ව, රෝගී ස්වභාවයක් උසුලමින් සිටියේද යත් පියානෝ ව දෑසින් දැකීමත් අප්‍රසන්න දෙයක් බවට පත් වී තිබිණ. ඇනා ඉවානොවිනා-මගේ සංගීත ගුරුතුමිය, මුලින් මා පෙන්වූ

ප්‍රගතියෙන් ඉමහත් සතුටට පත් ව සිටියත් ඒ වන විට දුකින් හිස සළමින් සිටියාය.

"මේ පාඩම් වලින් ඔයා සතුටක් ලබන්නේ නැද්ද?" ඇය මගෙන් ඇසුවාය. එවන් වූ අප්‍රසන්න දෙයකින් සතුටක් ලැබීමක් ගැන ඇසීමට ඇයට උමතුවක් වැළඳී ඇතැයි සිතූ මම පුදුමයෙන් ඈ දෙස බැලීමි.

"නැහැ! මට කිසිම සතුටක් නැහැ!" මම පිළිතුරු දුනිමි. ඈ ඉමහත් සේ කෝප ගෙන ඉන්මතු අප නිවසට නොපැමිණ සිටී යැයි මගේ එකායන බලාපොරොත්තුව වුවද, එය එසේ නොවීය.

අම්මාත් තාත්තාත් මට දොස් කියන්නට පටන් ගත්හ.

"බලන්න, අපි කොච්චර ලස්සන පියානෝවක් ඔයාට ගෙනැත් දුන්නද? හොඳ ම හොඳ ගුරුවරියකුත් ගෙදරට ම ගෙනැත් දුන්නා ඔයාට ඉගෙන ගන්න. ඇයි වදේ ඔයාට බැරි පියානෝ වාදනය ඉගෙන ගන්න? ඔයාට ඕනෑ නැද්ද මේ වගේ හැමෝට ම බැරි දෙයක් ඉගෙන ගන්න. ඡිහ්... ඔයා ගැන හරි ලැජ්ජයි ළමයෝ!" අම්මා තදින් පවසන්නට වූවාය.

අනතුරුව තාත්තාගේ වාරය එළඹිණ.

"දැන් මෙයාට සංගීතේ ඉගෙන ගන්න බැහැලු. තව ටික දවසක් යද්දි කියයි ඉස්කෝලේ යන්නත් බැහැ කියලා. ඔහොම ගිහින් ලොකු වෙනකොට කිසිම රස්සාවක් කරගන්න බැරි වෙයි. කම්මැලි කොල්ලන්ට පොඩි කාලෙම උගන්වන්න ඕනෑ ලොකු වුණාහම රස්සාවක් කර ගන්න පුළුවන් විදිහේ දෙයක්! එව්වා කොහිද මාත් එක්ක, මෙයා අනිවාර්යයෙන්ම පියානෝ වාදනය ඉගෙන ගන්න ඕනෑ!"

"අනේ අපි පුංචි කාලේ මෙහෙම දේවල් අපේ දෙමව්පියෝ අපට ලබා දුන්නා නං, අපි කොච්චර ඒ අයට කෘතඥ වෙනවද? ඒ කාලේ අපිට පියානෝවක් කියන්නේ හීනයක්" අම්මා වික්ෂෝප වූවාය.

"ඔයාලා පියානෝවක් ගෙනාවාට බොහොම ස්තුතියි. මං ඒ ගැන කෘතඥ වෙන්නම්. ඒත් මට තවදුරටත් සංගීතය ඉගෙන ගන්න ඕනෑ නැහැ අයියෝ" මම සෙමින් පැවසීමි.

අනතුරුව එළඹි දිනයේ ඈනා ඉවානොව්නා මහත්මිය පැමිණෙන විට මම සැඟවී සිටියෙමි. අම්මාත් තාත්තාත් නිවසේ උඩ සිට පහළටත්, සියලුම මාවත් පුරාත්, මිදුලේ අස්සක් මුල්ලක් නෑරත් මා සොයා තිබිණ. සංගීතය සඳහා වූ කාලය ඉක්ම යනතුරුවත් ඔවුනට මා සොයාගත නොහැකි විණි. කාලය අවසන් විය. ඒ බව හැඟුණු පසු මම සෙමින් සෙමින් මගේ ඇඳ යටින් එළියට පැමිණීමි.

"සුභ ගමන් ඈනා ඉවානොව්නා මහත්මිය" මම මගේ ගුරුතුමියට සමු ගැනීමේ වදන් පැවසීමි.

"මේ කරපු වැඩේ ගැන ඔයාට ගොඩක් කණගාටු වෙන්න වෙයි පුතා!" තාත්තා කෝප වී සිටියේය.

"ඔයාට කියන්න තියෙන දේ කියන්න. මං පස්සේ මගේ දඬුවම එයාට දෙන්නම්" අම්මා ද සූදානමින් සිටියාය.

"ඕනෑ දෙයක් කරන්න මට. ඒත් මට කවදාවත් සංගීතය ඉගෙන ගන්න ඕනෑ නැහැ. මට සංගීතය ඉගෙන ගන්න බැහැ" මගේ වදන් බිඳුනු අතර විශාල දුකකින් හදවත බර වූ බව හැඟිණ. මම හඬමින් සිටියෙමි.

ඒ වන විටත් කුඩා දරුවකු ව සිටි මා හට සංගීතය සඳහට ම එපා වී තිබිණ.

"සංගීතය හදවතට සන්තුෂ්ටිය ගෙන එනවා" ගුරුතුමිය පැවසුවාය. "මගේ ගෝලයින් කිසිම කෙනෙක් කවදාවත් මගෙන් හැංගෙන්න හිතාගෙන ඇඳන් යටට රිංගලා නැහැ. දරුවෙකුට පුළුවන් වුණා නං සංගීත පාඩමකින් බේරෙන්න කියලා හිතාගෙන පැයක් තිස්සේ ඇඳක් යටට වෙලා ඉන්න, ඒකේ ආයේ හිතන්න දෙයක් නැහැ,

එයා සංගීතය ඉගෙන ගන්න කොහෙත්ම කැමති නැහැ කියලා අපි වටහා ගන්න ඕනෑ. ඉතිං ඒ වගේ කෙනෙක් ව සංගීතය ඉගෙන ගන්න, සංගීතය ඉගෙන ගන්න කියලා බල කරලා යොමු කිරීමෙන් කිසිම වැඩක් වෙන එකක් නැහැ. සමහරවිට එයා වැඩිහිටි වුණු කාලෙක පසුතැවෙයි කොච්චර අගනා දෙයක් ද ගිලිහුණේ කියලා. එතකොට පෙරහැර ගිහින් ඉවරයි. මගේ සේවය අවශ්‍ය නැති බව අද හොඳ හැටියෙන් වටහා ගත්තා. ඉතිං එහෙනං මං ගිහින් එන්නම්. මං එනකොට ඇඳ යට හැංගෙන්නේ නැති, සංගීතයට ආදරය කරන ළමයින් කොච්චර ඉන්නවද? නිකරුණේ කාලය නාස්ති කරනවාට වඩා, ඒ අය වෙනුවෙන් කැප වෙන එක මට සතුටක්"

ඇය ගියාය. නැවත කිසි දිනෙක නොපැමිණියාය. මගේ තාත්තා මට බොහෝ සෙයින් බැණ වැදුණෝය. ඔහු අවසන් කරනවාත් සමගම අම්මා ආරම්භ කළාය. අපගේ විසිත්ත කාමරය අරා සිටි පියානෝව අසලින් යනවිට මගේ මුහුණ ඇඹුල්වීම වලකා ගන්නට කාලයක් යනතුරු මා හට නොහැකි විය.

වැඩිහිටි වූ පසු මා හට වැටහුණේ අනෙක් බොහොම මිනිසුන් සංගීතය වෙනුවෙන් විවර වුණු සවන්පත්වලින් යුතු වුවත් එවැනි හැකියාවක් මා හට නොවූ බවයි. අදටත් මට සංගීත භාණ්ඩයක් සුසර කරගත් නොහැකිය. ඉඳින් කුඩා කොලුවකු වූ මා කෙසේ නම් පියානෝ වාදනය ඉගෙන ගන්නද?

ඉතිං මගේ දුවේ, හැමදෙනාට ම හැමදේ ම එකාවන්ව ඉගෙන ගන්න නොහැකි බව දෙමව්පියන් වටහා ගන්නාතුරු අභිතකර පියානෝ වාදන වලින් අසරණ දරුවන් නිකරුණේ දුක් විඳීම වැළැක්විය නොහැකි වනු ඇති බව මගේ හැඟීමයි.

පාන් වර්ජනය කළෙම් මෙලෙසේ



ඔයා මම කියලා වෙනසක් නැහැ දුවේ... පුංචි වයසේදී කවුරුත් එක වගෙයි.

අනෙක් හැම දරුවකු සේම මාත් කුඩා කාලයේදී රසවත් ආහාරයන් හට ඉමහත් සේ ලැදි වූ අතර චීස්, මීට් බෝල්, බිස්කට් ආදිය ඒ අතර ප්‍රධාන විය. නමුදු පාන් යනු මගේ අප්‍රසන්න ම ආහාරය විය. එයට ප්‍රධාන ම හේතුව වූයේ හැම විට ම අම්මාත් තාත්තාත් පාන් සිහි කළ ආකාරය විය යුතු බව මට සිතේ.

"ඇහුනද පුතා? ඔන්න අමතක කරන්න එපා, පාං ටික සේරම කන්න ඕනෑ!"

මා හට කෙදිනකවත් පාන් රසවත් ආහාරයක් ලෙස නොහැඟිණි. එබැවින් ඒවා අනුභවය මට කිසි විටෙක සතුටක් ගෙන දුන්නේ නැත. මේ කාරණා නිසා රාත්‍රී ආහාරයට හෝ උදෑසන ආහාරයට පාන් තිබුණහොත් ඉතාමත් අපහසුවෙන් ඒවා ආහාරයට ගැනීමට මට සිදුවිය. විටෙක මට ලැබුණු පාන් පෙති සිහින් කැබලි බවට කඩා, කුඩා කුඩා බෝල බවට පත් කර කාටත් හොරා ඉවත දැමීමට මම සමත් වීමි. පාන්වල මද කොටස අපහසුවෙන් හෝ ආහාරයට ගන්නා මා හට වාටිය නම් අප්‍රසන්න ම දෙයක් විය. විටෙක පාන් පෙත්ත පිටින් ම මේස රෙද්ද යට සඟවා යෑමට පවා පෙළඹුණු මම සම්පූර්ණ පාන් පෙත්ත ම ආහාරයට ගත් බව හඟවා සිටීමට සමත් වූයෙමි. වැඩිහිටි කෙනෙකු බවට පත් වූ පසු කිසිදා පාන් ආහාරයට නොගන්නා බවටත්, යම් දිනෙක මා වැඩිවියට පත් වූ කලෙක මා හට සිටිනා දරුවන් හටත් කිසිම දාක එම අප්‍රසන්න ආහාරය නොදෙන බවටත්, මා හට ම දිවිර දිවිරා පොරොන්දු වෙමින් සිටියෙමි.

"නිකමට හිතන්න, ආයේ කිසිම දවසක මට පාන් කන්න වෙන්නෙ නැති වුණොත් කොහොමට හිටීද?" එකල මා හට නිරතුරු පහළ වූ මෝඩ සිතුවිලි ඒ ආකාර විය. "එහෙම වුණොත් මං මෙහෙම කියනවා, 'අද මොනවද උදේට කන්න තියෙන්නේ? චීස්? බොහොම අගෙයි අපි ඒවා කමු පාන් නැතුව ම'

'පාන් නැති රෑ කෑමක්, පාන් නැතිව රස විඳිය හැකි සුප් පානයක් හෝ මස් කෑල්ලක්. අහෝ එවැනි ජීවිතයක් කෙතරම් අගේට හිටීවිද? අනෙක් අතට, පහුවදා උදේ කෑමට පාන් නැති මේසෙක වාඩි වෙන්නයි තියෙන්නේ කියලා හිතේ තියාගෙන ඇඳට යන්න තියෙනවා කියන එකම මොන තරම් සැනසිල්ලක්ද?' වැඩිහිටියෙකු වූ පසු පාන් නැති ලෝකයක් ගොඩ නගා ගන්නා ආකාරය ගැන නිරතුරුව ම සිහින දකිමින් සිටි මට වැඩිහිටියෙකු වනතුරු ඉවසා සිටීමටවත් ඉස්පාසුවක් නොවීය.

දෙමව්පියන් ඇතුළු බොහෝ දෙනෙකු මාගේ දුර්මතය දුරු කරන්නට නොකළ දෙයක් නොවීය. එහෙත් ඔවුනට සවන් දෙන්නට මට කිසිම උවමනාවක් නොවීය. පාන් යනු කෙතරම් ගුණදායක ආහාරයක් ද යන්න ඔවුහු නිරතුරු පැවසූහ. ඒ ආකාරයට පාන් ආහාරයට ගැනීම ප්‍රතික්ෂේප කරනුයේ ඉතාමත් නරක සහ මෝඩ ළමයින් බව පැවසුණු අතර යමෙකු මනා ලෙස සාදන ලද දුඹුරු පාන් ආහාරයට නොගන්නේ නම් අනිවාර්යයෙන් රෝගියෙකු වන බවද පැවසිණ. මෙලෙස කරුණු පහදා දීත් මගේ අදහස් වෙනස් කළ නොහැකි වූ තැන මාගේ දෙමව්පියන් මා හට දඬුවම් කරන බවට තර්ජනය ද කරන්නට විය. නමුදු පාන් වෙත තිබූ මගේ බලවත් අකමැත්ත දුරු කිරීමට ඔවුනට නොහැකි විණි.

එක් දිනකදී ඒ නපුරු භයානක සිද්ධිය සිදුවිණ. එකල මා රැකබලා ගැනීමට සිටියේ වයස්ගත කාන්තාවකි. ඇය මා හට සතුටුදායක ලෙස ආදර කරුණාව පෑ කෙනෙකු වූ නමුදු කෑම මේසයේ දී මා විසින් ඇති කරන්නට යෙදුණු කලබැගෑනි ගැන නම් බලවත් නොරිස්සීමකින් පසු වූවාය. එදින අම්මාත් තාත්තාත් නිවසේ නොවූ අතර මම තනිව ම ආහාර ගනිමින් සිටියෙමි. සුපුරුදු පරිදි පාන් පෙති සියල්ල ම මගෙන් කිසිදු හානියක් නොලබා මේසය මත විය.

"කරුණාකරලා පාන් ටික කන්න. එහෙම නැති වුණොත් වෙන කිසිම දෙයක් ඔයාට කන්න ලැබෙන එකක් නැහැ" පාලිකාව තිර හඬින් පැවසුවේ මේ අතරතුරදීය.

"නෑ. මට බැහැ. මං කන්නේ නැහැ"යි පැවසූ මම එයින් නොනැවතී පාන් පෙති සියල්ල ම බිම දැමීමට තරම් නපුරු වීමි. පාලිකාවට කෙතරම් කේන්ති ගියේ ද යත් කතා කර ගැනීමටවත් නොහැකිව වෙව්ළන ඇගේ දර්ශනය බැන වැදීමකට වඩා බියජනක විය. අනතුරුව ඈ ඇසිපිය නොහෙළා මා දෙස බලා සිටින්නට වූ අතර අවසානයේ කතා කරන්නට වූවාය.

"මොකද ඔබට හිතෙන්නේ? මේ බිම තියෙන්නේ නිකම් ම නිකම් පාන් පෙත්තක් පමණක් කියාද? හ්ම්.... එහෙම නම් මට කියන්න තියෙන්නේ ඒක බොහොම ලොකු වැරදි සිතුවිල්ලක් කියලායි. මං පුංචි ළමයෙක් කාලයේ මට සිද්ධ වුණා එක පුංචි පාන් පෙත්තක් වෙනුවෙන්, මුළු දවස පුරා ම පාත්ත රංචුවක් බලා කියා ගන්න. එක සීත කාලෙකදී අපේ ගේ හරියේ එක ධාන්‍ය ඇටයක්වත් හොයා ගන්න බැරි තරමට අපට ආහාර නැති වුණා. ඔයාගේ තරම වයසේ හිටපු මගේ පුංචි සහෝදරයා බඩගින්දර දරා ගන්න බැරුව ම මිය ගියා කියන එක ඔයාට හිතාගන්නවත් බැරි වේවි. කවුරු හරි කෙනෙක් එක පුංචි පාන් පෙත්තක් මගේ සහෝදරයාට එදා දුන්නා නම්.... අපට එහෙම දුක්බර ඉරණමක් හිමි වෙන්නේ නැති වෙන්න ඉඩ තිබුණා. ඔයාලාට ඉස්කෝලේදි උගන්වනවා ලියන්න කියවන්න. නමුත් ඒ කවුරුවත් ඔයාලාට උගන්වන්නේ නැහැ නේද? පාන් මේ විදිහට මේසේ උඩට එන්නේ කොහොමද කියලා. මිනිස්සු අපමණ වෙහෙස වෙලා ධාන්‍ය වවලා, දිවා රෑ නොබලා ඒවා රැක බලාගෙන, පිටි හදලා, ඒවායින් පාන් හදනවා. ඒ දේවල් කරන්න මිනිස්සු ගොඩ දෙනෙක් මහන්සි වෙනවා, ඒත් ඔයාලා මොනවද කරන්නේ? ඒ පාන් ගෙදර ගෙනැත් විසි කරලා දානවා කිසිම හිතක් පපුවක් නැතුව. ලැජ්ජා වෙන්න ඕනෑ පුංචි මහත්තයා ලැජ්ජා වෙන්න ඕනෑ ඔයා. මට නම් මේ වෙලාවේ ඔයා වගේ ළමයෙක් ඇස් මානයේ ඉන්න එකත් දරා ගන්න බැරි දෙයක්".

එදින මගේ මුළු රැය ම නපුරු සිහින වලින් පිරුණක් විය. පසු දා උදෑසන, දඬුවම් වශයෙන් මුළු දවසට ම එකම එක පාන් පෙත්තක්වත් නොලැබෙන බව මා හට දන්වන ලදී. එතෙක් කාලෙකට ගණන් කළ නොහැකි තරමට විවිධාකාර දඬුවම් ලබා තිබුන ද පාන් නොලැබෙන සේ පැනවුණු එකම දඬුවම එය විය. ඒ සේරම පාලිකාවගේ අදහස් වූ අතර කෙසේ වුවද එය අපූරු දඬුවමක් ලෙස මා හට හැඟිණ. එදින උදෑසන ආහාරය ලෙස පාන් නොමැති ව චීස් හා තැවරුම් ද්‍රව්‍ය වලින් යුතු සැන්ඩ්විච් ලැබුණු අතර එය ඉතාමත් රසවත් ආහාරයක් විය. ඒවා කන්නට මට එක විනාඩියක්වත් ගත

නොවීය. නමුදු එක ගැටළුවක් මතුවිය. කෙතරම් කෑවද මගේ බඩ නොපිරුණි. පාතරාසය අහවර වුවද තවදුරටත් කුසගින්නෙන් පෙළෙන්නට වීමි. දහවල් ආහාරය කුස පුරවන්නට සමත් නොවූ අතර හවස පාන් නොමැති ව ලැබුණු මීට් බෝලය, මහ මුහුදට දැමූ පොල් ලෙල්ලක් සේ නොදැනී නොපෙනී ගියේය. රාත්‍රී ආහාරය ලෙස සිහින් ව තීරු කරන ලද තැම්බූ බිත්තර පමණක් ලැබිණ. පාන් කැබැල්ලක්වත් නොවීය. පාන් නොමැති ව බිත්තර පමණක් කෑම ඉතාමත් අප්‍රියජනක විය.

එයින් අනතුරු ව මා කෙතරම් සතුටින් සිටිය යුතු දැයි නිවසේ සැම දෙන කතා වන්නට වූහ. ඉන් පසු කිසි දිනෙක මා හට පාන් ලබා නොදෙන බව ඔවුන් පැවසුවත් පසු දින උදෑසන ආහාරයට නැවතත් මා හට පාන් පෙත්තක් දෙන ලදී. එය ඉතාමත් ප්‍රණීත පාන් පෙත්තක් විය. මම ගිජු ලෙස එය ආහාරයට ගතිමි. කිසිවකු කිසිවක් පැවසුවේ නැත. නමුදු හැමදෙන මා ආහාර ගන්නා දෙස බලා සිටියෝය. මා ගැන ම උපන් ලැජ්ජාවකින් මිරිකෙන්නට වූ මම ඉන්මතු කිසිම දිනෙක පාන් ආහාරයට ගැනීම ප්‍රතික්ෂේප නොකරන්නටත් මොනම කාරණයක් නිසාවත් පාන් ඉවත නොදැමීමටත් මා හට ම පොරොන්දු වූයෙමි.

කෝපයට පත්වුණු තාලේ



කවදාවත් තමන්ගේ ඉවසීම නැති කරගන්න හොඳ නැහැ දුවේ...

කුඩා කාලයේ එක් වකවානුවක දී නිරතුරුව ම හේතු රහිත ව නොසන්සුන් සිතින් පසු වූ හැටි මා හට සිහිවේ. එකල හැම කෙනෙකු කෙරෙහි ම බලවත් කෝපයක්, නොරිස්සීමක් නිරතුරු මා සිතෙහි ගොඩ නැගෙමින් තිබිණ.

"මොකද ඔයා කෑම තෝර තෝරා කන්නේ?" යි කෙනෙකු ඇසූ විට, මගේ සිත නොසන්සුන් ව කෝප සිතුවිලි පහළ වීම ඇරඹේ.

එසේත් නැත්නම්, "මොකද ළමයා ඔයා ඔය විදිහට හැසිරෙන්නේ?"යි කෙනෙකු ඇසුවේ නම් එය ද විගසින් මා නොසන්සුන් කරවීමට සමත් විය.

නිරතුරු සියල්ලන් කෙරෙහි කෝපයෙන් පසු වූ මා, මගේ මව කෙරෙහි කෝපයෙන් පසු වූයේ මට ඇයට යමක් පැවසීමට ඇවැසි වුවත් එයට සවන් දීමට තරම් ඉස්පාසුවක් නැති වන තරමට ඇය කාර්යබහුල වූ නිසාය. අනෙක් අතට මා, මගේ පියා කෙරෙහි කෝපයෙන් පසු වූයේ ඔහුට සවන් දීමට තරම් ඉස්පාසුවක් නැති වන තරමට මා කාර්යය බහුලව සිටින අවස්ථාවලදී විටින් විට බාධා කරමින් යමක් පැවසීමට ඔහු උත්සාහ දැරූ නිසාය. තවත් විටෙකදී ඔවුන් දෙදෙන මිතුරකුගේ නිවසට ගිය අවස්ථාවකදී හෝ චිත්‍රපටයක් නැරඹීමට ගිය අවස්ථාවකදී මම කෝපයෙන් පුපුරමින් හඬන්නට වීමි. මට එවිට අවශ්‍ය වූයේ ඔවුන් මා සමග නිවසේ රැඳී සිටිනු දැකීමටය. එසේ නොවුණු තැනදී ඒ ආකාරයට කෝපයට පත් වීම මගේ සිරිත විය. අනෙක් අතට මට සර්කස් සංදර්ශනයක් නැරඹීමට යන්නට අවශ්‍ය වුවත් එසේ යාමට නොහැකි වූ විට පෙරටත් වඩා හඬ නගා හඬන්නට වූයේ නිවසේ රැඳෙන්නට සිදු වූ නිසාය.

ඒ කාලය වන විටදී ඔයාගේ බාප්පා යන්තමින් වසරක් වියැති කුඩා ළමයෙකු විය. එනමුදු ඔහු ද මගේ කෝපය ඉහ වහා යවන්නට සමත් වූවෙකි. ඔහු මා සමගින් කිසිවක් කතා බහ නොකර, ලොඹු කට දක්වා සිනාසී කකුලේ මහපට ඇඟිල්ල කටට දමා ඉරීමට පටන් ගැනීම හෝ නිකම් ම 'ආ.... ආ....' කියමින් සිටීම මගේ කෝපය උත්සන්න කිරීමට හේතු වූ කාරණායි.

නැන්දා පැමිණි විටදී ඇය කෙරෙහි කෝපයෙන් පුපුරා හැළෙන්නට වීමි.

මාමා පැමිණි විටදී ඔහු කෙරෙහි කෝපයෙන් පුපුරා හැළෙන්නට වීමි.

නැන්දා හා මාමා එක් ව පැමිණි විටදී දෙදෙනා කෙරෙහි ම කෝපයෙන් පුපුරා හැළෙන්නට වීමි.

ඒ ඒ අවස්ථාවන්වලට විවිධ හේතු මා හට තිබිණ. නැන්දා මා විහිළුවකට ගනිතැයි සිතුණු නිසා ඇය කෙරෙහි කෝප වීමි.

මාමා මා සමඟ හරියකට කතා බහ නොකරතැයි සිතුණු නිසා ඔහු කෙරෙහි කෝප වීමි. ඊට අමතර ව විවිධාකාර හේතු විටින් විට මා හට තිබිණ.

මා එකල සිතාගෙන සිටියේ මේ ලෝකයේ සිටින වඩා ම වැදගත්, හැම දෙනම අවධානයෙන් සිටිය යුතු පුද්ගලයෙක් වේ නම්, ඒ මා ලෙසිනි. මට කතා කරන්නට අවශ්‍ය වූයේ නම් හැම දෙන නශ්ශබ්ද විය යුතු විය. මට කතා කරන්නට අවශ්‍ය නොවූයේ නම් එවිට ද හැම දෙන නිශ්ශබ්ද විය යුතු විය. මට විටෙක 'කදෑව් කදෑව්' ගෑමට සිතේ. තවත් විටෙක බුරන්නට සිතේ. විටෙක ගොරවන්නට ද සිතේ. 'කාක් කාක්' ගාමින් කෑ ගසන්නට ද සිතේ. 'පුරු පුරු' ගාමින් කොඳුරන්නට ද සිතේ. ඒ හැම විටෙක ම මා අවට සිටින හැමදෙන තමන් කෙතරම් වැදගත් කාර්යයක නියුතු ව සිටිය ද ඒ සියලු වැඩකටයුතු පසෙක දමා මා නගන අනර්ඝ වූ හඬ තැළිම් වලට සවන් දිය යුතු විය. එසේ නොවන විටදී මගේ කෝපය උත්සන්න වේ.

මා තරම් දැනමුත්තෙකු දන්නා කියන සමාජයේ බාල හෝ මහලු හෝ අය අතර නොවන බව මගේ හැඟීම විය. ඒ නිසා යමෙක් මා හා වාදයට පැමිණි විටදී හෝ මා හෙළා දැක කතා කළ විටදී පුපුරා යන තරමේ කෝපයකින් පෙළෙන්නට වීමි. එවැනි අවස්ථා වලදී ඉතාමත්

නින්දිත ලෙස මගේ අප්‍රසාදය පළ කරමින්, රවා බලන්නට හෝ පහර දෙන්නට පෙළඹීමි.

ඉදින් එකල මගේ මුළු කාලය ම ගත වූයේ කෙනෙකු සමඟ නැත්නම් වෙනත් කෙනෙකු සමගින් කෝපයෙන් පසු වීමට හෝ වාද කරමින් පසු වීමට හෝ දවස පුරා නොසන්සුන් සිතින්, නොරිස්සීමෙන් පසු වීමටය. එබැවින් මගේ මුළු කාලය ම වාගේ ගත වූයේ හපුටු කරගත් මුහුණින් විය යුතුය. උදෑසන දෙනෙත් හැරි මොහොතේ පටන් තමන් අවදි කරවූ හිරු එළිය කෙරෙහි පවා කෝප සිතුවිලි පහළ කර ගන්නා කෙනෙකුගේ මුහුණ කෙසේ විය යුතුද? කොටින් ම මහා රෑ තද නින්දේ පසු වන අවස්ථාවලදී පවා එම කෝපකාරී සිතුවිලි මගෙන් තුරන් නොවූ බව මට සිතෙයි.

තනි ව හිඳිමින් කෝප වෙමින් සිටීම කිසිවකු දැන නොගන්නට ද ඉඩ තිබුණු මුත් මගේ මේ ස්වභාවයේ අවාසි සහගත බව හොඳින් ම පෙන්නුම් කෙරුණු අවස්ථා ලෙස, වෙනත් ළමුන් හා සෙල්ලම් කිරීමට ගිය අවස්ථා පෙන්වා දිය හැකිය. මා කැමති වන්නේ කුමන ක්‍රීඩාවට ද එම ක්‍රීඩාවේ අනෙකුත් සියල්ලන් ම නිරත විය යුතුය යන්න මගේ තීරණය විය. සෙල්ලමට පැමිණි සිටි සමහර ළමයින් මගේ සිත් ගත් අතර ඔවුන් සමග සෙල්ලම් කිරීමට මා සතුටු වුවත් මා අකමැති ළමුන් සෙල්ලමට සහභාගි කරවා ගැනීම මගේ තීරණයේ හැටියට නොකළ යුත්තක් විය. මා කැමති යම් සේද එසේ ම කටයුතු සිද්ධ විය යුතු විය. කෙනෙකු අල්ලා ගෙන, ඇස් රතුවන විහිළු තහළු කරමින් හිංසාවට පත් කොට සිනාසීම මට කළ හැකි වූ දෙයක් නමුත් කිසිවකු මට එසේ කිරීම කිසිසේත් ම නොඉවසන ලදී. කෙසේ හෝ අවසාන වශයෙන් වියයුතු දෙය සිද්ධ විය. මගේ මේ විකාරරූපී හැසිරීම හැම දෙනට ම විකාරයක් සේ දැනෙන්නට, එපා වන්නට, වැඩි කල් ගත නොවීය. අවසානයේ දී හැම දෙන මා දුටු තැන ඉතාමත් දරුණු ලෙස සිනා සෙන්නට විය.

"පුතා ඔයාට තේ ඕනෑ ද? හැබැයි ඔන්න කේන්ති ගන්න නං එපා" අම්මා පවසන්නට වූවාය.

"හොඳයි. අපි යමු පොඩ් රවුමක් ඇවිදලා එන්න. ඔන්න ඔන්න කේන්ති නං ගන්න එපා"

"ආ... මේ... ඔයා හැබෑට තාම කේන්තියෙන් ද ආ?"

"හා... හා... ඉක්මන් කරලා, ඉක්මන් කරලා කේන්ති ගත්තොත් හොඳා. අපිට නාස්ති කරන්න තරම් කාලයක් නැහැ ළමයා"

ඒ සෑම අවස්ථාවක දී ම ඉතාමත් නිර්ලෝබී ව මගේ කේන්තිය මුදා හැරීමට මම කිසි විටෙක පසුබට නොවීමි.

හන්දියේ කොලු ගැටවුන් හට මා කදිම විහිළුවක් වන්නට විය. ඔවුහු නිරන්තරයෙන් මා දුටු තැන විසුළු නම් කියමින් කෑ ගසන්නට වූහ. "ආ... ආ... කුකුළු කේන්තිකාරයා... කුකුළු කේන්තිකාරයා..." එවිටද ඒ නමට මා කෙතරම් උචිත ද, ඒ නම මට කෙතරම් උචිත ද, යන්න පෙන්වා දෙන්නට තරම් මම මෝඩ වීමි.

"ඔන්න බලන්න... මම මේ ඇඟිල්ල නටවනවා විතරයි... අන්න අරයා පුපුරන්න ගන්න හැටි බලා ගන්න"

අනතුරුව කොලු පිරිසෙන් කෙනෙකු මා දෙසට හැරී ඇඟිල්ලක් නටවන්නට වන් කල රාජකාරිය නොපිරිහෙළා ඉටු කරන කෙනෙකු මෙන්, මගේ කේන්තිය මුදා හැරෙයි. එවිට කොලුවෝ බිම පෙරළි පෙරළි සිනා නගන්නට පටන් ගනිති. මා විසින් එකල සෑහෙන පරිද්දෙන් හන්දියේ කොලුවන් හට විනෝදය සපයන ලදී. කාලයක් ගත විය. කොලු පිරිසේ එක්තරා වැඩිමහල් කෙනෙකුගේ සිතෙහි මා ගැන

කණගාටුවක් ඉපදෙන්නට විය. තනි ව හමු වූ විටෙක ඔහු මා හා කතා කළේය.

"මේ අහන්න මල්ලි. මොකද ඔයා ඔය විදිහට කේන්ති ගන්නේ? ඔයා මේ කට්ටිය ව තඹ සතේකට මායිම් නොකර ඔයාගේ වැඩක් බලා ගත්තා නම්, එයාලට මේ විදිහට ඔයා ව විහිළුවක් වෙන්නේ නැහැනේ."

එදින ඒ හමුවෙන් පසුව මම එම වදන් ගැන කල්පනා කරන්නට වීමි. හැම පොඩි දේට ම කේන්ති උපදවා ගැනීමෙන් වැළකීමට එතැන් පටන් මම උත්සාහ කරන්නට වීමි. මදින් මද මගේ උත්සහය පල දරන්නට විය. මද කලක් ගත වන විට කොලු රැළ වෙහෙසට පත් වී සේ මා විහිළුවකට ගැනීම අත් හැර දමන ලදී. නමුදු වැඩිහිටියෙකු වනතුරු ම එම නරක පුරුද්ද සම්පූර්ණයෙන් අත් හැර ගැනීමට මට නොහැකි විය. ඒ නිසා ම සමහර අවස්ථාවලදී මට බලවත් පාඩු සිදුවිය. පාසලේ දී, කාර්යාලයේ දී, ආදී වශයෙන් ගත් කල බොහොම තැන් වල දී අසීරු අවස්ථාවන්ට මුහුණ දීමට මගේ කුකුළු කේන්තිය මට මග පාදා දුන්නේය. වටිනා මිතුදම් අහිමි කර ගැනීමට ද මේ කාරණය මට ඉතාමත් නරක ලෙස උපකාර වූයේය.

කුඩා කල පටන් මා හඳුනන අය අදටත් සමහර විට මට විහිළු කරයි. එහෙත් මම ඒවා නෑසූ කන් ව, කේන්ති නොගෙන සිටින්නට උත්සාහ කරමි. බොහෝ විට සාර්ථකය. ඇත්තට ම පැවසුවොත් කුඩා කල පැවති තත්ත්වයට වඩා යම් තරමකින් සාර්ථක යැයි කිව හැකිය.

අත්වැරැද්දක් සිදුවූවානේ රාළේ



අත්වැරදි කා අතිනුත් වෙන්න පුළුවන් දුවේ... නමුත් එයින් අප ලබා ගන්නා පාඩමයි වැදගත්. මේ ඒ වගේ අත්වැරැද්දක් ගැන කතාවක්.

මම පුංචි දරුවෙකුව උන් සන්ධියේ කිරි, වතුර, තේ සහ මෝර තෙල් පානය කරන්නට පුරුදුව සිටියෙමි.

මෝර තෙල් වැඩෙන දරුවනට ඉතාමත් සුදුසු පානයක් වශයෙන් වැඩිහිටියන් විසින් සළකන ලදී. නමුත් කුඩා දරුවකු වූ මා හට නම්

එය ඉතාමත් අප්‍රියකර වූ දෙයක් විය. මා එකල සිතාගෙන සිටියේ මෝර තෙල් වලට වඩා නරක දෙයක් මෙලොව තවත් නොමැති විය යුතුය කියාය. නමුදු මා නිවැරදි නොවීය.

ගිම්හානයේ එක් දිනකදී මම පිටත සෙල්ලම් කරමින් පසු වීමි. එදින ඉතාමත් උණුසුම් දිනයක් විය. තදබල පිපාසයක් දැනෙන්නට වූ නිසා නිවස තුළට දිව ගියෙමි. නිවසේ සිටි හැමදෙන කාර්යය බහුලව පසු වූයේ එදින හැන්දෑවේ මිතුරු හමුවක් සූදානම් කර තිබූ බැවින් ඔවුන් කෑම වර්ග සාදමින් මේසය සූදානම් කරමින් පසු වූ නිසාය. කුඩා ඩිකැන්ටරයකින් මවිසින් වතුර වීදුරුවක් පුරවා ගනු කිසිවකු නොදුටුවේ එබැවින් විය යුතුය. උතුරුවා නිවා ගත් වතුර නිරතුරුව ම එහි තබා තිබෙන බව මම දැන සිටියෙමි. වතුර වීදුරුවෙන් අඩක් පානය කළ මට හුස්ම හිරවන්නට යන ලෙසක් දැනිණ. කටින් නාසයෙන් දුම් පිටවන සෙයක් හැඟිණි. ඒ මොහොතේ මට කිසිවක් සිතාගත නොහැකි විය. කුමක්ද මේ සිදුවූයේ?

මට දැනුණේ හරියට ඇල්පෙනිති ගැසූ කුඩා කොට්ටයක් ගිලුණා සේය. එබැවින් මට හිතුණේ එය මා පානය කළ වතුරේ වරදක් ලෙස නොව මගේ යම්කිසි වැරැද්දකින් සිදු වූ දෙයක් ලෙසිනි. දැන් දැන් මිය යන්නට එතැයි සිතුණු බැවින් අතිශයින් භීතියට පත්වීමි. තවදුරටත් දරාගත නොහැකි වූ මා මහා හඬින් කෑ ගසන්නට වූයෙන් නිවසේ සිටි සියල්ලන් ම මා අසලට දිව එන්නට විය.

ඒ වනවිටත් මම කහිමින් හා හුස්ම හිරවීමෙන් පීඩාවට පත්වෙමින් පසුවීමි. මට දැනුනේ මුඛය තුළ ගින්නක් ඇවිලී ඇති සේය. මට මහත් වූ වේදනාවක් දැනෙන්නට වූ අතර කිසිවෙකුට සිදු වී ඇත්තේ කුමක්දැයි සිතාගත නොහැකිව පසුවිය.

"අනේ දෙවියනේ! එයාට වලිප්පුව හැදිලා," අම්මා වැළපෙන්නට වූවාය.

"අනේ මේ හොඳට බලන්න, එයා අපව රවටන්න රඟපානවා!" තාත්තා පැවසුවේය.

මෙවිට ම වාගේ ආයා මේ ගාලගෝට්ටිය කුමක්දැයි බැලීමට පැමිණියාය. මදක් කල්පනාවෙන් වටපිට බැලූ ඇයට සිදුවන්නට ඇත්තේ කුමක්දැයි අනුමාන කරගන්නට හැකිවිනි. "ඔහු වොඩ්කා ටිකක් බීලා වගෙයි" ඇය කෑ ගැසුවාය. "ඩිකැන්ටරයේ වොඩ්කා තිබුණා!"

එයින් අනතුරුව හැමදෙන නැවතත් කෑ ගසන්නට පටන් ගත්තෝය.

"අනේ දෙවියනේ! කවුරු හරි ඉක්මනට දොස්තරට කතා කරන්න," අම්මා කෑ ගැසුවාය.

"කෝ... කෝ... ඔයා මෙහාට වෙන්න මං පුතාව වඩා ගන්න," කලබලයට පත් වූ තාත්තා වහ වහා මා අසලට තවත් ළං වුණේය.

"ඉක්මනට එයාට මොනවා හරි කන්න දෙන්න," ආයා කෑ ගැසුවාය.

ඔවුහු මට කන්න දෙන්නට යමක් සොයා එහේ මෙහේ දිව ගියෝය. අවසානයේ සූදානම් කරමින් තිබුණු ආහාර අතුරින් සැන්ඩ්විච්චයක් මා අතට පත්විණි. එයින් කැබැල්ලක් සෙමින් විකන අතරේ මම මෙසේ කෙඳිරීමි. "මට හිතෙන්නේ වොඩ්කාත් හොඳ පෝෂ්‍යදායක පානයක් වගෙයි" ඒ සිතුවිල්ල වැඩි ආයුෂ නොවීය. මද වේලාවකින් ම මට මත් ගතියක් දැනෙන්නට විය. අනතුරුව එක්වනම මට බිම ඉන්දවුණේ මහත් වූ ශබ්දයක් උපදවමිනි. කාමරය මා වටේ භ්‍රමණය වන්නාක් මෙන් දැනෙන්නට විය.

එයින් පසු සිදු වූ කිසිවක් සිහිකරගන්නට මට හැකියාවක් නොතිබිණි. අම්මාත් තාත්තාත් පවසන පරිදි මා මුළු දහවල් කාලයම නින්දේ ගතකර ඇත. හැන්දෑ වන විට මදින් මද යථා තත්ත්වයට පත්වන්නට වීමි. එදින සවස් යාමයේ මිතුරු පිරිස රැස් වූ පසු වැඩිහිටියන් වයින් වීදුරු පුරවා වොඩ්කා පානය කරන විට ඔවුන් ගැන උපන් කණගාටුවෙන් යුතුව මම දොරකඩට වී බලා සිටියෙමි. මද වේලාවකින් ම ඔවුන් කෙතරම් අපුලකින් පෙළෙනු ඇතිදැයි මම දැන සිටියෙමි. "ඔය අප්‍රසන්න ජරාව බොන්න එපා!"යැයි පැවසීමටත් පසුබට නොවීමි.

පසුදා උදෑසන වනවිට මම සම්පූර්ණයෙන් ම යථා තත්ත්වයට පත් ව සිටියෙමි. නමුත් ඉන්පසු කිසිම දිනෙක පෙරකී ඩිකැන්ටරයෙන් එක බිඳක්වත් පානය කරන්නට සිතුවේවත් නැත. දැනටත් වොඩ්කා දකින විට මගේ මුහුණ අඳුරුවේ.

ඉතිං මගේ ආදර දුවේ! අදටත් ඉඳහිට කෙනෙකුට මම මේ කතාව පවසමි! ඒ පවසන හැමදා එය අවසන් කරනුයේ, "අන්න එදා තමයි මං මත්පැන් බීම අත්හැරිය දවස!" යනුවෙන් පවසමිනි.

ලිවීම උගත් කාලේ



ලූගේ ආදර දුවේ...

මම බොහොම කුඩා ළමයෙකුව උන් අවදියේ මාගේ සම වයසේ අනෙක් ළමයින්ට පෙර ඉතා ඉක්මනින් අකුරු කියවන්නට උගත්තෙමි. අම්මා මට 'අ' යන්න, 'ආ' යන්න උගැන්නුවාය. එතැන් පටන් කල් නොයවාම මම හෝඩියේ සියලුම අකුරු කියවීමට උගත්තෙමි. එය මහත් වූ විනෝදයක් උපදවන්නක් විය. මද කලකින් පිංතූර නරඹමින් සිටීමෙන් ඔබ්බට ගොස් පොත් කියවන්නට උගැන්මට මට හැකි විය. නමුත් මා හට කිසි ලෙසකින්වත් ලිවීම ඉගැනීමට උවමනා වූයේ නැත. පෑන නිවැරදි ලෙස අල්වා ගැනීම ඉගෙන ගැනීමට මට අවශ්‍ය වූයේ

නැති අතර එය වැරදි ලෙස අල්වා ගැනීමටත් අවශ්‍ය වූයේ නැත. මට අවශ්‍ය වූ එකම දෙය කියවීම මිස ලිවීම නොවීය. මා හට කියැවීම විනෝදජනක වූයේ යම් පමණකටද එපමණකට ම ලිවීම එපා විය.

කෙසේ හෝ මාගේ අම්මා නිරතුරු මෙසේ කියවන්නට වූවාය.

"අනේ පුතේ, ඔයා ලියන්න ඉගෙන ගත්තේ නැත්නම් කොහොමද ඉස්කෝලේ ගිහින් වැඩ කරන්නේ? කියැවීම විතරක් තිබුණාට මදි"

"හා හා දැන් ම මේ අකුරු ලියන්න පුරුදු වෙන්න එන්න!" තාත්තා, අම්මාගේ කතාවට එකතු කළේය.

හැම දිනකදී ම මා හට අසන්නට ලැබුණු දේ මෙසේ විය. හැමදා මේ ලෙස හෝඩිය ලියන්නට සිදුවීම මට මහත් වූ අප්‍රසන්න කාර්යයක් වී තිබිණ. මගේ ඇඳවුණු අකුරු ඉතාමත් අවලස්සන, වක ගැහුණු, කුදු ගැහුණු ඒවා වූ අතර මා ලියූ දේ දැකීම මට ම අප්‍රියජනක දෙයක් විය.

සැබවින්ම ඒවා එක ගොඩේ ලියැවුණු මහා ජංජාලයක් විය. නමුත් අකුරු ලියන්නට ගොස් මා අතින් නිමැවුණු තීන්ත පැල්ලම් ඉතාමත් අලංකාර ලෙසින් මට පෙණුනි. මට හැර වෙන කිසිවෙකුට එතරම් විශාල සහ එතරම් අලංකාර ලෙසින් තීන්ත පැල්ලම් මගින් රූප මැවීමට හැකියාවක් තිබුණේ නැත. කොළය මත තීන්ත පැල්ලම් ඇති කිරීමෙන් ම පමණක් මිනිසුන්ට අකුරු ලිවීමට උගත හැකි නම් මුළු ලොවින්ම විශිෂ්ටතම ලේඛන ශෛලියේ හිමිකරුවා වශයෙන් මා හට සම්මාන ලැබ ගැනීමට හැකිවන්නට ඉඩ තිබිණ.

තරමකින්වත් සතුටු විය හැකි තරමේ අකුරක් ලියා ගැනීමට මට නොහැකි විය. එයට අමතර ව හැම පිටුවක් ම පිරී තිබුණේ විශාල තීන්ත පැල්ලම් වලිනි. හැම අතින් ම මා හට බැණුම් අසන්නටත් නින්දාවට පත්වන්නටත් සිදු විය. අකුරු ලියන්නට පටන් ගත්

මොහොතේ සිට හැමවිට ම එකම අකුර දහ පහළොස් වරක් නැවත නැවත ලියන්නට මට සිදුවිය. නමුත් ලියන්න ලියන්න ඒවා හැඩ ගැහෙනු වෙනුවට තව තවත් නරක අතට හැරිණි. ඒ අතර ම මා ඇතින් ඇතිවුණු තීන්ත පැල්ලම් හි විශාලත්වය ද එන්න එන්නම වැඩි විය.

දෙමව්පියන් මේ ලෙසින් අකුරු ලියන්නට බල කරනුයේ මන්දැයි එකල වටහා ගැනීමේ හැකියාවක් මා හට නොවීය. කියවන්නට ඉගෙන ගැනීම මා හට අපහසු නොවූ දෙයකි. ඇත්ත වශයෙන් ම මට එකල අවශ්‍ය වූයේ අකුරු ලියන්නට නොව සම්පූර්ණ වචන ලියන්නටය. නමුත් හරියට අකුරු ලියන්නට නොදැන, ඒ අකුරු වලින් නිමැවෙන වචන ලියන්නට කිසිවෙකුට නොහැකි බව මා හට නිරතුරුව ම අවධාරණය කෙරිණි. එහෙත් මා කිසිදා ඒ වදන් විශ්වාසයට ගත්තේ නැත.

අවසානයේ මා පාසලට ඇතුළත් කෙරිණ. එහිදී, කියැවීමේ හැකියාව ඉහළින් ම ලබා තිබූ මාගේ ලිවීමේ හැකියාවේ තිබුණු අතිශය දුර්වලකම පිළිබඳ ව සියල්ලන් ම ඉතා පුදුමයට පත් වූ අතර ලිවීමේ හැකියාවෙන් පංතියේ දුර්වල ම තැන මට හිමිවිය.

එයින් පසු වසර ගණනාවක් පසුවිය. මම කෙමෙන් ලොකු මහත් වෙමින් පසු වීමි. නමුත් කියැවීමට තිබූ ආදරය, කැමැත්ත තරමට ම ලිවීමට ඇති අකමැත්ත අනෙක් පසින් වැඩි දියුණු වී තිබිණ. මගේ අත් අකුරු ඉතාමත් ම අවලස්සන, කැත ඒවා වූ අතර සමහරෙකු සිතුවේ ඒ මා සිතා මතා කරන දෙයක් ලෙසිනි.

සමහර අවස්ථා වලදී අවලස්සන අත් අකුරු නිසා ඉතාමත් අපහසුකාරී, නින්දා සහගත අවස්ථාවන්ට මුහුණ දීමට මට සිදු වූයේ වරක් දෙවරක් නොවේ. දිනක් මම තැපැල් කන්තෝරුවට ගියෙමි. එහිදී මා ලියා දුන් යමක් දෙස බලා සිටි ලිපිකරු මාගේ මුහුණ දෙස

බැලුවේය. නැවතත් ලියැවිල්ල දෙස බලා, "මට තෝර ගන්න බැහැ ඔබ මේ මොකක්ද ලියලා තියෙන්නේ කියලා"යි පැවසුවේ කොළය මා දෙසට දික් කරමිනි. මම කිව හැකි යමක් නොමැතිව බලා සිටියෙමි.

"මොකක්ද මේ අකුර?" එවර ඔහු ඇසුවේය.

"ආ... ඒ 'උ' යන්නනේ..." මම කෙඳිරිල්ලකට සමාන හඬකින් පැවසීමි.

"මක් කිව්වා? 'උ' යන්න? කවුද දෙයියනේ 'උ' යන්න මේ විදිහට ලියන්නේ?" විස්මයට පත් මුහුණින් යුතුව ඔහු මදෙස බැලුවේය.

"මම," මම නැවතත් කෙඳිරීමි.

වැඩිහිටියෙකු හැටියට දැන් කෙතරම් ලස්සන අත් අකුරු වෙනුවෙන් ප්‍රාර්ථනා කරනවා දැයි දන්නේ මා පමණි. අහෝ! මා හට ඕනෑම කෙනෙකුට පහසුවෙන් කියැවිය හැකි ප්‍රියමනාප, ලස්සන අත් අකුරු තිබුණා නම් කියා හැම විට ම දුක් වෙමි. එකල නිවැරදි ලෙසින් පෑන, පැන්සල අල්ලා ගන්නා අයුරු උගත්තා නම්! එලෙසින් නිවැරදි ලෙසින් ලිවීම ඉගෙන නොගැනීම ගැන අද මම මුළු හදින් ම දුක් වෙමි. නමුත් මගේ දුවේ දැන් මා ප්‍රමාද වැඩිය. ඒ දේ ඒ අයුරින් සිදු වූයේ වෙන කිසිවෙකුගේ වරදින් නොව මාගේ ම වරදිනි.

සොයුරු තනිකර දිවූ වේලේ



උවේ, මේ කතාව ඔයා හඳුනන කෙනෙකු පිළිබඳවයි. මේ සිදුවීම සිහිවන හැමවිටෙක ම මම ලැජ්ජාවටත් භයටත් පත්වෙමි.

මට වඩා වයසින් බාල වූ සහෝදරයෙක් මා හට සිටියේය.

ලොකු මහත් වී ඉංජිනේරුවකු ව සිටින, ඔබ විකී බාප්පා නමින් හඳුන්වන ඔහුටත් දැන් 'විකී' නමින් ම පුංචි පුතෙකු සිටී.

ඉතිං මා මේ කියන කාලය වන විට ඔබේ විකී බාප්පා, එනම් මගේ ආදරණීය මල්ලි ළදරුවකු විය. යන්තම් ඇවිදින්නට ඉගෙන ගනිමින් සිටි අතර පා ඔසවා ඇවිදිනවා වෙනුවට ඒ වන විටත් ඔහු බඩගා යෑමට වැඩි නැඹුරුවක් දැක්වීය. විටෙක පා ඔසවා යන ඔහු එක්වනම බිම වාඩි වෙයි. මේ ආදී කරුණු නිසා කිසි ලෙසකින්වත් මල්ලි ව තනි නොකළ යුතු බව නිවැසියන්ගේ ඒකමතික තීරණය විය.

කටයුතු මේ අයුරින් සිදුවන අතරේ දිනක් මාත් මල්ලිත් මිදුලේ සෙල්ලම් කරමින් පසුවීමු. එලෙසින් මද වේලාවක් ගත වන්නට ඇත. එක්වනම අප දෙදෙන සෙල්ලම් කරමින් සිටි බෝලය වීදිය දෙසට පෙරළිණි. මම වහ වහා බෝලය පසු පස දිව ගියෙමි. මගේ මල්ලි මා පසු පසින් බඩ ගා එන්නට විය.

අපගේ නිවස කඳු මුදුනට වන්නට තිබූ බැවින් බෝලය වීදිය දිගේ පහළට පෙරළි යන්නට විය. මා එය පසු පස දිව යන්නට විය. මා පසු පස මල්ලි පෙරළී එන්නට විය.

කඳු පාමුල දී අප වීදියට මහා පාරක් හමු වේ. අන්න එතැන දී මට බෝලය අල්ලා ගත හැකි විය. මල්ලිට මා අල්ලා ගත හැකි විය. අප තිදෙන අතරින් කුඩා ම කෙනා වුවත් බෝලයට එතරම් වෙහෙසක් දැනුණු බවක් නොපෙනිණ. මට මද වෙහෙසක් දැනිණ. මල්ලිට කෙතරම් වෙහෙස වීද යත් ඔහු හති හරිමින් සිටියේය. එසේ වුවත් උන් හිටි හැටියේ ඇවිදීමට උගත්තාක් මෙන් එක්වනම පුංචි පා දෙකට බර දෙමින් හිටගත් ඔහු කඩි මුඩියේ පාර මැදට ඇවිද ගියේය!

එක් වනම මහා පාර දූලි වළාවකින් වැසී ගියේය. ඒ සමගම අශ්වාරෝහක පෙළපාලියක් පැමිණෙන අයුරු දැකගත හැකිවිය. ඔවුන් පාර දිගේ වේගයෙන් එන්නට විය. මේ සිදුවීම සිදුවූයේ යුද්ධය අවසන් වූවාත් සමගමය.

යුද්ධය අවසන් වී තිබූ බව දැන සිටියත් ඒ මොහොතේ මම පෙර පුරුද්දට මෙන් භීතියෙන් ඇළලී ගියෙමි. බෝලය අත හැරිණ. මල්ලි තවමත් මහා පාර මැදය. මම ආපසු හැරී පිම්මේ ගෙදර දිව ගියෙමි. පාර මැද හිඳගෙන හිඳිමින් බෝලය සමග සෙල්ලම් කරන්නට ලැබීම පිළිබඳ ව මල්ලි නම් බොහෝ සෙයින් සතුටට පත් වන්නට ඇත. ඔහු අශ්වාරෝහකයින්ට කිසි ලෙසකින්වත් බිය වූයේ නොවේ. සැබවින් ම ඔහු කිසිම දෙයකට බිය වූයේ නොවේ. ඇත්ත වශයෙන්ම ඔහු බොහොම පුංචි අත දරුවෙකු පමණක් විය.

මේ අතරේ අශ්වාරෝහක හමුදාව ළඟ ළඟ ම පැමිණෙමින් තිබිණ. සුදු අශ්වයෙකු පිට නැගී සිටියේ කපිතාන්වරයාය. "නවතිනු!" එක්වනම ඔහු විධාන දුන්නේය. අසු පිටින් බිමට බට කපිතාන්වරයා කුඩා දරුවා වඩා ගත්තේය. ඔහුව ඔසවා මදක් ඉහළට විසි කළ කපිතාන්වරයා නැවතත් අල්ලාගෙන හඬ නගා සිනාසුණේය.

"හ්ම්... ඉතිං කොහොමද පුංචි ඉලන්දාරියා වැඩකටයුතු එහෙම?" ඔහු ඇසුවේය.

හඬ නගමින් නැගූ පුංචි කැකුළු සිනාවකින් කපිතාන්වරයාට සංග්‍රහ කළ මගේ මල්ලි බෝලය ඔහු අතට දුන්නේය. මේ අතරතුරේ අම්මාත් තාත්තාත් මාත් පිම්මේ කන්ද බැසගෙන දිව එමින් සිටියෝය.

"අනේ දෙවියනේ, කෝ මගේ දරුවා?" අම්මා කෑ ගසමින් දිව්වාය.

"කෑ ගහන්න එපා!"යැයි කෑ ගසමින් තාත්තා ද දිව්වේය. මම වැළපෙමින් දිව්වෙමි. අපි තිදෙන අවසානයේදී කපිතාන්වරයා අසලට ළඟා වීමු.

"මෙන්න ඔබේ දරුවා. ඔහු ප්‍රියමනාප පුංචි දරුවෙක්. ඔහු අඩුම ගණනේ අශ්වයන්ටවත් බය වුණේ නැහැ නෙව!" කපිතාන්වරයා පැවසුවේය.

තවත් වතාවක් මල්ලි ව උඩ දැමූ ඔහු අම්මා අතට මල්ලි ව දුන්නේය. තාත්තා අතට බෝලය දුන්නේය. අනතුරුව මා දෙස බැලූ ඔහු මෙලෙසින් පැවසුවේය.

"Garun fled faster than a doe" - *"ගරුන් මුවෙකුටත් වඩා වේගවත් වුණා"* වටව සිටි සියල්ලෝ ම මහා හඬින් සිනාසෙන්නට වූහ. අනතුරුව අශ්වාරෝහක සෙබළු පිටව ගියෝය. අම්මාත් තාත්තාත් මාත් මල්ලිත් කන්ද දිගේ නැග එන්නට වීමු. ඒ අතරතුරේ තාත්තා මට මෙලෙසින් පැවසුවේය.

"ගරුන් මුවෙකුටත් වඩා වේගවත් වුණේ ඔහුගේ ඇති දක්ෂ කමක් නිසා නෙමෙයි. ඔහු බයගුල්ලෙකු වූ නිසායි. කපිතාන් ඒ කිව්වේ ලීමොන්තව් නම් කවියාගේ කවියක පදයක්. මට නම් හරිම ලැජ්ජයි ඔයා ගැන පුතේ!"

මටත් ඇත්තට ම මා ගැනම මහත් වූ ලැජ්ජාවක් ඇතිවිණි.

ඉතිං දුවේ! මා කෙමෙන් වැඩී, වැඩිහිටියෙකු වූ පසු ලීමොන්තව්ගේ සියලුම කවි කියවමින් යන අතරේ, ඉහත කී පේළිය වෙත ආ දවසේ දරාගත නොහැකි අපහසුතාවයකින් පෙළෙන්නට වීමි. පෙර කී දින බියගුලු ලෙසින් මා දිව යන අතරේ අශ්වාරෝහක ප්‍රධානියා මාගේ ආදරණීය මල්ලි ව නුදුටුවේ නම්...!

මිතුරියයි මා ගලවා ගත්තේ

ඔයා දන්නවාද දුවේ, ඔයාට වගේ ම මටත් හොඳ මිතුරියක් සිටිය බව...

පුංචි කාලේ මා හට සිටි ඒ මිතුරියගේ නම මාෂා විය. ඇය කුඩා දැරියක් වූ අතර අපි එකතු වී බොහොම සතුටින් සෙල්ලම් කෙරුවෙමු. වැලි වලින් අලංකාර ගෙවල් සෑදුවෙමු. විශාල දිය කඩිත්තක කඩදාසි ඔරු පා කෙරුවෙමු. එහි ම මාළු බාන්නට ද ගියෙමු. කිසිදා කිසිම මාළුවකු අහු නොවූවද හැමවිටම එය ඉමහත් විනෝදයක් ඉපැදවූ දෙයක් විය.

මාෂා සමග සෙල්ලම් කිරීම මට සතුට ගෙන දෙන්නක් විය. ඈ කවදාවත් මා සමග රණ්ඩු කළේ නැත. මට ගල්වලින් ගැසුවේ නැත. මා යන එන විට කකුල දමා මා වැට්ටුවේ ද නැත. මා දන්නා සියලු ම පිරිමි ළමයින් මෙවන් ගතිගුණ වලින් යුතු වූවා නම් එය මට මහත් වූ සතුටක් වන්නට ඉඩ තිබිණ. නමුත් ඔවුන් සතුව මෙවන් ගතිගුණ නොවීය. ඒ වෙනුවට ඔවුහු ගැහැණු ළමයෙකු හා සෙල්ලම් කිරීම පිළිබඳ ව මා හට නිරතුරු සරදම් කළෝය. මා දුටු හැම විට ම ඔවුහු මෙලෙසින් ගායනා කරන්නට අමතක නොකළෝය.

සාෂා කැමති මාෂාට!
සාෂා කැමති මාෂාට!

"කවද්ද ඔය දෙන්නා විවාහ වන්නේ?" ඔවුහු ඇසුවෝය.

ඔවුන් හැමදෙන සිතුවේ පිරිමි ළමයෙකු හා ගැහැණු ළමයෙකු එක්ව සෙල්ලම් කිරීම බොහොම භයානක දෙයක් ලෙසිනි.

පිරිමි ළමුන්ගේ හිංසාවන් නිසා මගේ සිත බොහොම තදින් පෑරිණි. තනි වූ විටෙක මේ දේවල් සිහි වීමෙන් තනිව හැඬුවෙමි.

නමුත් පුංචි මාෂා මහා හඬින් සිනා පහළ කළාය. "ලී පොලු වලටත්, ගල් වලටත්, මගේ ඇට කටු කඩන්න පුළුවන්. නමුත් වචන වලට කවදාවත් මට රිද්දන්න බැහැ!" ඇය සිනා සී පැවසුවාය.

ඇයට සරදම් කිරීම තුළ කිසිවෙකු සතුටක් නොදුටුවේ එබැවිනි. අනෙක් අතට මට පමණක් සරදම් කිරීමට කොල්ලන් පෙළඹුණේ මේ නිසාය. මේ කාරණය සම්බන්ධයෙන් ඔවුන් මාෂා වෙත කිසි ලෙසකින්වත් අවධානය යොමු කළේ නැති තරමිය.

දිනක් අප සැම සෙල්ලම් කරන අතරතුර, එක් විශාල බල්ලෙකු මිදුලට දිව ආවේය. කිසිවෙකු බෙරිහන් දුන්නේය.

"පිස්සු බල්ලෙක්. පිස්සු බල්ලෙක්!"

පිරිමි ළමුන් සියලු දෙනා සී සී කඩ විසිර ගියෝය. කරකියාගත හැකි යමක් නොවූ මම හුන් තැන ම ගල් ගැසී බලා සිටියෙමි. බල්ලා මා වෙතට බොහෝ සෙයින් ළං විය. මෙන්න මේ මොහොතේ මාෂා මා වෙත දිව ආවාය. ඇය අත වූ කුඩා සවල ගෙන බල්ලා දෙසට වනන්නට වූවාය.

"දුවනවා යන්න මෙතැනින්!" ඇය කෑ ගසමින් අඩි පොළවේ හප්පන්නට වූවාය.

පිස්සු බල්ලා වලිගය කකුල් දෙක අස්සේ රඳවාගෙන අහකට දිව ගියේය. එවිට ඒ පිස්සු බල්ලෙකු නොවන වග හැමටම වැටහිණි. ඒ ඉබාගාතේ යන ගමන් අහම්බෙන් මිදුලට ආ බල්ලෙකි. හැම බල්ලා ම තමන්ගේ ගෙමිදුලෙත් ආගන්තුක ගෙමිදුලකත් වෙනස හොඳින් ම හඳුනයි. ඉතාමත් දරුණු, ප්‍රචණ්ඩ බල්ලෙකුට වුවත් ආගන්තුක ගෙමිදුලකදී සිය ප්‍රචණ්ඩත්වය අමතක ව යයි.

පිරිමි ළමයින් ඒ පිස්සු බල්ලෙකු නොවන වග වටහා ගත් වහාම බල්ලා පසු පස දිව යමින් කෑ කොස්සන් නගන්නට පටන් ගන්නා ලදි. නමුත් දුවේ! පළා යන බල්ලෙකු පසු පස පන්නාගෙන යන්නට තරම් නිර්භීත වීම එතරම් නුවණට හුරු දෙයක් නොවේ. බල්ලා පවා එය වටහා ගත්තා බඳුවිය. අප වීදියෙන් ඉවතට ගිය වහාම, බල්ලා නැවතුණෝය. නැවතී ආපසු හැරී පිරිමි ළමුන් දෙසට ගොරවාගෙන පැන්නේය. එවර නැවතත් ඔවුහු ගෙමිදුල වෙතට හැල්මේ දුව ආවෝය. එයින් නොනැවතී, කිසිත් නොකර පාඩුවේ සිටි මා හට සරදම් කරන්නට වූවෝය.

"බයගුල්ලා!" ඔවුහු කෑ ගැසූහ. "හපොයි බයගුල්ලා, කොච්චර බය වුණාද කිව්වොත් අඩුම ගානේ දුවා ගන්නවත් බැරිවුණා." එවර මම නිහඬව නොසිටියෙමි. මා වටහාගත් සත්‍යය පහදා දුනිමි. "ඔයාලා සේරම මෝඩ විදිහට බය වුණා. මාෂා විතරයි බය නොවුණු එකම කෙනා." එවර පිරිමි ළමයින් නිහඬ විය. නමුත් මාෂා ඉදිරිපත් වූවාය. "ඔයා වැරදියි. මමත් බය වුණා!"

ඈ එසේ පවසනවාත් සමගම සියල්ලෝ ම මහා හඬින් සිනා නගන්නට වූහ. නමුත් ඔවුනට සත්‍යය පැහැදිලි වන්නට ඇත. අප සියල්ලන් ම විටෙක නොවේ නම් වෙනත් විටෙක බිය වෙයි. නමුත් බිය පසෙක තබා නිර්භීත ව අවස්ථාවට මුහුණ දිය යුතුය. එය වටහාගත යුතුව ඇත. ඉතිං මගේ දුවේ! එයින් පසුව ඔවුන් කිසිදා මට සරදම් කළේ නැත. මාෂාත් මාත් හැමදාට ම හොඳ ම මිතුරන් වීමු.

සවිය උරගා බැලූ තාලේ



කෙමෙන් වැඩෙන විට මාගේ මිතුරු ලැයිස්තුව දිගුවන්නට විය. අපි හැම දා එක්ව සෙල්ලම් කෙරුවෙමු. විටෙක අපි වාද කෙරුවෙමු. එයින් නොනැවතී රණ්ඩු සරුවල් ද ඇතිකර ගත්තෙමු. නමුත් සැණෙකින් නැවතත් යථා තත්ත්වයට පත්වීමු. නමුත් කිසිදා රණ්ඩුවලට පැටලුණෝ නැති එක ළමයෙකු අප අතර විය. ඔහු 'වෝවා' නම් විය. මිටි ළමයෙකු වූ ඔහු ශක්තිමත් කෙනෙකු විය. ඔහුගේ පියා අශ්වාරෝහක හමුදාවේ නිලදරුවෙකු වූයේය. වෝවා නිරන්තරයෙන් 'බඩියොනි' නම් වූ, ඔහුගේ පියාගේ ප්‍රියතම කොමදෝරු තැන ගැන කතා කළේය. බඩියොනි කෙතරම් නිර්භීත ව සුදු සෙබළුන් හා සටන් කළේදැයි ඔහු අප හා නිරතුරු පැවසීය. බඩියොනි කිසිදා ජෙනරාල්වරුනට බිය වූයේ නැත. කර්නල්වරුන්ට බිය වූයේ නැත. උණ්ඩවලට හෝ අසිපත්වලට බිය වූයේ නැත.

බඩියොනිගේ අශ්වයා හා අසිපත ගැනද කියන්නට ද්වේල් වෝවා සතුවිය. ඔහු නිරන්තරයෙන් ම මෙසේ පැවසීය.

"මම ලොකු වුණාම, බඩියොනි වගේ කෙනෙක් වෙනවා."

වෝවාගේ නිවසට ගොස් ඔහු හමුවීම මට මහත් වූ සතුටක් ගෙනදිනි. එය හැමවිටම විනෝදජනක විය. වෝවා නිරන්තරයෙන් කුමක් හෝ දෙයක් කරමින් කාර්යය බහුලව පසුවිය. විටෙක ඔහු පාන් ගෙනෙන්නට වෙළෙඳසලට ගියේය. විටෙක පෝරණුවට දැමීමට දර පැලුවේය. ගේ අතුගෑවේය. එපමණක් නොව පිඟන් කෝප්ප සෝදා පිරිසිදු කළේය. වෝවා මෙලෙසින් හැමවිට ම කාර්යය බහුල විය.

පවුලේ සියල්ලන් ම වෝවාට බොහෝ සෙයින් ආදරය කළ බව මම දුටුවෙමි. බොහෝ විට වෝවාගේ පියා ඔහු ඇමතුවේ වැඩිහිටියෙකුට අමතන අයුරිනි. ඔහු මෙලෙසින් අසයි.

"වෝවා, අපි මේ ඉරිදා රාත්‍රී ආහාරයට ආරාධනා කරන්නේ කාටද?" එසේත් නැත්නම්, "වෝවා, ඔයා හිතනවද මේ දර ටික වසන්ත කාලය වෙනකම් අපිට ඇති වෙයි කියලා?"යැයි අසයි. ඒ හැමවිටම දියයුතු පිළිතුර වෝවා දැන උන්නේය.

වෝවාගේ මිතුරෙකු ඔවුන් බලන්නට පැමිණියේ නම් ඔවුහු ඔහුට අසුන් ගන්නට සලස්වා ප්‍රණීත යමකින් සංග්‍රහ කරන්නෝය. අනතුරුව හැමදෙන එකතු වී යම්කිසි ක්‍රීඩාවක නියැළෙති. වෝවාගේ නිවසේ තිබුණු ප්‍රීතිදායක පරිසරය අප නිවසේ කිසිදාක නොවීම ගැන මම නිරන්තරයෙන් කණස්සල්ලට පත්වීමි.

මාත් වෝවාත් අඹ යහළුවන් වුවද, ඔහුට රණ්ඩු වීමට උවමනා නොවූයේ මන්දැයි මට වටහාගත නොහැකි විය. ඉවසා සිටිය නොහැකි තැන මම ඔහුගෙන් මෙසේ විමසීමි.

"ඔයා රණ්ඩු වෙන්න, ගහගන්න බයයිද?"

"මොකක්ද ඇති පලේ තමන්ගේ ම කට්ටිය එක්ක රණ්ඩු වෙන එකේ?" ඔහු එක්වනම විමසීය.

වරක් පිරිමි ළමෝ තමුන් අතරින් වඩාම ශක්තිමත් කවුදැයි යන්න පිළිබඳ ව වාද කරන්නට වූහ.

"මං මට වඩා ලොකු කාටවත් බය නැහැ!" අප අතරින් කෙනෙකු පැවසීය. "මට පුළුවන් ඔයාලා සේරම රෑකඩ වගේ වීසිකරලා දාන්න. මේ බලන්න මගේ මස් පිඩු!" ඔහු අත නමා තමා සතුව ඇතැයි ඔහු සිතූ මස්පිඩු පෙන්වන්නට විය.

"මගේ ශක්තිමත් භාවය මටත් විශ්වාස කරගන්න බැරි තරමයි. විශේෂයෙන් මගේ වම් අත. ඒක හරියට යකඩෙන් හැදුවා වගෙයි," තවත් පිරිමි ළමයෙකු සිය වම් අත වනන්නට විය.

"ඔයාලාට ඇත්තට ම මං කොච්චර ශක්තිමත්ද කියලා දැන ගන්න ඕනෑ නම් මාව කෝප ගන්වලා බලන්න," තුන්වැන්නා පැවසීය. "හැබැයි ඊට පස්සේ ටිකක් එහාට මෙහාට වෙලා ඉන්න එක ඔයාලාට ඇඟට ගුණයි, මොකද මං මොනවා කරයිද කියලා මං ම දන්නේ නැහැ."

මේ සියලු කතා අසා සිටි මටත් යමක් කීමට අවශ්‍ය විය. එබැවින් මෙසේ පැවසීමි. "මොකද්ද ඇති පලේ වාද කර කර ඉන්න එකේ?

මං දන්නවා ඔයාලා හැමෝට ම වඩා මං ශක්තිමත් බව." අප තවදුරටත් ආඩම්බර කතා කියමින් පසු වුවද, වෝවා එකදු වදනක්

හෝ නොපැවසුවේය. මේ අතර එක් ළමයෙකු මෙසේ පැවසීය. "මං දන්නවා කරන්න ඕනෑ මොකක්ද කියලා! අපි පොර බදමු. එකිනෙකා පොර බදලා, බදලා, අවසානයේ කවුරු හරි කෙනෙක් දිනාවී. ආං ඒ කෙනා තමයි අපි අතර ශක්තිමත් ම කෙනා."

අපි හැමදෙන එක හඬින් එය අනුමත කළෙමු. වෝවා හා පොර බැදීමට හැමට ම අවශ්‍ය විය. කිසිදා අප කිසිවකු හා රණ්ඩු වී නොමැති බැවින් ඔහු ගැහැණු ළමයෙකු වැනි කෙනෙකු යැයි හැමදෙන සිතන්නට ඇත.

මුලින් වෝවාට අප කිසිවෙකු හා සටන් වදින්නට උවමනා වූයේ නැත. නමුත් පෙර කී 'යකඩවලින් නිමවූ ශක්තිමත් වම් අත හිමිකරුවා' විසින් ඔහුගේ අතින් තදින් ඇදීම නිසා වෝවාගේ කෝපය ඇවිස්සී ඔහු ව උස්සා බිමට විසි කළේය. මීළඟට අප සැම ඔසවා රූ කඩ මෙන් විසි කරන්නට සූදානමින් උන් ළමයා උඩුබැල්ලෙන් බිම වැතිරී සිටිනු දැකගත හැකිවිණි. ඊගාවට එළඹුණෝ කෝප ගැන්වීමෙන් සිය ශක්තිය උරගා බලන්නැයි කී ළමයාගේ අවස්ථාවයි. 'මට තාම ඇති තරම් කෝපය ඇවිස්සිලා නැහැ අයියෝ!'යැයි කියමින් හඬ නගද්දී ම ඔහුව ඔසවා වැරෙන් පොළව මත පතිත කෙරිණ. අවසාන වශයෙන් මගේ මිතුරා මාද ඔසවා පොළව මතට දමා ගැසීය. ඔහු මට පසුව පවසා සිටියේ, අප දෙදෙනාගේ මිතුරු කමේ නාමයෙන් මට පහරදීම ඔහුට ඉතාමත් අපහසු දෙයක් වූ බවයි.

"ඔයා තමයි අප අතරින් ශක්තිමත් ම කෙනා වෝවා. ඇයි ඒක අපිට කලින් නොකීවේ?" ළමෝ ඇසූහ.

වෝවා මහා හඬින් සිනා සී මෙසේ ඇසීය. "කට මැත දෙඩවීමෙන්, බලපුළුවන්කාරකම පෙන්වීමෙන්, ආඩම්බර කතා කීමෙන් මොකද්ද ඇති පලේ?"

අප සැම එම ප්‍රශ්නය හමුවේ නිරුත්තර විය. තම තමන්ගේ ශක්තිමත්කම් ගැන ආඩම්බර කතා කීම එයින් ම නැවතිණි. ශක්තිමත්වීම සඳහා කටමැත දෙඩවීමට වඩා කළයුතු බොහෝ දේ ඇති බව මම ද වටහා ගතිමි. වෝවා ගැන මසිතෙහි පැවති පැහැදීමට බලවත් වූ ගෞරවනීය හැඟීමක් එකතු විය.

වසර ගණනාවක් පසුවිය. මම වැඩුණු මිනිසෙකු වීමි. වෙනත් නගරයකට මගේ පදිංචිය මාරු වූ අතර වෝවා කොහේ වේදැයි නොදනිමි. ඒත් මගේ දුවේ! මට පැහැදිලි විශ්වාසයක් තිබේ. එනම්, වෝවා මෙලොව කොහේ සිටියත් යහපත් ළමයෙකු හැටියට හැදී වැඩී යහපත් මිනිසකු වන්නට ඇත.

ඉඳින් ඇරඹිණි පාසල් කාලේ



ළංචි දරුවකු ව සිටි අවධියේ මා නිරතුරු රෝගාතුර වන්නට විය. මට නොහැඳුණු එක ම එක ළමා රෝගයක්වත් නොවීය. සරම්ප, කම්මුල්ගාය, කක්කල් කැස්ස ආදී ලෙඩ රෝග බොහොමයක් හැදී සුව වූ පසු සංකූලතාවයන්ගෙන් පෙළෙන්නට වීමි. සංකූලතාවන් අවසන් වූ වහාම නැවතත් ලෙඩ රෝග සඳහා සූදානමින් පසුවිය යුතු ව තිබිණ.

පාසල් සමය අරඹන්නට කාලය උදා වූ විට ද නැවතත් මා පෙර පරිදි ම ලෙඩ වන්නට විය. අවසානයේ සියලුම රෝගයන්ගෙන් සුව වී පාසල් යන්නට පටන් ගත් විට මට දැක ගත හැකි වූයේ මගේ පංතියේ ළමුන් සියල්ලන් ම තරමක් දුරට ඉගෙනීම් කටයුතු අවසන් කර ඇති ආකාරයයි. එපමණක් නොව ඔවුන් එකිනෙකා හොඳින් හඳුනාගෙන සිටි

අතර ගුරුතුමිය පවා සියල්ලන් ම ඔවුන්ගේ නම් වලින් දැන හඳුනාගෙන සිටියාය. ඒත් මා හඳුනාගත් කිසිවෙකු නොවීය. හැමදෙන මා දෙස විමතියෙන් මෙන් ඇස් දල්වා බලා සිටින්නට විය. එය ඇත්ත වශයෙන් ම, මුල් වරට පාසලට පය ගැසූ දරුවෙකුට අපහසුකාරී අත්දැකීමකි. විශේෂයෙන් ම ඔවුන්ගෙන් කෙනෙකු මා වෙත දිව දික් කර ඇද කරන්නට වූ ආකාරය මා තව තවත් අපහසුවට පත් කරවන්නට විය.

මා එක්වරම ඇදගෙන වැටුණි. ඒ පිරිමි ළමයෙකු හිතාමතා ම මා යන මගට පය දික්කර වෙට්ටුවක් දැමූ නිසා බව වැටහුණේ පසුවය. නමුත් මා හැඬුවේ නැත. වහා නැගී සිට ඒ ළමයා වැරෙන් තල්ලු කළෙමි. ඔහු මේස පුටු පෙරලාගෙන ඇදගෙන වැටුණෝය. වහා නැගී සිටි ඔහු වෙර ගෙන මා තල්ලු කළේය. නැවතත් මා ඇදගෙන වැටුණේ පෙරටත් වඩා වේදනා ගෙන දෙමිනි. එහෙත් මෙවරද මා හැඬුවේ නැත. නැවතත් නැගී සිටි මම ඒ ළමයා තල්ලු කළෙමි. සීනුව නාද නොවුණා නම් අප දෙදෙන දිනය පුරා එකිනෙකා තල්ලු කරගනිමින්, මේස පුටු පෙරළාගෙන වැටෙමින් කාලය ගෙවා දමනු නිසැකය. ළමෝ පංති කාමරයට වැදී සිය අසුන් වලට වී තැන්පත් වූවෝය. නමුත් මම අසුන්ගත යුත්තේ කොතැනදැයි නොදැන අන්දමන්ද වී සිටගෙන සිටියෙමි. ගුරුතුමිය එක්තරා ගැහැණු ළමයෙකු අසලින් අසුන් ගන්නා ලෙසින් මට කීවාය. මම ඇයට අවනත වීමි. එපමණයි! සැමදෙන කොක්හඬලා සිනා නගන්නට වූහ. මා අසල සිටි ඒ ගෑණු ළමයාද ඔවුනට එක් වී සිනා නැගුවාය.

මට හැඬුම් එන්නට ආසන්න සේ දැනිණ. නමුත් එක් වනම දෙවියන්ට ස්තුති වන්නට මට හොඳ අදහසක් පහළ විය. එම සිදුවීම විශාල විනෝදයක් ලෙසින් දුටු සේ මමද ඒ කොක් හඬලෑමට එක්වීමි. එවට ගුරුතුමිය ද අපට එක් වූවාය.

"අන්න හොඳ ළමයා. මං බයේ හිටියේ ඔයා අඬන්නයි යන්නේ කියලා," ඇය පැවසුවාය.

"ඔව් මට ඇත්තට ම ඇඬෙන්න ම ආවා," මම පැවසීමි.

එවර නැවතත් පංති සිනා සාගරයක ගිලුණි.

"දැන් දරුවනි," ගුරුතුමිය පංතිය නිහඬ කරමින් පැවසුවාය, " මං ඔයාලාට සිහිපත් කරන්න කැමතියි දැන් ටිකකට කලින් වුණු සිදුවීම, ඔයාලාට කවදා හරි දවසක ඇඬෙන්න එනවා වගේ දැනුණු වෙලාවක මේ අපේ සාෂා වගේ, මුහුණ පිරිලා යන තරමේ ලොකු හිනාවකින් ඒ හැඬුම නැති කරගන්න උත්සාහ කරන්න ඕනෑ. මං මේ දුන්නු පුංචි අවවාදය ඔයාලාගේ ඉදිරි ජිවිත කාලයට ම වැදගත් වේවි. විවිධ අවස්ථාවලදී ඔයාලාට මේ දේ අවශ්‍ය වේවි. ඒක නිසා එය හොඳින් සිහි තබා ගන්න. හොඳයි, දැන් අපි පාඩමට යමු."

ඒ පළමු දවසේ දී ම පංතියේ අනෙක් සියලුම ළමයින්ට වඩා හොඳින් මා හට පාඩම කියැවිය හැකි බව සොයා ගතිමි. එලෙසින් ම ලිවීමේ හැකියාව අන් සියල්ලට ම වඩා දුර්වල බවද සොයා ගතිමි. කෙසේ නමුදු, පාඩම අතරතුරේ වෙනත් දේ කියව කියවා ඉන්නට ද සියල්ලන්ට ම වඩා සමතා මා බව වටහාගත් පසු ගුරුතුමිය තරවටු ස්වරූපයෙන් මා වෙත ඇඟිල්ල වනන්නට වූවාය.

ඇය ඉතාමත් හොඳ ගුරුවරියක් වූවාය. ඇය දැඩිය. නමුදු කරුණාවන්තය. ඇගේ ඉගැන්වීම් අපට විනෝදයක් ගෙනදිණි. මගේ දුවේ! ඇගේ අවවාදය මට මගේ ජිවිත කාලය පුරාම සිහිපත්වනු ඇත. නුඹත් ඒ අවවාදය හොඳින් සිහිතබාගනු ඇතැයි සිතමි.

ඒ මගේ පාසල් දිවියේ පළමු දිනය විය. එයින් අනතුරුව තවත් බොහෝ දින එළඹිණ. ඒ අතර විනෝදබර, දුක්බර, යහපත් සහ

අයහපත් ආදී වශයෙන් වූ නොයෙක් දේ සිදු වූ දින මාගේ පාසල් දිවියේ තිබිණා. නමුත් එය වෙනම කතාන්දර එකතුවකි.

රන්දිකා රණවීර

පමා වී පාසල් ගියෙමි ඒ කාලේ



අනෙක් ඕනෑ ම ළමයෙකුගේ සේම මගේ පාසල් දිවිය ද කුඩා අවධියේදී ම ඇරඹිණි.

මගේ පාසලේ අනෙකුත් ළමයි උදෑසන පාසල ආරම්භ කිරීමේ සීනුව නාද වීමට ප්‍රථම පාසලට පැමිණියහ. නමුත් මම සැමදා ප්‍රමාද වී දුවන්නකු වී සිටියෙමි. කෙටියෙන් ම කියතොත් සමහර දිනෙක පළමු පරිච්ඡේදය මග හැරී යාමටද මගේ මේ ප්‍රමාදය හේතු වී තිබිණ. මෙම කාරණය ගුරුතුමියගේ නිමක් නොමැති පුදුමයට හේතුවිය. තමන්ට කිසිදා මෙවන් සිසුවකු හමු වී නොමැති බව ඇය ස්ථිර ලෙසින් පවසා සිටියාය. විදුහල්පතිතුමාත් පවසා සිටියේ මා වෙනත් කිසිදු පාසලකින් සොයා ගත නොහැකි ආකාරයේ අරුම පුදුම සිසුවෙකු බවයි.

"මේ ළමයා හැමදාමත් ප්‍රමාදයි!" ඔහු පැවසුවේය. "එයාගේ දෙමව්පියන් මං එයාලාට කතා කරපු දෙපාර ම කිව්වේ තමන්ට කරන්න දෙයක් නෑ කියලායි"

ඇත්ත වශයෙන් ම මගේ දෙමව්පියන්ට කළ හැකි දෙයක් නොවීය. දිනපතා සන්ධ්‍යාවේ නිවස තුළ එකම නාට්‍යය රඟ දක්වන ලදැයි පැවසුවොත් වැරදි නොවේ.

"ගෙදර වැඩ කළාද?" මගේ අම්මා අසයි. "තත්පරයක් ඉන්න" මම පවසමි. "ඔය පොත කියවිල්ල නවත්තලා මේ දැන් ම ගෙදර වැඩ කරන්න පටන් ගන්නයි කිව්වේ!" තාත්තා පවසයි. "අනේ තව එක පිටුවයි," මම බැගෑපත් වෙමි. ඉදින් මම ඒ එක පිටුව කියවා අවසානයේ තව පිටුවකට මුල පුරමි. මා කියවමින් සිටි ඉතාමත් රසවත් වූ කතාන්දර පොත පසෙක තබා නීරස යැයි මා සිතූ පාඩම් වැඩක් අරඹන්නට කිසිදාක මට නොහැකි විය.

"පොත පැත්තකින් තියන්න!"

"තත්පරයක් ඉන්න"

"පොත පැත්තකින් තියන්න!"

"තත්පරයක් ඉන්න"

අවසානයේ ඔවුන්ගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගිය මොහොතේ දෙදෙනාගෙන් එක් අයෙක් මගෙන් පොත උදුරා ගනියි.

"අන්තිමේ නුඹ කම්මැලිකාර නිකමෙකු වෙලා තමයි නවතින්නේ" ඔවුහු බැණ වදිති.

එවිට මම තදින් ම මගේ අකමැත්ත ප්‍රකාශ කරන්නේ කෑ මොර දී විලාප දෙමින් වන අතර තදින් ම පොත ඉල්ලා පා පොළොවේ වද්දමින් හඬන්නටද පසුබට නොවෙමි. පොත නැවත නොලැබුණොත් ගෙදර වැඩ නොකරන වග පවසමින් ගෝරනාඩු කරමි.

ඒ ආකාරයට සැන්දෑව ඇදී යයි. කෙසේ හෝ අවසානයේ මා ගෙදර වැඩ කිරීමට හිඳ ගත්තත් ඒ මොහොතේ පටන් නිදි කිරා වැටීම ඇරඹෙන අතර අම්මාත් තාත්තාත් මිනිත්තුවක්වත් නතර නොවී මා අවදි කිරීමේ නිරත වෙති. මම නැවත නැවතත් නිදි කිරා වැටෙමි. සැමදාමත් අඩ නින්දේ තෝන්තුවාවෙන් මෙන් ගෙදර වැඩ කරන්නට සිදු වූයේ මේ හේතුව නිසාය. මා ගෙදර වැඩ පොත තුළ අඩ නින්දෙන් සැරිසරා එය අවසන් කරන විට බොහෝ රෑ බෝ වී තිබෙන අතර ඒ වනවිට අම්මාත් තාත්තාත් අධික ලෙස වෙහෙසට පත් ව සිටිති.

එළඹෙන උදෑසන රඟ දැක්වෙන්නේ ඉහත කී නාට්‍යයට හාත්පසින් ම වෙනස් නාට්‍යයකි.

"නැගිටින්න" අම්මා කියයි.

"තත්පරයක් ඉන්න" මම මුමුණමි.

"නැගිටින්න!" තාත්තා කෑ ගසයි.

"තත්පරයක් ඉන්න"

"ඔයාට පරක්කු වෙයි"

කෙනෙකු රෑ බෝ වී නින්දට ගියහොත් පසුදා පාන්දරින් ම අවදිවීම කෙතරම් අපහසු දැයි ඕනෑ ම කෙනෙකු දන්නා කාරණයකි. ඔබේ සියලුම මිහිරිතම සිහින ඔබ හමුවට පැමිණෙන්නේ හිම්දිරි පාන්දර නොවේද? විශේෂයෙන් ඔබට පාසල් යාමට තිබේ නම්...

ඇලි මෑලි දුරුකර, ඈනුම් ඇර, ඇඳෙන් බැස, මුහුණ කට සෝදාගෙන, අඩ නින්දේ මෙන් ඇඳුම් ඇඳ ගන්නා අතරේ කාලය සීරුවෙන් ගමන් කරමින් තිබේ. උදෑසන ආහාරය ගන්නා අතරේ නිදි කිරා වැටෙන මම එය අවසානයේ යන්තමින් පොත්පත් ටික එකතු කර ගන්නට සමත් වෙමි. කෙසේ හෝ අවසානයේ එක්වන ම අවදිවන මම හොඳ සිහියෙන් යුතුව නිවසෙන් පිටතට පැන පාර දිගේ පාසල වෙත

දිව යමි. ඒ අතරතුරේ වීදි ඔරලෝසු කණුව දකින වාරයක් පාසා මගේ හදවත කලබලයෙන් හා වේදනාවෙන් රිදුම් දෙන ආකාරය විඳ ගනිමි.

අවසානයේ හුස්මක් කටක් නොමැතිව, කඩා බිඳගෙන මා පංතියට ඇතුළුවන විට පංතියේ ළමයින් පමණක් නොව ගුරුතුමියද මහා හඬින් සිනාසෙන්නට වන්නීය. "ආ මෙන්න අපේ නිදිගුල්ලා!" ඇය පවසන්නීය. එය ඉතාමත් වේදනාකාරී හැඳින්වීමක් වූ බව ඔබට මා කිව යුතුද?

වරක් මා දැක්වෙන විකට කාටූන් චිත්‍රයක් පාසලේ බිත්ති පුවත්පතේ පළ විය. මා ඇඳෙහි ගොරවමින් සුව නින්දේ පසුවන අතරේ මගේ අම්මාත් තාත්තාත් විශාල භාජන දෙකකින් මා මත වතුර වත් කරන ආකාරයක්ද, විශාල එලාර්ම් ඔරලෝසුවක් මගේ කනකින් අදින ආකාරයත්, අනෙක් කන අසලට ළං වී පිරිමි ළමයෙකු ට්‍රම්පටයක් වාදනය කරන ආකාරයත් එයින් දක්වා තිබිණ. එහි යටින් වාක්‍යය කණ්ඩයක්ද සටහන් කර තිබිණ."පාසල් දරු නැළවිල්ල" එය මා කේන්තියට පත් කළත් මගේ පමා වීමේ වෙනසක් සිදු නොවීය.

දවසේ අවසානය දක්වා ම ගෙදර වැඩ නොකර කල් හැරීම නිසා කිසිදාක එය නිසියාකාරව සම්පූර්ණ කිරීමට නොහැකි වූවා පමණක් නොව ඒ හේතුවෙන් උදෑසන පාසලට පැමිණීමට පමා වූ නිසා තව පාඩමක ආරම්භයේ ගුරුතුමිය විසින් කරන පැහැදිලි කිරීම් සැමදා මට මග හැරිණ. මෙනිසා පංතියේ අනෙක් ළමුන් කරමින් සිටින්නේ මොනවාදැයි යන්න ගැන වටහා ගැනීම මා හට ඉතාමත් අපහසු කාරණයක් විය. අනෙක් අතට මා සැමදා කලබලයෙන්, සැමදා ප්‍රමාද වෙමින්, සැමදා දුවමින් හා සැමදා තිගැස්සෙමින් ජීවත්වන්නකු බවට හැරී තිබිණ. මේ හැමදේම මගේ නරකට ම හේතු වූ අතර ඒ දේවල් එසේ තිබියදීත් තවදුරටත් මා ප්‍රමාද වීමෙන් මිදී නොතිබිණ.

එක් යහපත් දිනකදී මා අනෙක් හැමට ම පෙර පාසලට පැමිණි පසු කිසිදාක ගුරුවරුන් මා හට බැණ වැදුණෝවත් ළමුන් විහිළු

කලේවත් නැති බව ඔබට පවසන්නට තිබේ නම් මම ඉතා සතුටුවෙමි. තවද එයින් අනතුරු ව මා කිසිදාක පමා වී පාසල් නොගිය බව පවසන්නට තිබුණේ නම් මම වඩාත් සතුටු වෙමි.

නමුත් මට මුසාබස් පැවසීමට අවැසි නොවේ.

ඉදින් මම මාගේ මුළු ජීවිත කාලය තුරාවට ම ප්‍රමාද වන්නෙකු බවට පත්වීමි. කුඩා කලදී පාසල් යාමට දිනපතා ප්‍රමාද වීමි. යොවුන් අවධියේදී උසස් පාසලට යාමට දිනපතා ප්‍රමාද වීමි. අනතුරුව එළඹි සමයේ රැකියාවට යාමට දිනපතා ප්‍රමාද වීමි. කුඩා දරුවකු ව සිටි සමයේදී මේ කාරණයේදී මා හට දඬුවම් කෙරිණ. බැණ වැදිණ. ලජ්ජාවට පත් කෙරිණ. කෙමෙන් කෙමෙන් වැඩෙන විට මේ නරක පුරුද්ද නිසා මට බොහෝ දේවල් අහිමි විය. චිත්‍රපටයක් නරඹන්නට යනවිට සෑම විටම ප්‍රමාද වී යෑමෙන් එහි මුල් කොටස් මග හැරිණ. උත්සව සඳහා ප්‍රමාද වී යාම නිසා නැවතත් ආරාධනා නොලැබෙන තැනට කටයුතු සැලසිණ. ව්‍යාපාර සැසි වාර සඳහා ප්‍රමාද වීමෙන් සියලු සබඳතා බිඳ වැටීමටත් මගේ මේ නරක පුරුද්ද මට ඉතාමත් නරක ආකාරය බල පෑවේය.

බොහෝ වසරවලදී මා හට නව වසර උදා වූයේ කිසිවෙකුත් නොමැති වූ පාළු වීදියකදීය. ඒ, එදිනත් නව අවුරුදු උත්සවයකට පමා වී කලබලයෙන් දිව යමින් සිටිය නිසාය. ආරාධිතයෝ නොසන්සුන් කමින් යුතුව මා එනතුරු බලා සිටියෝය.

මගේ මේ ප්‍රමාදය ගැන සිනහ උපදවන කතා ගොතා කීමට මගේ මිතුරෝ ඉතා ඕනෑ කමින් සැදී පැහැදී සිටියෝය. ඇත්තට ම දැන් මට සෙමින් ගමන් කරන්නේ කෙලෙසදැයි යන්න ගැන කිසිම අදහසක් නැත. මා නිරතුරු කඩියෙකු මෙන් දිවයන කඩිමුඩිකාරයෙකු බවට පත් වී තිබේ. ඒ සෑමවිට ම පමා වී අදාළ කටයුත්තට යොමු වීම නිසාය. රාත්‍රියේ නින්දේ දී සිහිනයෙන් පවා මා දකින්නේ යම්කිසි කටයුත්තකට පමා වී මා දිව යන ආකාරයයි. එබැවින් නින්දෙන්

වෙව්ලමින් වැළපුණු අවස්ථා එමටය. සමහර දිනෙක සිහිනයෙන් දකින්නේ කුඩා දරුවකු ව සිටින මා පාසල වෙත දිව යන අතරේ ඉහළින් ඇති ඔරලෝසුව දෙසට නෙත් යොමන විට පාසල ආරම්භ වීමට තව බොහෝ වේලා ඇති බව දැන ගන්නට ලැබෙන අතර සියල්ලෝ ම මට සුබ පතති. විදුහල්පතිතුමාද මා හට මල් කළඹක් පිරිනමයි. ඔවුහු මගේ පිංතූරයක් ගෙන පාසලේ ශ්‍රවණාගාරයේ එල්ලා තබති. තූර්යවාදක කණ්ඩායම මා වෙනුවෙන් වාදනයෙහි යෙදෙයි. ඒ අවස්ථාවේදී පියවි ලොවට පිවිසෙන මම බොහෝ සෙයින් පසුතැවිල්ලට පත්වෙමි. දුවේ, ඒ හැමවිටම මා හට සිතෙන එක් කරුණක් තිබේ. එය නම්, නැවත මා හට කුඩා දරුවෙකු වන්නට තිබේ නම් යළි කිසිදා පාසලට ප්‍රමාද වී නොයන බවයි.

සිනමා සිත්තම මග හැරුණු තාලේ



කුඩා දරුවෙකු ව උන් කාලයේ කිසිදා මා චිත්‍රපට බැලීමට කැඳවාගෙන නොයන ලදී. දෙමව්පියන් සැමවිට පැවසුවේ, "ඔයා ගොඩක් පුංචියි පුතේ. තව කල් තියෙනවා. දැන් ම ගිහින් ඔයාට බලන්න තරම් දෙයක් එහේ නැහැ" යනුවෙනි.

අම්මාත් තාත්තාත් එසේ පවසන විට නැන්දාට ද පවසන්නට යමක් තිබිණ. "චිත්‍රපට ශාලා කියන්නේ වසංගත රාජධානි. එහේ, සරම්ප, කම්මුල්ගාය, කක්කල් කැස්ස වගේ ලෙඩ හැර වෙන ඇති

දෙයක් නැහැ. මේ ලෙඩ ගැන කියද්දී, ඩිප්තීරියාව ගැන එහෙම කියන්නත් දෙයක් නැහැ. අනිවාර්යයෙන් තියෙනවාමයි"

අනතුරුව මා ආදරණීය නැන්දනිය ඩිප්තීරියාව පිළිබඳ ව දීර්ඝ දේශනයක යෙදෙයි. ඒ දේවල් කෙසේ වුවද මා ඔවුන්ගෙන් බැගෑපත් ව ඉල්ලා සිටියේ මා ද ඔවුන් හා රැගෙන යන ලෙසිනි. මගේ මිතුරන් බොහෝ කලක සිටි චිත්‍රපට නරඹන්නට කැඳවා ගෙන යන බවත් එහෙත් ඔවුන් කිසිවෙකුට සරම්ප කම්මුල්ගාය, කක්කල් කැස්ස ආදිය නොවැළඳුණු බවත් එනයින් ගත් කල ඩිප්තීරියාව ගැන කීමටවත් දෙයක් නොමැති බවත් මා පවසන විටදී ඔවුහු අඩුම වශයෙන් මට ඇහුන්කම් දීමට තරම්වත් පමා නොවූහ. පිළිතුර සෑම විටම එකම විය.

"ඔයා ඉස්කෝලේ යන්න තරම් ලොකු වුණාට පස්සේ ඒක ගැටළුවක් නෙමෙයි. ඒ කාලේ වෙද්දි කොහොමත් ලෙඩ රෝග වලින් ඔයාව සම්පූර්ණයෙන් බේර ගන්න අපට හැකි වෙන්නේ නැහැ. එතකොට ඔයාව චිත්‍රපට බලන්න එක්ක යන්න පුළුවන්"

මගේ යහළුවන් ඔවුන් නැරඹූ නවතම චිත්‍රපට මා ඉදිරියේ රඟ දක්වා පෙන්වන ලදින් සැබවින් ම ඒවා මා විසින් ම නැරඹූ සෙයක් මට හැඟී තිබිණ. 'ද මාස්ක් ඔෆ් සෝරෝ' චිත්‍රපටයේ රංගන ශිල්පි 'ඩග්ලස් ෆෙයාර්බෑන්ක්ස්' සෝරෝ ලෙසින් කාල වර්ණ ඇඳුම් ආයිත්තම් වලින් හා කාල වර්ණ මුව ආවරණයකින් සැරසී කඩු හරඹ කරමින් හතුරන් වනසා ලූ ආකාරය මගේ එක් මිතුරෙක් මා වටා පැන පැන යමින් මනාව රඟ දක්වා පෙන්වූයේය. චාලි චැප්ලින්, අයිගෝ ඉලින්ස්කි ආදීන් ද අනුකරණය කරමින් ඔවුන් ඉතාමත් අගනා චිත්‍රපට මාලාවක් ම මා ඉදිරියේ මවා පෙන්විය. ක්‍රීඩාපිටිය පුරා පැන පැන දුවමින් කෙනෙකු, ප්‍රසිද්ධ ගොපළු චිත්‍රපට නළුවකු වූ විලියම් හාට් බවට පත් වූ අතර එක් දිනෙක මට අසන්නට ලැබුණේ මේරි පික්ෆෝඩ් හට ඉතාමත් මන බඳනා වූ සිනාවක් ඇති බව වැඩිහිටි සිසුන් පවසන ආකාරයයි.

"මොන වගේ හිනාවක් ද ඇයට ඇත්තේ," මම මගේ මිතුරන්ගෙන් ඇසීමි. මගේ මිතුරන්ගෙන් කෙනෙකු ඇගේ සිනාව මේ ආකාරයැයි සිනාසී පෙන්වීය. ඔහු කෙතරම් කැපවීමකින් එම කාර්යයේ නියැලුණේද යත් එය මේරි පික්ෆෝඩ්ගේ සිනාවටත් වඩා මනරම් බව සැමදෙන පවසන්නට වූහ. විශේෂයෙන් ම ඇය වසර ගණනාවක් තිස්සේ මුදලට සිනාපාන අතරේ අප මිතුරා ඇගේ සිනාව නොමිලේ ම සිහි මිතුරාගේ සතුට වෙනුවෙන් දැක්වීම කෙතරම් අගය කළ යුතුද?

මගේ මිතුරන් මේ සැමදේ ම කළේ මා ඔවුන් සේම තුටින් සිටිනු දැකීමට බව මම දනිමි. නමුත් එයින් සිදු වූයේ මගේ චිත්‍රපට බැලීමේ ආශාව තව තවත් උත්සන්න වීමයි.

අවසානයේ ඒ සතුටුදායක දිනය උදාවිය. මා පාසල් සිසුවකු බවට පත්විය. එළඹුණු පළමු වැනි ඉරුදින ම අපගේ ආදරණීය ගුරුතුමිය චිත්‍රපටයක පස්වරු දර්ශනය සඳහා අප කැඳවාගෙන ගියාය.

'පුංචි රතු යක්ෂයින්' නම් වූ එහි කතාව අඩංගු පොත මා කියවා තිබිණ. මම එහි අඩංගු යම් යම් කොටස් දැකබලා ගැනීමට තදබල උනන්දුවකින් සහ ආශාවකින් පෙළෙමින් ඉමහත් සතුටින් චිත්‍රපට ශාලාවට ඇතුළු වීමි.

එය මගේ නිවසට එතරම් දුර තැනක් නොවීය. මගේ මල්ලි විකී පවා එය ඇති තැන දැන උන්නේය. එනිසා නිරතුරුවම පමාවන මට ප්‍රථම මල්ලි එහි පැමිණ මගේ මිතුරන් සමග මිතුරු ව සිටින ආකාරය දැක ගත හැකිවිය. ඔහු ඉතාමත් සුරතල් දරුවෙකු මගේ ගුරුතුමිය පැවසුවාය. ඔහු එහි සිටින බව දුටු මම වදනක්වත් නොපැවසීමි. වහා ඔහුගේ කොලරයෙන් ඔසවා ගත් මම ඔහුව පිටතට ඇද දැමීමි. මල්ලි බෙරිහන් දෙන්නට වූයේය.. ඔහුගේ කටේ තිබුණු ලොසින්ජර තුන ම බිම වැටිණ. මගේ පංතියේ ගැහැණු ළමයින් ඔහුට ඉතා හොඳින් සංග්‍රහ කර තිබුණු අතර මෙවැනි අවස්ථාවන්හි දි ඉතාමත් ආචාරශීලි

දරුවෙකු බවට පත් වන මගේ මල්ලි යම් අයෙකු ඔහුට ලොසින්ජර පිරිනමන්නේ නම් ඒවා කෙසේවත් ප්‍රතික්ෂේප නොකරන්නට තරම් ම ආචාරශීලි වන්නේය.

ඉඳින් මගේ මල්ලි කෙතරම් තදින් හඬන්නට වූයේද යත් මගේ පංතියේ සියලුම ළමෝ මා හැරදමා ඔහුගේ පැත්තට වූහ. ගුරුතුමිය පවා ඔවුනට එක් වූවාය. "එයාට අපිත් එක්ක එන්න අරින්න. මම එයාගේ වගකීම භාර ගන්නවා" ඇය පැවසුවාය.

ඉඳින් මම ඔහුගේ කොලරය අත් හැර දැමීමි. අපි සැවොම චිත්‍රපට ශාලාවට ඇතුළු වීමු. ළමෝ සෑම දොරකින් ම කලබලයෙන් දිව ගියෝය. සතුටින් මුසපත් ව සිටි මගේ මල්ලි සියල්ලන්ට ම ඉදිරියෙන් හාවෙකු මෙන් පැන පැන යමින් සිටියේය. එක්වනම ඔහු පය පැකිළී බිම හොත්තේය. ඔහුගේ පිටු පසින් ඔහුට ළංව දිව යමින් සිටි මා ඔහු මත ඇද වැටිණ. මේ ආකාරයට අප පසු පසින් දිව එමින් සිටි සියල්ලන් ම මද අඳුරේ එකිනෙකා මත ඇද වැටෙමින් පෙරළෙන්නට වූහ. එකම ජංජාලයකි. එය ඉතාමත් භයංකර තත්ත්වයක් විය. විශේෂයෙන් ම මෙම ළමයින් කන්දේ පතුලේ ම සිටි අයට!

පෙර හාවෙකු මෙන් පැන පැන යමින් සිටි මගේ මල්ලි ඒ වනවිට ඌරෙකු මෙන් බියෙන් හඬ නගමින් උන්නේය. මමත් ඔහුට නොදෙවෙනි ලෙසින් කෑ මොර දෙමින් සිටියෙමි. එවිටම වාගේ අප ගුරුතුමියත් වෙනත් පාසල් දෙකකින් පැමිණ සිටි ගුරුතුමියන් දෙදෙනෙකුත් වහ වහා පැමිණ ගළවා ගැනීමේ මෙහෙයුම දියත් කරන ලදී. ඔවුන් විසින් තවදුරටත් දිව එමින් සිටි ළමයින් නතර කරන ලද අතර ළමයින් කන්ද කෙමෙන් කෙමෙන් වෙන් කරන්නට විය. අවසානයේ කන්ද පතුලේ ම සිටි මාත් මල්ලිත් ඔවුන් මතුකර ගන්නා අවස්ථාව වනවිට අප දෙදෙන තැළී පොඩි වී මිරිකී නිල් පැහැ ගැන්වී සිටියා මතක තිබේ. තුවාළ කරුවන් වශයෙන් අප දෙදෙන නිවසට පිටත් කර හරින ලදී. අප දුටු සැණින් නැන්දනිය කෑ මොර දුන්නාය. "දැක්කද? දැක්කද? ඕක තමයි මං කිව්වේ!"

එයින් අනතුරුව තවත් බොහෝ කලක් ගතවනතුරු චිත්‍රපට ශාලා මට තහනම් කලාප බවට පත්විය. අවසානයේ කලකට පසු නැවත මා හට අවසර ලැබිණ. 'පුංචි රතු යක්ෂයින්' සේම තවත් බොහෝ චිත්‍රපට නැරඹීමට මට හැකිවිණ. එහෙත් මගේ දුවේ! තවමත් මගේ ආශාව නම් නිම වී නැත. ඒ වගේම විකී බාප්පාගේත්!

කිම් ද? මිතුරියනි කළේ සරදම්

මා පාසල් යන ළමයෙකු ව සිටි අවධියේ පාසල තුළදී නිතර ම වූ දෙයක් තිබිණි. කාල පරිච්ඡේදයක් අරඹන්නට සීනුව නාද වෙයි, ළමෝ එහෙ මෙහෙ දිව යති, මද වේලාවකින් සියලුම කොරිඩෝර හිස් වෙයි. ළමයින් සැමදෙන තම තමන්ගේ අසුන් වෙත පැන හිඳ ගනිති. නමුත් මා පමණක් පංති කාමරයේ දොරට මෙපිටින් සිට තදින් හඬමින් සිටින්නේ මගේ පංතියේ මිතුරන් සැමදෙන කැකිරි පළමින් සිනා නගමින් සිටිනා අතරතුරදීය. ගුරුතුමිය පැමිණෙන්නේ කාරණය කුමක්දැයි හොඳින් ම දැනගෙනය.

"මොකද මේ?" මද සිනාවක් මැදින් ඇය අසන්නීය. "ආපහු ගැහැණු ළමයි ටික ඔයාව විහිළුවට ගත්තද?" මම සෙමින් හිස වනමි.

ඇයි ඔවුන් එලෙසින් මා විහිළුවකට ගත්තේ කියා නුඹට සිතා ගත හැකිද මගේ දුවේ? ඔවුන් කුමක් කළේදැයි නුඹ දන්නේද?

ඒක හරිම සරළ දෙයක්. විවේක කාලයේදී අනෙක් ළමුන් කල්ලි ගැසී සෙල්ලම් කරන්නට යන විටදී, ගැහැණු ළමෝ හතර පස් දෙනෙකු පමණ පැමිණ මගේ මේසය පිටු පස සිට කැකිරි පළන්නට පටන් ගනිති. එකල මා ඉතාමත් ලජ්ජාශීලි නිහඬ ළමයෙකු විය. ගැහැණු ළමයෙකු හා මා දිනෙක සෙල්ලම් කළේ නම් ඒ මාෂා සමග පමණය. මා සැමවිට ම උත්සාහ කළේ ගැහැණු ළමයින්ගෙන් හැකි තරම් ඈත් ව සිටීමටය. මේ කාරණය ඔවුන් බොහොම ඉක්මනින් වටහා ගන්නා ලදී. ඇත්තට ම එක ගැහැණු ළමයෙකු ළඟින් නම් වාඩි වී සිටීම එතරම් නරක කාරණයක් නොවේ. නමුත් ගැහැණු ළමයින් හතර පස් දෙනෙකු පැමිණ කෙනෙකුගේ මේසය අසල සිට නොනවත්වා කැකිරි පළමින් සිනා නගන්නේ නම් එය වෙනත් ම කාරණයක් නොවන්නේද? මද වේලාවකින් මුළු පංතිය ම ඔවුන් හා එක් ව කොක් හඬලා සිනා නගන්නට වූ විට මගේ දරා ගැනීමේ හැකියාව අන්තයටම ගමන් කරයි. එවිට විගස මේසයෙන් නැගී සිටින මම පංතියෙන් පිටතට දිව ගොස් දොරට පිටතින් සිට ඉතාමත් කණගාටුදායක ලෙස හඬන්නට වීමි. එවිට මා ඉතාමත් මෝඩ ළමයෙකු ලෙසින් දිස් වන්නට ඇතැයි මට දැන් සිතේ. මෙවැනි දේ නිසා අනෙකුත් පිරිමි ළමෝ විටින් විට මා හට අවවාද දෙන්නට වූහ.

"ඔයා එයාලාට අවධානය යොමු කරන්නේ ඇයි? තල්ලු කරලා එළවලා දාන්න ඔය කෙල්ලන් ව, ඒක එයාලාට පාඩමක් වෙයි!" ඒත් සමග ම කෙනෙකු මාගේ පුටුව අසලට වී වැඩි ම ශබ්දයෙන් සිනාසෙමින් සිටි ගැහැණු ළමයාව තල්ලු කර දැමුවේය. ඇය ඉතාමත් දඟකාර දැරියක් වූවාය. ඒ වගේ ම ඇය ඉතාමත් ප්‍රියමනාප දැරියක් වූවාය. ඇගේ නම තමාරා නම් විය. හ්ම්... එහෙමත් නැත්නම් ගාල්යා?

හෝ වේරා හෝ ලූසි හෝ විය. නැත නැත. ඇත්තෙන්ම ඇගේ නම වාල්යා විය.මුළු පංතියේ ම ගැහැණු ළමුන් අතුරින් මා වඩාම කැමති වූයේ ඈට බව ඇය දැන සිටියාය. හැමවිට ම ගැහැණු ළමෝ මෙවැනි දේවල් දැන සිටිති. සමහරවිට ඈ එලෙසින් මහා හඬින් සිනාසුණේ ඒ බව දැන සිටි නිසා විය හැකිය. නමුත් එය මා හඬවන කාරණයක් බවට පත් වී තිබිණ.

අවසානයේදි ගුරුතුමිය මේ දේවල් නිසා වෙහෙසට පත් වූවාය. දිනක් ඇය, දොරට පිටතින් සිට හඬමින් සිටි මා අතින් අල්ලාගෙන පංතිය තුළට ඇතුළු වූවාය. "මේ පංතියේ ගැහැණු ළමයින් දහසය දෙනෙකුත් පිරිමි ළමයින් දහ අට දෙනෙකුත් ඉන්නවා. නමුත් ගැහැණු ළමයි දහසය දෙනා හැම තිස්සේ ම විහිළුවට ගන්නේ එක ම පිරිමි ළමයෙක් විතරයි. ඇයි ඒ කියා දැන ගන්න මං කැමතියි. ඇයි ඔවුන් අනෙක් පිරිමි ළමුන් දහහත් දෙනා විහිළුවට නොගන්නේ? ඒ ඇයි කියලා කාටද කියන්න පුළුවන්?"

සැමදෙන සිනාසෙන්නට වූහ. නැවතත් ගුරුතුමිය මෙලෙසින් පැවසුවාය.

"ඇයි ඔවුන් එක ම පිරිමි ළමයෙකුට විතරක් මෙහෙම කරන්නේ? මම බොහොම තදින් මේ අහන්නේ. මට අද ඒකට හේතුව දැනගන්න ම ඕනෑ"

පංතිය තුළ නිහඬතාවය රජයන්නට විය. ගැහැණු ළමුන් කිහිප දෙනෙකු පමණක් 'හිකි හිකි' ගාමින් පසුවිය. එක් පිරිමි ළමයෙක් අතක් ඔසවා අනතුරුව මෙසේ පවසන්නට වූයේය.

"එයාලා විහිළු කරද්දි මෙයා අඬන නිසා තමයි ඔහොම වෙන්නේ"

"අන්න හරි" ගුරුතුමිය පැවසුවාය. "සිහිකරගන්න, අපි හැමෝම පිළිගත්තා හඬනවාට වඩා සිනාසීම හැම අතින් ම යහපත් වග. ඔයා වටහා ගත්තාද?" ඇය මගෙන් ඇසුවාය.

"ඔව්," මම සෙමින් පැවසීමි.

"ඉතිං එහෙම නම් හැම තිස්සේ ම ඒක මතක් කරගන්න උත්සාහ කරන්න," ඇය පැවසුවාය. "එහෙම නොවුණොත් ඔයාගේ මුළු ජීවිත කාලය පුරාම ගැහැණු ළමයින්ගේ විහිළුවට ලක් වන්නට වේවි"

ඇත්ත වශයෙන් ම එතරම් භයානක දෙයක් මා හට සිදුවනු අත්දකින්නට මට කිසිසේත් ම උවමනා වූයේ නැත. මීළඟ වතාවේ ගැහැණු ළමයි හතරදෙනා මගේ මේසය වටේ සිටගෙන සිනා පාන්නට වූ විට මා හැඬුවේ නැත. මම සෙමින් නැගී සිටියෙමි. අනතුරුව සෙමින් ඇවිද ගොස් මුළු පංතියෙන් වැඩියෙන් ම මා සිත්ගත් ගැහැණු ළමයාගේ මේසය අසලට ගොස් ඇගේ පුටුව අසලින් අසුන් ගතිමි. එවර සැමදෙන ඈට සිනාසෙන්නට වූහ. ඇය හැඬුවේ නැත. නමුත් ඇය වහා සිය සිනාව නවතා ගත්තාය. එයින් අනතුරු ව ගැහැණු ළමෝ මා පෙළීම නවතා දැමූහ. එයින් නොනැවති ඔවුන් සැමදෙන මාගේ මිතුරියන් බවට පත් වූහ. එයින් අනතුරු ව මට ගැටළු ඇති කළා නම් ඒ පිරිමි ළමුන් පමණි. නමුත් දුවේ එය එතරම් සිතිය යුතු දෙයක් නොවේ. පිරිමි ළමුන් හැම විටම පිරිමි ළමුන්මය. ඔවුනු හැමවිට ම වාගේ රණ්ඩු කරන්නට ඉතාමත් මනාප ඇත්තෝය.

ගියෙමු අපි කොටි දඩයමේ



මම පාසල් යන වයසේ කුඩා දරුවකුව සිටි කාලයේ වරක් කොටි දඩයමේ ගියෙමි. මේ කියන කොටියා පාසල් පරිශ්‍රය තුළ ම ජීවත් වූවෙකු වුවත් කිසිදා පාසලේ ඉගෙනුම් කටයුතු වලට සහභාගී වූ කෙනෙකු නම් නොවේ. ඒ සිද්ධිය සිදුවූයේ මෙලෙසිනි.

ගිම්හානයේ එක් සැන්දෑවක පාසල් ඇරුණු පසු මාත් මගේ මිතුරන් කිහිප දෙනෙකුත් පාසල් මිදුලේ වාඩි වී හිරු එළිය විඳිමින් පසුවිය. ලොව හැමතැන පසුවන පිරිමි ළමුන් මෙන් මගේ මිතුරනුත් අර දේ ගැන, මේ දේ ගැන සහ හැමදේ ගැන නිමක් නොමැති කතාවක

ගැලී සිටියා මට මතකය. පා පන්දු ගැන, එළඹෙන දිනයේ යෙදී තිබුණු පරීක්ෂණය ගැන, පෙරදින රණ්ඩුව ගැන, බැග්ඩෑගයේ සොරා ගැන, තම තමන් කැමති ම අයිස්ක්‍රීම් රසයන් ගැන සහ කඳවුරු සඳහා යන අයත්, එසේ නොගිහින් දෙමව්පියන් සමඟ ගෙදරට ම වී සිටින්නට සිදුවන අයත් ගැන මේ කාලය තුළ සාකච්ඡාවට බඳුන් විය. මිතුරන් මෙලෙස කතාවේ ගැලී සිටින අතර මම පොතක් කියවමින් පසුවීමි. පොතෙන් විස්තර කෙරෙන දේ පිළිබඳ ව හරියාකාර වැටහීමක් නොතිබුණ ද වීරක්‍රියා වලින් සපිරුණු ඒ පොත මම ඉසිඹුවක් නොගෙන කියවන්නට වීමි. එය ඉතාමත් තදින් මගේ සිත ඇද බැඳ ගති. මිතුරන් මදකට කතාව නැවැත්වූ මොහොතක එක් වන ම, "කොට් දඩයමේ යෑම නියම වැඩක් වෙන්න ඕනෑ"යි යනුවෙන් මට කියැවුණෝ එබැවින් විය යුතුය.

සියල්ලෝ ම සිනා නගන්නට වූවෝය.

"මාවත් අරං යන්න," මීෂා පැවසුවේය.

"අනේ මාවත්! මාවත්!" පිරිමි ළමුන් සැවෝම කෑ ගසන්නට පටන් ගති.

ඒ අතරතුර එක් පිරිමි ළමයෙක් මෙසේ පැවසුවේය. "ඒයි! අපි හැමෝ ම යමු! අපේ මුළු පංතියම!"

හැමදෙනකුම එම අදහස එක හඬින් අනුමත කරන ලදී.

"ඒත් කොහොම ඔයා කොට් දඩයම් කරන්නේ?" මීෂාට දැනගන්නට අවශ්‍ය විය.

"ඒක හරිම ලේසියි," මම පැවසීමි. "මුලින් ම, ඔයාලාගේ අලි ටික කැලේට දක්කන්න ඕනැ. ඒ කැලෑව වඳුරන්ගෙන් කෙසෙල් වලින් සහ ගිරවුන්ගෙන් පිරී ඉතිරී ගිය එකක්."

"හරි හරි වඳුරෝ බඳුරෝ, කෙසෙල් බෙසෙල්, ගිරිව් බිරව් සේරම හිටියාවෙකෝ" මීෂා සරදම් කරන්නට වන්නේය. "දැන් අපිට කියන්නකෝ කොටියාගේ කොටස"

"ඒක තමයි මං මේ කරන්න යන්නේ. කොටියා හැංගිලා ඉන්නේ මේ කැලෑවේ. ඔන්න අපි අලි පිටින් එහෙට යනකොට කොටියා එක පාරම එළියට පැනලා අපේ අලින්ට පහර දෙන්න එනවා. ඔන්න එතකොට අපි හැමෝම හරියටම තිතට ම එල්ලය අරගෙන කොටියාට වෙඩි තියනවා. ඊට පස්සේ අපේ එක අලියෙක් කොටියාව හොඬවැළෙන්උඩටම උස්සලා අරගෙන කුඩු පට්ටම් වෙන්න පොළවේ ගහලා, පාගලා පාගලා දානවා. මේ බලන්න, ඒ සේරම මේ පිංතූරේ ලස්සනට ඇඳලා තියෙනවා"

මගේ මිතුරන් එම පිංතූරය මනාව අධ්‍යයනය කරන්නට විය. අනතුරුව මීෂා මෙසේ පැවසුවේය.

"හරි හරි මං දන්නවා මං දන්නවා. ඔයායි, ඔයායි, ඔයායි අලි වෙනවා. ඉතිරි අපි ටික දඩයක්කරුවන් වෙනවා. මේ මිදුල තමයි කැලෑව. හැමෝම තුවක්කුවක් කියලා හිතාගන්න පුළුවන් විදිහේ කෝටු අතට ගන්න ඕනැ. හැමෝ ම ලැහැස්තිද? එහෙනම් තම තමන්ගේ අලින්ගේ පිටට නගින්න දැන්, අපි යමු! අන්න කොටියා! දැක්කද? අර බලන්න උගේ ඇගේ ඉරි?"

"පිස්සුද ඔයාට? ඒ පූස් පැටියෙක්නේ" මම පැවසීමි.

"කට වහගන්න! ඔයා දන්නේ නැහැ ඔයා මොනවද කියන්නේ කියලා.දැන් මං කියන දේ කට්ටිය ම හොඳට අහගන්න. කොල්ලනි! අලි ඉදිරියට දක්කනු!"

ඔහුට අනුව මාද දඩයක්කරුවෙකු විය. පා විහිදුවා මගේ අලියා මතට ගොඩ වන මොහොතේ, ඉරි සහිත සමකින් යුතු වූ පුංචි පූස් පැටවා පුදුමයෙන් සහ ඕනෑ කමින් මේ අලි රංචුවත් දඩයක්කාරයින්

පිරිසත් දෙස බලා සිටින අයුරු මම දිටිමි.ඔහු කෙතරම් පුදුමයට පත් ව සිටියේ ද යත් පැන දුවන්නටවත් උත්සාහ කළේ නැත.

"වෙඩි තබනු!" මීෂා කෑ ගසා විධාන දුන්නේය.

එක්වනම කෝටු වරුසාවකින් අසරණ පූස් පැටවා වැසී ගියේය. මා කරන්නේ කුමක්දැයි මට ම වැටහෙන්නට පෙර මාත් මගේ කෝටුවෙන් දමා ගසා අවසන් ව තිබිණ. වාසනාවකට මෙන් එය නියමිත ඉලක්කයට ළඟා වූයේ නැත. පුංචි පූස් පැටවා භීතියෙන් මුසපත් ව දිව යන්නට විය. ඒ දිව යන ඔහුගේ හිස මතට කෝටුවක් විත් වේගයෙන් වැදිණි. "ඬෑව්" යැයි හඬ නැගූ ඔහු බිම පෙරළී ගියේය. ඔහුගේ පා මද වේලාවක් ගැස්සෙමින් තිබිණි. අනතුරුව සම්පූර්ණයෙන් නිසල විය.

"අපි කොටියාව මැරුවා!" මීෂා කෑ ගැසුවේය. නමුත් මද වේලාවකින් වෙනත් ළමයෙකු මෙසේ පැවසුවේය. "පූසා මැරිලා"

අපි පූසා වෙත දිව ගියෙමු.

ඉරි සහිත පුංචි පුළුන් බෝලය බොහෝ සෙයින් නිහඬ හා නිසසල පසුවිය. මෙදුටු මට තවදුරටත් එතැන රැඳෙන්නට උවමනාවක්වත් හැකියාවක්වත් නොවීය. මද වේලාවකට පෙර පණ ඇති ව සිටි පූස් පැටවා ඒ වනවිට පණ නැති මළ කඳක් ව සිටියේය. නැවත කිසිදා ඔහුට අනෙක් පූස් පැටවුන් සමග දුවන්නටවත්, පනින්නටවත් සෙල්ලම් කරන්නටවත් හැකියාවක් ලැබෙන්නේ නැති බවත්, ඔහුට කිසිදා ලොකු මහත් වී ලොකු පූසෙකු බවට පත්වන්නට නොහැකි වන බවත් වැටහීමෙන් මට ඇඬෙන්නට මෙන් විය. ඔහුට කිසිදා මීයන් අල්ලන්නට නොලැබෙනු ඇත. වහල මතට වී 'ඬෑව්' කියන්නට නොහැකිවනු ඇත. ඒ සැම කටයුත්තක ම අවසානය මොහොතකට පෙර සනිටුහන් වී තිබිණ. පූස් පැටවාට කොටි දඩයම් සෙල්ලම කිරීමේ උවමනාවක් කිසි ලෙසකින්වත් නොවීය. නමුත් ඔහුගේ

කැමැත්ත අකමැත්ත විමසීමට කිසිවකු කරදර වූයේ නැත. අපි මියගිය පූස් පැටවා වටා නිහඬව සිටගෙන සිටියෙමු.

එක් වනම අපට කිසිවකු හඬන හඬ ඇසිණි.

"අනේ මගේ පුංචි පූස් පැටියා!, මගේ පුංචි පූස් පැටියා!" නිල්පාට විසල් බෝ එකකින් හිස සරසාගෙන සිටි පුංචි ගැහැණු ළමයෙක් හඬමින් සිටියාය. ඇගේ පුංචි පූස් පැටවා වඩා ගත් ඇය නිවස වෙත සෙමින් ඇවිද ගියාය. අපිදු ඉතාමත් අපහසුවෙන් තම තමන්ගේ නිවෙස් වෙත පා නැගීමු. කෙතරම් ලජ්ජාවට පත් ව සිටියේද යත් එකිනෙකා දෙසවත් හිස ඔසවා බලන්නට හැකියාවක් අප වෙත නොවීය. ඉතිං මගේ ආදර දුවේ! මේ සිද්ධියෙන් පසු මම, කිසි ම දිනෙක පූසෙකුටවත් බල්ලෙකුටවත් වෙන කිසිම සතෙකුටවත් කිසිම හිංසාවක් නොකරන්නට තදින්ම සිතා ගතිමි. එලෙසින් ම කටයුතු කළෙමි. අදටත් ඒ අසරණ, ඉරි සහිත පුංචි පූස් පැටවා පිළිබඳ ව මුළු හිතින් ම කණගාටු වෙමි.

මා ඇන්ද-මා දන්න-සිත්තරේ විස්තරේ



මා පුංචි ළමයෙකු ව සිටි කාලයේ චිත්‍ර ඇඳීම මගේ ප්‍රියතම විනෝදාංශයක් විය. පාට පැන්සල් පෙට්ටියක් ලැබුණු විටදී එය ඉවර වනතුරු මම දින ගණන් තිස්සේ චිත්‍ර අඳිමින් කාලය ගත කළෙමි. මා පුංචි පුංචි ගෙවල් ඇඳි අතර ඒ හැම ගෙයකට ම චිමිනියක් විය. ඒ හැම චිමිනියකින් ම දුම් රොටු පාව එන්නට විය. හැම ගෙයකට ම පැත්තකින් ගසක් විය. ඒ හැම ගසේම කුරුල්ලකු විය. එපමණක් නොව හැම නිවස ම රතු පාට විය. හැම වහලම කහ පාට විය. හැම චිමිනිය ම කළු පාට විය. චිමිනිවලින් ගලා ආ

දුම්රොටුවල වර්ණය ලා නිල් හා රෝස පාට විය. හැම ගස ම නිල් පාට වූ අතර හැම කුරුල්ලා ම කොල පාට විය. ලා දම් පාට අහසේ කහ පාටින් ඉර බබලමින් තිබිණ. මුළු අහස ම රන්වන් පාට හා සුදු පාට තරු වලින් වැසී තිබිණ. එය ඇත්තෙන් ම පියකරු චිත්‍රයක් සේ දිස් වුවත් දකින සැම අසන එක් පැනයක් විය. "ඔයා කොහෙදිද දැක්කෙ නිල් පාට ගසුයි කොළ පාට කුරුල්ලොයි?"

ඉඳින් මම පිළිතුරු දෙමි. "මගේ චිත්‍රයෙන්!"

පාසල් සමය ඇරඹෙන්නට පෙර සමයේ මා සිතා සිටියේ මට ඉතාමත් මැනවින් චිත්‍ර ඇඳිය හැකි බවය. නමුත් පාසලේ සැමගේ අදහස එයට ඉඳුරාම වෙනස් විය. මගේ චිත්‍ර ඇඳීම කෙතරම් දුර්වල වීද යත් ගුරුතුමා චිත්‍රය දෙස බලා සිට වචනයක් හෝ නොපවසා ඉවත් ව යන්නේය. "මෙය කදිමයි!" "මේක නං හරියන්නේ නැහැ" හෝ "මේ ඉර කෙළින් කරන්න" මේ ආදී වශයෙන් අනෙකුත් ළමුන්ට පවසන ඔහු අවම වශයෙන්, "මේක නං හරියන්නේ නැහැ" යනුවෙන්වත් මා හට නොපැවසීය. මගේ මේසය අසලින් යන ඔහුගේ නෙතට මගේ චිත්‍රය හසු වූ විට ඔහුගේ මුහුණ රැළි ගැසෙයි. එය දුටුවේ නම් ඔහු ඇඹුල් දෙහි ගෙඩියක් හපා ඇතැයි ඔබට සිතෙනු ඇත.

පංතියේ ගැහැණු ළමුන් කිහිප දෙනෙකු මා පිළිබඳ කණගාටුවෙන් පසුවිය. ගුරුතුමා වෙනතක හැරුණු විගස ඔවුන්ගෙන් කෙනෙක් මගේ චිත්‍ර පොතේ යමක් ඇන්දාය. තමන්ට හැකි අවම මට්ටමින් එය කරන්නට ඔවුන් ප්‍රවේශම් වූයේ නැතහොත් ගුරුතුමා එය දැනගන්නට ඉඩ තිබුණු නිසාය. නමුත් මා තරම් කැතට ඔවුන් කිසිවෙකුට කිසිදා අඳින්නට නොහැකි වූ නිසා නිමේෂයකින් මේ වෙනස හඳුනාගන්නට ගුරුතුමාට හැකි විය. "කවුද මේක ඇන්දේ?" ඔහු අසයි.

මම අවංක ව පිළිතුරු දෙමි. "මම නෙමෙයි,"

"ඒක නං මටත් පේනවා," ගුරුතුමා නැවත පවසයි. "මට දැනගන්න ඕනෑ වන්නේ කාටද ඔයාට උදව් කරන්න ඕනෑ වෙලා

තියෙන්නේ කියන එකයි. මේ විදිහට ගියොත් ඔයාට කවදාවත් චිත්‍ර අඳින හැටි ඉගෙන ගන්න වෙන්නේ නැහැ දරුවෝ. ඉගෙන ගන්න නම් ඔයා තනියෙම අඳින්න ඕනෑ."

"දැන් ඉඳන් මම තනියෙම අඳින්නම්," මම පවසමි. අනතුරු ව චිත්‍ර පොතේ යමක් ඇඳිමි. එය දකින ගුරුතුමා නැවතත් වේදනාවෙන් මුහුණ හකුළා ගන්නේය.

"දැන් නං මට පේනවා ඒක ඔයාගේ ම චිත්‍රයක් බව," ඔහු පවසන්නේය.

ඉන්පසු එළඹුණු ගුරු-දෙගුරු රැස්වීමේදී චිත්‍ර ගුරුතුමා පුංචි කතාවක් පැවැත්තුවේය.

"ආදරණීය දෙමව්පියනි, මගේ සිසුන්ගෙන් පස් දෙනෙකු මේ විෂය සඳහා විශිෂ්ට සාමාර්ථ ලබා තිබෙනවා."

අනතුරුව ඔහු ඔවුන්ගේ නම් හඬගා පැවසුවේය.

"අනෙකුත් ළමුන්ගෙන් ගොඩක් අයට සතුටුදායක මට්ටමින් ලකුණු ගන්න හැකියාව ලැබිලා තියෙනවා. හැබැයි කිහිප දෙනෙකුගේ තත්ත්වය නම් සතුටුදායක නැහැ."

තවත් ළමුන් තුන් දෙනෙකුගේ නම් කියැවිණි.

"නමුත් එක ම එක ළමයෙක් ඉන්නවා-." මුහුණ ඇඹුල් කරගත් ගුරුතුමා මගේ නම පැවසුවේය. "ඔහු කැතට චිත්‍ර අඳිනවා නෙමෙයි. මට හිතෙන විදිහට ඔහුගේ මානසික වියවුලක් තියෙන හැඩයි. මොකක් හරි දෙයක්, හරියට ම චිත්‍ර අඳින හැටි ඉගෙන ගැනීමෙන් ඔහුව වළක්වනවා වගෙයි."

අම්මාත් තාත්තාත් බොහෝ සෙයින් කළකිරීමට පත් වූහ. නමුත් එය සැබෑ තත්ත්වය විය. වසර ගණනාවක් පසුවිය. මම පාසල් සමය සාර්ථකව අවසන් කළෙමි. විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලදිමි. නමුත් මේ

මුළු කාලයට ම මට හැකි වූයේ පූසෙකු අඳින්නට ඉගෙන ගන්නට පමණි. නමුත් ඕනෑ ම දරුවෙකුට පහසුවෙන් පූසෙකු ඇඳිය නොහැකි වේද? ඉතාමත් කුඩා දරුවෙකුට පවා එය එතරම් අපහසු කටයුත්තක් නොවේ. මට ඔවුන්ගේ පූසන් පිළිබඳ ව තදබල ඉරිසියාවක් පහළ වන්නේ මගේ පූසාට වඩා ඒ පූසන් හැම අතින් ම හොඳ වන නිසාය. වරක් මා මෙන්ම දුර්වල ලෙසින් චිත්‍ර අඳින කලාකරුවෙකු මට හමුවිය. නමුත් ඔහු මෙලෙසින් පැවසුවේය. "මේ විදිහට තමයි මට මේ මූණ පේන්නේ, මේ ගහ පේන්නේ, මේ අශ්වයා පේන්නේ. ඉතිං මං ඒ විදිහට තමයි මගේ චිත්‍ර අඳින්නේ."

එදා මට හිතුණු දේ දන්නවාද දුවේ! මගේ චිත්‍ර ගුරුතුමාට එලෙසින් පැවසීමට නොහැකි වීම පිළිබඳ ව ඉමහත් කණගාටුවක් මසිත ඉපදිණි.

රන්දිකා රණවීර

ගුරුතුමිය රැවටේද රාළේ?



මම කුඩා පාසල් දරුවෙකු ව සිටි අවධියේ මගේ ගුරුතුමියට තදින් ඇලුම් කළෙමි. මා පමණක් නොව පංතියේ සැවොම එලෙසින් ඇයට ඇලුම් කළහ. ඇය සිහින්, උස සාමාන්‍ය පෙනුමැති තැනැත්තියක වූවාය. සැම විටම ඇන්දේ තද පාට ඇඳුම්ය. වැඩිහිටි සිසුන් පැවසුවේ ඇය ආකර්ශණීය නොවන බවයි. නමුත් මට දැනුනේ ඇය ඉතාමත් දැකුම්කළු තැනැත්තියක ලෙසිනි.

මාරියා පෙත්‍රොවිනා ඇගේ නම විය. ඇය මිත්‍රශීලි තැනැත්තියක වූ අතර කිසි ලෙසකින්වත් දරදඬු තැනැත්තියක් නොවූවාය. වඩා ම වැදගත් දේ, ඈ ඉතාමත් සාධාරණ තැනැත්තියක වීමයි. ඈ කෝප ගැන්වී සිටියහොත් හැමට ම බැණුම් අසන්නට වන බව අප දැන සිටි කරුණක් විය. සැම විට ම එයට හොඳ හේතුවක් නොතිබිණි නම් ඇය නිකරුණේ කෝප නොගත්තාය. ඇයට පංති කාමරය තුළ විශේෂ සුරතලුන් නොවීය. ඇය ඇගේ සියලුම සිසුන්ට එක හා සමානව අවධානය යොමු කළාය. සැමට එක ලෙස ඇලුම් කළාය. ගෙදර වැඩ කර නොතිබුණේ නම්, පංති කාමරය තුළ කෑ කොස්සන් ගැසුවේ නම් ඕනැ ම කෙනෙකු වෙත ඇගේ කෝපය එල්ල වනු නියතය. එහි වෙනසක් නැත. ඈ වසර විස්සක් තිස්සේ උගන්වමින් සිටින බව අප හැම දැන සිටි කරුණකි. පුරසාරම් කීමත්, වැඩකට නැති කතා කියමින් සිටීමත්, කෑදර කමත් ඇගේ පිළිකුලට හේතු වූ කාරණාය.

ඇගේ ඉගැන්වීම් සැම විට ම සිත් ඇදගන්නාසුලු විය. ඈ උගන්වන විට ළමුන් නිහඬව සාවධානව අසා සිටියේ එබැවිනි. මෙසේ සාවධාන ව පාඩමට යොමු ව සිටි දිනෙක කිසිවෙක් මගේ පස්ස පැත්තට ඇල්පෙනිත්තකින් ඇන්නේය.

"ආවි..........." මට කෑ ගැසිණි.

"මොකද වුණේ?" ගුරුතුමිය ඇසුවාය.

මම කිසිවක් නොපැවසීමි.

"කරුණාකර පංති කාමරයෙන් එළියට යන්න!" මගේ ගුරුතුමිය පැවසුවාය.

මම නැගිට දොර වෙත පිය මනින්නට වීමි. එක් වනම ගැහැණු ළමයින් දෙදෙනෙකු කෑ ගසන්නට විය.

"ඒක එයාගේ වරදක් නෙමෙයි!"

"සයිච්කොව් එයාට ඇල්පෙනිත්තකින් ඇන්නා!"

එවර ගුරුතුමිය මෙලෙසින් පැවසුවාය. "කෑ ගහපු කෙනා පංතියෙන් එළියට යන්න. ඇල්පෙනිත්තෙන් ඇන්න කෙනාත් යන්න. ඕපදූප හෙව්ව අයත් යන්න. අනෙක් ළමයි සේරම මාත් එක්ක එකඟද?"

"ඔව්!" සැමදෙන එකඟත්වය පළ කරන ලදී.

ඉදින් ගැහැණු ළමයින් දෙදෙනාත්, මාත් සයිච්කෝව්ත් කණ්ඩායමක් වශයෙන් පංතියෙන් එළියට යන ලදී.

මම හඬන්නට වීමි. මා වරදක් නොකරත්, මට වරදක් සිදු ව තිබියදීත් පංතියෙන් එළියට යන්නට සිදු වී තිබිණි. මටත් ගැහැණු ළමයින් දෙදෙනාටත් සරදමට මෙන් සිනා පාමින් සිටියද පෙන්වන තරම් සතුටක් ඔහු වෙතත් නැති බව සයිච්කෝව් දකින ඕනෑම කෙනෙකුට වැටහෙන්නට ඉඩ තිබිණි. ගැහැණු ළමයින් හැඬුවේත් සිනා වූයේත් නැත. එහෙත් ඔවුන් දුකින් පසුවන බව පෙනිණි.

පසු දින මම තරමක් විශාල ඇණයක් පාසලට රැගෙන ගියෙමි. ගුරුතුමිය කළු ලෑල්ල දෙසට හැරී යමක් ලියන්නට වූ විට මම පෙර කී ඇණය ගෙන සයිච්කෝව් ගේ අතට තදින් ඇන්නෙමි. එයට මර හඬ දෙමින් සයිච්කෝව් දැක්වූ ප්‍රතිචාරය මා බිය ගැන් වූ අතර ගුරුතුමිය ව තදින් කෝප ගන්වන ලදී.

"සයිච්කෝව් ආයෙත් ඒ ඔයාගේ වැඩක්ද?" ඇය ඇසුවාය.

"නැහැ නැහැ. එයා මට ඇන්නා." සයිච්කෝව් නහයෙන් හඬමින් ඇයට පෙනෙන පරිද්දෙන් අත එසවූයේය.

"ඊයේ ඔයා කෙනෙකුට ඇන්නා. අද කෙනෙක් ඔයාට ඇනලා. ඒක නම් හරි ම සිත් ගන්නා සුලුයි. කවුද ඇන්නේ සයිච්කෝව්?"

සැමදෙන මා දෙසට හැරුණත් කිසිවෙකු වදනක්වත් නොපවසන ලදී. කිසිවෙකුට ඕපදූප කියන්නෙකු වන්නට අවශ්‍ය වූයේ නැත. සයිචිකෝව් පවා නිහඬ ව සුසුම් ලමින් පසුවිය.

"හොඳයි, කවුද ඒ?" මාරියා පෙත්‍රව්නා, අපේ ගුරුතුමිය ඇගේ හඬේ උපරිම දැඩි බවින් අසා සිටියාය. මා කෙතරම් බියට පත් වූවාද යත් එක්වනම මට ඇසුණේ මා මෙලෙසින් පවසන අයුරුය.

"මම එයාට ඇන්නේ නැහැ."

"මොකෙන්ද ඇන්නේ නැත්තේ?" ගුරුතුමිය ඇසුවාය.

මම වහා පිළිතුරු දුනිමි. "මේ ඇණයෙන්!"

එක්වනම පංතිය මහා සිනාවකින් පුපුරා ගියේය. පංතිය තුළ කෙතරම් ලොකු ඝෝෂාවක් පැතිර ගියේද යත් යාබද පංතියේ ගුරුතුමාද වහා පැමිණියේය.

"මොකක්ද හැබෑට මෙච්චර සතුටු වෙන්න කාරණය?" ඔහු ඇසුවේය.

ගුරුතුමිය පිළිතුරු දුන්නාය. "අපිට හරි සතුටුයි. මොකද දන්නවද? එක පිරිමි ළමයෙකු තවත් පිරිමි ළමයෙකුට මේ ඇණයෙන් ඇනලා නැහැ. ඉතිං ඒ ළමයා අඬලා නැහැ. ඒ වගේ ම කවුරුවත් ඕපදූප හොයලා නැහැ. ඒ වගේ ම කවුරුවත් එයාලාගේ වයස්ගත ගුරුතුමිය ව මෝඩයෙකු බවට පත් කරන්න උත්සාහ කරලා නැහැ. මේ හැමදේම නිසා අපිට හරි සතුටුයි."

සියලුම ළමෝ තම තමන් ගැන අතිශයින් ලැජ්ජාවට පත් වූහ. සැවොම මා දෙස රවා බලන්නට වූහ. අනතුරු ව නැගී සිටි මම මෙලෙසින් පැවසීමි.

"ඊයේ ඔහු මට ඇන්නා, මං කෑ ගැසුවා. අද මං ඔහුට ඇන්නා, ඔහු කෑ ගැසුවා. ඒ වගේ ම මං බොරු කිව්වා." මදක් නැවතුණු මම

මෙලෙසින් ද එයට එකතු කළෙමි. "ආයේ කවදාවත් මං එහෙම කරන්නේ නැහැ."

"මමත් කවදාවත් එහෙම කරන්නේ නැහැ," සයිච්කෝව් ද පැවසුවේය. එසේ පවසන ගමන් ඔහු මා දෙසට අතමිට මොලවා සොළවනු දුටු කිසිවෙකු ඔහුගේ වදන විශ්වාස කළේ නැත.

"බොරු කියනවාට වඩා නරක යමක් තවත් නැහැ," ගුරුතුමිය පැවසුවාය.

ඉතිං මගේ දුවේ! මා එයින් අනතුරුව ඇයට කිසිදා බොරු කීවේ නැත. කලාතුරකින් මිස...

ට්‍රොලි රථයේ ජංජාලේ



පාසල් ළමයෙකුව සිටි අවධියේ මට මීෂා නමින් මිතුරකු විය.

මීෂා හරිම දඟකාරයෙකු විය. විවේක කාලය තුළදී සැහෙන ළමුන් පිරිසක් ඔහු වටා රැස් වී සිටීම අනිවාර්යය දෙයක් විය. මීෂා පූසෙකු මෙන් 'ඤෑව්' කියන හඬත්, බල්ලෙකු මෙන් බුරන හඬත්, මී මැස්සෙකු මෙන් 'ගුමු ගුමු' නද නගන හඬත් එහෙමත් නැත්නම් ඌරෙකු මෙන් කෑ ගසන හඬත් අසන්නට සැමට අවශ්‍ය විය. විශේෂයෙන් කපුටකු මෙන් කරච් කරන්නට ඔහුට හොඳ හැකියාවක් තිබිණ. ඇත්ත වශයෙන්ම හොඳ නාට්‍ය දර්ශනයක් ඉදිරිපත් කරන්නට

තරම් හැකියාවන් ඔහු සතුවිය. මුලින් ම ඔහු තරුණ කුකුළකු මෙන් රඟ දක්වන්නට වන්නේය. 'කුක්කු කුක්...' යන කොටස හොඳින් කියැවෙන අතර '...කු කූක්' යන කොටස හරියට නොකියැවිණි. අනතුරුව තරුණ කුකුළා වැටක් මතට පියඹා ගොස් ඔහුගේ ජීවිතයේ පළමු වරට නියමාකාරයෙන් හඬලමින් අත්තටු සළන්නට වන්නේය. මෙහිදී මීෂා කරනුයේ ඔහුගේ කමීසයත් යට බැනියමත් කලිසමින් මුදවා ඉවතට ඇද දෙඅතේ අත්ලෙන් නිරුවත් බඩට 'සට සට' හඬින් පහර දී ගැනීමය. නමුත් විවේක කාලය කිසිදා මීෂාගේ සම්පූර්ණ දර්ශන වාරයක් තරමට දිගු වන්නේ නැත. විවේකයෙන් පසු එළඹෙන පාඩම් අතරතුරදී පුංචි පූස් පැටවකු කෑ ගසන්නට හෝ ඌරු බබෙකු හඬ තළන්නට වන්නේ ඒ නිසාය.

"මීෂා ගෝර්බුනොව්!" ගුරුතුමා හඬ නගා අමතන්නේය.

"ඔය කදෑවි කියවිල්ලයි හඬ තැළිල්ලයි නවත්වන්න!" හෝ "තව දුරටත් කෙකර ගෑවිලි අහන්න මට උවමනා නැහැ, මීෂා!" හෝ "ඔයාට ඇහුනද? නවත්වන්නයි කිව්වේ ඔය බිරිල්ල!" හෝ "තව කොච්චර වෙලා ගොරවන්න ඔයා හිතාගෙන ඉන්නවද?" හෝ "ආයේ කුරුල්ලෙක් වුණේ ඔයාද?" හෝ "තව එක ගුමු ගුමු හඬයි අවශ්‍ය, එවෙලේම ඔයා පංතියෙන් එළියට!" හෝ ආදී වශයෙන් ගුරුවරු හඬ නගති.

එහෙත් ඉඳහිට දවසක මිස මීෂා පංතියෙන් එළියට යැවුණේ ම නැති තරම්ය. ගුරුවරු ඔහුට කැමැති වූ අතර බොහෝ විට ඔහුගේ රඟ දැක්වීම් වලට තනිව ම සිනා වුණෝය. වරක් විදුහල්පතිතුමාටත් හැමදෙන බලා සිටියදීත් තමන්ගේ සිනාව නවතා ගන්නට නොහැකි විණි. එය සිදුවුණේ විදුහල්පති කාමරයට කැඳවා, මීෂාගේ දඟකාරකම පිළිබඳ ව දීර්ඝ දේශනයක් අවසානයේ විදුහල්පතිතුමා මෙසේ පැවසූ විටදීය.

"දැන් ඔයාට යන්න පුළුවන්, හැබැයි මට ආයේ කවදාවත් ඔයා මෙතන පය තබනවා දකින්න උවමනා නැහැ."

ඉතිං මීෂා කළේ එක් වනම දෙඅතින් සිටගෙන ගමන් කරමින් විදුහල්පතිතුමාගේ කාමරයෙන් පිටව ඒමය. පසුව මීෂාගේ දෙමව්පියන් කැඳවා දේශනයක් පැවැත්වුවද සත්‍යය නම් විදුහල්පතිතුමා මේ සිදුවීම දැකීමෙන් නවතා ගැනීමට අපහසු වූ ලෙසින් සිනා වූ වග සැවොම දුටු බවයි.

දිනක් පාසල අවසානයේ මීෂා මෙලෙසින් ඇසුවේය. "මම ට්‍රොලි රථයක් නවත්වන හැටි දකින්න ඔයාලාට ඕනෑද?"

සුපුරුදු පරිදි සියල්ලන් ම එක හඬින් එය අනුමත කරන ලදී.

"ඔව්!"

"එහෙනම් අපි යමු!" මීෂා ඉස්සර විය.

සියලුම පිරිමි ළමයින් රංචු ගැසී ඔහුගේ පසු පස ඇදෙන්නට විය. පාසලේ සිට ට්‍රොලි රථ පීලි වලට එතරම් දුරක් නොවීය.

"ඔන්න මෙතැන හිටගෙන හොඳට බලාගෙන ඉන්න, හරිද?" මීෂා පැවසුවේය.

ටික වේලාවකින් ට්‍රොලි රථයක් ඈතින් එනු පෙනෙන්නට විය. මීෂා එක්වන ම පීල්ල හරහා දිගා වී අත් දෙකින් හිස වසා ගත්තේය. ට්‍රොලි රථය වහ වහා ළං වන්නට විය. රියදුරුවරයා මාර්ගය හරහා ළමයෙකු වැතිර සිටි අයුරු දැක වහ වහා සීනුව නාද කළේය.

මීෂා සෙලවුණේ නැත. ට්‍රොලි රථය තව තවත් ළං වෙමින් තිබිණි. සීනුව කෑ මොර දෙමින් තිබිණ. සැවොම භීතියෙන් ගල් ගැසී බලා සිටින්නට වූහ. මීෂා අසලට ඔන්න මෙන්න කියා තිබියදී ට්‍රොලි රථය නතර විය. ඒ මොහොතේ දී ම සීනුව නිහඬ විය. මීෂා ඉවතට පැන සිය දෙපයින් සිටගත් අතර පසෙක තිබූ වීදියක් දිගේ බියෙන් මෙන් දිව යන්නට විය. රියදුරුවරයාට කළ හැකි වූයේ අත මිට මොළවා ඔහු ගිය දෙසට වැනීම පමණි. අනතුරුව ට්‍රොලි රථය

නැවතත් ගමන් ඇරඹිය. අප මීෂා පසුපස ගොස් ඔහුව වට කරගත් අතර සැවොම එම උද්වේගකර සිද්ධියෙන් කැළඹී සිටියහ.

"ඔයාට බය හිතුණේ නැද්ද?"

"බය වෙන්න මොකක්ද වුණේ?" මීෂා ඇසුවේය.

"නමුත් නතර කළේ නැත්තං මොකද වෙන්නේ?"

"එයා හිරේ යයි"

"නමුත් එයා ඔයාව අද අල්ලා ගත්තා නං එහෙම?"

"එයාට මහ මගදි ට්‍රොලි කාර් එකෙන් බැහැලා එන්න තහනම්"

ඔබට වැටහෙනවා ඇති මීෂා සියලුම කාරණා සළකා බලා හොඳ සැලසුමක් ඇති ව එය සිදු කරන්නට යෙදුණු බව!

පසු දින කෝල්යා විසින් ට්‍රොලි රථය නවත්වන ලදී. ඊට පසු දින කොස්ට්යා. එයින් අනතුරුව, සිකෝස්කි නිවුන්නුන්ගේ වාරය එළඹිණි. මේ අතර මගේ වාරය එළඹිණි. ගැහැණු ළමයින්ටත් පැමිණ නරඹන ලෙසින් කවුරුන් හෝ ආරාධනා කර තිබිණ. මා ට්‍රොලි රථ මාර්ගයේ දිගා වී එය නවතන්නට යන ආරංචිය තුඩින් තුඩ පැතිර ගොස් අවසානයේ වෙනත් පංති වලින්ද බොහෝ ගැහැණු ළමයි මගේ දර්ශන වාරය නරඹන්නට පැමිණෙන්නට වූහ. බොහොම නිහඬ, පාඩුවේ ඉන්නා ළමයෙකු වශයෙන් ඔවුන් හැඳිනගෙන සිටි මා ට්‍රොලි රථය නවත්වන්නේ කෙසේ දැයි සියැසින් ම දැක ගැනීම සියළුම ළමුන්ගේ අභිප්‍රාය විය.

මේ ළමා ජන සන්නිපාතය කෙතරම් විශාල වීද යත් ට්‍රොලි රථ රියදුරුවරයාට එය බොහෝ දුර සිටම දැකගත හැකි වී තිබිණ. ඉඳින් මා මාර්ගයේ දිගා වී, තදින් ඇස් වසාගෙන, අත් දෙකින් කන් දෙක වසාගෙන සිටිනා අතරේ ඔහු සෙමින් සිය රථය නවතා බිමට පැන මා වෙත දිව ඇවිත් තිබූ අතර මට සිතුණේ එදා නම් ට්‍රොලි රථය නියම

වෙලාවට නවතා නැති බවත්, එය මා යටකරගෙන ගොස් ඇති බවත්ය. රියදුරුවරයා මා ඔසවා සොලවා කෑ ගැසීමෙන් ඇති වූ කම්පනය නිසා මට එලෙස සිතෙන බවක් එවෙළෙහි මට හැඟුණේ නැත.

"ආ... හා... ඔන්න මං අන්තිමේ හොර ගෙඩියව අල්ලා ගත්තා!" අනෙක් ළමෝ සියලු දෙන එක්වනම විසිර ගියහ. මීෂා පමණක් වීදිය අයිනට වී කෑ ගසමින් සිටියේය.

"ඔහොම බැහැලා එන්න ඔයාට අවසර නැහැ!"

එහෙත් කිසිවෙකු ඔහුට ඇහුම්කන් දුන්නේ නැත.

මා මහජන හමුදා මූලස්ථානය වෙත රැගෙන යන ලදී. ඔවුන් මගේ ලිපිනය ලියා ගත් අතර මා පියාටත් විදුහල්පතිවරයාටත් මූලස්ථාන පරිශ්‍රයට පැමිණෙන ලෙසින් දන්වා යවන ලදී. ඉදින් නිවසේ දී දඬුවමට ලක්වන්නටත් පාසලේදී ලැජ්ජාවට පත්වන්නටත් මට සිදුවිය. පාසල් පුවත්පතේ මා පිළිබඳ ලිපියක් ද පළ විය. විදුහල්පතිවරයාත් මගේ දෙමව්පියනුත් සිතුවේ සැමදා ට්‍රොලි රථ මගෙහි දිගා වී එය නවත්වන ලද්දේ මා විසින් ම කියාය. එහෙත් මීෂා විසින් අරඹන ලද එම ක්‍රියාව දිනපතා පවත්වාගෙන යාමට කෝල්යාත්, කොස්ට්යාත් සහ සිකෝස්කි නිවුන්නුත් වග බලාගත් බවත් මාගේ වාරය එළඹුණේ එදින බවත් කියවෙන්නට ම ආවත් මා මගේ මිතුරන් පාවා දුන්නේ නැත.

අතටම හසු වූ එකම කෙනා මා බැවින් සිදු වූ අපකීර්තියෙන් ගැළ වී ගන්නට ඔවුන් මට කිසිදා ඉඩ නොදෙන ලදී. මීෂා පවා මෙසේ පවසන්නට විය.

"වැඩක් හරියට කරන්න දන්නේ නැත්තං, ඒ වැඩේ කරන්න තියා හිතන්නවත් එපා!"

එයින් අනතුරු ව කිසි ම ළමයෙකු ට්‍රොලි රථ මාර්ගයේ දිගා වූයේ නැත. මට එනිසා රියදුරුවරයාට හසු වන්නට සිදු වුවත් සතුටු

සිතේ. ඒ ට්‍රොලි රථයට කිසිවෙකු කිසිදා යට නොවූ නිසාය. එය නම් සැබවින් ම ආශ්චර්යයක් විය.

සර්පයකු කැබලි වූවයි කැලයේ



පාසල් සිසුවකු ව උන් අවධියේ දිනෙක් මවිසින් සර්පයෙකු මරණ ලදී. එය සිදු වූයේ මේ ආකාරයෙනි. දිනක් පාසල් කාලය නිමාවේ දී අප ගුරුතුමිය මෙසේ පැවසුවාය. "ළමයිනි! අපි හෙට වනාන්තරයට යනවා, අපි තණපත් මතින් ඇවිදගෙන යනවා, ඒ වගේ ම අපිත් එක්ක එන අයට පුළුවන් එළිමහනේ හිරු එළියේ සෙල්ලම් කරන්න. කවුද යන්න එන්නේ?"

සෑම ළමයෙකු ම එක්වනම අත් ඔසවා සිය මනාපය පළ කරන ලදු අතර ඒ අතර මාද විය.

අනතුරුව ගුරුතුමිය සිනා වී මෙසේ ඇසුවාය. "කාටවත් තියෙනවද මීට විරුද්ධ මතයක්?"

නැවතත් සියල්ලෝ ම පෙර පරිදි ම අත් ඔසවා මනාපය පළ කරන ලදී. ඒ අතර මා ද විය.

ගුරුතුමිය ඉමහත් සේ පුදුමයට පත් වූවාය.

"මොකක්ද මේකෙන් ඔයාලා අදහස් කරන්නේ?" ඇය ඇසුවාය.

"ඔයාලාට වනාන්තරයේ ඇවිදින්නට යන්න ඕනෑද? එපාද?"

"ඔව්. අපට යන්න ඕනෑ!" සියල්ලෝ ම හඬ නැගූහ.

"ඉතිං ඇයි අකමැත්තට මනාපය පළ කළේ?"

ඒ ඇයි දැයි කිසිවකු දැන සිටියේ නැත. අවසානයේ එක් ගැහැණු ළමයෙකු පිළිතුරු දුන්නාය.

"ඒ මනාපය පළ කරන වැඩේට අපි හරි ම කැමති නිසා"

අනතුරුව සියල්ලන් ම මහා හඬින් සිනහ වූ අතර ගුරුතුමියත් එයට එක් වූවාය. අනතුරුව ඇය මෙසේ පැවසුවාය. "අනේ අනේ පුංචි මෝඩ පැටව් ටික! ඔන්න කෑම අරගෙන එන්න අමතක කරන්න එපා. කැලේ නැහැ කෑම. හරි අදට වැඩ කටයුතු අහවරයි. දැන් යන්න ලැහැස්ති වෙන්න"

සැවොම නැගී සිටියහ.

මගේ සිතට පැනයක් නැගුනෙන් මම අත එසවීමි.

"ඒ පාර මොකද?" ගුරුතුමිය ඇසුවාය. "ඔයාත් මනාපය පළ කරන්න කැමතියි. එහෙම නේද?"

"මට මගේ සවල අරං එන්න බැරිද?"

"හ්ම්... ඔයාලා මනාපය පළ කරන්න හරි කැමති එකේ අපි ඒකටත් මනාපය විමසීමක් තියමු. හා කෝ බලන්න මෙයා එයාගේ සවල අරං එනවට කැමති අය අත් ඔසවන්න"

සැම අතක් ම ඉහළට ගමන් කරන ලදී.

"හ්ම්... ඒක ඒකමතිකව තීරණය කරන ලදී" ගුරුතුමිය මදෙස බලා සිනා සී පැවසුවාය.

ඉදින් වනාන්තරය තුළට ගිය අපේ සවාරියට මාත් සමග මාගේ සවල ද යන ලදී. කුඩා දරුවෙකු ව සිටි මම මගේ සවලට බොහෝ සේ ඇලුම් කළ අතර සැමදෙන සවල රැගෙන යාමට පක්ෂ ව සිය මනාපය පළ කිරීම පිළිබඳ ව බොහෝ සතුටින් පසු වීමි.

වනාන්තරය තුළ ගත කිරීම සැබවින් ම සතුටුදායක දෙයක් විය. කොලපාට ගස් කොළන් අතර බිම පැලව තිබූ අලුත් තණ පැළෑටි බොහොම සිනිඳු වූ අතර මම මහත් වූ පුදුමයෙන් ඒවා දෙස බලා සිටියෙමි.

"ළමයිනි, බලන්න මේ ගහ දිහා," ගුරුතුමිය පැවසුවාය. "මේ මොන වර්ගයේ ගහක් ද කියලා කාට හරි කියන්න පුළුවන්ද?"

"ඒක ඕක් ගහක්, ඒක ඕක් ගහක්," සැවොම එක හඬින් පිළිතුරු දෙන්නට වූහ.

අපි අත් එසවූයේ මනාපය පළ කරන්නට කැමති නිසා යැයි පැවසූ ඔල්යා නම් වූ ගැහැණු ළමයා මෙසේ පැවසුවාය. "ඒක ගොඩක් පරණ, ශක්තිමත් ඕක් ගහක්" ඇය එසේ පැවසුවේ මන්දැයි කිසිවෙකු දැන සිටියේ නැත. ගුරුතුමියත් පුදුම වූ බවක් පෙනිණ. අනතුරුව ඇය මෙසේ ඇසුවාය.

"මේ ගහ මොකක්ද?"

සැමදෙන හඬ නගන්නට වූහ. "ඒක පුංචි බර්ච් ගහක්!"

ඒත් සමග ම ඕල්යා යමක් කියන්නට මුව හරිනු මම දිටිමි. මම සිහින් හඬින් මෙසේ පැවසීමි. "ඒක ශක්තිමත් පුංචි බර්ච් ගහක්!"

ඕල්යා මවෙත දිව දික් කළාය. එවර මා මහ හඬින් මෙලෙස පවසන ලදී. "ශක්තිමත් ළපටි දිවක්!"

සැමදෙන කොක් හඬලා සිනා නගන්නට වූහ. නමුත් ගුරුතුමිය මෙලෙස පැවසුවාය.

"කවුරු හරි ළමයෙක් පාඩමට බාධා කළොත් වනාන්තරයෙන් එළියට යන්න කියන්න මට සිදු වෙනවා"

ඇය එය පැවසූ දැඩි ස්වරය නිසා සියල්ලෝ ම සිය කතාවන් නැවතූහ. නමුත් අනතුරුව ඈ තනිව ම සිනාසෙන අයුරු දැකගත හැකි විය.

එයින් අනතුරුව ඇය අපට ගස් ගැන බොහෝ දේ පැහැදිලි කළාය. උතුරේ සහ දකුණේ වැඩෙන එකිනෙකට වෙනස් ගස් වර්ග ගැන ඇය අපට කියා දුන්නාය.

මේ අතර කෙනෙක් රං බෝනික්කෙකු දුටුවෙන් සැවොම ඒ ගැන ගායනා කරන්නට පටන් ගති.

රං බෝනික්කෝ!, රං බෝනික්කෝ!
ගිනි ඇවිලී ඇත නුඹේ නිවසට!
ඉගිළ යන්න හනි හනිකට!
හඬමින් ඉන්නා පැටවුන් අසලට!

නමුත් රං බෝනික්කාට වගේ වගක් නොවිණි. ඇය ඉගිලී නොගියාය. මේ අතර දිවා ආහාරය සිහි වී එක් වනම අප අතර කුස ගින්න, ගින්නක් සේ පැතිර යන්නට විය. වනාන්තරයේ එළිමහන් තැනකට වී දිවා ආහාරය ගන්නට ලැබීම ඇත්තෙන් ම ප්‍රීතියට කාරණයකි. විශාල ගසක කොටයක් මේසය ලෙසින් භාවිතා කරන්නට

අපට හැකිවිණි. සැවොම තම තමන්ගේ දිවා ආහාරය අනෙක් අය හා බෙදාගෙන කන්නට වූ අතර ගුරුතුමිය ඇගේ බෑගයෙන් ලොසින්ජර පෙට්ටියක් එළියට ගන්නවාත් සමග ම ළමුන් අතුරින් ඝෝෂාවක් පැන නැගිණි.

ඒ අතුරින් එක අයෙකු කෑ මොර දුන්නාය. "මෙන්න නයෙක්! මෙන්න නයෙක්!"

ඒ ඕල්යා විය. ඇය මගේ පසෙකින්, එළිමහන් භූමියේ කෙළවරට වන්නට හිඳ සිටියාය. එක් වනම උඩ පැන නැගී සිටි ඇය හඬ වැඩි කරමින් මොර දෙන්නට වූවාය.

"උදව් කරන්න! අනේ අම්මේ!"

මමත් විගසින් උඩ පැන නැගී සිටියෙමි. අළු කොළ පැහැති, කලු පාට පුල්ලි ඇති සර්පයෙකු ඕල්යා අසලින් ඇදෙන අයුරු දැකගත හැකි විය. මා කිසිදා පණ ඇති සර්පයෙකු දැක තිබුණේ නැති අතර බයෙන් බිරාන්ත වූ මා විගස හැකි තරම් වෙර ගෙන මගේ තියුණු සවලින් සර්පයාට පහර දුන් අතර ඒ පහරින් ඒ සතා දෙකඩ විය. ඕල්යා තවදුරටත් ගිරිය යටින් කෑ ගසමින් පසු වූවාය. එවර අනෙකුත් සියලුම ගැහැණු ළමයින් ද ඇයට එක් විය.

ගුරුතුමිය මා දෙස ප්‍රසාදයෙන් යුතු ව බැලුවාය. මම මගේ වැඩෙහි බැරෑරුම් ව යෙදී සිටියෙමි. මුලින් සර්පයින් දෙදෙනෙකුගෙන් හතර දෙනෙකුත්, ඒ හතර දෙනාගෙන් අට දෙනෙකුත්, ඒ අට දෙනාගෙන් දහසය දෙනෙකුත්, ඒ දහසය දෙනාගෙන් තිස් දෙදෙනෙකුත් වශයෙන් සර්පයින් මවමින් පසු වීමි. ඒ වන විට ලැබී සිටි සර්පයින් බොහොම කුඩාවුන් වූ අතර ගුරුතුමිය පැමිණ සෙමින් මගේ අත අල්ලා නවතාලූයේ නැතිනම් ඊටත් වඩා කුඩා සර්පයින් මා අතින් නිමවන්නට ඉඩ තිබිණ.

"ඒ ඇති! ඒ හානිදායක නොවන, තණකොළ සර්පයෙක්," ඇය පැවසුවාය. "එයා පොඩ්ඩක්වත් විස ඇති කෙනෙක් නෙමෙයි"

මම වහා මගේ කැබලි කිරිල්ල නැවැත්වීමි. අනෙකුත් ගැහැණු ළමෝ සිය කෑ ගැහිල්ල නතර කළහ. නමුත් ඕල්යා තවමත් කෑ ගසමින් පසු වූවාය.

"ඒ තණකොළ සර්පයෙක්! ඒ තණකොළ සර්පයෙක්!" ඇය ගිරිය යටින් කෑ ගැසුවාය.

ඒත් සමගම පිරිමි ළමුන් කෑ ගසන්නට විය.

"උදව්! උදව්!" ඔවුහු කෑ ගැසුවෝය. "උදව්! මෙන්න සර්පයෙක්!"

"නවත්වන්නයි කිව්වේ හැමෝට ම ඔය කෑ ගැහිල්ල!" ගුරුතුමිය පැවසුවාය. සියල්ලෝම නිහඬ වූ පසු ඇය මෙසේ පැවසුවාය.

"තණකොළ සර්පයින් විස ඇති අය නොවෙයි. උන් අපේ වතුවල ඉන්න මීයන් ගෙම්බන් ආදීන් ආහාරයට අරගෙන ජීවත් වන්නේ. කවදාවත් එයාලාව මරන්න එපා. තණකොළ සර්පයින් හා විස සහිත සර්පයින් වෙන් කරලා හඳුන ගන්න ඔයාලා ඉගෙන ගන්න ඕනෑ. අනිත් කාරණය හොඳට මතක තියා ගන්න පුංචි බබාලා වගේ කෑ මොර දෙන්න තියා ගන්න එපා, ඔයාලා එහෙම කරන්නේ මොකක් නිසාද කියලා හරියට ම නොදැන. යම් පිරිමි ළමයෙක් ඒ විස සහිත සර්පයෙක් කියලා හිතලා, පැනලා දුවන්නේ නැතුව තමන්ගේ යාළුවාගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටියා නම් ඔහු නිර්භීත පිරිමි ළමයෙක්, නමුත් මොන තරම් විස තිබුනත් බේරෙන්න කියලා ඒ සතාව කෑලි සියයකට කැබලි කරන්න අවශ්‍ය වන්නේ නැහැ"

එවර නැවතත් සියල්ලන් ම සිනා නගන්න හැකි සාමාන්‍ය තත්ත්වයට පත් විය. මම මගේ සවල පඳුරු ගොල්ලට විසි කළෙමි. එයින් අනතුරු ව බොහෝ කලක් යනතුරු පංතියේ ළමයින්, "උදව්! මෙන්න තණකොළ සර්පයෙක්!" යනුවෙන් කෑ ගැසුවත්, ඒ ඕල්යා ට සරදම් කරන්නට මිස මා අපහසුවට පත් කරන්නට නොවන වග දැන

සිටියෙමි. ඉතිං මගේ දුවේ, ඒ මං මගේ ජිවිත කාලයට ම මරණ ලද අවසාන සර්පයා බව කිව යුතුය.

ජර්මන් බස උගත් තාලේ



පාසල් සිසුවකු ව උන් සන්ධියේ විෂයයන් සඳහා සියලුම ආකාරයේ අකුරු මා හට ලැබී තිබේ. රුසියානු භාෂාව සඳහා බී අකුරක්ද, ගණිතය සඳහා සී අකුරක් ද, අත් අකුරු ලිවීම සඳහා ඩී අකුරක්ද, චිත්‍ර සඳහා අසමාර්ථය හඟවන එෆ් අකුරක්ද වශයෙන් සෑම අකුරක් ම මට ලැබී තිබේ. චිත්‍ර ගුරුතුමා මා හට තවත් එෆ් අකුරක් පොරොන්දු වූයේ මගේ නොහැකියාව හැකියාව බවට පත් කර නොගන්නේ නම් එය දෙන බව පවසමිනි.

මේ අතරතුරේ එක් දිනක් අලුත් ගුරුතුමියක පංති කාමරය තුළට ඇතුළු විය. ඇය ඉතාමත් ප්‍රියමනාප විය. ලස්සන ඇඳුමකින් සැරසී සිටි ඇය, තරුණ, ලස්සන, නිතර සිනාසෙනසුලු වූ තැනැත්තියක විය.

"මගේ නම එලේනා ඉවනොව්නා. කියන්න බලන්න ඔයාලාගේ නම්..." ඇය එසේ කියමින් සිනාසුනාය. පංතියේ සැම දෙන හඬ නගන්නට වූහ.

"සේන්යා!"

"සීනා!"

"ලීසා!"

"මීෂා!"

"කෝල්යා!"

ගුරුතුමිය වහා සිය දෙඅතේ ඇඟිලි දෙකකින් කන් දෙක වසා ගත්තාය. මද වේලාවකින් පංතිය නිහඬ විය. අනතුරුව ඇය මෙසේ පැවසුවාය. "මම ඔයාලාට ජර්මන් භාෂාව උගන්වන්නයි යන්නේ. ඔයාලා කැමතිද ජර්මන් ඉගෙන ගන්න?"

"ඔව්! ඔව්! අපි කැමතියි" මුළු පංතිය ම නින්නාද දෙන්නට විය.

ඉදින් මම ජර්මන් උගනීමට පටන් ගත්තෙමි. මුල් කාලයේ නිතර දෙවේලේ භාවිතා වන වචන සඳහා ඇති ජර්මන් වචන ඇසීමෙන් මම සතුටට පත් වීමි. ඒවා ඉගෙනීම මට සතුටක් විය.

පුටුව 'ඩෙයාර් ස්ටූල්' ලෙසින්ද, මේසය 'ඩෙයාර් ටිස්ච්' ලෙසින්ද,පොත 'ඩාස් බුච්' ලෙසින්ද, පිරිමි ළමයා 'ඩෙයාර් ක්නේබ්' ලෙසින්ද, ගැහැණු ළමයා 'දාස් මෙච්යන්' ලෙසින්ද කියැවුණු ජර්මානු භාෂාව කනට ප්‍රිය වදන් වලින් පිරුණක් ලෙසින් මට හැඟිණ.

එය සෙල්ලමක් මෙන් වූ අතර සැමදෙන ඉතාමත් කැමැත්තෙන් ජර්මන් ඉගෙන ගනිමින් සිටියහ. නමුත් සියල්ල කණපිට පෙරළුණෝ වදන් ගළපා වාක්‍යය තනන්නට පටන් ගත් තැනදීය. සමහර 'ක්නේබ්' ලාටත්, 'මෙච්යන්' ලාටත් එය නීරස කාරණයක් බවට විය. ඔවුන්ට වැටහී ගියේ ජර්මන් ඉගෙන ගන්නට නම් බොහෝ සෙයින් මහන්සි වන්නට සිදු වන වගය. එය තවදුරටත් සෙල්ලමක් වූයේ නැත. එයත් රුසියානු භාෂාව හෝ ගණිතය සේම තවත් එක් විෂයයක් පමණක් විය. අප ගුරුතුමිය සිය උපරිම උත්සාහය යොදමින් එය අප හට සිත් ඇදගන්නාසුලු පාඩමක් බවට පත් කරන්නට වෑයම් කරමින් සිටියාය.

ඇය සම්පූර්ණයෙන් විනෝදබර කතාවලින් යුතු වූ ජර්මන් කතාන්දර පොත් පංතියට ගෙන ආවාය. ළමුන්ට ජර්මන් ගීත කියා දුන්නාය. ජර්මන් විහිළු කතාන්දර කියා දුන්නාය. ඇත්තට ම කැමැත්තෙන් උවමනාවෙන් ඉගෙන ගත් ළමුන් නම් බොහොම සතුටින් පසුවිය. නමුත් එසේ නොවූ අයගේ තත්ත්වය ශෝචනීය විය. ඔවුනට ඈ පවසන දේ වටහා ගත නොහැකි විය. ඒ සියල්ලන් ම වෙහෙසට පත්වී සිටි අතර ඔවුන් ඔවුන්ගේ 'බුච්' වෙත නෙත් යොමු කළේ ඉඳ හිටය. ගුරුතුමිය අමතන විට 'ටිස්ච්' ලෙසින් ගල්බිල්ලන් සේ සිටින ලදී.

විටෙක ජර්මන් පාඩම ආරම්භ කිරීමට පෙර මෙවැනි හඬක් පංතිය සිසාර පැතිර යයි.

"ඉච් හැබෙ ස්පැසියිරෙන්!"

එහි නියම අරුත 'මට ඇවිදින්නට ඕනෑ' වුවත් එය පැවසූ කෙනාට පවසන්නට උවමනා වී තිබුණේ, "අපි මෙතැනින් එළියට පැන ගමු" යනුවෙනි. එක් අයෙකු මෙසේ හඬන්නට වූ විට තව තවත් පිරිමි ළමුන් එයට එක් වන්නට පටන් ගනී. අසරණ ගුරුතුමිය එන විට සියළුම පිරිමි ළමුන් පැන ගොස් අහවරය. මමද ඒ අතර වෙමි. අප

'ස්පැසියිරෙන්' වී සිටින අතරේ ගැහැණු ළමෝ පමණක් පාඩමට ඉතිරි වී සිටිති. ගුරුතුමිය අසතුටින් හිස සළන්නීය.

මා ඈ අසතුටට පත් කරන්නට සිතාගෙන පැන ගියා නොවේ. නමුත් ගුරුතුමියගෙනුත්, විදුහල්පතිවරයාගෙනුත් අනෙක් ගුරුවරුන්ගෙනුත් මිදී පාසලේ අට්ටලය තුළ හැංගී සිටීම එකල මට මහත් වූ විනෝදයක් ගෙන දිණි. පංති කාමරය තුළ වාඩි වී, වටහා ගත නොහැකි පාඩමකට ඇහුම් කන් දෙමින්, ගුරුතුමිය අසන,

"හැබෙන් සෙයි එන් ෆෙඩර්මෙසර්?"- "ඔබ සතුව පෑන් පිහියක් තිබෙනවාද?" වැනි ප්‍රශ්න වලට, නැගී සිට ගොළුවකු මෙන් මද වේලාවක් සිට අවසානයේ, "ඉච් නිට්ච්..." යනුවෙන් පවසා ගැහැණු ළමුන්ගේ සිනාවට ලක් වනවාට වඩා එය මහත් වූ සැනසීමක් ලෙසින් මට දැනිණ. අනෙක් අයට සිනාසීමට කැමති වුවත් කිසිදා අනෙක් අයගේ සිනාවට ලක්වන්නට මට උවමනා වූයේ නැත. නමුත් දැන් මා හට සිතෙන්නේ එකල මා බුද්ධිමත්ව සිතා බැලුවේ නම් මා ජර්මන් ඉගෙන ගන්නා බවය. එනමුදු එකල මට ජර්මන් ගුරුතුමිය දැකීම පවා නීරස දෙයක් වී තිබිණි. ජර්මන් භාෂාවත් නීරස වී තිබිණි. එබැවින් විය යුතු පරිද්දෙන් ජර්මන් ඉගෙන ගැනීමට මා හට නොහැකි විය. වෙනත් පාසලක දී මේ අයුරින් ම ප්‍රංශ ඉගෙන ගැනීමත් මා අතින් මග හැරිණි. සියලුම පාසල් වලදී ඉංග්‍රීසි ඉගෙන ගැනීම සම්පූර්ණයෙන් මග හැරිණි. අවසානයේ මම කිසිම විදේශීය භාෂාවක් හඳුනාගත නොහැකි කෙනෙකු බවට පත් වී සිටිමි. ඒ හැකියාවන් නැති කරගත්තේ මා විසින් ම බව අද වටහා ගෙන සිටිමි. මේ කාරණය නිසා මා කැමති කිසිම පොතක් ඒ පොත ලියැවුණු මව් භාෂාවෙන් කියැවීමේ සතුට මට අහිමි ව තිබේ. මෙයට අමතර ව සමහර අවස්ථාවන් වලදී මට වෙනත් රටවල පුද්ගලයින් හඳුනා ගන්නට ලැබේ. රුසියානු භාෂාව හැසිරවීම ඉතාමත් දුර්වල මට්ටමක තිබුණත් ඔවුන් අපහසුවෙන් හෝ එය ඉගෙනගෙන තිබේ. ඉදින් ඔවුහු මගෙන් මෙසේ අසති.

"ඔයාට ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්ද?"

"ස්ප්‍රෙචෙන් සෙයි ඩෙයුට්ස්ච්?"

"පාර්ලෙස්-වොයුස් ෆ්‍රැන්කයිස්?"

නමුත් දුවේ මට කළ හැක්කේ එක් දෙයක් පමණි. එනම් ඔවුන් කියන සෑම දෙයට ම හිස සළමින්, "ඉච් නිට්ච්" කීම පමණි.

රචනා දෙකක් තිබුණා දෙඅතේ



පාසල් යන කුඩා ළමයෙකු ව සිටි අවධියේ මා හට වාස්යා නමින් මිතුරෙක් සිටියේය. ඔහු වාසය කළේ මගේ නිවසට යාබද නිවසේය. සැමවිට අප දෙදෙන එක්ව පාසලට ඇවිදගෙන ගිය අතර නැවත නිවසට පැමිණියේද එකටම ය. පාසලේදී අප දෙදෙන යුගල මේසයක් හවුලේ භාවිතා කරන ලදී. මුළු පංතියෙන් ම ගණිත ගැටළු මුලින් ම විසඳා අහවර කළේ වාස්යා ය. ඔහු සැමවිට ම මටත් ගණිත ගැටළු විසඳා ගැනීමට උදව් කිරීමට සැදී පැහැදී සිටියේය. රචනා ලිවීමේ දී මම ඔහුට උදව් කළෙමි. අප දෙදෙනා

එකිනෙකා කෙරෙහි ප්‍රසාදයෙන් පසු වූ අතර යම් දිනෙක රණ්ඩු වුණේ නම් ඒ රණ්ඩුව ඇති වුයේද අප දෙදෙනා අතර මිස වෙන අය සමග නොවේ.

එක් දිනක් ගුරුතුමිය අප හට රචනාවක් සඳහා මාතෘකාවක් ලබා දුන්නාය. "මා ගිම්හානය ගත කළ හැටි!"

"අනේ මට නම් තේරෙන්නේ නැහැ මොනවා ලියන්න ද කියලා?" වාස්යා මා සමග පැවසුවේය.

"ගිම්හානයේ දී ඔයා කොහෙද හිටියේ?"

"පිටිසර පළාතේ"

"එහෙනං ඒ ගැන ලියන්න"

"මොනවා ගැනද?"

"ඔයා එහෙදි මොනවද කළේ?"

"විශේෂයක් නැහැ ඉතිං. පීනන්න ගියා, මාළු අල්ලන්න ගියා, කැලේ ඇවිදින්න ගියා."

"ඉතිං ඒ දේවල් ගැන තමයි ඔයා ලියන්න ඕනෑ" මම පැවසීමි. එහෙත් වාස්යාගේ රචනාව කවදාවත් සම්පූර්ණ වූයේ නැත. ඒ අසම්පූර්ණ රචනාව ඔහු මට පෙන්වූයේය. ඔහු යමක් ලියා තිබිණි.

මම ගිම්හානය ගත කළ හැටි...

ගම්බද පෙදෙසක පිහිටි, මගේ ආච්චි අම්මාගේ නිවසේ මෙවර ගිම්හානය ගත කළෙමි. මම තවත් පිරිමි ළමයින් පිරිසක් සමගින් පීනන්න, මාළු අල්ලන්න, කැලේ ඇවිදින්න ගියෙමි. ගම්මානයේ ගිම්හානය මට සතුටක් ගෙන එන ලදී.

"මේක රචනාවක් නෙමෙයි" මම පැවසීමි. "ලියන්න ඔයාගේ ආච්චි අම්මා ගැන, එයා මොන වගේද, මොනවද කිව්වේ, මොනවද කළේ, මොන වගේ සිංදු ද එයා ගායනා කළේ, අන්න ඒ වගේ දේවල් ගැන ලියන්න"

"එයා සිංදු නම් ගායනා කළේ නැහැ, හැබැයි මට කතා කියලා දුන්නා"

"වඩා හොඳයි, එහෙනම් එයා ඔයාට කියලා දුන්නු කතා ගැන ලියන්න. එහෙදි ඔයාට හමු වුනු යාළුවන් ගැන, ගංගාව ගැන, වනන්තරය ගැන රචනාවේ ලියන්න"

"මට ඔය දේවල් සේරම ලියන්න බැහැ" වාස්යා පැවසුවේය. "මොකද කියන්නේ? මම සේරම ඔයාට කියන්නම්, ඔයාට බැරි වෙයිද ඒ රචනාව ලියන්න?"

ඉඳින් කුමක් සිදුවන්නද? වාස්යා ඔහුගේ ආච්චි අම්මා ගැන, ගමේ මිතුරන් ගැන, වනාන්තරය ගැන වගේ ම ගංගාව ගැනත් මට පැවසුවේය. මම මගේ උපරිම හැකියාවන් යොදා ඉතාමත් දීර්ඝ රචනාවක් ලීවෙමි. එය ඉතාමත් අනර්ඝ ලියැවිල්ලක් ලෙසින් වාස්යා සිතුවේය.

"මම දැන් ආපහු ඒක මගේ අත්අකුරින් ලියන්නම්," ඔහු පැවසීය. "ඒ අතරේ දැන් ඔයා ඔයාගේ රචනාව ලියන්න, නැත්තං පරක්කු වෙයි"

ඔහු ගිය පසු මම මගේ රචනාව ලිවීම ඇරඹීමි. නමුත් මට ඒ සඳහා දිගු කාලයක් ගත කරන්නට විය. එක දිගට එක ම මාතෘකාව යටතේ රචනා දෙකක් ලිවීම පහසු කටයුත්තක් නොවේ. මාද ගිම්හානය ගත කළේ ගම්බදවය. කැලේ ඇවිදින්නට මෙන් ම ගංගාවේ පිහිනීම සඳහා ද ගියෙමි. නමුත් ඒ වන විට ඒ සියල්ල මවිසින් වාස්යාගේ රචනාවේ ලියා අහවර ව තිබිණි. ඒ වන විට මට ඇති ව තිබූ ගැටළුව නම් වාස්යාගේ රචනාවට වඩා වෙනස් රචනාවක් ගොනු කර ගැනීමයි. එසේ නොවුණාහොත් ගුරුතුමිය අනිවාර්යයෙන් ම යම්කිසි වැරැද්දක් සිදු ව

ඇති වග අනුමාන කරනු නියතය. ඉඳින් බොහෝ වෙලාවකට පසු රචනාවේ ගුණාත්මක භාවය පසෙක තබා වාස්යාගේ රචනාවට කිසිසේත් ම සමාන නොවන රචනාවක් ලියා ගැනීමට මට හැකි විණි. ඇත්ත වශයෙන් ම කියතොත් මගේ රචනාවට සමාන කළ හැකි යමක් මෙලොව නොමැති බව ගුරුතුමිය පැවසුවාය.

අපේ රචනා පොත් එකතු කරගත් ගුරුතුමිය ඒ සියල්ල කියවා අවසානයේ අප වෙත දුන්නාය. "මෙන්න ඔයාලාගේ පොත් ළමයිනි, වාස්යාගේ රචනාව තමයි හොඳ ම රචනාව. මම ඒක ඔයාලාට ඇහෙන්න කියවන්නම්"

ඇය මගේ පළමු රචනාව පංතියට ඇහෙන්නට කියෙව්වාය.

"හරිම හොඳයි වාස්යා!" අවසානයේ ගුරුතුමිය පැවසුවාය. "එය අනර්ඝ ලියැවිල්ලක්. සිත් ඇදගන්නාසුලු, මැනවින් ලියන ලද්දක්. ඒකේ කිසිම වැරැද්දක් නැහැ. ඔයාට හරිම හොඳ ආච්චි අම්මා කෙනෙක් වගේම හොඳ යාළුවෝ ටිකක් ඉන්නවානේ"

වාස්යාගේ මුහුණ රතුවිය. තමන් නොකරන ලද දෙයකට ප්‍රශංසා ලැබීමට ඔහු කැමති නොවීය.

අනතුරුව යම්කිසි හේතුවක් නිසා ඇය මා දෙස බැලුවාය. "හ්ම්... දැන් මං කියවන්නම් පංතියෙන් ම නරක ම නරක රචනාව" අනතුරු ව ඇය මගේ දෙවැනි රචනාව කියෙව්වාය.

එවර මගේ මුහුණ රතුවිය. මගේ නොවන වැරැද්දකට දොස් ඇසීමට මාද කැමති නොවීය.

මගේ රචනාව කියවා අවසානයේ ගුරුතුමිය මෙසේ පැවසුවාය. "මම බලාපොරොත්තු වෙනවා ඔයා මීට වඩා හොඳින් රචනා ලියන්න ඉගෙන ගනියි කියලා, ඒ වගේ ම වාස්යා තමන්ගේ හැකියාව වැඩි දියුණු කරගන්න ඕනෑ. ඔය තත්ත්වයෙන් පහළට වැටෙන්න බැහැ. මං කිව්ව දේ පැහැදිලිද?"

"ඔව්" මම කෙඳිරුමකට ආසන්න ස්වරයෙන් පැවසීමි.

"ඔව්" වාස්යා ද කෙඳිරුවේය.

අප දෙදෙන රතු වුණු මුහුණු වලින් යුතුව එක ළඟ අසුන්ගෙන සිටි අතර අනෙක් ළමුන්ට සිදුව ඇත්තේ කුමක්දැයි වටහා ගත නොහැකි විය. අප දෙදෙන කිසිදා සිදු වූ දේ ගැන සාකච්ඡා කරන්නට සිතුවේ ද නැත. නමුත් එයින් අනතුරු ව මා මගේ ගණිත ගැටළු තනිව විසඳා ගත් අතර වාස්යා සිය රචනා තනිව ලියා ගත්තේය. මුලදී මගේ ගණිත විසඳීම් සම්පූර්ණයෙන් ම පාහේ වැරදි වලින් වැසී තිබිණි. වාස්යාගේ රචනාත් අනර්ඝ වූයේ නැත. නමුත් කාලයත් සමග ම අප දෙදෙනා ම තම තමන්ගේ හැකියාවන් වර්ධනය කරගත් අතර කෙනෙකු තමන්ගේ ඉගෙනීම් කටයුතු තමන් ම කර නොගන්නා තාක් කල් නිවැරදි ලෙස ඉගෙන ගන්නට නොලැබෙන වග දෙදෙනාම වටහා ගන්නා ලදී. එනමුදු දුවේ, අපේ මිතුදමට මේ දේවල් බාධාවක් නොවුණා පමණක් නොවේ, බොහෝ කාලයක් යනතුරු අප දෙදෙන හවුලේ භාවිතා කරන ලද්දේ යුගල මේසයකි.

මහා කිච්චර හා දුරකථන සංවාදේ

මා පාසල් යන වයසේ කුඩා පිරිමි ළමයෙකු ව සිටි අවධියේ වරක් මවිසින් වරක් කිච්චර මයකොව්ස්කි හට දුරකථනයෙන් අමතන ලදී. එසේත් නැත්නම් ඔහු මා හට අමතන ලද්දේය. කෙසේ නමුදු සිද්ධිය සැකෙවින් මෙසේය.

දිනක් මවිසින් "පතල්කරුවා" නමින් කවියක් ලියා ගුරුතුමියට පෙන්වන ලදී. ඇය එය කියවා මෙසේ පැවසුවාය. "අපේ පාසලේ කවුරුවත් කවි ලියන්නේ නැහැ. ඒ නිසායි මං මේ කවිය පාසල්

පුවත්පතේ පළ කරන්නේ. හැබැයි ඔයා හිතන්න එපා තාම ඔයා පුෂ්කින් තරමට ම ශ්‍රේෂ්ඨ කවියෙක් බවට පත් වෙලා කියලා"

මම පුෂ්කින් වැනි යැයි නොසිතන බවට ඇයට පොරොන්දු වූයෙමි.

ඉදින් මගේ කවිය පාසල් පුවත්පතේ පළ විය. එය කියවූ සෑම ළමයෙකු ම, කවි ලියන පිරිමි ළමයෙකු තුන්වන ශ්‍රේණියේ ඉන්නා බව දැන ගන්නා ලදී. ගුරුවරු මා හට ප්‍රශංසා කළහ. ඒ අතරේ සමහර ළමයි මට සරදම් කරන්නට වූහ. "එයා ලොකු කවියෙක්ලු. ඒත් ඒක එයා දන්නේ නැහැලු" ඔවුහු පැවසූහ. වැඩිහිටි ශිෂ්‍යාවෝ තම තමන්ගේ සමරු පොත් මට දෙමින්, ඒවායේ කවිය බැගින් ලියා දෙන මෙන් ඉල්ලා සිටියෝය. පාසල් පුවත්පතේ සංස්කාරකවරයා සිය මිට මෙළ වූ අත මා වෙත පාමින් පැවසුවේ, "ඔයා අපේ පත්තරේ හැම කලාපයට ම කවියක් ලිව්වොත් හොඳයි. නැත්නම් ඔයාට කණගාටු වන්න සිදුවේවි"

වැඩිහිටියෙකු වූ පසුව, තමන්ගේ පුවත්පතට හැමදාම කවියක් ලියන ලෙසින් බල කරන සංස්කාරකවරයෙකු මෙලොව සිටී නම්, ඒ පිළිබඳ ව ඕනෑ ම කවියෙකු සතුටට පත්වනු ඇති බව මා හට වැටහිණි. නමුත් එදින මම අතිශයින් බියට පත් වීමි. සංස්කාරකවරයා හත්වන ශ්‍රේණියේ ලොකු කොලුවෙකු වූ අතර ඔහුගේ මිට මෙළවූ අත ඕනෑ ම කෙනෙකු බියට පත්කරවන්නට තරම් විශාලත්වයෙන් ප්‍රමාණවත් විය. ඉන් අනතුරුව පළවුණු සෑම කලාපයකම මගේ කවියක් ඇතුළත් වන්නට වූයේ මගේ ඒ අනිතය බියේ ආනිශංසයක් වශයෙනි. සමහර කලාප වල කවි දෙකක් පවා පළ වූ අවස්ථා තිබිණි.

මේ ඉර හඳ යට ඇති කිසිම දෙයකට මගෙන් ගැළවුමක් නොවිණි. ඒ සෑම දේ ගැන ම මම කවි ලීවෙමි. සෘතු හතර ගැන සතරාකාරයකට කවි පද බැන්දෙමි. පැරිස් ජන සමාජය පිළිබඳවද කවි ලීවෙමි. 'පුගචොව් මියුටිනි' යනුවෙන් නමින් මා රචනා කළ කවියෙන්

කියැවුණේ හයවෙනි ශ්‍රේණියේ ළමුන් ඔවුන්ගේ රසායන විද්‍යා පංතිය මග හැරි ආකාරය පිළිබඳ ව වූ අතර 'පුගචොව්' යනු ඔවුන්ගේ ගුරුතුමාගේ නම විය. වසර දෙකක් පුරාවට සැළකිය යුතු කවි ප්‍රමාණයක් රචනා කර තිබුණු නමුත් ඒ වනවිටත් ඒවායේ ගුණාගුණ පිළිබඳ පැහැදිලි වැටහීමක් මා හට නොවිණි. ඒවා ඇත්තට ම හොඳ නිර්මාණදැයි දැන ගැනීමේ ක්‍රමයක් ද මට නොපෙණිනි. පාසලේ සෑම කෙනෙකු ම මා හට ප්‍රශංසා කළද මට හැඟුණේ මා ලියනුයේ නියම කාව්‍ය නොවන බවයි. කවදා හෝ මට නියම කාව්‍ය රචකයෙකු විය හැකි වේදැයි දැන ගැනීමේ බලවත් උවමනාවකින් පෙළෙන්නට වීමි. 'එය ඉෂ්ට වේදැයි කිව හැකි වන්නේ කාටද?' මම සිතන්නට වීමි. 'සැබෑම කාව්‍ය රචකයෙකුට පමණි.' මට සිතිණි. 'හොඳ ම සහ ජනප්‍රිය ම කවියාට...' මම තීරණය කළෙමි. 'හරියට ම කියනවා නම් ව්ලැඩිමියර් මයකොව්ස්කි හට'

මම මගේ දැනුමේ හැටියට මවිසින් ලියන ලද කවි අතුරින් හොඳ ම යැයි හැඟුණු ඒවා තෝරා ගෙන ඔහුට පෙන්වන්ට සිතා ගතිමි. නමුදු ඒ වනවිටත් කුඩා දරුවෙකු වූ මම ඔහු හමුවන්නට යන්නට බිය වීමි. එමනිසා මගේ අවසාන තීරණය වූයේ ඔහු හට දුරකථනයෙන් ඇමතීමටයි. දුරකථන නාමාවලියෙන් ඔහුගේ අංකය සොයා ගැනීම අපහසු කාරණයක් නොවීය. අනතුරුව එළඹුණු සන්ධ්‍යාවන් කිහිපය තුළ සුදුසු අවස්ථාවක් පාදාගෙන, කලින් තෝරා ගන්නා ලද මගේ කවි සියල්ල මේසය මත දිගහැර, ගැඹුරු හුස්මකින් සිතට සැහැල්ලුවක් ගෙන දී, රිසිවරය ඔසවා ඔහුගේ අංකය ලබා ගෙන නැවතත් මොහොතකින් එය තැබීමි. 'මයකොව්ස්කි හට අමතන්නයි සූදානම් වන්නේ' යන සිතුවිල්ලත් මගේ ගත සිත සසල කරවන්නට සමත් විය.

මෙම සිදුවීම මේ ආකාරයට ම පුරා සතියක් පුරා අප නිවස තුළ හුදකලාවේ රඟ දැක්විණි. මට මා ගැන ම බලවත් ලජ්ජාවක් ඇති වී තිබිණි.

අවසානයේ එක් ඉරු දිනෙක සන්ධ්‍යාවේ අම්මාත් තාත්තාත් චිත්‍රපටයක් නරඹන්නට ගොස් සිටි අවස්ථාවේ නැවතත් මම සුපුරුදු දුරකථන ඇමතුම ලබා ගතිමි. ආදරණීය බලාපොරොත්තුව වෙනුවෙන් තරයේ රිසිවරය අල්ලාගෙන සිටි අතර එවර එය අත් හැරියේ නැත. ගැඹුරු ගෙරවීමක් වැනි හඬින් දුරකථනයට පිළිතුරු සැපයිණි. එවන් කටහඬක් එයින් මතු කිසිදා මට අසන්නට ලැබී නැත. එය බොහෝ සෙයින් කේන්තියට පත් ව සිටින්නෙකුගේ බව ඔබට ඇසුණේ නම් සිතෙනු ඇත.

"කවුද මේ කතා කරන්නේ?" අනෙක් පසින් දැඩිව අසන ලදී.

මට උන් හිටි තැන් අමතක විය. කෙතරම් සිර වූයේද යත් එක වදනක්වත් දිව අගට ළං නොවීය.

"කවුද මේ පිස්සෙක් වගේ වැඩ කරන්නේ?" ඒ හඬ ගිගිරුම් දෙන්නට විය. "කවුරු හරි පිස්සෙක් හැමදාම මට කෝල් ගන්නවා. ගන්නවා විතරයි එක වචනයක්වත් කියන්නේ නැහැ! හොඳයි, මොනවා හරි කියන්න! මට ගායනා කරන්න මිතුරෝ!"

මම තව තවත් බියෙන් හැකිළීමි. ඒ අතරතුරේ, සමාව ගන්නට හෝ 'හෙලෝ' කියන්නට හෝ අවම වශයෙන් වෙනත් කිසිවක් හෝ පවසන්නට තිබුණු කාලය ගත වී ගියේය. ඒ වනවිට මට කළ හැකිව තිබූ එක ම දෙය නම් ඒ භයංකර නිහඬතාවට ඇහුන්කන් දී සිටීම පමණි.

"හොඳයි, ඔහොම ම හිටින් යාළුවා, මම නුඹ ව අල්ලගන්න තෙක්! ආයේ මට කෝල් අරං බලමුකෝ එහෙනං!"

ඒත් සමඟ ම අනෙක් පසින් මහා හඬක් නගමින් දුරකථනය තබනු ඇසිණ. මා කිසිදා නැවත ඔහු ඇමතුවේ නැත. කිසිදා ඔහු ව දුටුවේ හෝ ඔහුගේ හඬ අසන්නට ලැබුණේ නැත. අවම වශයෙන් කිසිවෙකු හා එම සිදුවීම පිළිබඳ ව පැවසුවේ ද නැත. එදා මෙදාතුර ඒ

පිළිබඳ ව දැන සිටියේ මෙලොව වාසී දෙදෙනෙකු පමණි. ඒ මාත් ව්ලැදිමියර් මයකොව්ස්කීත්ය. එනම් සැබෑ ම සිදුවීම දැන සිටියේ මා පමණි. මයකොව්ස්කි හා මගේ සංවාදය මට කිසිදා අමතක නොවනු ඇත. දැන් මගේ දුවේ! එය ඔබටත් රහසක් නොවේ.

ලියූ කවි ගැයූවයි වේදිකාවේ



ප්‍රාසල් යන වයසේ කුඩා පිරිමි ළමයෙකු ව උන් අවධියේ, අප හට වෙනත් පාසලක තිබූ උත්සවයක් සඳහා ආරාධනා ලැබිණ. ඇත්ත වශයෙන් ම ඊට පෙර ඔවුන් අප පාසලට එවැනි ම වූ උත්සවයක් සඳහා පැමිණ තිබූ අතර එවර ඔවුහු නැටුම්, ගැයුම්, කවි ගායනා ඉදිරිපත් කිරීම් සහ කායවර්ධන ප්‍රදර්ශනයක් පවත්වන්නට යෙදුනහ. පුෂ්කින්ගේ 'බොරිස් ගොඩනොව්' නාටකයෙන් කොටසක් පවා රඟ දැක්වූහ. ග්‍රෙගරි ලෙසින් රඟ පෑ ළමයා ජනේලයෙන් පනින්නට ගොස් එහි හිරවූ අතර එයින් එළියට ඒමට යත්න දැරීමේදී මහ හඬක් නගමින් සම්පූර්ණ දර්ශන තලය ම ඇද වට්ටවන්න සමත් වූ බව සත්‍යයක් වුවද එය ඕනෑ ම කෙනෙකුට විය හැකි වර්ගයේ අකරතැබ්බයකි. කෙසේ හෝ සමස්තය ලෙස ගත් කල එය හොඳ ඉදිරිපත් කිරීමක් වූ බව කිව යුතුය. ඒ වනවිට උදා වී

තිබුණේ අප පාසලේ අවස්ථාව බව මම පෙරදී සඳහන් කළෙමි. අපට අවශ්‍ය ව තිබුණේ එම පාසලේ සිසුන් පුදුමයෙන් පුදුමයට පත් කරවන්නට වුවද එය කළ හැක්කේ හෝ කළ යුත්තේ කෙසේදැයි යන්න පිළිබඳ ව අදහසක් කිසිවෙකු සතු නොවීය. ඉදින් අපි සාකච්ඡා වට බොහොමයක් පවත්වන්නට වීමු.

"අපිට ගයන්න පුළුවන්, එයාලටත් පුළුවන්නේ. අපිට නටන්න පුළුවන්, ඒකත් එයාලාට පුළුවන්නේ, අපටත් වඩා හොඳට මං හිතන්නේ. නමුත් අපේ ජිම්නාස්ටික් කණ්ඩායම එයාලා තරම් ම හොඳයි නේද? අපේ ජිම්නාස්ටික් පිරමීඩය වැටුණාට මොකද එයාලාගේ සම්පූර්ණ දර්ශන තලය ම ලස්සනට කඩාගෙන වැටුණේ. අපිට කවි ගායනා කරන්න පුළුවන්, වැඩක් නැහැ ඒකත් එයාලාට පුළුවන්නේ. ඉතිං මොනවද එයාලාට බැරි අපිට පුළුවන් දෙයක් තියෙන්නේ?"

අපි සැවොම සිතන්නට පටන් ගත්තෙමු.

"ආහ්... අපිට මීෂා ඉන්නවානේ," අවසානයේ කිසිවෙකු පැවසීය.

"හරි! එයාට බුරන්න පුළුවන්!"

"එයාට කරවි කරන්න පුළුවන්!"

"එයාට කඳැවි කියන්න පුළුවන්!"

"එයාට අත් දෙකින් ඇවිදින්න පුළුවන්!"

"කරුණාකරලා හැමෝ ම එකපාර කෑ ගහන්න එපා!" ගුරුතුමිය පැවසුවාය.

කෑ ගැසීම් නතර වූ පසු මීෂා කතා කළේය. "ඉතිං මොකද? කාටත් ඔය දේවල් කරන්න පුළුවන්. ඔන්න මට කවි ලියන්න පුළුවන් නම්, ඒක වැඩක් වෙන්න ඉඩ තිබුණා." අනතුරු ව විය යුතු සේ ම ඔහු මදෙස බැලීය.

අනෙක් සෑම දෙනාමත් මා දෙස බලන්නට වූහ.

"ඔයා කියපු දේ කොච්චර නිවැරදිද!" ගුරුතුමිය සතුටින් පැවසුවාය. "අපිට අපේ ම පංතියේ කවියෙක් ඉන්නවානේ!"

"එයාලාට එහෙම කෙනෙක් නැහැ!"

ඉතාමත් අසරණ ලීලාවට පත් වූ මා පවසා සිටියේ එයට පෙර කිසිදා වේදිකාවක් මත ඉදිරිපත් කිරීමක් කර නොමැති බවත්, ඇරත් ආගන්තුක පාසලක වේදිකාවක මවිසින් ම රචනා කරන ලද කවියක් ගායනා කිරීම ගැන සිතීමටවත් අපහසු බවය.

"ඔච්චර දුක් මනස්තාප වෙන්න එපා!" කෙනෙක් කෑ ගැසුවේය.

"ඕකේ හිතන්න දෙයක් නැහැ ළමයෝ" තව කෙනෙක් හඬ නැගුවේය.

"හැමදේම හොඳින් සිදුවෙයි," ගුරුතුමිය පැවසුවාය. "එකම දේ ඔයා පුෂ්කින් නොවන වග අමතක නොකිරීමයි."

ඇය මෙම කාරණය ඊට පෙරත් මට පවසා තිබුණු අතර මට අමතක වී තිබුණේ ද නැත.

අවසානයේ එම භයංකර දිනය උදා විය. මම, වේදිකා භීතිකාවේ ගොදුර, අප පාසලින් පිටත් වූ ජිම්නාස්ටික්කරුවන්, නර්තන ශිල්පීන් හා ගායන ශිල්පීන් හා එක් ව ඒ ඓතිහාසික ගමන පිටත්වීමි. එසේ ගොස් ආගන්තුක පාසලේ, ආගන්තුක වේදිකාවේ මුල්ලකට වී, ආගන්තුක ප්‍රේක්ෂකාගාරය දෙස බලා සිටියෙමි. පෙර කිසිදා දැක නොමැති ගැහැණු ළමයින්ගෙන් හා පිරිමි ළමයින්ගෙන් එය පිරී ඉතිරී තිබිණ. එහි ඉදිරි පෙළ අසුන් වල ආගන්තුක විදුහල්පතිවරයාත් ආගන්තුක ගුරු මණ්ඩලයත් අසුන්ගෙන සිටියහ. ඒ සැමගේ දෙනෙත් තිබුණේ වේදිකාව දෙසටය. ප්‍රේක්ෂකාගාරය ඉතාමත් සාමාන්‍ය ළමුන් පිරිසකගෙන් හා ඉතාමත් සාමාන්‍ය ගුරු මණ්ඩලයකින් යුතු ව

තිබෙන්නට ඇති වග මේ වනවිට නියත වශයෙන් ම ඔබට වැටහී තිබෙනු ඇත. නමුදු එදින, උග්‍ර වේදිකා භීතිකාවකින් පෙළෙමින් සිටි මා ආගන්තුක පාසලේ ආගන්තුක පිරිසක් මැද තනිව භයානක උවදුරකට ලක් ව සිටින්නාක් සේ දැණින.

"මේ ඉස්කෝලේ ඇති දෙයක් නැහැ," මීෂා මගේ කනට කෙඳිරුවේය. "මේකත් අපේ එක වගේ ම තමයි. සමහරවිට ඊට වඩා අප්සැට් වගේ" නමුත් ඒ සියල්ල නිෂ්ඵල කතා පමණක් විය.

කෙසේ හෝ අවසානයේ ඒ භයානක මොහොත උදා විය.

"දැන් ඔබ සැමට අප පාසලේ කවියා විසින් රචිත කවියක් ඔහුගේ හඬින් ම අසන්නට ලැබෙනු ඇත"

අත්පොළසන් නාදය අවට සිසාරා ගියේය. මීෂා මා තල්ලු කළ අතර බිමට ඇළ වී තිබුණු පා යුවල අපහසුවෙන් ගලවාගෙන බිම දිගේ ඇදගෙන පැකිළෙමින් යන්නට වීමි. ඊට පෙර මා මෙතරම් භය බිරාන්ත වූ අවස්ථාවක් සිහිකර ගත නොහැකි විය. ප්‍රේක්ෂකාගාරය වේගයෙන් භ්‍රමණය වන්නාක් සේ දැනෙන්නට වූ අතර දූවිලි පිරී ගියාක් මෙන් උගුර කට වියැලී ගියේය. මුහුදු වෙරළේ ඉන්නාක් මෙන් 'හෝ හෝ' හඬින් දෙසවන් පිරී ගියේය.

මට හිස ඔසවා ප්‍රේක්ෂකාගාරය දෙස එක්වරක් හෝ බැලීමට නොහැකි ලෙසින් දැනිණ. එතෙක් වේලා පැවති අත්පොළසන් නාදය නතර වී තිබිණ. නිශ්චලතාව රජයමින් තිබුණු අතර සියල්ලෝ ම මවිසින් රචිත, මා විසින් ගායනා කරන්නට ගිය කවිය අසන්නට සැදී පැහැදි සිටියෝය. නමුත් කිසිවක් නොකළ මා එතැන නිසොල්මනේ සිටගෙන සිටි අතර මීෂා පසුව පැවසූ පරිදි මුලින් කඩදාසියක් මෙන් සුදු වූ මගේ මුහුණ මද වේලාවකින් නිල් පාට වී, අනතුරු ව කොළ පාට වී අවසානයේ රතු පාට පැල්ලම් වලින් පිරී ගොස් තිබිණ. "ඔයාලා එයාව ඒ වෙලාවේ දකින්න තිබුණේ!" එම උත්සවයට සහභාගී නොවූ මිතුරන් සමග මීෂා පසුව පැවසුවේය. "එයා හරියට පෙනුණේ මල්

වෙඩිල්ලක් වගේ! මං ඔට්ටු අල්ලනවා ඒ වගේ කෙනෙක් තවත් නං ඒ ඉස්කෝලේ හිටියේ නැහැ!" ප්‍රේක්ෂකාගාරයෙන් සිනා නැගෙන්නට වූ විට අප පාසල වෙනුවෙන් මා විසින් රචිත ස්තුති ගීතය ගයන්නට පටන් ගතිමි. සියල්ලන් ම සාවධාන ව අසා සිටි අතර මැද පද පෙළ ගයන විට ඔවුන් නොසන්සුන් වන්නට විය. එය මෙසේ විය.

නුඹ රොබින් හුඩ්ටත් වඩා නිර්භීත වූයේ නම්
සෑම දෙණියක ම හෝ වනයක ම සෙව්වේ නම්
රට පුරා තියෙන සෑම සියලු පාසල් කණ්ඩායම්
අතර හොඳ කණ්ඩායමක් නැති වග දැනෙයි අප තරම්!

වෙනත් පාසලක සිට මෙවැන්නක් ගායනා කළ විට ඇතිවිය හැකි තත්ත්වය කෙබඳුදැයි ඔබට සිතාගත හැකි නේද? ස්වභාවිකව ම සියල්ලෝ ම තම තමන්ගේ පාසල් පිළිබඳ ව අභිමානයෙන් පසු වෙති. එවැනි තත්ත්වයක් යටතේ එදින ප්‍රේක්ෂකාරය තුළ මගේ කවියෙන් පසු නොසන්සුන් භාවයක් ඇති වීම අරුමයක් නොවේ. ඇති ව තිබූ තත්ත්වය තේරුම් ගැනීමටත් නොහැකි ලෙසින් මම බියෙන් තැති ගෙන සිටියෙමි. නමුත් මට කවිය ගායනා කර අවසන් කිරීමට අවශ්‍ය විය. එබැවින් අත ඔසවා මෙසේ ඉල්ලා සිටීමට මට සිදුවිය.

"කරුණාකර මැදදි බාධා කරන්න එපා. මම ගායනා කරලා ඉවර වුණාට පස්සේ ඔයාලා ට පුළුවන් ශබ්ද කරන්න" ඉල්ලීම සළකා බැලිණ. එම කියමන මගේ අවසානය සනිටුහන් කිරීමක් බව ඒ මොහොතෙහි මට සිතුණේ නැත. නැවතත් ඊළඟ කවිය ගයන්නට වීමි. කවිය අවසන් වූ වහා ම නැවතත් ප්‍රේක්ෂකාගාරය නොසන්සුන්විය. පා හප්පමින්, විසිල් ගසමින්, හූ කියමින් ළමයින් දඟලන්නට විය. එහෙත් එම බාධාවන් නොතකමින් සෑහෙන කවි ප්‍රමාණයක් කියා ගැනීමට මට හැකි විය. අපමණ බාධා මැද ඉතා දැඩි උත්සහයකින් යුතුව, අප පාසලේ නම්බුව වෙනුවෙන් කටයුතු කළ මා සියලුම කවි ගායනා අවසන් කළ වහාම සියල්ලෝ ම සිනා වී මැරෙන්නට තරම් ළං ව සිටියහ. ප්‍රේක්ෂකාගාරයත් වේදිකාව පිටුපසත් යනුවෙන් වෙනසක්

නොවීය. එනම් ආගන්තුක පාසලේ ඊට පෙර කිසිදා දැක නොතිබූ සිසුන් හා මගේ ම පාසලේ සිසුන් යනුවෙන් වෙනසක් නොවූ බවය. මීෂා බිම පෙරළෙමින් සිනා නගමින් සිටි අතර මගේ ගුරුතුමියත් සිනා වෙමින් සිටියාය. එදින සිදු වූ නොහොත් කෙරුණු අවමානය කිසිදා මට අමතක නොවනු ඇත.

එයින් පසු බොහෝ වසර ගණනාවක් ගෙවී ගිය තැන වැඩුණු මිනිසෙකු වූ මා හට මගදී හමු වන මැදි වයසේ ආගන්තුකයෙකු, "නුඹ රොබින් හුඩ්ටත් වඩා නිර්භීත වූයේ නම්!" යනුවෙන් පැවසුවේ නම් හෝ මා යන අතර මගදී විවිධ උසුළු විසුළු හඬ ඇසෙන්නට වූයේ නම්, එවිට පාසල් යන වයසේ කුඩා පිරිමි ළමයෙකු ව උන් අවධියේ, ආගන්තුක පාසලකට ගොස් ගැයූ තුති ගීය හොඳින් සිහිවේ. එලෙසින් ම මා පුෂ්කින් නොවන වගද හොඳින් මගේ සිහියේ තිබේ.

ඇළී ගැලුනෙමි පිං පොං බෝලේ



මා පාසල් යන වයසේ කුඩා දරුවකු ව සිටි කාලයේ අලුත් ක්‍රීඩාවක් ප්‍රචලිත වන්නට විය. එය නමින් 'පිං පොං' නම් විය. අද වන විට සෑම කුඩා දරුවකු ම පාහේ හඳුනන සාමාන්‍ය ක්‍රීඩාවක් වුවද, එකල එය හඳුන්වා දුන් සමයේ සියල්ලන් ම වියරුවෙන් මෙන් එහි නියැළෙන්නට විය. උදේ පටන් රෑ වනතුරු සෑම පාසලක ම සහ සෑම මිදුලක ම තිබුණු මේස මත, බංකු මත පමණක් නොව විශාල පියානෝ මතද එයින් නොනැවතී කිසිවක් ම නොමැති නම් පොළොව මතද පිං පොං සෙල්ලම මායාවක් මෙන් පැතිර යන්නට විය. මහා පොළොව මත ඇති සියලු දේ අමතක ව ගිය බොහෝ ළමුන්

හට මතක තිබුණු එකම දෙය පිං පොං පමණක් විය. මගේ පාසලේත් එක් දිනක් අත් නොහැර සැමදා පිං පොං තරඟ පැවැත් විණි. සෑම පංතියක ම ළමයින් 'පාසල් ශූරතාවලිය' නමින් තරඟ පවත්වන්නට වූ අතර අනතුරුව පංති අතර තරඟ පැවැත්විණි. අනතුරුව වෙනත් පාසල් සමඟත් තරඟ කර අවසානයේ දිස්ත්‍රික් ශූරයෙකු තෝරා පත් කරගත් අතර එයින් පසු දිස්ත්‍රික් ශූරයින් අතරත් අනතුරුව පළාත් ශූරයින් අතරත් වශයෙන් නොනැවතී තරඟ පැවැත්වෙන්නට විය.

මේ දේවල් දැකීමෙන් මම අතිශයින් පුදුමයට පත් ව සිටියෙමි. මට වටහාගත නොහැකි දෙය වූයේ පුංචි සුදුපාට බෝලයකට දෙපස සිට පුංචි පිත්තක් වැන්නකින් පහර දීමෙන් ලැබෙන්නට වූ අසීමිත සතුට කුමක්දැයි යන්නයි.

"ඇයි ඉතිං ඔයා සෙල්ලම් කරලා බලන්නේ නැත්තේ?" සමහර විටෙක මගේ යහළුවෙක් අසයි.

"ඒකේ කිසි සතුටක් නැහැ"

"පිස්සුද ඔයාට? ඒක හරිම සතුටුදායක සෙල්ලමක්"

"නැහැ එහෙම නැහැ!"

"හරි එක පාරක් කරලා බලන්නකෝ"

"මට ඕනෑ නැහැ"

මේ දෙබස මේ ආකාරයට ම බොහෝ සැරයක් සිදු වී තිබේ. මේ අතරවාරයේ එක්තරා පැහැබර දිනයකදී පිං පොං මේසයේ එක් පසෙක සෙල්ලම් කිරීමට මට අවස්ථාවක් උදාවිණි.

එය මගේ අවසානය විය!

එය එක්තරා පැහැබර දිනයක් යැයි මම කීවෙමි. නමුත් මගේ දෙමව්පියන් විසින් එය සලකන ලද්දේ ඔවුන්ගේ ජීවිත වල උදා වූ අඳුරු ම දිනයන්ගෙන් එකක් ලෙසිනි.

ඒ සියල්ලට ම හේතුව පිං පොං ක්‍රීඩාව මා අතිශයින් ප්‍රීති ප්‍රමෝදයට පත් කරන්නට සමත් වූ නිසාය. ආරම්භයේදී මට නියමාකරයෙන් බෝලයට පහර දීමට නොහැකි විය. පහර දීමට ඉගෙන ගත්තද මේසය මත පොළා පනින ආකාරයෙන් එය හසුරුවා ගත නොහැකි විය. කෙසේ හෝ අවසානයේ බෝලයට නියමාකාරයෙන් පහර දෙන්නත්, මේසය මතින් පොළා පැන අනෙක් පසට යන ආකාරයෙන් හසුරුවා ගන්නටත් හැකි වූ අවස්ථාවේ එය කෙතරම් සිත් ඇදගන්නාසුලු ක්‍රීඩාවක්දැයි මා හට වැටහෙන්නට විය. බෝලයට පහර දිය හැකි ක්‍රම ගණනාවක් ඇති බව නොබෝ වේලාවකින් ම සොයා ගත් අතර වේගයෙන් පහර දීමටත්, දඟ කවන්නටත්, දෙකොනින් එක් කොනක් එල්ල කර පහර දෙන්නටත් විගසින් උගතිමි. ඉතාමත් අපහසු ම කාරණය වූ මේසය මත සිය ප්‍රතිවාදී ක්‍රීඩකයාගේ ප්‍රදේශය මත බෝලය පොළා පැනීමට ලක් කිරීම ඉතාමත් දක්ෂ ක්‍රීඩකයෙකුට පමණක් කළ හැක්කක් වූ අතර මට එයා ඉතාමත් පහසු දෙයක් විය. මම පිං පොං ක්‍රීඩාවට ඉතාමත් දැඩි ලෙසින් බැඳෙන්නට වීමි. පොත් කියවීම නැවතීමි. පාසලේ ගෙදර වැඩ කිරීම නැවතීමි. පාසල් යෑමට හේතු වූ එකම කාරණයක් තිබිණි. එය නම් මගේ ප්‍රියතම ක්‍රීඩාවේ නියැලීමට ලැබෙන අසීමිත නිදහසයි. එන්න එන්නම මගේ ක්‍රීඩා කෞශල්‍යය වැඩි දියුණු වූ අතර පාසලේ වැඩ කටයුතු එම වේගයෙන් ම අඩාල වන්නට විය.

ගුරුතුමිය කිහිප විටක් ම මා පසෙකට කැඳවා අවවාද දුන්නාය. සෑම දෙයකට ම සීමාවක් ඇති බව ඇය මට පැහැදිලි කර දුන්නාය.

"හැම දෙයකට ම කලක් වේලාවක් තියෙනවා" යන කියමන ඇය නිරතුරු මට සිහි කළාය.

මම වාද කරන්නට නොගියෙමි. එයින් පලක් නැත. මගේ දිවියට පැවරී ඇති කාර්යය පිං පොං සෙල්ලම් කිරීම බව ඇයට පහදා දෙන්නේ කෙසේද? මා කෙතරම් පිං පොං ක්‍රීඩාවේ දක්ෂයෙකු වූයේද යත් මගේ මිතුරන් බොහෝ දෙනෙක් මා හමුවේ පරාජයට පත් වූහ. පාසලේ පිං පොං ක්‍රීඩාව අතින් තුන්වන තැන පසු වූ සිසුවා පරාද කළ දිනයේ ගුරුතුමිය මේසේ පැවසුවාය.

"මට ඔයාගේ දෙමව්පියන්ට කතා කරන්න ඕනෑ. දැන් මේ සිද්ධ වෙන දේවල් මේ ආකාරයෙන් ම ඉදිරියටත් වෙන්න ඉඩ දෙන්න බැහැ"

ඇය මගේ දෙමව්පියන් වෙත, ඔවුන් වෙත කිසිදා ළඟා නොවන ලිපියක් ලීවාය. නිවසේ තැපැල් පෙට්ටිය වෙත එය ලැබුණු වහාම එය ගෙන කියවා ඉරා විසි කරන්නට තරම් මා කපටියෙකු වී සිටි නිසා එයට ගමනාන්තය වූ දෙම්ව්පියන් වෙත ළඟා වීමට හැකියාවක් ලැබුණේ නැත. එය ඉතාමත් සියුම් කැබලි වලට ඉරා දැමූ ආකාරය සිහිවන විට මා පිළිබඳව ම අපුලක් මසිතේ පහළ වේ.

ගුරුතුමිය දින කිහිපයකින් නැවතත් ලිපියක් ලීවාය. එය පෙර ලිපියටත් වඩා මා හට හානිකර වූ භයංකර යමක් විය. ඉදින් පෙර ලිපියටත් වඩා කුඩා කැබලි වලට එය ඉරන්නට මට සිදුවිය.

ඇත්ත වශයෙන් ම ඔබට එලෙසින් පැවසීමට සිදුවීම මා බලවත් ලජ්ජාවකට පත් කළත් සැබෑවටම සිදු වූ දෙය සැඟවීමට මා හට නොහැකිය.

මගේ දෙමව්පියන්ගේ නොපැමිණීම ගුරුතුමිය බලවත් විමතියට පත්කරවන්නක් විය. ඇගේ තුන්වන ලිපියට සමගාමී ව මා පාසලේ පිං පොං ශූරයා බවට පත්විය. එයින් අනතුරුව පාසල් යෑමට මා හට

කාරණයක් නොමැති විය. එබැවින් පාසල් ගමන නවතා දැමුවෙමි. නමුත් සැමදා උදෑසන පාසල් යන බවක් හඟවා නිවසින් පිටවීමි. නමුත් ලියන පොත් හෝ පාඩම් පොත් මගේ බෑගය තුළ නොවීය. ඒ වෙනුවට තිබුණේ පිං පොං පිති දෙකක්, දැලක් හා බෝල තුනක් සමගින් දිවා ආහාරය පමණි. දවස පුරා පිං පොං ක්‍රීඩාවෙන් ම කාලය ගතවිය. මට පිං පොං ක්‍රීඩාව වෙනුවෙන් උමතුවට පත් ව සිටි මා වැනි ම මිතුරන් බොහෝ පිරිසක් හමුවිය. මොස්කව් නගරයේ පිං පොං ශූරයින් සියල්ලන් ම දුටු පමණින් හඳුනා ගැනීමට හැකියාවක් මා හට තිබුණි. සුප්‍රසිද්ධ ෆොල්කෙවිෂ් සහෝදරයින් විසින් මා සලකන ලද්දේ ඔවුන් හා සම මට්ටමේ ශූරයෙකු ලෙසිනි. මද කලකින් ම කණිෂ්ඨ පිං පොං කණ්ඩායමේ ක්‍රීඩකයෙකු වන්නට මට හැකිවිය. නමුත් ඒ වන විටත් සැබෑ තරඟය මා වෙතින් ගිලිහී තිබිණි.

මේ අවස්ථාව වන විට තම ලිපිවලට කිසිදා පිළිතුරු නොලැබීමත්, මගේ අතුරුදහන් වීමත් හේතු කොටගෙන ගුරුතුමිය මා බලන්නට නිවසට ගොස් තිබිණි. ඒ අවස්ථාවෙදීත් මා නිවසේ නොසිටි අතර අම්මාත් තාත්තාත් දෙදෙනා ම නිවසේ හිඳ තිබිණි. තමන්ගේ පුතණුවන් පාසලෙන් කට්ටි පැන පුංචි සුදු පාට බෝලයකට පහර දෙමින් දිනය පුරා නගරය පුරා කරක් ගසන බව සොයා ගත් මොහොතේ මගේ දෙමව්පියන් හට අකුණු සැරයක් වැදුණා හා සමාන වන්නට ඇත. මා උමතුවකට පත් ව ඇතැයි ඔවුන් විසින් තීරණය කරන ලදි. කිසිදා පිං පොං ක්‍රීඩාවෙහි නිරත නොවුණු ඔවුන් ඒ හා සම්බන්ධ ව මා සතුව තිබූ සියලුම ආම්පන්නට සඟවා මා දොස්තර මහතෙකු වෙත කැඳවා ගෙන යන ලදී.

ඒ සාමාන්‍ය දොස්තර කෙනෙකු නොවීය. සිය ජීවිත කාලය පුරා උමතු රෝගීන් වෙත වෙදකම් කරන ලද මහාචාර්යවරයෙකු විය. නමුත් ඔහු කිසිදා පිං පොං බෝලයක්වත් අතින් ඇල්ලූ කෙනෙකු නොවීය. පිං පොං නමින් හැඳින්වුණු ක්‍රීඩාවක නාමයෙන් මා පාසලෙන් කට්ටි පැන්නේ මන්දැයි ඔහුට වටහා ගැනීමට නොහැකි වූ අතර එතරම්

මුග්ධ වූ ප්‍රශ්න වැලක් මහාචාර්යතුමා විසින් අසන්නේ මන්දැයි මා හට වටහා ගත නොහැකි විය.

"ඉස්කෝලෙදි ළමයි ඔයාට ගහනවද?"

"ඔයාට හොඳට නින්ද යනවද?"

"උදේට උදේට ඔයාට හිසේ ඇම්ම හැදෙනවද?"

"කළුවරට ඔයා බයයිද?"

"ඔයාට කවදා හරි වලිප්පුව හැදිලා තියෙනවද?"

"කවදා හරි ඔයාට කලන්තේ හැදිලා තියෙනවද?"

ඒ හැම ප්‍රශ්නයකට ම වූයේ එකම එක පිළිතුරක් පමණි. "නැහැ"

එවර මහාචාර්යතුමා තව තවත් ප්‍රශ්න අසන්නට විය.

"ඔයා ඔයාගේ ඉස්කෝලෙට කැමතිද?"

"ඔයාගේ ගුරුතුමිය ප්‍රියමනාප කෙනෙක්ද?"

"ඔයාට ඉස්කෝලේ යාළුවෝ ඉන්නවද?"

"පිරිමි ළමයි?"

"ගැහැණු ළමයි?"

එවර ද සෑම ප්‍රශ්නයකට ම සපයන්නට තිබුණේ එකම එක පිළිතුරක් පමණි. "ඔව්"

"කවුරු හරි ගැහැණු ළමයෙක් ඉන්නවද අනිත් අයට වඩා ඔයාගේ සිත් ගත්ත?"

මහාචාර්යවරයා ඇසුවේය. එම ප්‍රශ්නය මා හට සැබවින් ම උමතුව කැඳවන්නක් විය.

"ඇයි ඔයා දිගින් දිගට ම මේ වගේ ප්‍රශ්න අහගෙන අහගෙන යන්නේ? මම ඉස්කෝලේ යන්නැතුව හිටියෙ එතකොට මට පිං පොං සෙල්ලන් කරන්න පුළුවන් නිසායි. ඔයාගේ මේ ප්‍රශ්න වැළෙන් ඒකට පිළිතුරු ලැබෙයි කියලා හිතන්න පුළුවන් කාටද?"

"හොඳයි," මහාචාර්යවරයා පැවසුවේය. "දැන් ඔබ මොනවද කරන්න කල්පනා කරන්නේ?"

"වෙන මොනවද ඉතිං, පිං පොං සෙල්ලම් කරන්න මිසක්," මම පැවසීමි.

"ඔයා දන්නවද මේ වැඩේ කෙළවර වෙන්නේ කොහෙන්ද කියලා? කවදා හරි හිතුවද අනාගතේ මොන වගේ වෙයිද කියලා?"

"ඇත්තෙන්ම," මම පිළිතුරු දුනිමි. "අපේ කණ්ඩායම අනිවාර්යයෙන් ම මොස්කව් තරඟාවලිය දිනනවා"

"මම මේ අහන්නේ බොහොම බැරෑරුම් ව" මහාචාර්යවරයා සැර වුණේය.

"ඉතිං මාත් එහෙමම තමයි මේ කියන්නේ" මම පැවසීමි.

එවර ඔහු දෙවුර සළා යම් බෙහෙත් දියරයකින් බිංදු කිහිපයක් වතුර වීදුරුවකට දමා මා වෙත පෑවේය. "මෙන්න, මේක බොන්න,"

"මට එපා, මට කිසි අසනීපයක් නැහැ"

"නමුත් මට අසනීපයි" යි පැවසූ මහාචාර්යවරයා වහ වහා වතුර වීදුරුව පානය කරන්නට විය. අනතුරුව ඔහු සිහින් හඬින් මෙසේ අසා සිටියේය. "මම ඔයාගේ අම්මාටයි තාත්තාටයි කතා කරලා අගෝස්තු නිවාඩු කාලය පුරා ඔයාට සෙල්ලම් කරන්න අවස්ථාව සලසලා දුන්නොත්, සැප්තැම්බර් මාසේ ඉඳන් ආපහු ඉස්කෝලේ යනවා කියලා ඔයා මට පොරොන්දු වෙනවද?"

"ඔව්. මම පොරොන්දු වෙන්නම්," වහා පිළිතුර සටහන් විය.

අනතුරුව මහාචාර්යවරයාගේ දීර්ඝ දේශනයකට සවන් දීමේ අගනා අවස්ථාව දෙමව්පියන් හට එළඹිණි.

"මේ දරුවා සම්පූර්ණ හොඳ සිහියෙන් ඉන්නේ.එයාට පිං පොං සෙල්ලම් කරන්න ඉඩ අරින්න. සමහරවිට පාසල් වාරයෙන් කොටසක් මග ඇරෙන්නත් පුළුවන්. ඒත් එයාට සෙල්ලම් කරන්න ඉඩ අරින්න."යි පැවසූ ඔහු නැවතත් බෙහෙත් මාත්‍රාවක් පානය කළේය.

ඉදින් මාත් අම්මාත් තාත්තාත් නැවතත් නිවසට පැමිණියෙමු.

අපේ කණ්ඩායමට තරඟාවලිය ජයග්‍රහණය අහිමි වූ නමුත් අනුශූරයින් වන්නට හැකි විය. එම වසරක කාලය අපතේ ගිය වගක් අදටත් මට සිතෙන්නේ නැත. ලොව තිබෙන වැදගත් ම දේ පිං පොං නොවන බව වටහා ගැනීමට එම කාල පරිච්ඡේදය මා හට උපකාරී විය. පාසල් වැඩ කටයුතු බොහෝ සෙයින් මා හට මග හැරුණත්

එළඹුණු සැප්තැම්බරයේ සිට නැවතත් පාසල් යන්නට පටන් ගත් බැවින් යළි නියමිත මාර්ගයට අනුගත වන්නට හැකිවිය.

එයින් අනතුරුව බොහෝ කාලයක් ගතවිය. මගේ පැරණි පිං පොං පිති දෙක තවදුරටත් කබඩය උඩ නිසොල්මනේ රැඳී තිබිණි. ඒ දුටු මා දෙමව්පියන් වෙව්ලන්නට වූ නමුදු මා ඒ දෙස නෙත් හෙළුවේ පැරණි හිතැති සගයෙකු දුටුවාක් මෙන් හදපිරි සතුටිනි. ඇත්ත වශයෙන්ම පිං පොං සෙල්ලම් කිරීම වෙනුවෙන් පාසලින් කට්ටි පැනීම මහා මුග්ධ ක්‍රියාවකි. මේ කතාව අසන හැම දෙන සිනා නගන්නේ ඒ නිසාය. ඔවුන් පමණක් නොව විටෙක මටද මා ගැනම සිනා නැගෙයි. ඒ කෙසේ වතුදු පිං පොං යනු අගනා ක්‍රීඩාවක් බව පුන පුනා පැවසීම අවැසි නොවේ. ඒ පිළිබඳ ව කීමට ඇති සියලු දේ මතුයම් දිනෙක ලිවීම මගේ අභිප්‍රායයි.

නමුත් මගේ දුවේ නුඹ පිං පොං ක්‍රීඩාව පිළිබඳ ව උනන්දුවකින් පසුවන බව දැන ගත් දිනයේ නම් මගේ සිතුවිලි යහපත් වුණේ නැත. මගේ සිත කණගාටුවෙන් පිරී යන්නට විය. නමුදු ඒ වෙනුවෙන් පාසල මග හැර නොගෙන, පාසල් ශූරතාවය දිනා ගැනීමට නුඹ සමත් වූ බව දුටු මොහොතේ මගේ සිත සුවපත් විය.

නමුදු, නුඹ නිසා මගේ දෙමව්පියන්ගේ හැඟීම වටහා ගැනීමට මට හැකිවිය. එබැවින් කබඩය මත තිබූ පැරණි පිති දෙක කබඩය තුළ මුල්ලකට දමන ලද නමුත් සමහර විටෙක ඒවා පිටතට ගෙන බලා, ස්පර්ශ කර මගේ පැරණි පිං පොං දිනයන් සිහි කර සතුටු වීම පුරුද්දක් බවට පත්විය.

පරහ හිටියයි බංකු කකුලේ



පාසල් යන වයසේ කුඩා දරුවකුව උන් සන්ධියේ වරක් මවිසින් කිසිදා අමතක නොවන වර්ගයේ ලී බංකුවක් සාදන ලදී. ඇත්ත වශයෙන් ම එවැනි ලී බංකුවක් මේ ලොව නොව මේ විශ්වයේ කොතැනකවත් නෙමැති විය යුතුය. ඉවාන් පෙත්‍රවිච්, අප වඩු ගුරුතුමා පවා එය එක පයින් එය අනුමත කළේය.

පාසලේ වඩු වැඩ වැඩමුළුවේදී ඔහු අපට කියතයි-මිටියයි, යතු කැටයයි-මැලියම් භාජනයයි මැනවින් භාවිතා කරන හැටි ඉගැන්නුවේය. වැරදි වැරදි නමුදු නිවැරදි දේ කරන හැටි ඔහු අප හට පැහැදිලි කර දුන්නේය. හරියට ම හරි දේ අප අතින් ඉටුවනතුරු ඔහු කාර්යය අත් නොහැරියේය.

ඔහු කුඩා ප්‍රමාණයේ වයස්ගත පුද්ගලයෙකු වූ අතර යකඩ රාමුවකින් සෑදූ උපැස් යුවලක් භාවිතා කළේය. ඔහුගේ ප්‍රියතම කියමන වූයේ, "යහපත් ආරම්භය ම කාර්යය අඩක් සපුරයි" යන්නයි. එයට විටෙක ඔහු මෙලෙසින්ද ඈඳුවේය. "කම්මැලියා වැඩට බියවේ"

අප පළමු පාඩම ආරම්භ වූ ආකාරය පවසන්න මට ඉඩ දෙන්න!.

"මේ මොකක්ද?" ඔහු ඇසුවේය.

"මිටියක්!" අප සැවොම එක හඬින් හඬ නැගීමු.

"හරි. එතකොට මේ මොකක්ද?"

"ඇණයක්!"

"ආපහු හරි. එතකොට මේක මොකක්ද?"

"ලෑල්ලක්!"

"අගෙයි!. දැන් කෙරෙන්න ඕනෑ දේ මේකයි. එක මිටි පහරින් මෙන්න මේ ඇණය ලෑල්ලට ගහන්න ඕනෑ. කෝ කවුරු හරි ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වෙනවද?"

"මම!..."

"මට පුළුවන් ඒක කරන්න!"

"කෝ මට දෙන්න!"

ඉදිරිපත් වන්නට නම් බොහෝ දෙනෙකු විය. නමුදු ශක්තිමත් ම ළමයාටවත් එක මිටි පහරින් අදාළ කාර්යය කරගත නොහැකි විය. අවසානයේ අප ගුරුතුමා මනා ලෙසින් එය කර පෙන්වීය. ඔහු අප තරම් තදින් පහර නුදුන් අතර ඇණය ලෑල්ල තුළට ඉතාමත් හොඳින් ගිලා බැස්ස අතර එහි හිස පමණක් පෙනෙන පරිද්දෙන් නතර විය. සැවොම ඉහළට ගත් හුස්ම එලෙසම රඳවා එදෙස බලා සිටියෝය.

"තියුණු ඇහැක් වගේම ස්ථිර විදිහට වැඩ කරන අතක් තියෙන්න ඕනෑ," ඉවාන් පෙට්‍රොවිච්, අප ගුරුතුමා පැවසුවේය. "ඒක පැහැදිලිද? ඔයාලා හිතන්නේ මං හැම තිස්සේ ම හරියටම ඇණයට එල්ලය ගත්තා කියලද? නැහැ, කොහෙත්ම නැහැ. මමත් ඕනෑ තරම් ඇඟිල්ල තළා ගෙන තියෙනවා, ඒ විතරක් නොවෙයි. මට මගේ ගුරුතුමාගෙන් ගුටි කන්නත් සිදු වුණා. ඒ බොහොම කාලෙකට කලින්. එහෙම තමයි මගේ ගුරුතුමා එයා හරියට ම ඇණයට ගහන හැටියි මං වරද්ද ගන්න හැටියි පෙන්නලා දුන්නේ. අන්න එහෙම තමයි අපි ඉගෙන ගත්තේ"

කුඩා පිරිමි ළමයෙකු ව උන් ගුරුතුමා ගැන අප සියල්ලන් ම දුක් වන අතරේ ඔහු සිනා නගා මෙසේ පැවසුවේය.

"හා හා දුක් වෙන්න එපා. මං කාටවත් ගහන්නේ නැහැ. ඔයාලා හැමෝම මෙතැන ලොක්කෝ. මේ හැම ආයුධයක් ම ඔයාලාටමයි. අපි පුංචි බංකුවක් හදමින් වැඩේට බහිමු."

පුංචි බංකුවක්! මොන තරම් ලේසි පහසු වැඩක් වෙන්න පුළුවන්ද? නමුත් ඔයාලා ම එකක් හදන්න උත්සාහ කරලා බලන්න. හරියට ම මිනුම් වලට හදන්න උත්සාහ කරන්න. අහෝ! වැඩය අවසන් කරන්න කෙතරම් කියත් පහර ප්‍රමාණයක්, යතු පහර ප්‍රමාණයක් සහ මැලියම් ප්‍රමාණයක් ඕනෑ වනවාද! ඒ වගේ ම කරපු වැඩේ සම්පූර්ණයෙන් පැත්තකට දමා නැවත මුල සිට කරන්න සිදුවන වාර ගණන කොපමණද! අහෝ! කෙතරම් කාර්යය ප්‍රමාණයක්, ශක්තියක්, කෞශල්‍යයක් සහ ඉවසීමක් අවශ්‍ය වනවාද!

මුලින් ම සිය බංකුව සාදා අවසන් වූයේ මීෂාය. "ඉඳ ගන්න," ඔහු මහත් වූ අභිමානයකින් යුතුව පවසා සිටියේය.

"හ්ම්... ඔයා ම ඉඳ ගන්න බලන්න," අප ගුරුතුමා පවසා සිටියේය. ආඩම්බර බැල්මක් සහිතව මීෂා සිය බංකුවේ හිඳ ගත්තේය.

බංකුව මැදින් පැලී දෙකඩ වී ගියේය. මීෂා පොළොව මතට පහත් විය. සැම දෙන සිනා නගන්නට වූහ.

"ඒක බොහොම ක්ෂණික ව සම්පූර්ණ කරපු වැඩක්. නමුත් නරක අවසානයක්," ගුරුතුමා පැවසුවේය. "දැන් නැවත මුල සිට අරඹන්න, හැබැයි බොරු කලබලයක් ඇති කරගෙන කටයුතු කරන්න එපා. එහෙම වුණොත් ආයෙත් සේරමට ම ඔයාට හිනා වෙන්න පුළුවන් වෙයි"

කිසිම කෙනෙකුට එක වරින් බංකුවක් සාදා ගත නොහැකි විය. නැවත නැවතත් මුල සිට අරඹන්න සැමට සිදුවිය.

"දුක්වන්න එපා," ගුරුතුමා පැවසුවේය. "මොස්කව් නගරය එක් දිනකින් ගොඩනැගුවක් නොවේ. ඔයාලා ඇත්තට ම හිතාගෙන හිටියේ මිටියත් කියතත් පාවිච්චි කරන එක හරිම ලේසි දෙයක් කියලා නේද? ඔව් ඇත්තට ම ගත්තොත් ලේසියි තමයි. නමුත් ඒ සඳහා ඔයාලාට ගොඩක් මහන්සි වන්න වෙනවා. ගොඩක් දහදිය හෙළන්න වෙනවා. විශිෂ්ට දෙයක් කරන්න නම් අපි හිතනවාට වඩා කැප වන්න සිදු වෙනවා"

පිරිමි ළමුන් සියල්ලෝ ම තමන්ට කළ හැකි වූ උපරිම දෙය කළෝය. වැඩහල සාමාන්‍ය පංති කාමරයක් සේ දිස් විය. සෑම කෙනෙකුට ම අවශ්‍ය වූයේ ගැටළුව විසඳූ පළමු වැන්නා වන්නටය. එය ඇත්තෙන් ම විනෝදජනක කාර්යයක් විය. නමුත් ඔබට ගැටළුවක් මත හිඳ ගත නොහැකිය. ඔබ එය විසඳූ වහාම එය අගනා බංකුවක් වනු ඇත. එනම් ඔබ ගැටළුව නිවැරදි ව විසඳුවේ නම් ඔබට ඔබේ ම අගනා බංකුවක් මත අසුන් ගත හැකිවනු ඇත. එලෙස ම ඔබගේ අගනා ලෙසින් විසඳන ලද ගැටළුව මත ලොව ඕනෑ ම කෙනෙකුට අසුන් ගත හැකිවනු ඇත!

මුලින් ම ඉතාමත් නිවැරදි ලෙසින් බංකුව සාදන ලද්දේ වාර්යා නම් වූ ගැහැණු ළමයාය. සත්‍යය නම් ඇගේ පියා වඩුවෙකු වූ අතර

යතු කැටයත් කියතත් භාවිතා කරන හැටි ඔහු ඇයට යම් පමණකට උගන්වා තිබීමය.

"එය අතිවිශිෂ්ට නිර්මාණයක්! ඔයා මේ පිරිමි ළමයින් හැමෝ ම ලැජ්ජාවට පත් කළා," සතුටට පත් වූ ගුරුතුමා පැවසුවේය.

පිරිමි ළමෝ අපහසුවට පත්ව ඇඹරෙන්නට වූහ.

යන්තමකට හෝ අපට පහසුවක් දැනෙන්නට වූයේ මීෂා ඔහුගේ බංකුව සාදා නිම වූ අවස්ථාවේදීය.

එය අතින් අත යවමින් අප සැවොම ඒ මේ අත හරවමින් බලන්නට වූ අතර "අවම වශයෙන් එය බංකුවක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්" ගුරුතුමා පැවසුවේය.

අවසානයේ මගේ බංකුව සදා නිම විය. ඒ වන විට මගේ දෑතම සීරී, තුවාල වී, රතු වී තිබුණු අතර මැලියම් මුහුණ පුරාත් ඇඳුම පුරාත් තැවරී තිබුණු නමුත් ඒ කිසිවක් මට ගැටළුවක් නොවීය. ජීවිතේ පළමු වතාවට සාදන ලද බංකුව අවසානයේ මා ඉදිරියේ විරාජමානව තිබිණ. ඒ වගේ සතුටක් මගේ උපන්දිනය දවසේදීවත් මට දැනී තිබුණේ නැත.

ගුරුතුමාද එය වටහා ගත්තාක් මෙන් මෙසේ පැවසුවේය.

"යන්න. ගිහින් ඉඳ ගන්න." මායාකාරී වදනක් පැවසුනාක් මෙන් මම ද පාව ගොස් ඒ මත හිඳ ගතිමි. බංකුව සෙලවුණේවත් නැත. එක් වනම ගුරුතුමා හොඳින් ළංව එය නිරීක්ෂණය කරන්නට වූයේය.

"ඔයාගේ කකුල් ගැනලා බලන්න ළමයා," අනතුරුව ඔහු පැවසුවේය.

මම අතිශයින් පුදුමයට පත් වීමි. එබැවින් දෙකට නැමීගෙන මගේ කකුල් ගණින්නට වීමි. හැමවිට ම තිබුණාක් මෙන් එතැන කකුල්

දෙකක් තිබිණි. නමුත් ඒ වනවිටත් පංතියේ ළමුන්ගේ කැකිරි පැළීම ආරම්භ වී තිබිණි. ගුරුතුමා පවා සිටියේ කොක් හඬලා සිනාසෙමිනි.

අද වනවිටත් මට වටහා ගැනීමට අමාරු කාරණය නම් එදා මා කකුල් පහක බංකුවක් සාදා නිම කිරීමට සමත් වූයේ කෙසේද යන්නයි. නමුත් එතැන ඇත්තට ම කකුල් පහක බංකුවක් තිබිණ. අදටත් එය මහ ගෙදර තිබෙන අතර අදටත් එහි කකුල් පහක් තිබේ. හතරක් නොවේ පහක්!. එදා ගුරුතුමා පැවසූ වදන් අදටත් මට ඇසෙනවා සේ දැනේ. "කකුල් පහක් කියන්නේ කකුල් තුනක් කියන එකට වඩා හොඳ දෙයක් නොවෙයි. ආපහු පටන් ගන්න මුල ඉඳන්." ඒ වගේ ම එදා ගුරුතුමා විසින් පවසන්නට යෙදුණු වදන් මා මොන රැකියාව කළද, සදා මතකයේ තබා ගත යුත්තක් සේ මට සිතේ.

මා නොදැන පළමුවැනියා වූ වසරේ



මා පාසල් යන වයසේ කුඩා දරුවකුව උන් සන්ධියේ කිසිදා පංතියේ පළමු වැනියා වී නැත. එයට හේතුව නම් පළමු වසරේ පළමු වාරයේ බොහෝ දින ගණනක් අසනීප තත්ත්වය හේතුවෙන් පාසල් යාමට නොහැකි වීමත්, ඒ නිසා අනෙක් ළමුන් පස දිව යමින් මෙන් ඔවුන් උගත් දේ ඉගෙන ගැනීමට සිදුවීමත්, එසේ අත පසු වූ දේ ඉගෙන ගෙන අවසන් වනවාත් සමග ම නැවතත් අසනීප වීමත් නිසාය. වරෙක මා සරම්ප රෝගය ගොදුරු වීමෙන් තව තවත් පාසල් වැඩ අතපසු විය. ඒ හේතුවෙන් මුළු ගිම්හාන නිවාඩු

කාලය ම අතපසු වූ පාඩම්වල ගිලෙමින් ගත කරන්නට මට සිදුවිය. දෙවන වාරය ආරම්භ වනවාත් සමග ම මා සොයා ආවේ කක්කල් කැස්සය. අනතුරුව ගලපටලය මා සොයා ආවේය. ඒ අතරේ අටෝරාසියක් වූ තවත් ලෙඩ රෝග නිරන්තරයෙන් මා සොයා එන්නට විය. ඒ මදිවාට අප පවුල මේ කාලය තුළ එක්වනම මොස්කව් නගරයට සංක්‍රමණය වූ අතර තුන්වැනි පංතිය ආරම්භ වූයේ එහිදීය.

පුදුමයකට මෙන් තුන්වන පංතියේදී මා බිම හෙළන්නට කිසිදු දෙයකට නොහැකි වූ අතර ඒ වෙනුවට කවි ලිවීම අරම්භ කළෙමි. සාමාන්‍යයෙන් මගේ කවි එතරම් හොඳ ඒවා නොවූ නමුත් පාසලේ වෙන කිසිවෙකු කිසිදු ආකාරයක කවියක් නොලියූ අතර අඩුම වශයෙන් මගේ කවි මෙන් එතරම් හොඳ නොවූ කවියක්වත් නොලියන ලදී. වදන් සියල්ල පටළවා මහා හඬින් පාඩම කියැවූවද ගුරුතුමිය මා අගේ කළාය. භයංකාර අත් අකුරු වලින් පිරී ගියද මගේ රචනා ඇය අගේ කළාය. මගේ අංක ගණිතය පොතෙහි දෙපස තීරු ගුරුතුමියගේ සටහන් වලින් පිරී තිබිණ. "පිළිවෙලකට ලියා නැත!" "පැහැදිලි ව ලියන්නට උත්සාහ කරන්න!" "කුමන ආකාරයේ පටලැවිල්ලක්ද!" එසේ නමුදු කෙසේ හෝ සියලුම ගැටළු නිවැරදි ව විසඳාගැනීමට මට හැකි වී තිබිණ. එවිට ගුරුතුමියගේ අගය කිරීම් වලට වඩා දොස් කීම් ඇසීමට මට සිදුවිය.

වාර අවසානයේ ගුරු දෙගුරු රැස්වීමක් පැවැත්විණි. එය අවසානයේ මගේ දෙමව්පියන් වෙත පැමිණි ගුරුතුමිය, "කරුණාකර ඔය දෙන්නා තව ටිකක් වෙලා රැඳෙනවද? මට පොඩ්ඩක් කතා කරන්න අවශ්‍යයි."යි පැවසුවාය.

අනෙකුත් දෙමව්පියන් පිටව ගිය පසු ගුරුතුමිය මගේ දෙමව්පියන් වෙත එළඹුණාය. "ඔයාලාගේ පුතා මගේ හොඳම සිසුවා. නමුත් එයාගේ පොඩි පොඩි වැරදි ගොඩක් තිබෙනවා. අත් අකුරු ඉතාමත් දුර්වල මට්ටමක තියෙන්නේ. ගෙදර වැඩ පොත දිහා බලන්න බැහැ. මහා අවුල් ජාලාවක් වගේ. ඒ වගේ ම කියන්න ඕනෑ එයාගේ

වගේ අවුල් වලින් පිරුණු, අපිළිවෙල සටහන් පොතක් මගේ ජීවිතයේ කවදාවත් මං දැකලා නැති බව. කරුණාකර එයාට කියන්න එපා එයා මගේ හොඳම සිසුවා කියලා මං කිව්ව වග. ඒක දැන ගත්තොත් ආත්ම විශ්වාසය වැඩි වෙලා මේ කිව්ව වැරදි එකක්වත් හදා ගන්නේ ම නැතුව යයි. මං හිතනවා මේ හැමදේම එයාගේ හොඳට කිව්ව වග ඔයාලා වටහා ගත්තා කියලා."

මගේ දෙමව්පියන් එකඟ වී තිබිණි. ඔවුන් ගෙදර ආ වේලාවේ පටන් ගුරුතුමිය හා ගිවිසුමකට එළඹුණාක් මෙන් නොනවත්වාම අත් අකුරු ගැනත් සටහන් පොතේ පිළිවෙල පවත්වාගෙන යන ආකාරය ගැනත් දේශන අසන්නට මට සිදුවිය. නමුත් මේ හැමදේම එක් දිනක් නෑර සැමදා මා හට ගුරුතුමියගෙන් ද අසන්නට සිදු වී තිබුණු බව ඔවුන් නොදැන සිටින්නට ඇත. ඉදින් මේ හැම වදනක් ම කටපාඩමින් කියන්නට පවා හැකියාවක් මා සතුව තිබිණ. එයත් ඔවුන් නොදැන සිටියාට නොඅනුමානය.

"එයා මෙච්චාට අමතර ව මොනවද මං ගැන කිව්වේ?" මට දැන ගැනීමට අවශ්‍ය වූයේ එයයි.

"ඇය කිව්වා ඔයා හතරේ පංතියට සමත් කළ වග," අම්මා පැවසුවාය. "ඉතිං අපට ඒ ගැන සතුටුයි. ඒ වගේ ම අපි බලාපොරොත්තු වෙනවා ලබන වසරේදී ඔයා මීට වඩා මහන්සි වෙලා වැඩ කරයි කියලා."

පසු කාලෙක දැන ගන්නාතුරු මා ඇගේ හොඳ ම සිසුවා වී සිටි බවක් එකල මට සිහිනෙන්වත් සිතිය හැකි දෙයක් නොවීය. හොඳ ම සිසුවාගේ සටහන් පොත් සේ ම පාඩම් පොත් යන සියල්ල ම ඉතාමත් පිරිසිදුව පිළිවෙලට තිබිය යුතු නොවේද? අත් අකුරු සඳහා විශිෂ්ට සාමාර්ථයක් ලබා තිබිය යුතු නොවේද? පංතියේ අනෙකුත් ළමයින්ට ප්‍රථම, ගුරුතුමිය විසින් අසන ඕනෑ ම ප්‍රශ්නයකට පිළිතුරු දීමේ හැකියාව තිබිය යුතු නොවේද? හොඳ ම සිසුවාගේ සටහන් පොතෙහි

මුළු වසරට ම එක ම එක බොඳ වූ තීන්ත බිංදුවකට එහා වැරැද්දක් තිබිය නොහැකිය. එම බිංදුවත් එතැන තිබිය හැකි වන්නේ වෙනත් කෙනෙකුගේ අතක් වැදීමෙන් ඇඳුනක් ලෙසින් මිස හොඳ ම සිසුවාගේ වරදකින් නොවේ. හොඳ ම සිසුවා සැබවින් ම හොඳ ම යන්න හොඳින් ම අර්ථ ගන්වන්නෙක් විය යුතු නොවේද? ඔහු යම් ගැටළුවකට පිළිතුරු නොදැන සිටියේ නම් මේ මිහිපිට ඔහු හා සම වයසේ කිසිවෙකු එයට පිළිතුර නොදැන සිටිය යුතුය. මේ ආදී කරුණු සළකා බැලීමේදි මා කිසි දිනෙක හොඳ ම සිසුවා විය නොහැකිය.

තුන්වන වසර අවසන් වී නිවාඩු කාලයෙන් පසුව හතර වන වසර ආරම්භ විය. අලුත් මුහුණු කිහිපයක් ම පංතිය තුළ මතු වී තිබිණ. ඒ අතර 'අලෙක්' නමින් ළමයෙකු විය. ශක්තිමත්, ඉතාමත් විනෝදකාමී ළමයෙකු වූ ඔහුට ඝණ, දුඹුරු පැහැති කොණ්ඩයක් හිමි ව තිබිණ. එය ඇස් වසාගෙන නළල පුරා විසිරී යන නිසා ඔහු නිරතුරු හිස ගස්සමින් කොණ්ඩය නළල මතින් හිස මතට යවමින් උන්නේය. විවේක කාලය පුරා අනෙකුත් පිරිමි ළමයින් හා එකතුව පාසල පුරා දිවීමේ තරඟ පැවැත්වීමට අලෙක් විශාල කැමැත්තක් දැක්විය. විටෙක මැරයෙකු සේ හැසිරුණු ඔහු ගුටි බැට හුවමාරුවකට පවා යොමු වූ අවස්ථා දුලබ නොවීය. නමුත් පංතියේදී ඔහු තරම් හොඳ සිසුවකු නොවීය. සත්‍යය වශයෙන් ම ඔහු හොඳ ම සිසුවා බවට පත් ව සිටියේය. අංක ගණිතයේදී ඔහු හා සම වූ කිසිවෙකු නොවීය. ගුරුතුමිය ප්‍රශ්නයක් ඇසූ වහාම එම මොහොතේ ම එසවෙන පළමු අතේ හිමිකරුවා සැම විට ම අලෙක් විය. එලෙස ම පාඩම කියවීමේදී ද ඔහු එය ඉතා හොඳින් කළේය. අත් අකුරු මුතු කැටවල හැඩය පැරදවීය. ඔහුගේ සටහන් පොත් වල පවිත්‍රතාව සහ පැහැදිලි බව පිළිබඳ ව විස්තර කරන්නට තරම් මා සතුව වදන් නොවී යැයි සිතේ. මේ සැම දේට ම අමතරව ඔහු ඉතාමත් හොඳ මිතුරෙකු විය. ඉදින් පංතියේ හොඳ ම සිසුවා අලෙක් බව ඉතාමත් පහසුවෙන් ඕනෑ ම කෙනෙකුට පෙනුණු අතර ගුරුතුමිය ඒ බව ඊළඟට පැවැති ගුරු දෙගුරු රැස්වීමේ දී පවසා සිටියාය. ඒ අසා මගේ දෙමව්පියන්

වියවුලට පත් වී තිබුණු අතර නිවසට පැමිණෙන විට ඔවුන්ගේ මුහුණු දුකින් බරව තිබිණ.

"ගිය අවුරුද්දේ හොඳ ම සිසුවා වෙච්ච් ඔයා මේ පාර එහෙම නොවුණේ කොහොමද?" දොර විවර කළ මොහොතේ ම මගේ පියා අසා සිටියේ නිවසට ගොඩ වන්නටත් පෙරය.

අන්න ඒ මොහොතේ තමයි මගේ දුවේ මා දැන ගත්තේ පසුගිය වසරේ හොඳ ම සිසුවා වූයේ වෙනත් කිසිවෙකු නොවන වග!. ඒ ඇසූ මොහොතේ මුලින් මා හට එය විශ්වාස කළ නොහැකි සේ දැනිණ. නමුත් මොහොතකින් මසිත කෝපයක් ඉපැදිණ. එයට හේතුව එම කාරණය මගේ සිත තදින් රිදවන්නට සමත් වීමයි.

"ඇයි තාත්තේ ඔයා මේ කතාව මට ගිය අවුරුද්දේ දී නොකීවේ?"

"ඔයා හිස උදුම්මා ගනියි කියලා," මා පියා පැවසුවේය.

"ඔයා හිස උදුම්මාගෙන පණ්ඩිතයෙක් වගේ හැසිරෙන්න පටන් ගනියි කියලා, ඊක ඔයාට කියන්න එපා කියලා ඔයාගේ ගුරුතුමිය තමයි අපට කිව්වේ."

"මං දැනන් හිටියා නම් මම තමයි හොඳ ම සිසුවා කියලා," මම පැවසීමි. "මං මීට වඩා ගොඩක් මහන්සි වෙලා කටයුතු කරන්න ඉඩ තිබුණා. මං දන්නවා මොනවා වුණත් අලෙක් තමයි හොඳම සිසුවා කියලා. නමුත් මට තිබුණා එයා පළමුවැනියා වෙද්දි දෙවැනියා වෙන්නවත් මහන්සි වෙලා වැඩ කරන්න. එහෙමත් නැත්නම් තුන්වැනියා වෙන්නවත්. එහෙමත් නැත්නම් අඩුම ගණනේ හොඳ සිසුන් කියන ගොඩට එකතු වෙන්නවත් මහන්සි වෙන්න තිබුනා. නමුත් ඔයාලා මේක මට හැංගුවා, මාව රැවටුවා. දැන් ඉතිං මට කවදාවත් මගේ පංතියේ හොඳ ම සිසුවා වෙන්න බැරි වෙනවා ස්ථිරයි! දෙවැනියාවත්,

තුන්වැනියාවත් වෙන්න බැරි වෙයි. මං මේ ඔයාලාව රවටනවා නෙමෙයි. ඒක තමයි නරක ම ඇත්ත."

මම සත්‍යය ම පවසමින් සිටියෙමි. මම විශ්ව විද්‍යාලය දක්වාම ඉගෙනීම් කටයුතු කළත් එයින් පසු කිසිදා පංතියේ පළමු වැනියා වන්නට සමත් නොවීමි. දෙවැනියාවත්, තුන්වැනියාවත් වන්නට සමත් නොවීමි. එනිසා කිසිවෙකුට මා පෙර පරිදි රැවටීමේ අවස්ථාවක් උදා නොවීය. නමුත් මා නිරතුරු කැඩපතින් දුටු ඡායාවට මෙසේ පවසන ලදී. 'මහන්සි වෙලා වැඩ කළොත් පමණයි, ඉන්න තැනින් ඉහළට එක් අඩියක් හරි තියන්න පුළුවන් වන්නේ'

මට දැන් හිතෙන හැටියට මගේ ගුරුතුමිය එදා කටයුතු කළේ කළ යුතු සුදුසුම ආකාරයටයි. නමුත් මේ සම්පූර්ණ සිද්ධිය පිළිබඳ ව ම නොපැහැදීමක් මගේ සිතේ තවමත් පවතී.

යකඩ ගොඩක් හමු වූ දවසේ

පාසල් සිසුවකු ව උන් කාලයේ මාත් මගේ මිතුරනුත් පරණ පත්තර, කඩදාසි වගේම ඉවත දමන පරණ යකඩ ආදියත් එකතු කරන්නට වූයේ පාසලෙන් ඇරඹූ පරණ යකඩ එකතු කිරීමේ ව්‍යාපාරය වෙනුවෙනි. පරණ පත්තරත්, පරණ යකඩත්, අලුත් සටහන් පොත් සේම සිත් ඇදගන්නාසුලු වෙනත් පොත් බවටත් පත් කරගත හැකි වග අපි දැන සිටියෙමු. ඇත්ත වශයෙන් ම තමන්ට අලුත් පොතක් මිල දී ගැනීම වෙනුවෙන් තමන්ට ම දායක වන්නට ලැබුණා නේද කියා සිතීමත් හිතට සතුටක් ගෙන එන දෙයක් විය. ඇත්තට ම ඒ පොතක් සඳහා නොව පොතකින් භාගයක් සඳහා වූවා කියා හිතේ සතුට අඩු වන්නේ නැත. එය එතරම් සිත් ඇදගන්නාසුලු

පොතක් නොවූවා කියාද වෙනසක් ඇති වුයේ නැත. අලුත් පොත, මං වැඩිය කැමැත්තක් නොදැක් වූ අංක ගණිතයට යොදා ගන්නා ආකාරයේ ප්‍රස්ථාර පිටු වලින් සමන්විත වූවක් වුවද, මව්සින් දක්වන ලද දායකත්වය විසින් ගෙන එන ලද සතුට අව ප්‍රමාණ කිරීමට සමත් නොවීය.

එබැවින් අපි පරණ යකඩ සොයමින් ගම, නගරය පීරන්නට වූයෙමු.

සැබවින් ම පරණ කළයක් හෝ සිදුරු වුණු කේතලයක් දුම්රිය එන්ජිමක හෝ සැබෑ ට්‍රැක්ටරයක හෝ විශේෂයෙන් ම යම් දිනෙක අහසේ පියාසර කරන අහස් යාත්‍රාවක කොටසක් වේ යැයි සිතා ගැනීමටවත් නොහැකි කාරණයක් විය.

කෙසේ නමුදු නව අහස් යානයක් සෑදීම සඳහා ලබා දිය හැකි උපරිම දායකත්වය අපි ලබා දුනිමු. සෑම දිනකම පාසල් කාලයෙන් පසුව අවට නිවෙස් පීරමින් පරණ යකඩ සොයන්නට වීමු. නිවෙස්වල සීනු නාද කරමින් එකද නිවසක්වත්, එකද තට්ටු නිවාසයක්වත් මග නොහැර අපි අපේ කටයුත්තේ නිරත වීමු. සැබවින් ම එය විනෝද ජනක චාරිකාවක් බවට පත් වී තිබිණ. රංචුවක් වශයෙන් ඉබාගාතේ තැන තැන ඇවිදින්නට ලැබීම, විවිධාකාර මිනිසුන් දකින්නට ලැබීම පමණක් නොව කිසිදා දැක නොමැති ආකාරයේ ආගන්තුක ද්‍රව්‍යය පරණ යකඩ වශයෙන් ලැබීම යනාදී කාරණා අපට සතුටක් ගෙන එන ලදී. කෙනෙකු අපට පිත්තලවලින් සාදන ලද පැරණි ඉටිපන්දම් රඳවනයක් ලබා දෙද්දී, තව කෙනෙකු කැඩුනු යකඩ සෙල්ලම් බඩුවක් ලබා දෙන ලදී. තවත් අය යකඩ දොර බෝල, වයර් කැබලි, කුරුළු කූඩු, යකඩ පෙට්ටි සහ තැටි ලබා දෙන්නට තරම් කාරුණික විය.

ඔය අතරතුරේ දිනක් සිදු වූ දෙය මෙයයි.

මගේ පුංචි සහෝදරයා වික්, නිරන්තරයෙන් මා හා එල්ලී එන්නට පුරුදු ව සිටියේය. අනෙක් ළමුන්ට වඩා බොහෝ සෙයින් කුඩා වූ ඔහුට

අප හා හරි හරියට ඒමට නොහැකි වූ බැවින් අප පසුපස දුවමින් මෙන් එන්නට සිදුවිය. දිනක් මෙලෙස කටයුතු සිදු වෙද්දී, අපි තට්ටු නිවාස පෙළක සිට පහත මාලයට බසිමින් සිටියෙමු. අපට බොහෝ පසු පසින් මල්ලි එමින් සිටියේය. මේ අතර මැදි වයසේ කාන්තාවක විසින් සිය නිවසේ දොර විවර කර මල්ලි අමතා තිබුණි.

"පුංචි කොලුවෝ! ඔයා පරණ යකඩ එකතු කරනවද?"

"පරණ යකඩ, තඹ, වානේ, ලෝකඩ ඔය ඕනෑ එකක් එකතු කරනවා," ඔහු පවසා තිබිණ.

"ආ... එහෙමද? එහෙනං අර ළමයින්ට උඩට එන්න කියන්න. මං දෙන්නයි යන්නේ ලොකු දෙයක් ඔයාලාට. ඒක අලුත් දෙයක්, නමුත් කාරියක් නැහැ."

අපි ඇය පසු පස ඇගේ නිවසට ඇතුළු වීමු. ඇය පෙන්වූ අතිවිශාල නවතම යකඩ ඇඳ දුටු අප පුදුමයට වඩා බියට පත් වූවා යැයි කීවොත් නිවැරදි යැයි සිතමි.

"මෙන්න. මේක සම්පූර්ණයෙන් හොඳ ම ලෝහ වලින් හදලා තියෙන්නේ. අරං යන්න!"

පිරිස එකිනෙකා දෙස බලන්නට වූ අතර මම මෙලෙසින් පවසා සිටියෙමි.

"අපි එකතු කරන්නේ පරණ යකඩ. මේක මේ අලුත් ම අතිවිශාල ඇඳක්නේ."

"ඒකේ ඇති කාරියක් නැහැ ළමයිනේ, ඔයාලාට පුළුවන් ඒක එළියට ගෙනිහින් ඇණ ගලවලා කෑබලි වලට පත් කරගන්න"

නැවතත් එකිනෙකා දෙස බලන්නට වූ අප පිරිස අනතුරුව ඇඳ තල්ලු කරගෙන දොරින් එළියට ගෙන එන ලදී. අට දෙනෙකු සිටියත් එය පහළට ගෙන එන්නට අපට අපමණ දුකක් විඳින්නට විය.

"මං ඔට්ටු අල්ලනවා මුළු දිස්ත්‍රික්කයෙන් ම පරණ යකඩ එකතු කිරීම අතින් අපි පළමු තැනට පත් වෙනවා," වලෝද්යා පැවසුවේය. " හිතා ගන්න පුළුවන්ද මේක කොච්චර බරයිද කියලා?"

අවසානයේ එය මිදුලට ගෙන ආ පසු සැමදෙන සැනසුම් සුසුම් හෙළන්නට විය.

"මං ඔට්ටු අල්ලනවා මේ වගේ ඇඳක් ඒ වගේ තැනක ඉඳන් මේ වගේ තැනකට ගේම අතින් අපි මුළු නගරයෙන් ම පළමු තැනට පත් වෙනවා," ශූරා පැවසුවේය. "නමුත් දැන් කොහොමද අපි මේක ඉස්කෝල මිදුලට අරගෙන යන්නේ?"

ඇඳ අයිති ව තිබූ කාන්තාව අප පසු පැමිණ තිබූ අතර ඇඳ ඉදිරි දොරෙන් එලියට ගත් විගසම ලොකු සිනාවකින් මුව සරසා ගත් ඈ, සාමාන්‍යයෙන් හැමවිට ම අප අවසාන සගයා වන මගේ මල්ලි හට මෙසේ පවසා තිබිණ.

"ඔයාලාට ගොඩාක් ස්තුතියි, මේක මගේ දුවගේ මහත්තයා, මගේ බෑණාගේ ඇඳ. මට හිතෙන්නේ දැන් ඉතිං උන්දෑ මැරෙයි!"

ඒ වදන් මල්ලිට වැටහී නොතිබුණා පමණක් නොව ඒ පිළිබඳ ව වදනක් හෝ අප හට පැවසුවේ ද නැත. කෙසේ හෝ අවසානයේ හතින් මුනින් දාගෙන, පාසලේ පරණ යකඩ අංගනය වෙත අප නව ලැබීම ගෙන යෑමට අපි සමත් වීමු.

පසුදා උදෑසනින් ම ගෝනියක් රැගෙන ආ මිනිසෙක් පාසල ඉදිරිපිට සිට කෑ මොර දෙන්නට විය. "මගේ ඇඳ ආපහු දෙන්නයි කිව්වේ! මගේ නැන්දම්මා ඒක ඔයාලාට පරිත්‍යාග කරලා, ඉතිං දැන් මං මොකේද නිදියන්නේ? බිමද? අනෙක් අතට මගේ දෙවියනේ, ඒක අලුත් ම අලුත් ඇඳක්!"

සැවොම සිනාසෙන්නට වූහ. ඉහළ මහලේ සිට පහළටත්, මහා පාර පුරාත් ඇඳ ඇදගෙන ආ අට දෙනෙකුගෙන් සමන්විත පිරිස හැර!

"කොහොමද ළමයිනේ ඒක?" ශෘරා ඇසුවේය. "මට පේන්නේ අපිට ඒක එයාට දෙන්න වෙන හැඩක් තියෙන්නේ. ඇත්ත කතන්දරේ නම් මේක පරණ යකඩ අංගනයක් නේ. අලුත් ඇඳන් එකතු කිරීම අපේ වැඩක් වෙන්න බැහැ නේද?"

"ඉතිං ඇයි අපි ඒක අර විදිහට මහන්සියෙන් මෙච්චරක් දුර ඇදගෙන ආවේ?" වලෝද්යා මිමිණුම් හඬින් ඇසුවේය.

"මට සමාවෙන්න දරුවනේ," ගෝනිය අතින් ගත් මිනිසා පැවසුවේය. "මම හිස් අතින් ආවේ නැහැ. ඇඳත් එක්ක හුවමාරු කරගන්න දෙයක් ගෙනාවා. ඉතිං ඔයාලාට දුක් වන්න කාරණයක් ඉතිරි වෙන්නේ නැහැ." ඔහු අලුත් ම අලුත් කේතලයක්, එවැනි ම වූ අමුත්තන්ට තේ පිළිගන්වන තැටියක් සහ අලුත් භාවයෙන් දිලිසෙමින් තිබුණු ඉස්තිරික්කයක් සිය ගෝනියෙන් එළියට ගත්තේය.

ඇස් විසල් කර එදෙස බැලූ මට ඉබේ ම මෙලෙසින් ප්‍රශ්න කෙරිණ. "මේ සේරම ඔයාගේද? එහෙමත් නැත්නම් ඔයාගේ නැන්දම්මාගේද?"

එය රැස්ව සිටි සියල්ලන් ම සිනා සයුරේ ගිල්වන ආකාරයේ පැනයක් විය.

"අපි අලුත් දේවල් එකතු කරන්නේ නැහැ," ශෘරා ඒ මිනිසාට පැවසුවේය.

මද වේලාවක් අප දෙස බලා සිටි ඔහු තමන් ගෙන ආ දේවල් නැවතත් ගෝනියට දමාගෙන ඇඳ ඇදගෙන යාම ඇරඹීය.

"අපිට තිබුණේ එයාව පරණ යකඩ එකතුවට පරිත්‍යාග කරන්න" මද වේලාවකින් වලෝද්යා මිමිණුවේය.

"ඇයි එයාව විතරක්. එයාවයි නැන්දම්මාවයි දෙන්නම පරිත්‍යාග කරන්නයි තිබුණේ" ශෘරා එකතු කළේය.

"මට හිතෙන්නේ දැන් ඉතිං ඇය මැරෙයි!" මගේ මල්ලි ඉතාමත් සිහින් හඬින් එසේ පැවසුවත් එය සැමට ඇසුණු අතර සැමදෙන සිනාසෙන්නට විය.

මටත්, මල්ලිටත් අනෙක් යාළුවන්ටත් කිසිදා ඒ ඇඳ අමතක කරන්නට නොහැකි විය. බොහෝ කාලයකට පසුවත් අපට යම්කිසි බර දෙයක් ඔසවන්නට සිදුවූයේ නම්, "මගේ බෑණාගේ ඇඳ. මට හිතෙන්නේ දැන් ඉතිං උන්දෑ මැරෙයි!" යනුවෙන් කීම පුරුද්දක් බවට පත් වී තිබිණ.

අපේ පංතිය දිස්ත්‍රික්කයේ පළමු තැනට පත් නොවූවත් තුන්වන තැන ලබා ගන්නට සමත්විය. ඇඳට සෑණ ලකුණු ලබාගෙන!

උණත් නරක නැතැයි සිතෙන තාලේ

පාසල් යන වයසේ කුඩා ළමයෙකු ව සිටි කාලයේ දිනක් මම තදින් අසනීප වීමි.

සිද්ධිය සැකෙවින් විස්තර කරන්නේ නම් මෙසේය. දිනක් මම උදෑසනින් ම අවදි වීමි. මුහුණ කට සෝදාගෙන, පාසල් යාමට සූදානම් වී උදෑසන ආහාර ගත යුතු කාලය ගත වෙමින් තිබිණ. නමුත් ඒ කිසිවකට මට සිතක් නොවීය. අවම වශයෙන් උදෑසන ආහාරය ගන්නවත් මට උවමනාවක් නොවීය. මට මහත් වූ අපහසුතාවක් දැනෙන්නට වූ අතර උගුර සහ හිස රිදෙන්නට වී තිබිණ. මුලින් ම

තදබල රස්නයක් දැනෙන්නට වූ අතර මද වේලාවකින් මා සීතලෙන් වෙව්ලන්නට විය. කෙටියෙන් පවසතොත් මා අසනීපයට පත් ව තිබිණ.!

"දැන් නැගිටින්න වෙලාව හරි!" අම්මා මා ඇමතුවාය.

"ඔන්න ආයෙත් ඉස්කෝලෙට පරක්කු වෙන්නයි යන්නේ!" තාත්තා හඬ නැගුවේය.

"මට සෙම්ගෙඩි හැදිලා වගේ," මම සෙමින් පැවසීමි.

"සෙම්ගෙඩි?"

"ඔළුවත් රිදෙනවා. මට රස්නෙයි. ඒ වගේ ම සීතලයි."

"ආ මට තේරෙනවා."තාත්තා හිස වනමින් පැවසුවේය. "අද මොනවද ඔයාට තියෙන විෂයයන්?"

"සාහිත්‍යය," මම පිළිතුරු දුනිමි.

"හ්ම්... තව මොනවද?"

"තව...අංක ගණිතය, ජර්මන් භාෂාව, චිත්‍ර."

"හ්ම්... එහෙම නම් කාරණය පිරිසිදු වතුර වගේ පැහැදිලියි," තාත්තා පැවසුවේය. "අංක ගණිතය ගැන හිතීම ඔයාට හිසේ අමාරුව ගෙනැල්ලා තියෙනවා. ජර්මන් තමයි සෙම්ගෙඩි දීලා තියෙන්නේ. චිත්‍ර රස්නෙයි සීතලයි දෙකම එක පාර දීලා තියෙන හැඩයි. මෙදා කට්ටි පැනලා හමාරයි. දැන්ම මේ මොහොතේදීම නැගිටින්නයි කිව්වේ!"

මට තදබල කණගාටුවක් ඇතිවිණි. අංක ගණිතයත්, ජර්මන් භාෂාවත් ඇති බොහෝ දිනවල මට අසනීප ඇති වූ බව සත්‍යයකි. එවැනි බොහෝ දිනවල හිසේ අමාරුවක් ඇති බව පවසමින් පාසල් ගමන මග හැරි බවද සත්‍යයකි. චිත්‍ර ඇති දිනවලදී මට රස්නයත්

සීතලත් එකවර දැනුණු අවස්ථා දුලබ නොවීය. මේ සෑම දේම සැබෑ ලෙසින් ම සිදු වූ දේය. එසේ නොවේ යැයි කිසි දින නොපවසමි.

නමුත් මේ කියන දිනයේදී මා කිසි රඟ දැක්වීමක් කරමින් නොසිටි අතර සැබෑ ලෙසින් ම අසනීප ව සිටින බව දැනෙන්ට වී තිබිණ. කෙසේ නමුත් අම්මාත් තාත්තාත් මා ගැන හොඳින් ම දැන සිටි බැවින් මගේ රෝගය ගැන තුට්ටුවකට තරම්වත් මායිම් නොකර පාසල වෙත පිටත් කර යැව්වෝය. අවම වශයෙන් පිටත් කර යැවීමට පෙර මගේ උණ පරීක්ෂා කර බලන්නටවත් ඔවුහු නොසිතුවෝය.

"ඔයා ඉස්කෝලේ ඇරිලා ආවාට පස්සේ දවල්ට අම්මා ඔයාගේ උණ බලයි," තාත්තා පැවසුවේය.

"ඔයාගේ ශරීර උෂ්ණත්වය කිසි ම උස් වීමක් නැතුව තියෙන්න ඕනෑ මට්ටමේ තියෙන බව මට විශ්වාසයි," අම්මා එකතු කළාය.

ඔවුන්ගේ වදන් සැත් මෙන් ඇවිත් මගේ හදවතේ ඇණින. එනිසා ඔවුන්ට පිළිතුරු සපයන්නටවත් මට සිත් නොදිණ. ඇඳෙන් නැගී සිටි මම මුහුණ කට සෝදාගෙන, සූදානම් වී තේ ස්වල්පයක් පානය කළෙමි. ඉතාමත් තදින් අසනීපයට පත් ව හිඳින බව දැන දැන ම පොත් පත් ටික එකතු කරගෙන බෑගයට දමාගෙන පාසල වෙත පිටත් ව ගියෙමි.

පාසලට පැමිණි පසු තත්ත්වය වඩාත් දරුණුවට දැනෙන්නට විය. සාහිත්‍ය කාල පරිච්ඡේදයේදී ගුරුතුමිය මා අමතා කවියක් ගායනා කරන ලෙසින් ඉල්ලා සිටියාය. ගායනය ආරම්භ කළ මොහොතේ පටන් මගේ හඬ තුළින් මහා හුස්ම හඬක් මිස කිසිදු ශබ්දයක් පිට නොවීය.

"අනේ දරුවෝ මොකක්ද මේ ඔයාට වෙලා තියෙන්නේ?"

"මට සෙම්ගෙඩි හැදිලා, ටීචර්" මම අපහසුවෙන් පවසා ගතිමි.

ගුරුතුමිය වඩා ළංවී මා දෙස හොඳින් බැලුවාය. ඇයට තත්ත්වයේ බැරෑරුම්කම වැටහුණා විය යුතුය.

"ඔයා හොඳට ම අසනීපයෙන්නේ. වඩා ම හොඳ මේ දැන් ම ගෙදර යන එකයි"

ඉඳින් මේසය මත තිබූ පොත්පත් කිහිපය එකතු කරගත් මම අපහසුවෙන් නිවසට පිය මනින්නට වීමි.

අවසානයේ නිවසට පැමිණි පසු අම්මා මගේ උණ පරීක්ෂා කර බැලුවාය. එය කෙතරම් ඉහළ අගයක් ගත්තේද යත් බියෙන් මුසපත් වූ අම්මා වහා දොස්තර මහතාට දුරකථනයෙන් අමතා ගෙන්වා ගත්තාය. ඔහු මා කවුදැයි ඉතා හොඳින් හඳුනන අතර මගේ දෙමව්පියන් කුඩා කලදීත් ඔවුන්ට වෙදකම් කළ ඔහු අප සියල්ලන් පිළිබඳ ව මනා දැනුමක් ඇත්තෙකු විය. නත්තල් සීයා සිහිකරවන පෙනුමක් තිබූ ඔහු විනෝදමත් පුංචි මිනිසෙකු විය. මගේ උගුර පරීක්ෂා කර බැලූ ඔහු 'කිචි කිචි' හඬින් සිනා නැගුවේය.

"මට කාලෙකින් මේ වගේ තදින් ස්කාලට් උණ හැදුණු ලෙඩෙක් මේ හමු වුණේ," ඔහු පැවසුවේය. පෙනුණු හැටියටත් ඇසුණු හැටියටත් ඔහු නම් පසුවුණේ සතුටිනි.

ස්කාලට් උණ යන වදන ඇසුණු සැනින් අවසානය ඉතාමත් ආසන්න බව මට වැටහිණි. "මං මැරෙන්න නේද යන්නේ?" මම අපහසුවෙන්, දුකින් ඇසීමි.

ඒ මොහොතේ ඔහු මහා හඬින් කොක් හඬලා සිනා නගන්නට වූයේය. "ඇයි? ඔව් ඇත්ත වශයෙන් ම ඔයා මැරෙයි," වගේ වගක් නොමැතිව ඔහු පැවසුවේය. "මෙයින් අවුරුදු සියයක් ඇතුළත ඒක වනවා ස්ථිරයි."

අනතුරුවු කෙතරම් තදින් සිනා නැගුවේද යත් හුස්ම හිරවී, එක දිගට කහින්නට වූයේය. මෙසේ හැසිරුණ නමුත් ඔහු මෝඩ මිනිසෙකු නොවීය. ඔහු සිතුවේ සිය රෝගියාට වෙදකම මෙන් ම හෙදකම ද කළ යුතු බවයි. ඔහු සිතුවේ සිය රෝගියා ව සතුටින් තබන්නට තමන්ට කළ

හැකි උපරිම දේ කළ යුතු බවයි. ඔහු සැමදා කැකිරි පළමින් හෝ කොක්සන් නගමින් සිටියේ එබැවිනි.

මා රෝහල වෙත ගෙන යන්නට ගිලන් රථයට දුරකථනයෙන් අමතන විටත් ඔහු සිටියේ සිනා නගමිනි. ගිලන් රථ සේවකයින් ගිලන් ඇඳක හොවා මා රැගෙන යනවිට, මරණයේ ආසන්නතාව පිළිබඳ මගේ අදහස තවදුරටත් ස්ථිර වනු මට දැනිණ.

මද වේලාවකින් මා සිටියේ රෝහල් වාට්ටුවේ ඇඳක් මතය. ජීවිතයේ පළමු වතාවට නිවසින් පිට ගත කරන පළමු රැය එළඹියේ එදාය. තදබල ලෙස රෝගී වූ මා රෝහලේ ඇඳක් මත අසරණ ව සිටියදී අඳුර තුළින් වුණෝ තවත් කුඩා පිරිමි ළමයෙකු හඬන හඬය.

මා ගැන ම උපන් කණගාටුවෙන් පෙළෙමින් සිටියදද අවසානයේ නින්ද මා වෙත ළඟා විය. අවදිවන විට දිවා එළිය හොඳින් පැතිර තිබිණ. පෙරදා රාත්‍රියේ අඳුරේ හඬමින් සිටි කුඩා ළමයා තවත් ළමයෙකු හා කතා කරමින් සිටි අතර මොහොතකින් ඒ දෙදෙන සිනා නගන්නට විය. තවත් ළමුන් දෙදෙනෙකු කාඩ් සෙල්ලම් කරමින් සිටි අතර මගේ ඇඳට යාබද ඇඳේ සිටි වඩා වැඩිමහල් වූ පිරිමි ළමයෙකු පොතක් කියවමින් පසුවිය.

මා දෙනෙත් හැරි බව දුටු ඔහු පොත පහත් කර මා දෙස බලා මෙසේ ඇසුවේය. "මොනවද කියන්න හිතෙන්නේ?"

"ඔබට ස්තුතියි කියලා," මම වැඩිදුර නොහිතා වහා පිළිතුරු දුනිමි.

"අපොයි නැහැ. ඔයා කියන්න ඕනෑ 'සුභ උදෑසනක්' කියලායි."

"සුභ උදැසනක්," මම පැවසීමි.

"ඔබටත් සුභ උදෑසනක් වේවා. කාඩ් සෙල්ලම් කරනවද?"

"එච්චර දන්නේ නැහැ"

"මම ඔට්ටු අල්ලනවා," ලොකු ළමයා ඇසක් ඉගි මරමින් පැවසුවේය. "මූණ එල්ලගෙන ඉන්නේ මොකද වයසක මනුස්සයෝ. ඉස්පිරිතාලේ ඉන්නවා කියන එක හිතන තරම් නරක දෙයක් නෙමෙයි. ඉස්කෝලේ යන්න නැහැ, ගෙදර වැඩ නැහැ, නැද්ද මං අහන්නේ?"

"ඔව්," යි පවසනවාත් සමඟ ම පෙර නොවූ ආකාරයේ සැහැල්ලුවක් මට දැනෙන්නට විය.

උදෑසන ආහාරය ගන්නා අතරතුරේ අනෙක් ළමුන්ගේ නම් දැන ගන්නට මට හැකිවිය. එයින් අනතුරුව මට නැවතත් තද නිදිමතක් ඇති වූ අතර ඒ වනවිට මගේ මරණ භය නැති වී ගොස් තිබුණේ එහි කිසිවෙකු ස්කාලට් උණෙන් මිය යතැයි යන සිතුවිල්ලේ පසු නොවූ නිසා විය යුතුය.

දොස්තර මහතා ආ වෙලාවේ මා අවදි විය. ඔහු වාට්ටුවේ සිටි ළාබාල ම ළමයා පරීක්ෂා කර බලා මෙසේ පැවසීය. "ඔයාට ඔයාගේ අම්මා ගාවට ඉක්මනින් ම යන්න පුළුවන් වේවි." එයින් අනතුරු ව මගේ ඇඳට යාබද ඇඳේ උන් වැඩිමහල් පිරිමි ළමයා පරීක්ෂා කළ ඔහු, "ඔයාට ඔයාගේ ගෑණු ළමයා ගාවට ඉක්මනින් ම යන්න පුළුවන් වෙයි හාදයා..." යි පවසද්දී, වටේ සිටි සෑම ළමයෙකු ම සිනා නගන්නට වූ අතර වැඩිමහල් පිරිමි ළමයාත් අප හා එක් ව සිනාසෙන්නට වූයේය. සමහරවිට අප වැනි කුඩා ළමයින් පිරිසක් සමග රෝහල් වාට්ටුවේ ගැවසෙන්නට ලැබීම ඔහුට සතුටක් වූවා විය යුතුය.

"හ්ම්... කොහොමද ඔයාගේ උගුර?" මා අසලට පැමිණි පසු දොස්තර මහතා විමසා සිටියේය.

"තාමත් රිදෙනවා," මම පිළිතුරු දුනිමි.

"ඔයාට ඉක්මනින් ම සුවයක් දැනේවි," ඔහු පැවසුවේය.

අප පවුලේ දොස්තර මෙන් ලොකු රැවුලක්වත්, හැම තිස්සේ ම මතුවන හිනාවක්වත් නොමැතිව සිටියත් එම දොස්තර මහතා පැවසුවේ සත්‍යයක් බව මට වැටහිණ.

එයින් අනතුරු ව නැවතත් නින්ද මා කරා ආවේය. නින්දේදී පෙර පරිදි උගුර නොරිදුණු අතර ඉක්මනින් ම අවදිව සිටියදීත් වේදනාව පෙරට වඩා අඩුවෙන් දැනෙන්නට විය. එයටත් වඩා ඉක්මනින් වාට්ටුවේ සිටි ළමයින් හා මිතුරුව දිනපතා විවිධ ක්‍රීඩාවන් හී නිරත වන්නට මට හැකිවිය. වාට්ටුව තුළ පොත් රාක්කයක් තිබුණු අතර එහි ඉතාමත් හොඳ කතා පොත් විශාල ප්‍රමාණයක් තිබිණ. වැඩිමහල් පිරිමි ළමයා ඉතාමත් හොඳ කතා කියන්නෙකු වූ අතර යාළු ගැහැණු ළමයෙකු ඉන්නට තරම් අපට වඩා වැඩිමහල් කෙනෙකු වූ ඔහු එහිදී අප හා සම වයස් කෙනෙකු මෙන් හොඳ සගයෙකු විය.

සුවපත් වූ පසු පිටත් ව එන්නට සිදු වීම මගේ සිතේ දුකක් ඉපදවීය. එයට හේතුව ඔබට පැහැදිලි යැයි සිතමි. මට එහිදී හොඳ මිතුරන් පිරිසක් මුණ ගැසුණු අතර හිතූ තරම් රෝහල තුළ කරුණු කාරණා අයහපත් ද නොවීය. ගෙදර වැඩ යනුවෙන් කිසිම දෙයක් නොවූ අතර විනෝදය උපරිමයෙන් ලැබිය හැකිවිය. ඇත්ත වශයෙන් ම ඔබට විනෝදයෙන් කාලය ගත කරන්නට ලැබේ නම් රෝගී වීමත් නරක දෙයක් නොවනු ඇත.

රෝහලක ඇතුළත ස්වභාවය පිළිබඳ මනා වැටහීමක් මට ලැබුණු අතර ගත කරන්නට ලොව තිබෙන හොඳ ම ස්ථාන අතරට නොගැණුනත් එයින් පසුව රෝහල් ගතවීමට සිදුවීම මා භීතියෙන් මුසපත් කිරීමට සමත් නොවීය.

බියෙන් ගැහුණෙමි එල්ලී වහලේ



දහසල් යන වයසේ කුඩා සිසුවකු ව උන් අවධියේ දිනක් මම බිත්තියක් දිගේ නැග්ගෙමි. මා පමණක් නොවේ, මගේ පංතියේ අනෙක් ළමුන් සියල්ලමත්!

ඇත්ත වශයෙන් ම එහි පුදුම වන්නට තරම් දෙයක් නැත. අපි බිත්තියක් දිගේ නගින්නට සූදානම් වුණෙමු. තනිවම එම කාරණය සපුරා ගත නොහැකි පිරිස හට පුංචි උදව්වක් කිරීමට ගුරුතුමා සූදානමින් සිටියේය. දැන් ඔබට කාරණය පැහැදිලි යැයි සිතමි. එය අපේ ශාරීරික අභ්‍යාස පංතිය වූ අතර අපි බිත්තියේ සමාන

පරතරවලින් සවිකර තිබූ පොලු දිගේ නැගිය යුතු වූයෙමු. සෑම සිසුවා ම ඉහළම පොල්ල දක්වා නැග නැවත බැසිය යුතු විය.

බිත්තියක් දිගේ නගින්නට ක්‍රම බොහෝ ප්‍රමාණයක් තිබිය හැකි අතර තමන් තමන්ගේ ම ක්‍රමයකට එය සැපිරීම ප්‍රමාණවත් විය. කෙනෙකු හතර ගාතෙන් බඩ ගාගෙන නැග එලෙසින් ම බසිනු ඇත. කෙනෙකු හිමින් හිමින් දණහිස්ද භාවිතා කරමින් නැග ඊටත් වඩා හිමින් බසින අතරේ තවත් කෙනෙකු සෙමින් නැග, වහා වහා බිමට බසිනු ඇත. මේ සෑමදෙන අතර කිසි ලෙසකින් ඉහළට එක අඩියක්වත් තබා ගත නොහැකි අයද සිටිනු ඇත.

මගේ පංතියේ සෑම ළමයෙකු ම ගැහැණු පිරිමි භේදයකින් තොරව සිවිලිම දක්වාම පොලු දිගේ නගින ලදී. නමුත් ඒ අතුරින් වහා බිමට බැසීමට සමත් වූයේ කිහිප දෙනෙකු පමණි.

මා කොහොමත් ඉහළ තැන් වලට බියක් දැක් වූ කෙනෙකු විය. බිම නොබලා ඉහළට නැග යනතුරු සෑම දෙයම ඉතාමත් යහපත් තත්ත්වයෙන් පැවතිණ. අවසාන පොල්ල වෙත ළඟා වී බිම බැලූ වහාම මට සියල්ල භ්‍රමණය වන ලෙසක් දැනෙන්නට වූ අතර අත්දෙක ලිහිල් වී වැටෙන්නට ඔන්න මෙන්න මෙන් විය. අන්න ඒ මොහොතේ දී තදින් ඇස් පියා ගත් මම ඉතාමත් තදින් කිටි කිටියේ අත් දෙකින් හා දණහිස් දෙකින් අසළ වූ පොලු බදාගෙන මෙන් වහ වහා ඒවාට ඇලුනෙමි. මොහොතකින් සියලු ම ළමයින් පොළොව කරා ළඟා වී තිබිණ. ඔවුන් බසින පිළිවෙලට පෙලට සැදී සිටගත් අතර ගුරුතුමා ඉහළම පොල්ලේ ඇළී ඉන්නා මා දැක පුදුමයට පත් වූයේය.

"විකාර වැඩ කරන එක නවත්වන්න!" ඔහු කෑ ගැසුවේය.

"බහින්නයි කිව්වේ දැන් ම."

"මට බැහැ," මගේ හඬ නැගුණේ ගෙම්බෙකුගේ බක බක ගෑමක් ලෙසිනි.

එය සභාව සිනා සයුරේ ගිල්වීමට තරම් විය. සියල්ලන් ම සිතුවේ මා විසුළුකාරී ලෙස හැසිරෙන බවකි. නමුත් ඔබත් මාත් දන්නා සත්‍යය ඔවුනට ඒ මොහොතේ නොපෙණිනි. මගේ වදනත් සමගින් ගුරුතුමා කෝපයට පත්විය.

"දැන් ම, මේ මොහොතේ ම බිමට බැස්සේ නැත්නම් ඔයාට ගොඩක් කණගාටු වෙන්න වෙයි,"

"මට දැනටමත් ගොඩක් කණගාටු හිතිලා තියෙන්නේ," මගේ හඬ පෙර පරිදි ම වීම සියල්ලන් වෙත නැවතත් සිනා කැඳවන ලදී.

"මං හිතනවා ඔයා තේරුම් ගනියි කියලා අද ශාරීරික අභ්‍යාස පාඩමට දැනටමත් ඔයාට ලැබිලා තියෙන්නේ අසමාර්ථයක් බව!"

"මට අසමාර්ථයක් ගන්න ඕනෑ නැහැ," මම පැවසීමි.

"එහෙනං දැන්මම බහින්න බිමට!"

"මට බැහැ."

"එහෙනං අසමාර්ථයක් ලැබෙයි, ඒ වගේම ඔයාට තව දුරටත් මෙතැන ඉන්න බැහැ. ඇහෙනවද ඔයාට?"

"ඔව්."

"මේ දැන් ම මෙතැනින් යන්න!"

"මට බැහැ."

"දැන් ඔයාට ඕනෑ මට කියලා බලෙන් එළියට දමා ගන්නද?"

"නැහැ."

මට සිතුණේ ගුරුතුමා මා සමග 'ඔව්, නැහැ, බැහැ' සෙල්ලම කරනවා කියලාය. අසන සියලුම ප්‍රශ්න වලට ඔව්, නැහැ හෝ බැහැ

යනුවෙන් පිළිතුරු දිය යුතු අතර සිනා නැගුවොත් ඔබ සෙල්ලමෙන් ඉවත් කරනු ලැබේ. මේ සෙල්ලම ඒ වනවිට එපා වී සිටි මම, එතරම් උඩක, සීලිම අසල පොල්ලක ඇළී, හීතියෙන් මියෙන්නට ආසන්නව සිටිනා අතරේ සිනාසෙන්නට වූයෙමි.

"ආ... ඔයාට බොහොම සතුටුයි වගේ," ගුරුතුමා ඇසුවේය.

"හිනාත් වෙනවා නේද?"

"ඔව්," මිමිණුම් හඬින් පිළිතුරු දුනිමි. සිනා වුණත් ඒ වනවිටත් හීතියෙන් මුසපත් ව සිටින බව කියන්නට අවශ්‍ය විය. ඇත්ත වශයෙන් ම කියතොත් කෙතරම් බියපත් වී සිටියේද යත් බිමට බැස්මක් ගැන කතා කරන්න තබා ඇස් ඇර ගන්නවත් නොහැකි ව සිටියෙමි. එසේ සිටිමින් අපහසුවෙන් හෝ සිනාසෙන්නට වූයේ විනෝදජනක අවස්ථා වලදී පමණක් කරන, 'ඔව්, නැහැ, බැහැ' සෙල්ලමෙන් ගැළවී ගන්නට නම් සිනාවිය යුතු නිසාය.

ඇත්තට ම එය විනෝදජනක අවස්ථාවක් නොවීද?

මා සිනාසෙමින් ඉන්නා බව පිළිගත් මොහොතේ පහළ සිටි ළමෝ නැවතත් අඬි පොළොවේ වද්දමින් සිනා නගන්නට වූහ. සියල්ල යහපත් ලෙසින් පවත්වා ගන්නට ගුරුතුමා දැඩි උත්සාහයක් දැරුවේය. ඔහු කෑ ගසමින් සිටියේය. "නිශ්ශබ්ද වන්න හැමෝම!" "මෙතැන මොකක්ද හිනා වෙන්න තියෙන්නේ!"

ඔහු තරුණ ගුරුවරයෙකු වූ නමුදු හැම විට ම අපට කෑ ගසමින් සිටි කෙනෙකු විය. මෙහිදී සුපුරුදු පරිදි එහේ මෙහේ දුවමින් ගුරුතුමා කෑ ගසමින් සිටි අතර ළමෝ නොනවත්වා සිනා නගමින් සිටියෝය. කෙතරම් ඝෝෂාවක් ශාලාව තුළ වීද යත් විවේක කාලය දන්වන සීනුව නාද වනු අපට නෑසිණි.

ඒ අසලින් ගමන් කරමින් සිටි විදුහල්පතිතුමා දොර විවරව තිබූ බැවින් නිකමට හිස ඇතුළට දමා බැලූ මොහොතේ ඔහු දුටු දර්ශනය

මෙසේ විය. ආදරණීය වූ ජීවිතය රැක ගැනීම වෙනුවෙන් දැස් කිට් කිට්යේ වසාගෙන ඉහළම පොල්ලේ එල්ලී, එයට ඇළී මා සිටියි. මගේ මිතුරු මිතුරියෝ පා පොළොවේ වද්දමින්ද, කොක්සන් නගා සිනාසෙමින්ද, උගුර යටින් කෑ ගසමින් ද සිටිති. ඒ අතරතුරේ රතු වූ මුහුණෙන් යුතු වූ අපේ ගුරුතුමා එහේ මෙහේ දුවමින් කෑ ගසමින් සිටියි.

"මං සේරමල්ලාගේ ම අම්මලා තාත්තලා ගෙන්නලා, සේරම විස්තරේ අකුරක් නෑර කියලා, පන්නලා දානවා සේරම! එක්කෙනෙක් නෑර සේරම එලවලා දානවා!"

"මොනවද මෙතැන වෙන්නේ?" ගුරුතුමා වෙත එමින් විදුහල්පතිතුමා ඇසුවේය.

එක් මොහොතින් සියල්ල සන්සුන් විය. ගුරුතුමාගේ හඬ එක්වරම නතර වූ අතර ළමුන්ගේ කෑ ගැසීම ද නතර විය. විදුහල්පතිතුමාගේ සන්සුන් ස්වරය ඇසුණු සැනින් සෙමෙන් දෙනෙත් විවර කළ මා සෙමින් සෙමින් පහළට බැස ආවේ සමාධියට සම වැදුණාක් මෙනි.

"මම කැමතියි ඔයාට පොඩ්ඩක් තනියෙම කතා කරන්න,"යි ගුරුතුමාට පැවසූ විදුහල්පතිතුමා පිටව ගියේය.

මට කිසිවෙකු විදුහල්පති කාමරයට පැමිණෙන්නට යැයි දැන්වූයේ නැත. මගේ දෙමව්පියන් කැඳවූයේ ද නැත. අපගෙන් කිසිවෙකු පාසලෙන් පන්නා දැමුනේද නැත. වරක් විවේක කාලයේදී මා දුටු විදුහල්පතිතුමා සිය දබර ඇඟිල්ල වනා මා දෙස රවා බලා, අනතුරුව සිනා වී වහ වහා ඇවිද ගියේය.

එයින් පසු ශාරීරික අභ්‍යාස ගුරුතුමා කිසි දිනෙක මා වෙත සිය අවධානය යොමු කළේ නැත. එහෙත් අප වටහාගත් දෙය නම් ඔහු පෙර පරිදි කිසිවෙකුට කෑ ගසන්නේ නැති බවයි. නැවතත් මා දිනෙක

සිව්ලිම අසල එල්ලී, දැස් තදින් වසාගෙන මරණ බියෙන් මෙන් බිත්තියට ඇළී සිටින අයුරු දකින්නට කැමැත්තෙන් සිටි මිතුරු මිතුරියන්ගේ බලාපොරොත්තු සුන් කරමින්, එම සිදුවීමෙන් පසු බිත්ති පොලු දිගේ නැගීමට මවෙත තිබූ බය නැත්තට ම නැතිව ගියේය. නැවතත් මා එදා සේ හැසිරෙතැයි ගුරුතුමාත් බලාපොරොත්තු වූවා විය යුතුය. මගේ වාරය පැමිණි සෑම විට ම ඔහු ඉවත බලා ගත්තේ එබැවින් යැයි මට සිතුණි.

එයින් අනතුරුව බොහෝ වසර ගණනාවක් ගතව ගියද මගේ පැරණි මිතුරු මිතුරියන් අදටත් සිතන්නේ එදා මා කළේ විහිළුවක් බවයි. මා ස්වල්ප වශයෙන්වත් බිය වූ බව ඔවුන් සිතන්නේ නැත.

එයින් අනතුරුව උස් ස්ථාන වලට තිබූ බය මගෙන් දුරු වූ අතර සංචාර සඳහා ගුවන් යානා මගින් කිහිප වරක් ම ගමන් කළද කිසිදු බයක් මසිතේ ජනිත වූයේ නැත. නමුත් අදටත් මගේ වැඩි ම කැමැත්ත ඇත්තේ දුම්රියෙන් යන ගමන් සඳහාය. ඒ වගේ ම අදත් කවුරුන් හෝ මහා හඬින් කෑ ගැසීම මගේ බලවත් නොරිස්සීමට හේතු වෙයි. මගේ මිතුරන් පවසන්නේ යම් කෙනෙකු කෑ ගසන අවස්ථාවක මගේ පෙනුම ඔවුන්ට පෙර කී සිද්ධිය සිහි කරවන බවත්, එම මොහොතේ මට බිත්තියක් දිගේ නගින්නට සිදුව ඇති ලෙසින් මුහුණ විකෘති වන බවත්ය.

සම ව බෙදූ තාලේ



පසළොස් සල් යන වයසේ කුඩා ළමයෙකු ව උන් අවධියේ වරක් මාත් මගේ මල්ලිත් වරක් ගිම්හාන කඳවුරකට සහභාගි වීමු.

අප කණ්ඩායමේ සිටි පිරිමි ළමයින් මගේ සිත් ගත් පිරිසක් වූ අතර අපට එහිදී කරන්නට බොහෝ වැඩ තිබිණ. එක් දිනක් අප විසින් යාබද විසූ ගොවියන්ට උදව් කළ අතර ඊළඟ දිනයේදී මුළු රැයක් පුරා වනාන්තරයේ සාදාගත් එළිමහන් කඳවුරක ගත කරන ලදී. ගිනි මැලය වටා වාඩි වී එකිනෙකාට හොල්මන් කතා කියමින් කාලය ගත කිරීම ඉතාමත් විනෝදජනක ක්‍රියාවක් විය. එක් දිනක් යාබද කඳවුරක ළමුන්ට

අප හා සුහද තරඟාවලියක නිරත වන්නට ආරාධනා කළෙමු. එයට ජවන හා පිටිය තරඟත්, පිහිණුම් තරඟත්, පිං පොං හා වොලිබෝල් තරඟත් ඇතුළත් විය. බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම, කුසලතා ප්‍රදර්ශනයක් පැවැත්වීම ආදී කී නොකී සෑම දේම අප කළ අතර ඒ සෑම දෙය ම කළේ කණ්ඩායමක් වශයෙන් එකට එකතු විය.

විවේක හෝරාවන් පෙර කිසිදා නොවූ විරූ ආකාරයක් ගන්නා ලදී. නිවසේ සිටින කල්හි දහවල් ආහාරයෙන් පසු ස්වල්ප වේලාවක් හෝ නිදන්නට උත්සාහ කළ අප කඳවුරේදී නොවැදගත් නින්දක් නිසා ලබා ගත හැකි වූ වැදගත් යමක් අත් හැර ගන්නට මනාප වූයේ නැත.

උදෑසනින් අවදි වී කඳවුරේ නළාකරු බොරිස්, අවදි ව ඔහුගේ ඔරලෝසුව දෙස බලා, පිටතට දිවවිත් පිරිසට අවදි වන්නට සන් කරමින් නළාව වයන අයුරු බලා සිටීම විනෝදජනක දෙයකි. ඔහු එය නාද කරන්නේ ඒ වනවිටත් නිදා සිටින අයවලුන් උඩ විසි වී බිම වැටෙන තරමේ හඬකිනි. එම හඬින් සියල්ලන් ම අවදි වුවත් වලෝද්‍යා නොවේ අවදි වන්නේ. ඔහු පෙරවනය තුළට තව තවත් ගුලි වී කොට්ටය යටට රිංගා යන්නේය. නිදිගුල්ලා යැයි නම් කරන්න වටින පරිද්දෙන් හැසිරෙන්නට වූයේය. නමුත් එසේ වන්නට දෙන්නට නොහැකිය. එබැවින් මා ගොස් ඔහුගේ බ්ලැන්කටය ගස්සා ඇද බිමට දමන අතරේ තව කෙනෙකු ඔහුගේ කොට්ටය අදිනු ලැබේ. ඒ අතරතුරේ තව පිරිසක් සූදානමින් සිටින්නේ ඔහු ව කිති කවන්නටය. අවසානයේ කෙසේ හෝ වලෝද්‍යා අවදි වන්නේ බොරිස් පැමිණ ඔහුගේ කනට කර කෑ ගැසූ පසුවය.

කෙසේ නමුදු මේ කටයුත්ත මා හට සතුටුදායක පුදුමයක් විය. එයට හේතුව නම් මටත් වඩා පමා වී අවදිවන කෙනෙකු මේ ලෝකය තුළ සිටින බව දැන ගන්නට ලැබීමයි. අප නිවසේ අවසානයට ම අවදි වූයේ මාය. යම් කිසි වටහා ගත නොහැකි වූ කාරණයක් නිසා කඳවුර තුළදී අනෙක් ළමුන් හා අවදි වීමත් ඔවුන් සමග ම නින්දට යාමත් මට සතුටක් ගෙනදිණ. එලෙසින් ම පෙරවනය යටට වී පොත් කියවන්නට ද

එහිදී මට උවමනාවක් නොවීය. සමහරවිට එම කාරණය, පහසුවෙන් උද්‍යාසන අවදිවන්නට මට උදව් වන්නට ඇත.

විටෙක ළමුන්ගේ දෙමව්පියන් පැමිණ සිය දරුවන්ගේ ක්‍රියාකාරකම් ගැන විපරම් කරන ලදී. එහි ආහාර පාන විශිෂ්ට මට්ටමේ පැවතියත් දෙමව්පියන් පැමිණෙන විට මොන මොනවා හෝ රැගෙන ඒම සිරිතක් විය. සාමාන්‍යයෙන් කිසිම ළමයෙකු ඒ දේවල් ප්‍රතික්ෂේප කළේ නැත. අප දෙදෙනා හැර අප කුඩාරමේ තවත් ළමයින් දහහතර දෙනෙකු විය. ශෞරා ගේ දෙමව්පියන් ගෙනා ජෑම් භාජනයෙන් යන්තම් එක්කෙනෙකුට හැඳි දෙක බැගින් පමණක් රස විඳින්නට සිදු වූයේ එබැවිනි. වලෝද්යාගේ දෙමව්පියන් විසින් ගෙනෙන ලද දුම් ගසන ලද මාළුවා පුංචි පුංචි කැබලි දහසයකට කපන්න ඔහු සමත්විය.

සෑහෙන පමණ දිග චොකලට් එකකුත්, ඇපල් පුඩිමක් සහ ජෙලි භාජනයක් යනාදී දේ මේ ආකාරයට කොටස් දහසයකට බෙදන ලදී.

අවසානයේ අප දෙමව්පියෝ කඳවුර වෙත ආවෝය. ඒ එනවිට අප දෙදෙනාට එක බැගින් පේස්ට්‍රි ගෙන ආවේ මාත් මල්ලිත් ඒවා කන්නට කෙතරම් මනාප දැයි ඔවුන් දන්නා නිසා විය යුතුය. එතරම් මනාපයක තිබිය දී මල්ලි පැවසූ වදනින් ඔවුන් පුදුමයට පත් විය.

"ඔන්න වැඩේ. දැන් කොහොමද අපි පේස්ට්‍රි දෙකක් කෑලි දහසයකට කපන්නේ?"

මම පිළිතුරු දුනිමි. "ඒක හරි ම ලේසි වැඩක්. මුලින් ම අපි පේස්ට්‍රි දෙකම හරි මැදින් දෙකට බෙදනවා. ආයේ ඒ කෑලි දෙකට බෙදනවා. ආයෙමත් ඒ කෑලි දෙකට බෙදනවා. එතකොට අපිට කෑලි දහසයක් ලැබෙනවා."

"නමුත් ඇයි දෙවියනේ ඔයාලාට එහෙම කරන්න ඕනෑ වෙන්නේ?" අම්මා පුදුමයෙන් ඇසුවාය.

"අපි හැමදේම එක් එක්කෙනා අතර බෙදා ගන්නවා," මම පැහැදිලි ව විස්තර කළෙමි.

"අපි දුම් ගසන ලද මාළුවෙකුයි, ජෑම් භාජනයකුයි, චොකලට් එකකුයි, ඇපල් පුඩිමකුයි ගාණට දහසයට බෙදාගෙන කෑවා," මල්ලි සිය සිහින් හඬින් එකතු කළේය.

"හොඳයි," අම්මා පැවසුවාය. "ඊගාව පාර එද්දී අපි ඔයාලාට පේස්ට්‍රි දහසයක් ම අරගෙන එන්නම්කෝ. සමහරවිට දහසයක් ම නෙමෙයි, අවම වශයෙන් අටක් නම් ස්ථිරව ම ගේන්න පුළුවන් වෙයි. එතකොට එක්කෙනෙකුට භාගයක් ලැබෙනවානේ. ඉතිං ඒක නිසා ඔය දෙන්නා මේ දෙක කන්න"

"අපි හැම තිස්සේ ම බෙදා ගන්නවා," මම පැවසීමි.

"ඔව්. එහෙම නැතුව අපට කන්න බැහැ," මල්ලි එකතු කළේය.

"හ්ම්... එතකොට එහෙමයි ඔයාලාගේ අදහස," තාත්තා පැවසුවේය.

"එහෙම නම් අපි දෙන්නා මේ දෙක කන්නම්. පේස්ට්‍රි දෙකක් තියෙනවා. අපි දෙන්නෙක් ඉන්නවා. එකක් ඔයාලාගේ අම්මාට. අනික මට."

නමුත් ඒ ඔවුන්ගේ විහිළුවක් පමණක් විය. ඔවුන් කිසිදා අපේ පේස්ට්‍රි නොකනු ඇත. නමුත් ඒ මොහොතේ ඔවුන් කරන්නේ විහිළුවක් බව අප දෙදෙනාට ම දැනුණේ නැත.

"හොඳයි. ඔයාලාගේ පේස්ට්‍රි ඔයාලා ම කන්න," මම පැවසීමි.

"ඔව්. ඔව්. කන්න. කන්න. මම නං බලන්නෙවත් නැහැ," මල්ලි එසේ පවසා අනෙක් පසට හැරුණේය.

"අනේ අනේ දරුවනි, අපි විහිළුවක් කළා විතරයි," තාත්තා සිනාසෙමින් පැවසුවේය. "මෙන්න ඔයාලාගේ පේස්ට්‍රි. ඔයාලාට පුළුවන් මේවා කැලි සියයකට හරි කපන්න, ඒක ඔයාලාගේ කැමැත්ත නම්."

"දහසයකට, සියයකට නෙමෙයි," මම සෙමින් පැවසීමි.

"අපි එකක් කැලි අටකටයි කපන්නේ," මල්ලි පැවසුවේය.

පේස්ට්‍රි දෙක නියම ආකාරයට කැබලි බවට පත් කළ පසු එතැන වූයේ ඉතාමත් කුඩා කැබලි වූ නමුත් එතැන හරියට ම සෑම දෙනාට ම ප්‍රමාණවත් වන පරිද්දෙන් දහසයක් විය. සියල්ලන් ම සතුටින් පසුවිය.

අතිවිශේෂ යමක් සිදු නොවූවද එම දිනය මගේ සිතේ සදා නොමැකී රැඳෙනු ඇත. මල්ලිගේ හිතෙත්!

ඒ එය සාමාන්‍ය නමුත් සාධාරණ ලෙසින් කාරණා අවසන් වූ දිනයක් වූ නිසා විය යුතුය.

මා පෙළූ සරදම් නාමේ



පාසල් සිසුවකු ව උන් සන්ධියේ මගේ පංතියේ බොහොමයක් ළමෝ මට සරදම් කරන්නට වූහ. අනෙක් ළමුන්ටත් විටෙන් විට කාගේ හෝ සරදම් කිරීමකට ලක් වන්නට වූවත් ඔවුන් මා මෙන් ඒ පිළිබඳ ව කෝප ගත්තේ නැත. එම කාරණය හේතුකොට ගෙන මා විහිළුවට ගැනීම අනෙක් ළමුන්ට මනා වූ විනෝදයක් සපයන දෙයක් බවට පත් ව තිබිණ. උපැස් යුවළක් පැළඳීම හේතු කොටගෙන ඔවුන් මා හට පටබැඳි නාමය මහාචාර්යතුමාය. කවි ලිවීම හේතු කොටගෙන ඔවුන් මා හට පටබැඳි

නාමය 'කවියෙකු බව නොදත් කවියා'ය. රණ්ඩු නොකරන, ගැහැණු ළමයින්ට උසුළු විසුළු නොකරන කෙනෙකු වූ බැවින් මා ලද නාමය 'පැණි' විය. ඇත්ත වශයෙන් ම ඒ නම යොදන ලද්දේ ද ගැහැණු ළමයින්මය. ඔවුන්ට මගේ සිත රිදවන්නට අවශ්‍ය නොවීය. ඔවුන් එය පවසන ලද්දේ සිත් ඇදගන්නාසුලු අයුරිනි. මගේ අවාසනාවකට මෙන් එය පිරිමි ළමුන්ට ඇසුණු මොහොතේ පටන් ඔවුන් එය යොදා ගත්තේ ජීවිතය එපා වන තරමට සරදම් කිරීමටය. පූසෙකු මෙන් මියෑව් හඬින්ද, බල්ලෙකුගේ බිරුම් හඬින්ද, ගීතවත් හඬින්ද පැණි යනුවෙන් මා ඇමතීම ඔවුන්ගේ සතුට විය. එපමණකින් නොවැතී කළු ලෑල්ල මත විසල් අකුරෙන් එය සටහන් කිරීමටද ඔවුහු අමතක නොකළහ. වරක් අපට පැමිණි නව ගුරුතුමෙකු විසින් මගෙන් නම විමසා සිටි කල්හි මට ප්‍රථම පංතියේ පිරිමි ළමෝ 'පැණි' යනුවෙන් හඬ නැගූහ. ඒත් සමගම පංතිය ම සිනා සයුරේ ගිලී ගිය අතර ගැහැණු ළමෝ ද ඒ අතට එක්වූහ.

ගුරුතුමාද මද සිනාවක් නැගූ නමුත් එතැන තිබූ විහිළුව කුමක්දැයි ඔහුට නොවැටහිණි.

එදින තරම් දුක්ඛිත තත්ත්වයක් ඉන් පෙර මට දැනී නොතිබිණි.

මගේ පංතියේ වූ බොහෝ ළමයින් හට සුරතල් නම් තිබිණ. කෝල්යාගේ සුරතල් නම බෝංචි රිට වූයේ ඔහු සිහින් උස කෙනෙකු වූ නිසාය. ටෝල්යා, හම්ටි ඩම්ටි නමින් හැඳින්වූයේ ඔහු මිටි මහත කෙනෙකු වූ නිසාය. සමහර සුරතල් නම් සාදාගෙන තිබුණේ ළමුන්ගේ අග නම් වලින් කොටස් යොදාගෙනය.

අයිගෝ කටමැත දොඩවන්නට කැමති වූ කෙනෙකි. අනෙක් අතට දත් අතරින් කෙළ විදීමේ නරක පුරුද්දක් ඔහු සතුවිය.ඔහු කෙළ පූචානමා නම් විය.

පිරිමි ළමුන්ට පමණක් නොව ගැහැණු ළමයින්ටද සෑදූ සුරතල් නම් තිබිණ. කෙනෙකු අඬන බබා නම් වූ අතර තව කෙනෙකු හාවී නම්

විය. කෙනෙකු විස්කෝතු නම් වූ අතර ඔයාකාරයට විවිධාකාර නම් මහා ගොඩක් තිබිණ. උසම ගැහැණු ළමයා දිගී ලෙසින් නම් කෙරෙන අතරේ මිටි ම ගැහැණු ළමයා මිටී වී තිබිණ. රතුපාට කෙස් කළඹක් හිමි ව සිටි ග්‍රීෂා රතූ හෝ ගිණි අස්වයා නමින් හඳුන්වනු ලැබීය.

නමුත් මහාචාර්යතුමා, කවියකු බව නොදත් කවියා හෝ පැණි යන නම් වලින් හඳුන්වන කල්හි සිත රිදවා ගත් එක ම ළමයා මා විය. විශේෂයෙන් පැණි යන වදන මා හට නයාට අඳුකොළ මෙන් වූ අතර එනමින් කෙනෙකු මා ඇමතූ මොහොතේ පටන් ඒ ළමයා ගැහැණු වුවත් පිරිමි වුවත් කතා නොකර අත්හැරීම මගේ සිරිත විය.

මේ අතර සිදු වූ දෙය මෙයාකාර විය. අප පංතිභාර ගුරුතුමිය, ළමුන්ගේ මුල් නම් දැන සිටියත් අප අමතන ලද්දේ අපගේ වාසගම යොදාගෙනය. යම් ළමයෙකුගේ වැඩක් සම්බන්ධයෙන් ඇය සතුටට පත් වූයේ නම් එවිට මුල් නමින් ඇමතීම ඇගේ පුරුද්ද වී තිබිණ. "හරි ම හොඳයි, ලීසා!" හෝ "කෝල්යාගේ රචනාව විශිෂ්ටයි!"

සෑම ළමයෙකුට ම අවශ්‍ය වූයේ ඇය සිය මුල් නමින් අමතනු ඇසීමටය. ඇය තද නීති කාරියක වූ නමුදු සාධාරණ කෙනෙකු වූවාය. පංතිය තුළ භාවිතා වූ අවර ගණයේ කෙටි නාම ඇගේ සිත් නොගන්නා ලද බව නොකිවමනාය.

දිනක් ඇය මෙසේ පැවසුවාය. "මං දන්නවා ඔයාලා හැමෝට ම කෙටි නම් තියෙනවා කියලා. නමුත් කෙනෙකු කණ්නාඩි පළඳින නිසා හෝ මිටි වීම නිසා හෝ කෙටි නමක් යොදාගෙන විහිළු කිරීම ඉතාමත් නරක දෙයක්. ඇයි වැදගත් විදිහට හිතන්න, හැසිරෙන්න කල්පනා කරන්නේ නැත්තේ?"

පංතියේ සියලු දෙනා අනෙක් අයට විසුළු නොකරන බවට පොරොන්දු වූ අතර එම පොරොන්දුව ඒ ආකාරයෙන් ම ටික කාලයකට රකින ලදී. නමුත් එම ටික කාලය කෙළවරදී නැවතත් පෙර පරිදී ම එකිනෙකාට විසුළු නාම භාවිතා කිරීම ඇරඹිණ.

එවර, තමන්ගේ ම ක්‍රමයකට මෙම ගැටළුව විසඳිය යුතු වග ගුරුතුමිය කල්පනා කළ අතර ඇය යොදාගත් ක්‍රියා මාර්ගය මේ ආකාර විය. මීළඟට එළඹුණු ගුරු-දෙගුරු රැස්වීමේදී ඇය දෙමව්පියන් අමතන්නට වූවාය. "අපි කතා කරමු දරුවන්නේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳව. හම්ටි ඩම්ටි අංක ගණිතයට දක්ෂයි, නමුත් එයාගේ අක්ෂර වින්‍යාසය නම් ගන්න දෙයක් නැහැ. විස්කෝතු ඇගේ පැවරුම් හොඳින් කරනවා, නමුත් ඇගේ ගෙදර වැඩ නම් පිළිවෙලක් නැහැ. අපේ පංතියේ කලාකාරිය රතු. නමුත් එයාට පාඩම නම් හරියට කියවා ගන්න බැහැ. අඬන බබායි හාවියි අංක ගණිතය ගැන මීට වඩා උනන්දු වන්න වෙනවා. බෝංචි රිට ට පුළුවන් වෙයි මං හිතන්නේ එයාලාට උදව් කරන්න"

සියලුම දෙමව්පියන් පුදුමයෙන් අසා සිටි අතර අවසානයේ කෙනෙකු මෙසේ අසන ලදී.

"මොනවද මේ කියන්නේ කියලා මට නං වැටහෙන්නේ නැහැ. බෝංචි රිට? හම්ටි ඩම්ටි? කා ගැනද මේ කියන්නේ?"

"ළමයින් ම ඔයාලාට පැහැදිලි කරයි මං හිතන්නේ," ගුරුතුමිය පිළිතුරු දුන්නාය. "මේ විසුළු නම් කීම නවතනතුරු මාත් එයාලාට ඒ විදිහට ම අමතන්න, හඳුන්වා දෙන්න හිතුවා. කෙළ පූචානමාගේ අම්මායි තාත්තායි පොඩ්ඩක් නවතිනවද? මට ඔයාලාට පුද්ගලික ව කතා කරන්න ඕනෑ"

නිවසට ගිය පසු සැමගේ ම තත්ත්වය නරක අතට හැරිණ. දෙමව්පියන් සැම සිය දරුවන්ට තදින් බැණ වැදී තිබිණ. ගුරුතුමියගේ ක්‍රමය සාර්ථක විය. එයින් අනතුරුව අවර ගණයේ නම් සියල්ල අතුරුදන් විය.

නමුත් සියල්ල අතුරුදන් වූවා යැයි කිව නොහැක.

ඒ තවදුරටත් 'පැණි' යන නමින් මා හඳුන්වමින් තිබීම නිසාය. එය ස්වභාවිකව ම ළමුන්ගේ දිව අගට පැමිණි නමක් විය. ගුරුතුමියට ඒ පිළිබඳ ව කළ හැකි යමක් නොවීය.

කෙසේ හෝ ඒ නම ස්ථිර විය. අදටත් පරණ මිතුරන් මා ඒ නමින් අමතන අතර පෙර මෙන් එය හිත රිදවා ගන්නට තරම් කාරණයක් ලෙසින් මට නොහැඟේ. විශේෂයෙන් කාන්තාවන් එසේ අමතන විට මා එය කිසිසේත් ම නින්දාවක් ලෙස ගණන් ගන්නේ නැත. එයට හේතුව කුඩා ගැහැණු ළමුන් ව උන් සන්දියේ ඔවුන් විසින් ඒ නම මට දුන්නේ නින්දාවක් ලෙසින් නොවන නිසාය.

ඇත්ත පැවසූ අල්ල පනල්ලේ



පාසල් යන වයසේ කුඩා පිරිමි ළමයෙකු ව උන් අවධියේ කිසිදා බොරුවක් හසු නොවන පරිද්දෙන් කීමට නොහැකි වූ කෙනෙකු වීමි. අනෙක් ළමුන් කෙසේ හෝ හසු නොවන පරිද්දෙන් බොරුව ගැට ගසා ගන්නට සමත් වුවද මා බොරුවක් පැවසූ වහාම, "ඔයා ඔය කියන්නේ ඇත්ත නෙමෙයි" යනුවෙන් අසා ගැනීමට මට සිදු විය.

ඒ සෑම විට ම මම පුදුමයෙන් පුදුමයට පත් වීමි. "කොහොමද ඔයා දැන ගත්තේ?" මම අසමි.

ඉදින් කෙනෙකු මෙසේ කියනු ඇත. "ඇයි, ඔය ඔයාගේ මුණේ ඒක ලියවිලා තියෙන්නේ."

මේ කතාව බොහෝ සැරයක් ඇසීමෙන් පසුව මම තීරණය කළේ මගේ මුහුණේ ඇති වැරැද්ද කුමක්දැයි පරීක්ෂා කර බැලීමටය. ඉදින් මම කණ්නාඩිය අසලට ගියෙමි. "මම තමයි මේ ලෝකේ ඉන්න ශක්තිමත් ම ළමයා! මම තමයි දක්ෂ ම ළමයා! මම බල්ලෙක්! මම කිඹුලෙක්! මම කෝච්චි පෙට්ටියක්!" කණ්නාඩියට පවසා මගේ පිළිඹුව දෙස හොඳින් පරීක්ෂාකාරී ලෙස බලා සිටියෙමි. නමුත් එකද වචනයක් වත් මගේ මුහුණේ ලියැ වී නොතිබිණ!

එවර මා තීරණය කළේ ඒවා ඉතා කුඩා බොරු බැවින් නොගිණිය හැකි මට්ටමේ ඒවා විය යුතුය යන්නයි. ඉදින් තවදුරටත් පිළිඹුව දෙස බලාගෙන ම වඩා විසල් යැයි මට හැඟුණු බොරු වැළක් කියන්නට වීමි. "මට පිහිනන්න පුළුවන්! මට මං කැමති ඕනෑ ම දෙයක් අඳින්න පුළුවන්! මගේ අත් අකුරු අති විශිෂ්ටයි!"

කෙතරම් සද්දෙන්, කෙතරම් ලොකු බොරු කීවත් ඒ කිසිවක් ගණන් ගත හැකි මට්ටමේ බොරු නොවී තිබිණ. මම තවත් හොඳින් කණ්නාඩිය පරීක්ෂා කරන්නට වීමි. කිසිම ලියැවිල්ලක් මුහුණ මත නොවීය. අවසානයේ කරුණු කාරණා දෙමව්පියන් සමග සාකච්ඡා කළ යුතු වග මට හැඟී ගියේය.

"මම බොරු වැළක් කියාගෙන කියාගෙන ගියා, ඒත් කිසිම දෙයක් මගේ මූණේ ලියැවිලා තිබුණේ නැහැ. ඉතිං ඇයි ඔයාලා කියන්නේ මං බොරුවක් කියපු හැම වෙලාවේ ම ඒක මගේ මූණේ ලියැවිලා තියෙනවා කියලා?"

දෙමව්පියන් සිනා සයුරක ගිලී යන්නට විය. එයින් අනතුරුව තාත්තා මෙසේ පැවසුවේය.

"කාටවත් තමන්ගේ මූණේ ලියැවිලා තියෙන දේවල් තමන්ට ම පේන්නේ නැහැ. ඔයාට කවදාවත් ඒක කණ්නාඩියෙන් දකින්න වෙන්නේ නැහැ. ඒක හරියට ඔයාගේ වැලමිට ඔයා ම හපන්න උත්සාහ කරනවා වගේ වැඩක්. කවදාවත් ඒක කරන්න උත්සාහ කරලා තියෙනවද?"

"නැහැ," මම පැවසීමි. "නමුත් මේ දැන් ම උත්සාහ කරලා බලන්න පුළුවන්." අනතුරු ව මම උත්සාහ කළෙමි. නමුත් කෙතරම් වට ප්‍රමාණයක් කැරකුණත්, කොයි අතට හැරුණත්, කට වැලමිට ගාවටවත් ගෙන යන්නට නොහැකි විය. එයින් අනතුරුව තවදුරටත් කණ්නාඩියෙන් මුහුණ දෙස බලාගෙන බොරු නොකීමටත්, වැළමිට හැපීමට උත්සාහ නොදැරීමටත් තීරණය කළෙමි. එයට අමතර ව කිසිදා බොරු නොකියන්නටත් තීරණය කළෙමි. සඳුදා සිට සත්‍යය ම පමණක් පවසන්නට සිතා ගත් අතර එදින සිට මගේ මුහුණේ ලියවෙනු ඇත්තේ සත්‍යය ම පමණක් වනු ඇතැයි සිතීමි.

හිතන්නටත් පෙර සඳුදා උදා විය. උදෑසන ආහාරය ගන්නා වේලේ අම්මා මෙසේ ඇසුවාය.

"කන් පෙති දෙක හේදුවද?"

"නැහැ," සත්‍යය පවසන්නට ගත් තීරණයේ එල්බ සිටීමි.

ඇත්තට ම කන් පෙති සේදීම සතුටින් කරන ළමයෙකු ඒ වන විටත් ලොව පහළව සිටින්නට නැතැයි මම සිතුවෙමි. එතැන සෝදන්නට කන් පෙති දෙකක් ම තිබුණු අතර කෙතරම් සේදුව ද හවස් වන විට නැවතත් ඒවායේ කුණු රැඳී තිබෙයි. වැඩිහිටියන්ට මේ ප්‍රශ්න කිසිදා වැටහෙන්නේ නැත. තාත්තා මෙසේ පැවසුවේ එබැවින් විය යුතුය.

"මේ දැන් ම ගිහින් සෝදගෙන එන්න."

"හා," හිස සළා මේසයෙන් නැගිට ගොස් නැවතත් ඊළඟ තත්පරයේදී එතැන පෙනී සිටියෙමි.

"හේදුවද?"

"ඔව්."

වෙනදා නොඅසන අලුත් පැනයක් එවර පැන නැගිණ. "එකක්ද? දෙකමද?"

"එකක්" සත්‍යය ම පවසන මම පවසා සිටිමි.

නැවතත් අනෙක් කන සෝදාගෙන එන්නට සිදු වූ අතර ඒ ආ පසු ඊළඟ පැනය මා හමුවේ තැබිණ.

"මෝර තෙල් බිව්වද?"

"ඔව්," සත්‍යය ම පවසන මම පවසා සිටිමි.

"තේ හැන්දක්ද? මේස හැන්දක්ද?!"

එම ඓතිහාසික සඳුදාවට පෙර මගෙන් මේ ප්‍රශ්නය ඇසූ සෑම විට ම මේස හැන්දකට වඩා එක බිංදුවක්වත් පානය නොකර තිබුණද පිළිතුර "මේස හැන්දක්" විය. එය මෝර තෙල් බොන්නට සිදු වූ කෙනෙකුට වටහා ගත හැකි තත්ත්වයකි. මගේ මුහුණ මත නොලියවුණු එක ම බොරුව එය පමණක් විය. ඔවුහු හැම විට ම එය විශ්වාස කළහ. ඇත්ත වශයෙන් ම සිදු වූයේ මෝර තෙල් බෝතලයෙන් බිඳුවක් මේස හැන්දට ගැනීමය. එය මේස හැන්දක් ද නොවන මේස හැන්දක් ද වන අවස්ථාවකි.

නමුත් ඒ සඳුදාවේ සත්‍යය ම පවසන මවිසින්, "තේ හැන්දක්" යයි පවසන ලදී. සත්‍යය පැවසීම වෙනුවෙන් මා ලද ත්‍යාගය නම් තවත් තේ හැන්දක් පිරෙන තරමේ මෝර තෙල් මාත්‍රාවකි.

මෝරතෙල් වලට ඉතාමත් කැමති ළමුන් ලොව වෙසෙන බව ඔවුහු පැවසූහ. නුඹ එහෙම කෙනෙකු ව දන්නෙහිද? මම නම් දන්නේ නොදන්නෙමි.

උදෑසන ආහාරයෙන් පසුව මම පාසල බලා පිටත් වීමි.

එහි තත්ත්වය නිවසට වඩා සතුටුදායක වූයේ නොවේ.

"ගෙදර වැඩ කරන්න කාටද අමතක වුණේ?" ගුරුතුමිය අසා සිටියාය.

කිසිවකු වදනක්වත් කීවේ නැත. නමුත් මා නිහඬව සිටියේ නැත.

"මට," මම පැවසීමි.

"ඇයි?"

හිස වේදනා දෙන්න ගත්තා හෝ ගේ ගිනි ගත්තා හෝ භූමි කම්පාවක් ඇති වුණා හෝ මට සිතා ගත හැකි වූ වෙන කිසියම් බොරුවක් හෝ කිව නොහැක. මම සත්‍යය පවසන්නෙකු බවට පත් ව සිටියෙමි. ඒ නැතත් එවැනි බොරු කිසිදා මා හට පලදායක වී නොතිබිණ. සත්‍යය පවසන්නකු වූ මා සත්‍යය ම පැවසිය යුතු විය. "මට වෙලාවක් තිබුණේ නැහැ. හරිම හොඳ පොතක් ලැබුණා, මං ඒක කියෙව්වා"

"ඇත්තට,"යි ගුරුතුමිය පැවසුවාය. "මට හිතෙන්නේ මට ඔයාගේ දෙමව්පියන් එක්ක කතා කරන්න වෙනවා"

එය සැබවින් ම මා විසින් බලාපොරොත්තු නොවූ දෙයක් විය!

එදින සන්ධ්‍යාවේ මගේ මවගේ මිතුරියක් අප නිවසට ආවාය.

"ඔයා චොකලට්වලට කැමතිද?" ඇය මගෙන් ඇසුවාය.

"ඔව්. ගොඩක් කැමතියි," මම සත්‍යය ම පැවසීමි.

"ඔයා මට කැමතිද?" ඇය තොළොල් හඬින් ඇසුවාය.

"නැහැ," මම සත්‍යය පවසන්නෙකු වී සිටි බව ඔබ දන්නවා නේද?

"ඇයි ඒ?"

"ඔයාගේ කම්මුලේ තියෙන ලොකු තුවාල කැළල නිසා. අනිත් කාරණේ ඔයා සද්දෙන් කතා කරන්නේ හරියට පිස්සු හැදිලා වගේ!"

ඉතාමත් දිගු කතාවක් කෙටියෙන් පවසන්නේ නම්, ඉතාමත් දිගු චොකලටයක් මට අහිමි විය.

එදින සන්ධ්‍යාවේ අම්මා මා අමතා මෙසේ පැවසුවාය. "බොරු කීම නරක දෙයක් පුතේ. ඒ වගේ ම සම්පූර්ණ සත්‍යය හොඳ වෙන්නෙත් නැති අවස්ථා තියෙනවා පුතේ. මගේ යාළුවාගේ වරදක් නෙමෙයි එයාගේ කම්මුලේ තුවාල කැළලක් තිබ්බ එක. අනිත් අතට එයා කවදාවත් පොඩි කාලේ ඉගෙන ගත්තේ නැත්නම් හිමින් කතා කරන්න දැන් ඒක ඉගෙන ගන්න එයා ප්‍රමාද වැඩියි. ඒ සේරම පැත්තකින් තියෙද්දි, එයා ඔයාට ලොකු චොකලට් එකකුත් අරගෙන අපිව බලන්න ආ වෙලාවේ එයාගේ හිත රිදෙන විදිහට කතා නොකර හිටියා නම් හොඳයි කියලා දැන් හිතෙනවා නේද?"

මම සම්පූර්ණයෙන් ව්‍යාකූලත්වයට පත් වීමි. සත්‍යය පැවසිය යුතු වේලාවවත්, මොකුත් ම නොපවසා සිටිය යුතු වේලාවවත් වටහා ගත නොහැකි වීම එයට හේතුවයි.

එදා පටන් කිසිම දාක නැවත බොරු නොකියන්නට සිතා ගතිමි. එලෙසින් ම සෑම විට ම සත්‍යය පවසන්නට උත්සාහ කළෙමි.

සමහර අවස්ථා වලදී වැඩ වැරදුණු අවස්ථා නොතිබුණා ම නොවේ. නමුත් සත්‍යය පැවසීම වඩා යහපත් දෙය වන බව මගේ හැඟීමයි දුවේ!. ඉඳහිට බොරුවක් කී විට තාමත් මගේ යහළුවන් එය මගේ මුහුණේ ලියැවී ඇතැයි පවසන අතර එයට කරන්නට දෙයක් තාමත් මට සිතා ගත නොහැකිය. ඇත්තට ම කළ හැකි දෙයක් වේද?

බිත්ති පුවත්පතේ කතන්දරේ



පාසලේ ඉහළ පංති වල ඉගෙනුම ලබමින් උන් අවදියේදී පංතියේ බිත්ති පුවත් පතේ සංස්කාරකවරයා වශයෙන් මා තෝරා පත් කර ගන්නා ලදී. ඇත්ත වශයෙන් ම මා එම තනතුර සඳහා යෝජනා වූයේ උපැස් යුවළක් පැළඳි නිසාය.

කෙසේ හෝ නියම සංස්කාරකවරයෙකු නම් උපැස් යුවළක් පැළඳීම අනිවාර්ය ලෙසින් එකල සලකන ලදී. මේ කාරණාව නිසා මා නිතරඟයෙන් ම ඒ සඳහා පත් වුණි. මගේ මිතුරන් සිව් දෙනෙකු සංස්කරණ මණ්ඩලය ලෙසින් පත් කෙරුණු අතර ඒ අයද පත් වූයේ නිතරඟයෙනි.

සංස්කරණ මණ්ඩලයේ පළමු රැස්වීමේදී නැගී සිටි මම ඔවුන් අමතා කතා කළෙමි. "මේ අහන්න ළමයි, මම තමයි සංස්කරණ මණ්ඩලයේ ප්‍රධානියා. නමුත් නිකං හරි මං අසනීප වුණොත් මොකද වෙන්නේ? මගේ කකුලක් බැරි වෙලා හරි කැඩුනොත් මොකද වෙන්නේ? නිකං හරි පිස්සු බල්ලෙක් මාව කෑවොත් මොකද වෙන්නේ? මං මේ කියන්න යන්නේ මට සහායකයෙකු අවශ්‍යයි. මං කියනවා අපි ශෘරා ඒ සඳහා පත් කර ගමු. හැමෝම කැමති නේද? හරි. ඔන්න නිතරගයෙන් ශෘරා පත් කර ගන්නවා. ඔන්න ඔයා තමයි මගේ සහායක සංස්කාරකවරයා."

එයින් අනතුරුව නැගී සිටි ශෘරා කතා කළේය. "නමුත් නිකං හරි මං අසනීප වුණොත් මොකද වෙන්නේ? වාහනයක් මගේ ඇඟ උඩින් ගියොත් හරි වෙන මොකක් හරි වුණොත් මොකද කරන්නේ? අනිත් අතට මට පූසෙක් ඉන්නවා, එයාට ජල භීතිකාව හැදිලා, එයා මාව හැපුවොත් මොකද කරන්නේ? මං මේ කියන්න යන්නේ මටත් සහායකයෙකු අවශ්‍යයි. අපි වලෝද්‍යාව පත් කර ගමු. කවුරුත් අකමැති නැහැ නේද?"

වලෝද්‍යා නිතරගයෙන් පත් කර ගැණින. සත්‍යය වශයෙන් ම ඔහුටත් අසන්නට ගැටළු තිබිණ. "මොකද වෙන්නේ මගේ ඔළුව උඩට ගලක් වැටුනොත්?" නමුත් කිසිවෙකු ඔහු වෙත අවධානය යොමු කළේ නැත.

"දැන් ළමයි, මෙහෙමයි වැඩේ වෙන්නේ," මම පැවසීමි. "මට අසනීප වුනොත්, ශෘරා වැඩ බලනවා, මොකද එයා තමයි මගේ පළමු සහායක. අපි දෙන්නා ම අසනීප වුනොත්, වලෝද්‍යා වැඩ බලනවා, මොකද එයා තමයි මගේ දෙවන සහායක. වැරදිලාවත් මං හොඳ සනීපෙන් ඉද්දි ශෘරා අසනීප වුණොත් ඔන්න වලෝද්‍යා මගේ පළමු සහායක බවට පත් වෙනවා. එහෙනම් ඔන්න ඒ වැඩේ අවසානයි."

"නැහැ, තාම ඉවර නැහැ," යූරා පැවසුවේය. "කවුද ලේකම් එතකොට?"

"ඔයා!" අනෙක් ළමෝ සියල්ලන් ම එකවර හඬ නැගූහ.

"ඇයි මම? ඇයි මෙයා නොවෙන්නේ?" ඔහු සංස්කාරක මණ්ඩලයේ අවසාන සාමාජිකයා වූ සාෂා දක්වමින් ඇසුවේය.

"එයා තමයි අපේ මණ්ඩලයේ කලාකරු, ඒක නිසා එයාට ලේකම් වෙන්න බැහැ." මම පැවසීමි.

"එයා පත්තරේට ඕනෑ කරන සියලු ම චිත්‍ර ඇඳලා දෙයි. වෙන මොනවා හරි ප්‍රශ්න තියෙනවද?"

"මට තියෙනවා," සාෂා නම් වූ අපේ කලාකරු අත එසෙව්වේය. ඔහුගේ හඬෙහි දුක්බර ස්වභාවයක් ගැබ් ව තිබිණ. "ඔයාලා සේරම එක පාරම මැරුණොත් මොකද වෙන්නේ? එතකොට මට තමයි තනියෙම පත්තරේ කරන්න වෙන්නේ. ඒ ගැන කොයි වෙලාවකවත් ඔයාලා හිතුවද?"

"අයියෝ නිශ්ශබ්ද වෙන්න!" මම වහා පැවසීමි.

"පිස්සු කතා කියන්න එපා," මගේ පළමු සහායක ශූරා පැවසුවේය.

"සන්සුන් වෙන්න සාෂා, අපි එහෙම එක පාරම මැරෙන්නේ නැහැ," මගේ දෙවන සහායක වලෝද්යා පැවසුවේය.

අවසානයේ සාෂා සන්සුන් විය.

"දැන් අපි පත්තරේට නමක් හිතන්න ඕනෑ," මීළඟ වැදගත් කාරණය ඉදිරිපත් කළෙමි. "මොකද කියන්නේ 'රතු ටයිපටිය' කියන නම ගැන?"

"අපෝ අනිත් හැම පංතියේ ම බිත්ති පුවත්පත් වලට කියන්නෙත් ඔය නමමනේ," ශෘරා නොකමැත්තෙන් හිස සලමින් පැවසුවේය.

"ඔයාගේ යෝජනාව මොකක්ද එහෙනම්?" මම ඔහුගෙන් විමසීමි.

"මොකක්වත් නැහැ. මං කිව්වේ..."

"අපිට කතා කර කර ඉන්න වෙලාවක් නැහැ. අපිට ඕනෑ කරන්නේ යෝජනා. එහෙම නේද ළමයි?"

" 'විසල් බඳුන' " වලෝද්යා යෝජනා කළේය.

සංස්කාරක මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට සිතුණෝ එය ඔහුගේ අගනා විහිළුවක් ලෙසිනි.

"ඒ වගේ නමක් හිතුණේ මොකද?"

"ඒක තරුවකට කියන නමක්. ඒක ඈත අහසේ තියෙන්නේ. අනිත් ඒක ඒක ලස්සන තරුවක්."

"ඒක හොඳ වැඩී මට හිතෙන්නේ. යූරා මොකක්ද ඔයාගේ යෝජනාව?"

"අපි එය නම් කරමු, ඉදිරියෙන් නමක් දාලා බිත්ති පුවත්පත කියලා. හරියට මේ වගේ නමක්..."

"ආ... ස්තුතියි යූරා," ඔහුට බාධා කරන්නට මට සිදු වූයේ එය වැදගැම්මකට නැති යෝජනාවක් ලෙසින් හැඟුණු බැවිනි. "සාෂා, ඔයාගේ යෝජනාව මොකක්ද?"

"මොකක්ද?"

"ඔයාගේ අදහස මොකක්ද පත්තරේට දාන නම ගැන?"

"මගේ...?"

"ඔව් ඔයාගේ?"

"පත්තරය"

"මොනවා කියනවද මන්දා."

"මං දන්නේ නැහැ. මං චිත්‍ර අංශයේ ප්‍රධානියා විතරයිනේ."

"හොඳයි. ස්තුතියි, සාෂා. හොඳයි ළමයිනි, දැන් අපි හැමෝ ම තනි තනි ව හිතමු අපේ පත්තරේට හොඳ නමක්. නැවත අපි ලබන බදාදා හමුවෙමු."

මීළඟ රැස්වීමේදී ඡන්දයෙන් තෝරා ගැනීමට එදින යෝජනා වූ නාමයන් මෙසේය.

1. රතු ටයි පටිය (මගේ යෝජනාව)

2. තරුණ පුරෝගාමියා (ශූරාගේ යෝජනාව)

3. තරුණ පුරෝගාමියෝ (යූරාගේ යෝජනාව)

4. කුඩා බඳුන (වලෝද්යාගේ යෝජනාව. සුළු වෙනස්කමක් කර තිබුණි.)

5. තෙලිතුඩ සහ මිනිරන් තුඩ (සාෂාගේ යෝජනාව. එය බොහෝ කලක් ගතවනතුරු ඔහුගේ සුරතල් නාමය බවට පත්වනු ඇතැයි කිසි දු අදහසක් යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ ඔහුට නොතිබෙන්නට ඇත.)

සියල්ලන් ම තම තමන්ගේ යෝජනාවන් වෙනුවෙන් පෙනී සිටි අතර රැස්වීම අවසන් වනතුරු නමක් ස්ථිර කරගත නොහැකි විය. අවසානයේ ඡන්දයක් පැවැත්වීමට යෝජනා වූ අතර එය බදාදා දිනයේ පැවැත්වීමට තීරණය කෙරිණ.

මහත් ම අපදාව සිදු වූයේ ඔය අතරතුරේදීය. සාෂා, සංස්කාරක මණ්ඩලයේ සිටි එක ම කලාකරු සහ සහායකයෙකු නොසිටි කෙනා, උන් හිටි හැටියේ අසනීප විය. සාමාන්‍යය සිරිත නම් මේවන් අවස්ථා වලදී ක්ෂණිකව සහාය කලාකරුවෙකු පත්කර ඔහුට වගකීම බාර දීම වූ අතර ඒ සඳහා නමක් යෝජනා කරන්නට මුව විවර කර මොහොතකින් මට සිහිවූයේ චිත්‍ර ඇඳීමට සමත් තවත් කිසිවෙකු සංස්කාරක මණ්ඩලය තුළ නොවූ බවය. විවර කළාටත් වඩා වේගයෙන් මුව වසා ගැනීමට මට සිදුවිය. නමුත් නැවත මුව විවර කළ මා,

"දැන් අපට අපගේ කාර්යය මණ්ඩලය තුළ කලාකරුවෙකු නැහැ. ඒ වගේ ම කිසිම ලිපියක් නැහැ. කාටවත් ලියන්න දෙයකුත් නැහැ වගේ. එක් කෙනෙක් කියනවා තමන්ට ලියන්න දන්නේ නැහැ කියලා, තව කෙනෙක් කියනවා ලියන්න ඕනෑ කමක් නැහැ කියලා, අනිත් අය එහෙමවත් මොකුත් ම කියන්නේ නැහැ. දැන් එයාලාට ලියන්න, ලියන්න කියලා මට එපා වෙලා තියෙන්නේ. මොකද ඔයාලා කියන්නේ?" යි දීර්ඝ විස්තරයක් කළෙමි.

"අපිටත් එහෙම තමයි," මුළු සංස්කාරක මණ්ඩලය ම එක හඬින් පවසා සිටියේය. "කාටවත් උවමනාවක් නැහැ පත්තරේට ලියන්න."

"ඇත්තෙන්ම," මම හඬ බාල කොට පැවසීමි. "අපිට පුළුවන් නමක් නැතිව පත්තරේ පළ කරන්න."

"ඒ වගේ ම කිසි ම ලිපියක් නැතිව," ශූරා කෙඳුරුම් හඬින් පැවසීය.

එය සිනහ උපදවනසුලු කතාවක් වුවද, කිසිවකුට සිනහ නොගියේ, අවසානයේ අප කතා කරමින් සිටියේ, නැති පුවත්පතක් පිළිබඳ ව වග සැමට වැටහුණු නිසාය.

ඒත් සමග ම දොරට තට්ටු කරන හඬක් ඇසිණ.

"ඇතුළට එන්න," යූරා ආචාරශීලි ව පැවසුවේය.

ඒ ආන්යා නම් වූ ගැහැණු ළමයා විය. ඇය අප පාසල අලුත් සිසුවියක් වූ අතර ඉතාමත් සාමාන්‍ය ස්වභාවයේ, විශේෂත්වයක් නොමැති කෙනෙකු විය. නමුත් මේ සාමාන්‍ය පෙනුමක් ඇති ආන්යා නම් වූ ගැහැණු ළමයා, ඉතාමත් සාමාන්‍ය වූ හඬින් පවසන්නට ඇරඹී දෙය ඉතාමත් අසාමාන්‍ය විය.

"මෙන්න පත්තරේට නමක්,"යි පැවසූ ඈ, රෝල්කර තිබූ තරමක් විශාල කොළයක් දිග හැරියාය. සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයින් හට සිය ඇස් අදහා ගත නොහැකි වූ මොහොතක් උදා විය. අපි සිහිනයක් නරඹමින් සිටියෙමුද? එතැන පුවත්පතේ නාමය විය. එය සාෂා අඳින ලද්දක් සේ ම ඉතාමත් හොඳ තත්ත්වයේ තිබිණ.

"ඔයාලාට උදව්වක් කරන්න පුළුවන්ද කියලා ග්‍රීෂා මගෙන් ඇහැව්වා," ආන්යා කීවාය. "මං කලින් හිටපු පාසලේ සංස්කාරක මණ්ඩලයේ මම කටයුතු කරලා තියෙනවා," ඇය එකතු කළාය. "ළමයි ලියපු ලිපි කිහිපයකුත් මං අරං ආවා. හැබැයි ඉතිං හතරයි මට ගේන්න පුළුවන් වුණේ."

"කීයක්ද?" මට මුව විවර කරගත හැකි විය.

"හතරයි. මගෙයි, තව තුන්දෙනෙකුගෙයි. මට ඔච්චරයි ගැහැණු ළමයින්ගෙන් ගන්න පුළුවන් වුණේ. මං දන්නේ නැහැ පිරිමි ළමයින්ගේ පැත්ත කොහොමද කියලා," ඇය කීවාය.

"ඒකට මක් වෙනවද," මම සිනහ වෙමින් පැවසීමි. "පිරිමි ළමයි මේ දැන් ම ලියයි ලිපි තුන හතරක්. මේ මෙතැනදී ම. ඉතිං අපිට පුළුවන් හෙට අපේ පත්තරේ පළ කරන්න."

කිසිවකු කිසිවක් පැවසුවේ නැත. 'රතු ටයි පටිය' නම් වූ අපේ බිත්ති පුවත්පත, (ඇත්ත වශයෙන් ම නම සඳහන් කර තිබූ පත්‍රය ආන්යා අතින් ලැබුණු පසු කිසිවකුට ඒ ගැන වාද කරන්නට හැකි වූයේ නැත) පසුදින පළ විය. සංස්කාරක මණ්ඩලයේ සියලු ම සාමාජිකයින්

විසින් එක් එක් ලිපිය බැගින් ලබාදුන් අතර එම විශේෂ අවස්ථාව වෙනුවෙන් ම රචනා කරන ලද කවියක් මවිසින් ලබා දෙන ලදී.

සංස්කාරක මඩුල්ලේ අප දුටු සිහිනය
කිසිදා අමතක නොවන සිද්ධි දාමය
ඔබට අවැසි වන්නේ නම් පත්තරය
නැගී සිට ලබා ගත යුතුය පන්නරය

එය හොඳ පත්තරයක් ලෙසින් අනෙක් ළමෝ සිතුවෝය. ආන්යා සංස්කාරක මණ්ඩලයට පත් කෙරිණ. සාෂා නොබෝ දිනකින් සෙම්ප්‍රතිශ්‍යාවෙන් මිදී නැවතත් පාසලට පැමිණියේය.

අප බිත්ති පුවත්පතේ ඊළඟ කලාපය බොහොම ඉක්මනින්, වඩා හොඳින්, සැමගේ එකමුතුවෙන් එළි දක්වන්නට අපට හැකි වූ අතර එය සැමට විසල් සතුටක් ගෙන ආවේය.

වැටත් ගැලවුණායි දෙවන මහලේ



මා පාසලේ ඉහළ පංතියක ඉගෙන ගන්නා කාලයේ වරක් ගිම්හාන කඳවුරක් පැවැත්වුණු අතර එහි දී සිදු වූ අමතක නොවන සිදුවීම මෙසේය.

දෙමහල් ගොඩනැගිල්ලක දෙවන මහලේ අප කණ්ඩායමේ නවාතැන විය. එක් සැන්දෑවක, මාත් මගේ මිතුරන් කිහිප දෙනෙකුත් සඳළුතලයට වී සිටින කල්හි ශූරා, වලෝද්යා හට මෙලෙස පැවසුවේය.

"මං ඔට්ටු අල්ලනවා, ඔයා මෙතනින් පනින්න බයයි."

"මාත් ඔට්ටු අල්ලනවා, ඔයාත් බයයිනේ," මම ශෞරා හට වහා පැවසීමි.

"මට නං ඒක හරිම සිම්පල් වැඩක්. නමුත් ඔයාලා සේරම බයයිනේ," ශෞරා මදෙස හැරී පැවසීය.

"ඔච්චර මොකක්ද අමාරු වැඩේ බැල්කනියකින් පනින එකේ," සාෂා ඇසුවේය. "මං එක පාරක් පැරචුට් එකකිනුත් පැනලා තියෙනවා, විනෝද ක්‍රීඩා උද්‍යානයකදි."

"ඒක වෙනයි. නමුත් මං ඔට්ටු අල්ලනවා මෙතැනින් පනින්න ඔයා බයයි."

"මොකක්ද ඇති වැඩේ නිකං ඉන්න බැරුවට වගේ බැල්කනියකින් පැනිල්ලේ?" වලෝද්යා ඇසුවේය. "ඔන්න කමක් නැහැ මෙතන ගින්නක් හරි මොකක් හරි ඒ වගේ දෙයක් ඇති වෙලා නම්."

"හරි. මං ගිනිකූරක් පත්තු කරන්නම්කෝ. එතකොට ඔයා පනින්න," පිරිමි ළමයෙකු සේ දඟකාර ටාන්යා එක්වර ම පැවසුවාය.

"බයගුල්ලා, බයගුල්ලා!" හැමදෙන කෑ ගසන්නට වූහ.

"මං ඔට්ටු අල්ලනවා, ඔයා කීයටවත් මෙතැනින් පනින්නේ නැහැ," එවර වලෝද්යා ටාන්යාට පැවසුවේය.

ඈ සිය තොල හපනු මම දිටිමි. ඇගේ මුහුණ බොහෝ සෙයින් සුදුමැලි විය.

"ස්ථිරයෙන් ම එයා පනිනවා," මම පැවසීමි. "නමුත් ඒක නං මහා මෝඩ ම මෝඩ අදහසක්."

"මෙතැන තියෙන ලොකුම මෝඩ වැඩේ ඔයාලාගේ බොරු පුරසාරම් කතා අහගෙන ඉන්න එකයි" ටාන්යා කට උල් කර පැවසුවාය.

"ඒ කිව්වේ මටත් එක්කද?" වලෝද්යාට දැන ගැනීමට අවශ්‍ය විය.

"ඔව් ඔව්, නැතුව නැතුව, අනිත් සේරට ම වැඩියෙන් ඔයාට තමයි කිව්වේ," ටාන්යා අත් නොහැරියාය.

වලෝද්යාගේ මුහුණ බලා සිටියදීම රත් පැහැ ගැන්වුණු අතර ඔහු කේන්තියෙන් නොසන්සුන් වන්නට විය. "හොඳයි," හේ පැවසීය.

"ඔයා කියන්නේ මං පුරසාරම් කියනවා කියලානේ, ඔයාගේ කැමැත්ත ඒක නම්, මං බය නැතුව කියනවා මෙතැන ඉන්න අයගෙන් මෙතැනින් පනින්න කෙනෙක් ඉන්නවා නම් ඒ මං විතරයි."

"ඔයා හොඳට ම බය වෙලානේ ළමයෝ ඉන්නේ,"යි පැවසූ ටාන්යා තදකරගත් සිනාවකින් යුතුව ඔහු දෙස බලා සිටින්නට වූවාය.

වලෝද්යා අපහසුවෙන් මෙන් පා ඔසවාගෙන සඳළුතලයේ වැට වෙත ගිය අතර පසුපස හරවා ඒ මත වාඩි විය. වැටෙන් කිරි කිරි ගා හඬක් නැගුණි. "එතකොට මං බයයි, මං බොරු කියන්නේ... ආ?" ඔහු ඉතාමත් සන්සුන් හඬකින් අසා සිටියේය.

"ඔව් ස්ථිරෙන් ම..." ටාන්යාත් එවැනි ම වූ සන්සුන් හඬකින් පැවසුවාය.

"වලෝද්යා!" මම හඬ නැගුවෙමි. "මං කවදාවත් හිතුවේ නැහැ ඔයා ඔය තරම් මෝඩයි කියලා."

"කරදර වෙන්න එපා," ටාන්යා පැවසුවාය. "එයා කොහේ පනින්නද? එයා එච්චර මෝඩ නැහැ."

"මං එච්චර මෝඩ නැහැ," වලෝද්යා එය ම ප්‍රතිරාව කොට වැට මතට නැග්ගේය. එවිට වැට පෙරට වඩා හඬින් කිරි කිරි හඬ නගන්නට විය.

"වලෝද්යා!" එවර ටාන්යා කෑ ගැසුවාය.

"ඇහුම්කන් දෙන්න හැමෝම," අසල තිබූ කණුවක් අල්ලාගෙන, කිරි කිරි හඬ නගන සඳළුතල වැට මත සිටගෙන, වලෝද්යා අප අමතමින් සිටියේය. "මං දැන් පනින්නයි යන්නේ. මගේ මරණයට වගකිවයුතු මෙලොව වාසී එක ම කෙනා මේ ටාන්යා. මෙන්න මං යනවා මිතුරනි! එකයි, දෙකයි, තුනයි!"

ක්ෂණයකින් මම මගේ දෙනෙත් තදින් වසා ගතිමි.

"මෙන්න මං යනවා මිතුරනි!" වලෝද්යාගේ හඬ මට ඇසිණ. වැට කිරි කිරි හඬ නැගුවේය. ඒත් සමග ම යම් කිසිවක් බොල් හඬක් නගමින් සඳළුතලය මත පතිත විය. මරණීය නිහඬ බවක් පැතිර ගියේය.

සියල්ලන් ම කොක්හඬලා සිනාසෙනු ඇසී දෙනෙත් විවර කර බලන විට වලෝද්යා සඳළුතලයේ බිම මත වාඩි වී සිනාවට එක් ව සිටිනු දැකිය හැකිවිය.

"මං කිව්වානේ මං පනිනවා කියලා, හා හොඳයි කිව්වේ නැද්ද? ඒ වගේ ම පැන්නා!"

එම විහිළුව පිළි නොගත් එක ම කෙනා ටාන්යා විය. අවසානයේ කොක්සන් නැගීම අවසන් වූ පසු ඇය මුව විවර කළාය.

"මං ඒක දැනගෙන හිටියේ. මං ඒක හොඳින් ම දැනගෙන හිටියේ! ඔයාට පුළුවන් පුරසාරම් කියන්න විතරමයි!" එසේ පැවසූ සැනින් ඇය වැට මතට නැංගාය. එම දර්ශනය මට දැනුදු මතකයේ තිබේ. සිහින් සිරුරැති ඈ, සුදුපාට ටී ෂර්ටයෙන් හා නිල් පාට කොට කලිසමෙන් සැරසී සිටි අතර ක්‍රීඩාශීලී විලාසයෙන් අප දෙස බැලුවාය. වැට මත සිට මොහොතකින් පසු ඇය එක් වනම බිමට පැන්න අතර දුන්නක් මෙන් නැමී වකුටු වී පොළොව වෙත අති සාර්ථක ලෙස ළඟා වුවත් සමබරතාව ගිලිහීමෙන්, කැරකී ගොස් අසල තිබූ මල් ගොමුව

වෙත ඇද වැටුණාය. සඳලුතලයේ සිටි පිරිමි ළමෝ කෑ ගසමින් පියගැට පියමං කොට පහළ උද්‍යානය වෙත ළඟා වූහ. සඳලුතලයේ ඉතිරි වුයේ මාත් වලෝද්‍යාත් පමණි. වලෝද්‍යා ඒ වනවිටත් බිම හිඳගෙන අන්දමන්ද ව මෙන් බලා හුන්නේය. මම නිහඬ ව ඔහු දෙස බලා සිටියෙමි.

මොහොතකින් නිහඬතාවය බිඳ වැටිණා.

"ඇය පැන්නා,"යි මුමුණන්නට ප්‍රථම වලෝද්‍යා කිහිප වරක් ම කට අරිමින් වසමින් සිටියේය. අවසානයේ කෙසේ හෝ ඔහුට එය කියා ගත හැකිවිය.

"ඇය පැන්නා."යි මම ද එය ම ප්‍රතිරාව කළෙමි. වෙන කුමක් නම් කියන්නද?

මේ අතරතුරේ මල් ගොමුව දෙසින් පිරිමි ළමුන්ගේ කෑ ගැසීම ඇසෙන්නට විය. "ටාන්යා වෙනුවෙන් අපගේ ආචාරය!"

"දැක්කනේ! මං චුට්ටක්වත් බය වුණේ නැහැ." ඇය කාන්තිමත් බැල්මෙන් යුතුව ඔවුන් දෙස බලා පැවසුවාය.

"ඇය හරි," මම පැවසීමි. "ඇය පොඩ්ඩක්වත් බය වුණේ නැහැ. නමුත් නුඹ බය වුණා."

වලෝද්‍යා කිසිවක් නොපැවසුවේය.

"මමත් බය වුණා," ඔහුට සහනයක් ගෙන එන අටියෙන් එකතු කළෙමි. අනතුරුව මම සෙමින් හා පරිස්සමින් වැටට නැග ආදරණීය ජීවිතය වෙනුවෙන් අසල වූ කණුව බදාගෙන සිටියෙමි. පැනීමේ කිසිදු බලාපොරොත්තුවක් මවෙත නොවූ බව දිවිරා පැවසිය හැක. මට දැන ගැනීමට අවශ්‍ය වුයේ වලෝද්‍යා බියට පත් කළ, නමුත් ටාන්යා බියට පත් නොකළ කාරණය කුමක්ද යන්න පමණි. තත්පරයක්වත් ගත වීමට ප්‍රථම ඒ කුමක්දැයි මට වැටහිණා.

එය දැන ගැනීමෙන් අනතුරුව සඳළුතලය වෙත බසින්නට සූදානම් වත් ම අපගේ අනුශාසකවරිය වූ ග්‍රීෂා එතැනින් යන්නට පැමිණ, වැට මත හුන් මා දැක කෑ ගැසුවාය. "මොනවද කරන්නේ? මේ දැන් ම බහින්නයි කිව්වේ!" ඇය මරණ බියෙන් තැතිගත් අයෙකු සේ දිස්විය.

මා ඇය කී දෙය කරන්නට සැරසෙනවාත් සමග ම පැද්දෙන්නට වූ අතර කිරි කිරි හඬ නගමින් සිටි වැට ඇඹරී ගියේය. මගේ පය ලිස්සා ගියේය. කරණමක් සමගින් මා මල් ගොමුව වෙත පතිත වූයේ වැටේ කොටසක් ද මා සමඟ රැගෙනය. එය ඒ අලංකාර මල් ගොමුවේ අවසානය විය.

මට තවමත් වටහා ගත නොහැක්කේ, කැඩුණු අතක් හෝ කකුලක් අනිවාර්යයෙන් හිමි විය යුතුව තිබූ මා නැගිට ඇවිද යාමට සමත් වූයේ කෙසේද යන්නයි. මගේ පැනිල්ල මා සැලසුම් කරන ලද්දක් නොවේ. මා ඉබේ ම දෙවන මහලේ සිට බිමට ඇද වැටුණා පමණි. පස් සහ දූවිලි වැකී, තැළුණු තැන් නිල් පාට වී, නරක විදිහට සිදු ව තිබූ සීරීම් සහිත ව සිටියද එතරම් දරුණු හානි සිදු වී නොතිබීම පිළිබඳ ව සැනසුම් සුසුම් හෙළීමි.

"අන්න නියමයි!" අනෙක් පිරිමි ළමුන් බලා සිටියදී ටාන්යා පැවසුවාය.

මා නිකම් ම කරණමක් ගසා බිමට පාත් වූ බව කිසිවෙකු විශ්වාස කළේ නැත. උපදේශකවරියට, වැට ගැලවී ගිය බව තමන් දුටු බව පැවසූ වලෝද්යාවත් එය කරණමක් නොවූ බව විශ්වාස කළේ නැත.

"මේ මට නං බොරු කියන්න එන්න එපා,"යි ඔහු මට පැවසුවේය. "ඔයාට ඕනෑ හැටියේ තිබුණානේ මං පැන්නා වගේ ආපහු බැල්කනියට ම පනින්න. කොල්ලෝ, ඔයායි ටාන්යායි ඇත්තට ම නියමයි. එයාට පුළුවන් බව පෙන්නන්න එයා පැන්නා, ඒ වගේ ම

ඔයාත් ඔයාට පුළුවන් වග පෙන්වන්න පැන්නා. ඔයාට ඕනෑ වුණේ නැහැ ගැහැණු ළමයින්ට හිතවන්න එයාලා අපට වඩා දක්ෂයෝ කියලා නේද? නමුත් එයා හරි. මං ඇත්තට ම පුළුවන් දෙයක් ගැන නෙමෙයි කිය කියා හිටියේ. පුරසාරම් කිව්වා විතරයි."

පසුදින පැවති රැස්වීමේදී, මෙවැනි දේකට අප දෙදෙනාට සමාව ලැබෙන අවසාන අවස්ථාව මෙය විය හැකි බව ටාන්යාටත් මටත් දන්වන ලදී. එදින සන්ධ්‍යාවේ පිරිමි ළමෝ මට සුභ පැතූහ. නමුත් මම ඉතාමත් අසරණ ලෙසින් ලජ්ජාවට පත් ව සිටියෙමි. "මම වැටුණා දෙයියනේ! ඇත්තමයි, මම වැටුණා!"

කාටවත් මා විශ්වාස කරන්නට උවමනාවක්වත් හැකියාවක්වත් තිබුණේ නැත. එයට පෙර ඇති වී නොතිබුණු හැඟීමක් මසිත පෙළන්නට වූයේ එවිටය. ඔබට කිසිවෙකු දොස් නගන විට එයට විරුද්ධව පළ කරන්නට අදහස් ඔබ සතුව තිබුණද, කෙනෙකු ඔබව පසසන විට එසේ නොවන්නේ නේද? මේ කරුණ නිසා මගේ මිතුරන් මා ප්‍රශංසාවට ලක් කරන කල්හි මුවින් නොබැන සිටියද, ඒ ප්‍රශංසාවන් මා ඉමහත් සතුටකට පත් කළේ නැත.

ඉදින් මා ආදරණීය දුවේ, මේ දේවල් සිදුව දැනට වසර ගණනාවක් ගත වී ගොස් තිබේ. එම කාලය තුළ බොහෝ වාරයක් මා හට දොස් නැඟීම්වලට මෙන් ම ප්‍රශංසාවන්ට ද මුහුණ දීමට සිදුවිය. නමුත් දුවේ විශ්වාස කරන්න! නොකළ දේකට ප්‍රශංසා ලැබීම තරම් නරක දෙයක් තවත් නැත. එයට වඩා නොකළ දේකට දොස් ඇසීම යහපත් යැයි නුඹට සිතෙනු ස්ථිරය.

සඳළුතලයෙන් බිමට පතිත වී එසේ පතිත වූවාට ප්‍රශංසාවට ලක් වූ එම ගිම්හානයේ මා උගත් පාඩම එයයි.



රුසියානු ගත්කතුවර ඇලැක්සැන්ඩර් රස්කින් විසින් රුසියන් බසින් රචිත කතාන්දර පොතක් අනුසාරයෙන්, ෆායින්නා ග්ලැගෝලෙවා (Fainna Glagoleva) විසින් When Daddy was a Little Boy නමින් ඉංග්‍රීසි බසට පරිවර්තනය කළ සුන්දර කතාන්දර පොතේ සිංහල අනුවාදයයි, මේ. දඟකාර පොඩිත්තෙකුගේ සූරවීරකම්, මෝඩකම් හා හපන්කම් අතරින් ඔහු අනාගතය හා ජීවිතය හැඩගස්වාගන්නා ආකාරය ගැන කියා දෙන මේ කතාන්දර පොත, වැඩිහිටියන්ව ද සිය ආකල්ප හා හැසිරීම් ගැන නැවත වරක් සිතා බලන්නට පොළඹවනු ඇත. එනිසා මේ පොතේ එන කතාන්දර, කුඩා ළමයින් සහ වැඩිහිටියන් එක්ව කියැවිය යුතු රස සාගරයකි.

THATCHER PUBLISHERS
YOUR READING ATTITUDE

තැචර් ප්‍රකාශන
518/8E, මුදිතා මාවත,
හීන්කෙන්ද, රාගම
දුරකථන : 077-448 34 34
වෙබ් : www.thatcher.lk
ඊ මේල් : thatcher@thatcher.lk
thatcherpub@gmail.com

මිල රු 380/=

ISBN 978-955-7541-04-4